214 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 214 - இல. 2
Volume 214 - No. 2

2013 ජනවාරි මස 09 වන බදාදා
2013 சனவரி 09 புதன்கிழமை
Wednesday, 09th January, 2013

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
ටෙන්ඩර් කැඳවීමකින් තොරව මිනරල් අළෙවි කිරීම

**නීති විද්‍යාල ප්‍රවේශය - 2013 :**
අධිකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
එක්සත් මුස්ලිම් උම්මාහ් (සංස්ථාගත කිරීමේ)- [ගරු හුනෙයිස් ෆාරුක් මහතා] - පළමුවන වර කියවන ලදී

ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ)-[ ගරු හුනෙයිස් ෆාරුක් මහතා] - පළමුවන වර කියවන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
ගංවතුරින් විපතට පත් වූවන්ට සහන

---

# பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல்மூல வினா:

கேள்வி கோரப்படாது கனியப் பொருள் விற்பனை

சட்டக் கல்லூரி அனுமதி - 2013 :

நீதி அமைச்சரினது கூற்று

தனி உறுப்பினர் சட்டமூலங்கள்:

ஐக்கிய முஸ்லிம் உம்மா (கூட்டிணைத்தல்) - [மாண்புமிகு ஹுனைஸ் பாறூக்]- முதன்முறை மதிப்பிடப்பட்டது

ஸ்ரீலங்கா ஹிரா பௌன்டேஷன் - [மாண்புமிகு ஹுனைஸ் பாறூக்]- முதன்முறை மதிப்பிடப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

வெள்ளத்தினால் பாதிக்கப்பட்டோருக்கு நிவாரணம்

---

# PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Sale of Minerals without adhering to Tender Procedure

LAW COLLEGE ENTRANCE - 2013:
Statement by Minister of Justice

PRIVATE MEMBERS' BILLS:
United Muslim Ummah (Incorporation) – [The Hon. Hunais Farook] – Read the First time

Sri Lanka Hira Foundation (Incorporation) – [The Hon. Hunais Farook] – Read the First time

ADJOURNMENT MOTION:
Relief for Flood Victims

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2013 ජනවාරි මස 09 වන බදාදා***
*2013 சனவரி 09, புதன்கிழமை*
*Wednesday, 09th January, 2013*

***අ.භා.1.00 ට පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා [ගරු චමල් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சமல் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.00 p.m.*, MR. SPEAKER [THE HON. CHAMAL RAJAPAKSA] *in the Chair.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2011 වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව මුදල් හා ක්‍රමසම්පාදන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යඵල වාර්තාව හා ගිණුම් වාර්තාව.-[රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් 2008 සහ 2009 වර්ෂ සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා ඛනිජ තෙල් කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍ය ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා වෙනුවෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

2011 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ කාර්යසාධන වාර්තාව සහ වාර්ෂික ගිණුම්.- [කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ගරු රිසාඩ් බදියුදීන් මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2008 වර්ෂය සඳහා පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පිළිගන්වන ලද වාර්තා
## சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED

### ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත් කෙටුම්පත
### இலங்கை புனித சூசையப்பர் சகோதரர் சபை (திருத்தம்) சட்டமூலம்
### SOCIETY OF THE CEYLONESE BROTHERS OF ST. JOSEPH (AMENDMENT) BILL

**ගරු චන්දිම වීරක්කොඩි මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு சந்திம வீரக்கொடி - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Chandima Weerakkody - Deputy Speaker and Chairman of Committees)

ගරු කථානායකතුමනි, "ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ "බී" ස්ථාවර කාරක සභාවේ වාර්තාව සහ එහි කාර්ය සටහන් මම ඉදිරිපත් කරමි.

"වාර්තාව

'ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් කරන ලද සංශෝධන සහිතව කාරක සභාව සලකා බැලූ අතර, මෙයට අමුණා ඇති පුනර් මුද්‍රණයේ දැක්වෙන යථෝක්ත සංශෝධන සහිතව පනත් කෙටුම්පතට එකඟ වී ඇත.

මෙම පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ."

***පනත් කෙටුම්පත "බී" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2013 ජනවාරි 10 වන බ්‍රහස්පතින්දා සලකා බලනු ලැබේ.***

*சட்டமூலம் நிலைக்குழு "பி" இனால் அறிக்கை செய்யப்பட்டவாறு 2013 சனவரி 10, வியாழக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.*

*Bill, as reported by Standing Committee B," to be considered upon Thursday, 10th January, 2013.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத்துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)

ගරු කථානායකතුමනි, මම උඩුමීය, ඇසළ උයන, 3 වෙනි පටුමග පදිංචි එච්.එම්.පී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - පැමිණ නැත.
ගරු සරණ ගුණවර්ධන මහතා - පැමිණ නැත.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, මම කුරුණෑගල, පනාදරගම, කොස්සව වත්ත පදිංචි කේ.ජී. මද්දුම බණ්ඩාර මහතා ඇතුළු පිරිසගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සජිත් රෝහන කොඩිතුවක්කු මහතා - පැමිණ නැත.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මම බලන්ගොඩ, මීගොඩ, කිරිදිගල පදිංචි යූ.ඩබ්ලිව්. ෂෙල්ටන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු වයි.ජී. පද්මසිරි මහතා - පැමිණ නැත.
ගරු පී. පියසේන මහතා - පැමිණ නැත.
ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.
ගරු රුවන් රණතුංග මහතා - පැමිණ නැත.
ගරු නාමල් රාජපක්ෂ මහතා - පැමිණ නැත.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු කථානායකතුමනි, මම හොරණ, ඇල්බට් පීරිස් මාවත, අංක 40 දරන ස්ථානයෙහි පදිංචි ඒ.අයි. ගමගේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### විගණකාධිපති දෙපාර්තමේන්තුව : කාර්ය මණ්ඩලය
### கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்: பணியாட்டொகுதி
### AUDITOR-GENERAL'S DEPARTMENT : STAFF

1407/'11

**1. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3) :

(අ) (i) විගණකාධිපති දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට අයත් සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම දෙපාර්තමේන්තුවේ වත්මන් සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) කාර්ය මණ්ඩලයේ පිරවීමට ඇති පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) කාර්ය මණ්ඩලයට හිමි වැටුප් සහ අනෙකුත් දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ වාර්තාවේ සඳහන්ව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் எப்போது நடைமுறைக்குக் கொண்டுவரப்பட்டது என்பதையும்;

(ii) கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தின் அங்கீகரிக்கப்பட்ட பதவியணியில் உள்ள உறுப்பினர்களின் எண்ணிக்கையையும்;

(iii) திணைக்களத்தின் தற்போதைய பணியாட்டொகுதியினரின் எண்ணிக்கையையும்;

(iv) பதவியணியில் நிரப்பப்பட வேண்டிய வெற்றிடங்களின் எண்ணிக்கையையும்;

(v) பணியாட்டொகுதியினருக்கு உரித்தாக உள்ள சம்பளங்கள் மற்றும் ஏனைய ஊதியங்களையும்

அவர் சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தின் அரசியல் மயப்படுத்துகை குறித்து ஐ.நா அறிக்கை குறிப்பிட்டுள்ளதா என்பதையும் அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?.

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he inform this House -

(i) as to when the Auditor General's Department was brought into existence;

(ii) the number of staff members in the approved cadre of the Auditor General's Department;

(iii) the current strength of the Department;

(iv) the number of vacancies in the cadre to be filled; and

(v) the salaries and other emoluments that the staff is entitled to?

(b) Will he state whether the UN Report has referred to the politicization of the Auditor General's Department?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) 1799.01.24

(ii) 1,838

(iii) 1,358යි.

(iv) 480යි.

(v)

| | වැටුප් | 2011 (රුපියල්) | 2012.10.31 දක්වා (රුපියල්) |
|---|---|---|---|
| 01. | ඒකාබද්ධ වැටුප | 346,840,863 | 289,877,536 |
| 02. | අනෙකුත් දීමනා ජීවන වියදම් දීමනාව, භාෂා දීමනාව, කාර්යස්ථාන දීමනාව | 114,950,186 | 123,599,611 |
| 03. | දිරිදීමනා | 107,000,000 | 107,000,000 |
| | එකතුව | 568,791,049 | 520,477,147 |

(ආ) විගණකාධිපති දෙපාර්තමේන්තුව දේශපාලනීකරණය වීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ වාර්තාවේ සඳහන් වී තිබීම පිළිබඳ කිසියම් තොරතුරක් මේ දක්වා අනාවරණ වී නැත. එසේ වුවද, එක්සත් ජාතීන්ගේ සංවිධානය 2011 දෙසැම්බර් 22වන දින සම්මත කරගෙන තිබූ අංක A/66/209 දරන යෝජනාව මඟින් ජාත්‍යන්තර උත්තරීතර විගණන ආයතන ශක්තිමත් කරමින් රාජ්‍ය පරිපාලනයේ කාර්යක්ෂමතාව, ගණන් දීමේ වගකීම, ඵලදායකත්වය, විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාත්‍යන්තරව එකඟ වූ සංවර්ධන ඉලක්ක හා සහස්‍ර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේදී උත්තරීතර විගණන ආයතනවල සහයෝගය මෙවලමක් ලෙස භාවිත කිරීම සඳහා උත්තරීතර විගණන ආයතනවල ධාරිතා වර්ධන අවශ්‍යතාව අවධාරණය කර ඇත. මේ පිළිබඳව උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර සංවිධානයේ මහ ලේකම්වරයා විසින් මා වෙත එවා තිබූ අංක 200/371-INTOSAI/2011 හා 2012 ජනවාරි මස වාර්තාවේ පිටපතක් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

බොහොම ස්තුතියි, ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් මට කියන්න අවශ්‍ය වන්නේ මේ පාර්ලිමේන්තුවෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව පුළුවන් තරම් ශක්තිමත් කරන්න අවශ්‍ය බවයි. ඊයේ පාර්ලිමේන්තුවේදී කියනවා අපට ඇහුණා, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ විදේශීය ජාතිකයකු වන CEOට රුපියල් ලක්ෂ 50ක් මාසයකට ගෙවන බව. එවැනි අවස්ථාවකදී අපේ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ බොහොම දක්ෂ විගණකාධිපතිවරු සහ ඊට අනුබද්ධ සියලුම සේවක පිරිසක් ඉන්නවා. ඔවුනට මීට වැඩිය හොඳ වැටුප් ප්‍රමාණයක් ගෙව්වොත් එතැන රඳවා ගන්න පුළුවන්. අපි ඒ අයත් එක්ක කථා කරන නිසායි කියන්නේ. පෞද්ගලික අංශයේ සහ වෙනින් තැන්වල ඊට වැඩිය වැටුප් ගෙවන අවස්ථාවක මේ රජයේ දෙපාර්තමේන්තුවේ ඔවුන් රැඳී සිටීමේ තිබෙන වටිනාකම මොකක්ද? ඒ ආයතනය ශක්තිමත් කරන්න ඕනෑයි කියන පදනමින් මම කියනවා, කරුණාකරලා මේ අයට නිසියාකාර වැටුපක් ගෙවලා අපේ විගණකාධිපති දෙපාර්තමේන්තුව මීට වැඩිය ශක්තිමත් කරන්න කටයුතු කරන්න කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔව්, මම හිතන හැටියට ගරු මන්ත්‍රීතුමා කියන කාරණය කෙරෙහි අවධානය යොමු වෙලා තිබෙනවා. නමුත් ඔබතුමා දන්නවා, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුගමනය කරන වැටුප් ශ්‍රේණි අනුව ගමන් කරමින් තමයි විගණන දෙපාර්තමේන්තුව රජයේ සේවයේ සුවිශේෂී දෙපාර්තමේන්තුවක් හැටියට කටයුතු කරන්නේ. ඔබතුමා ඉදිරිපත් කරන මේ කාරණය ගරු කථානායකතුමාත්, පාර්ලිමේන්තුවේ සියලු පක්ෂ නායකයිනුත් රැස් වෙලා අපට බලපාන විගණන කටයුතු පිළිබඳව කථා කරලා රජයත් සමඟ කථා කිරීමයි මම හිතන්නේ උචිත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ආයතන 267ක් කැඳවා තිබෙනවා. ඒ ආයතන 267න් 238ක් අලාභයට ලක් වෙලා තිබෙනවා. විගණකාධිපතිගේ වාර්තා අනුව

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රවි කරුණානායක මහතා]

එයින් සියයට 75ක විතර තත්ත්වය බොහොම අවදානම් කියලා තොරතුරු ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක, ඒ කියන්නේ Disclaimer Report එකක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක ඒ ආයතන භාර ඇමතිවරු සහ ආණ්ඩුව හරියට එම ආයතනවල කටයුතු ක්‍රියාත්මක කරන්නේ නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

අද ලංකා විදුලිබල මණ්ඩලයේ අලාභය කෝටි 11,800යි. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය කෝටි 9,500යි. මේවා කිය කියා තිබෙන දේවල්. විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ සම්බන්ධව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට දන්වා තිබෙනවා. දැන් අපි උත්තරීතර යැයි කියන පාර්ලිමේන්තුව මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ නැත්තේ ඇයි? ගරු කථානායකතුමා තුළින් තමයි මම ගරු ඇමතිතුමාගෙන් ඒ සම්බන්ධව අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ ප්‍රශ්නය ගරු කථානායකතුමාගෙන් අහන විධියයි පෙනෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට ගරු කථානායකතුමා තුළින් තමයි ප්‍රශ්න අහන්න තිබෙන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ගැනයි අහන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා තමයි අපේ captain. අපව ආරක්ෂා කරන එතුමා තුළින් වක්‍රාකාරව තමයි අපි ඔබතුමන්ලාගෙන් අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ආදී ආයතන අයත් වන අමාත්‍යාංශ යටතේ අමාත්‍යවරුන්ට මේ ප්‍රශ්න එකින් එක යොමු කිරීමයි වඩා හොඳ. ඔබතුමා කියන කාරණය COPE වාර්තාවේ අන්තර්ගත කර තිබෙනවා. එය ඉතාම වැදගත්. ඒ ගැන රජයේ අවධානය යොමු කර කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ගරු කථානායකතුමාට ඉතා ඕනෑ කමින් කියන්නේ, අවුරුදු 19ක් පාර්ලිමේන්තුවේ ඉඳලා, වාර්තා 10ක් දැකලා තිබෙනවා කියලායි. නමුත් විගණකාධිපති දෙපාර්තමේන්තුවට තඹ ශතයක වටිනාකමක් ඇති වන විධියකට කටයුත්තක් කර නැහැ. විපක්ෂය පැත්තේ ඉන්නවාය කියලා ඒගොල්ලන්ට හිරිහැර කරලා, ආණ්ඩු පක්ෂයට ගියාම හුරතල් කර කර ඉන්න ස්වරූපයක් තමයි පෙනෙන්න තිබෙන්නේ. විගණකාධිපති දෙපාර්තමේන්තුව තුළින් තමයි රටේ ආර්ථිකය ආරක්ෂා කර ගන්න පුළුවන් වන්නේ.

අධිකරණයට අභියෝග කරන මේ අවස්ථාවේ තිබෙන තත්ත්වය පෙනෙනවා නේ. ඒ නිසා විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලැබෙන තොරතුරු පාවිච්චි කර පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්නය කියා අපි කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඉතා වැදගත් අදහසක්. යම් නීතිරීති සංශෝධනයන් අවශ්‍යයි. ඒවා පිළිගනිමින් කටයුතු කිරීමට අපට සිදු වෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්න අහන පිළිවෙළේත් මොකක් හෝ සංශෝධනයක් කරන්න වෙනවා.

ප්‍රශ්න අංක 2 - 1886/'11 - (2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## කාල්ටන් ක්‍රීඩා නාලිකාව : විකාශන අයිතිය
### கால்டன் விளையாட்டு அலைவரிசை : ஒலிபரப்பு உரிமை
### CARLTON SPORTS NETWORK : TELECASTING RIGHTS

1903/'11

**3. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට - (4) :

(අ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ (CSN) අයිතිය රජය හෝ රජය අනුබද්ධ ආයතනයක් සතුවන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයක් සතු නම්, එම ආයතනයේ හිමිකරු හෝ හිමිකරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ විකාශන කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(ii) එම නාලිකාව ආරම්භ කිරීමට වෙන් කළ තරංග පරාසයන් (frequency range) කවරේද;

(iii) කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විකාශන අයිතිය ලබා දෙන ලද්දේ කවර කාලසීමාවක් සඳහාද;

(iv) එම නාලිකාව ආරම්භ කිරීමට අනුමැතිය ලබා දුන් ලේඛන සහ විකාශන අයිතිය ලබා දීමට අදාළ ගිවිසුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම නාලිකාව ආරම්භ කිරීම සඳහා ගෙවන ලද මුදල කොපමණද;

(ii) එම ගෙවීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கால்டன் விளையாட்டு அலைவரிசையின் (CSN) உரிமை அரசுக்கு அல்லது அரசு சார்பான நிறுவனமொன்றுக்கு உரித்தானதா என்பதையும்;

(ii) இந்நிறுவனம் தனியார் நிறுவனமொன்றுக்குச் சொந்தமானதாக இருப்பின் இந்நிறுவனத்தின் உரிமையாளரது அல்லது உரிமையாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iii) இந் நிறுவனத்தின் பணிப்பாளர் சபையினரின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கால்டன் விளையாட்டு அலைவரிசையின் ஒலிபரப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்ட திகதி அல்லது ஆரம்பிக்க உத்தேசிக்கப்பட்டுள்ள திகதி யாதெனப்பதையும்;

(ii) மேற்படி அலைவரிசையை ஆரம்பிப்பதற்காக ஒதுக்கப்பட்டுள்ள அலை அதிர்வெண் வீச்சிடை (frequency range) யாதென்பதையும்;

(iii) கால்டன் விளையாட்டு அலைவரிசைக்கான ஒலி பரப்பு உரிமை வழங்கப்பட்டுள்ள காலகட்டம் யாதென்பதையும்;

(iv) மேற்படி அலைவரிசையை ஆரம்பிப்பதற்காக அங்கீகாரம் வழங்கப்பட்ட பிரசுர மற்றும் ஒலிபரப்பு உரிமையை வழங்குவதுடன் தொடர்புடைய உடன்படிக்கை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ (i) மேற்படி அலைவரிசையை ஆரம்பிப்பதற்காக செலுத்தப்பட்ட பணத்தொகை யாதென்பதை யும்;

(ii) மேற்படி கொடுப்பனவுடன் தொடர்புடைய ஆவணங்களை சமர்ப்பிப்பாரா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he state -

(i) whether the ownership of Carlton Sports Network is with the Government or an institution affiliated to the Government;

(ii) if its ownership is with a private institution, the name/names and address/addresses of the owner/owners of that institution; and

(iii) the names and addresses of the Board of Directors of that institution?

(b) Will he inform this House of -

(i) the date on which telecasting of Carlton Sports Network was started or is due to be started;

(ii) the frequency range allocated for the purpose of starting that channel;

(iii) the period of time for which telecasting rights were granted to Carlton Sports Network; and

(iv) the documents that granted approval for starting that channel and the agreements relevant to the granting of broadcasting rights?

(c) Will he state -

(i) the amount paid for starting that channel; and

(ii) whether the documents relevant to the aforesaid payment will be submitted?

(d) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි:

(අ) (i) නැත.

(ii) කොටස් හිමියන්

| නම | ලිපිනය |
|---|---|
| සචිත්‍ර කවිෂාන් දිසානායක මහතා | 7/2, Vidyala Road, Mount Laviniya. Off Temple Road, |
| අශාන් රබිනාත් ප්‍රනාන්දු මහතා | 29/3, Samudra Mawatha Panadura. |
| ශාදියා කරුණාජීව මෙනවිය | 31/3, Horton Place, Colombo 7. |
| රොහාන් වැලිවිට මහතා | 33, Hospital Road, Galavilawatte, Homagama |

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

(iii) අධ්‍යක්ෂ මණ්ඩලය

| නම | ලිපිනය |
|---|---|
| කවිෂාන් දිසානායක මහතා | 7/2, Vidyala Road, Off Temple Road, Mount Laviniya. |
| අශාන් ප්‍රනාන්දු මහතා | 29/3, Samudra Mawatha, Panadura. |
| ශාදියා කරුණාජීව මෙනවිය | 31/3, Horton Place, Colombo 7. |
| දිනේෂ් ජයවර්ධන මහතා | 248, Vauxhall Street, Colombo 2. |

ලිපින මාරු වෙලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාරු වෙලා තිබෙන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඇත්තද? දැන් වෙන්න ඇති. මට දෙන කොට එහෙම මාරු වෙලා නැහැ.

(ආ) (i) රූපවාහිනී විකාශන බලපත්‍රය ලබා දෙන ලද්දේ 2011 මාර්තු 03වනදා සිටය.

(ii) කොළඹ UHF 22, දෙනියාය UHF 28, නායබැද්ද UHF 30, නුවරඑළිය UHF 47, මහනුවර UHF 41, මාතලේ UHF 32, කොකාවිල් UHF 29, යාපනය UHF 30.

(iii) කාලසීමාවක් පනවා නොමැත.

(iv) භෞමික රූපවාහිනී විකාශන (Free to Air Terrestrial Television Broadcasting Network) ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා 2011.03.03 දිනැති විකාශන බලපත්‍රයක් ලබා දී ඇත.

(ඇ) (i) විකාශන බලපත්‍රය නිකුත් කිරීමේ ගාස්තුව රුපියල් 100,000කි. (රුපියල් එක්ලක්ෂයකි)

(iii) ඔව්.

අංක H/21 695283 සහ 2011.03.03 දිනැති මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. මම මේ ප්‍රශ්නය ඇහුවාට පස්සේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් සහ ලිපිනයන් මාස කිහිපයක් ඇතුළත මාරු වෙලා තිබෙනවා. ඇත්තටම මම මේ ප්‍රශ්නය මුලින්ම අහපු දවසේ තමයි පිළිතුරක් ලබා ගැනීමට අවශ්‍ය වුණේ. මම මේ ප්‍රශ්නය 4වැනි වතාවටයි අහන්නේ. ඔබතුමාත් අසනීප වෙලා සිටියා. මම ඒක දන්නවා. ඒ නිසා ඔබතුමාට එන්න බැරි වුණා. ඇවිල්ලාත් උත්තර දුන්නේ නැති අවස්ථා තිබුණා. ඒ නිසා මෙම ආයතනයේ මුල ඉඳලා හිටපු අධ්‍යක්ෂවරුන්ගේ නම් ටික සහ ඒ දිනයන් මට ලබා දෙන්න පුළුවන්ද? එහෙම දෙන්න පුළුවන් නම් ලොකු දෙයක්.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒ පිළිබඳව ප්‍රශ්නයක් අහන්න. මම විස්තර ලබා දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. එතකොට අනෙක් කාරණය තමයි කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විකාශන අයිතිය සඳහා කාල සීමාවක් ලබා දී නැහැ. අනෙක් නාලිකාවලට විකාශන අයිතිය සඳහා යම් කාල සීමාවක් තිබෙනවා. නමුත් මේ ආයතනයට පමණක් කාල සීමාවක් නැතිව මේ විකාශන අයිතිය ලබා දීලා තිබෙන්නේ ඇයි?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මේ ඔක්කොටම එක විධියට විකාශන අයිතිය ලබා දීලා තිබෙනවා. [බාධා කිරීමක්] මුදල් අරගෙනත් නැහැ. මේක නිකම් දීලා තිබුණේ. පසු කාලයක තමයි මුදල් ගන්න තීරණය කරලා තිබෙන්නේ. මුදල් එක්කම ඒ කටයුතුත් ලබා දීලා තිබෙනවා. හැබැයි අවශ්‍ය වෙලාවක යම් කිසි ප්‍රශ්නයක් මතු වුණොත් ඒ ප්‍රශ්නය පරීක්ෂාවට ලක් කරලා, එය යම් කිසි විධියක නිරීක්ෂණයකට ලක් කිරීමේ අයිතිය තිබෙනවා.[බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාට විශේෂ කාරක සභාවේ සභාපතිතුමා හරියට උදවු කරනවා නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඔව්. අපේ එහෙම ප්‍රශ්නයක් නැහැ, ඔබතුමන්ලා එක එකා මරා ගත්තාට.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, ඒ වාගේම මම කියන්න කැමැතියි, ඇත්ත වශයෙන් රූපවාහිනියට තිබුණු "අයි" නාලිකාවේ වෙන් කළ තරංග පරාස තමයි මේ කාල්ටන් ක්‍රීඩා නාලිකාවට ලබා දීලා තිබෙන්නේ කියලා. සාමාන්‍යයෙන් අවුරුදු 10, 15 මේ රටේ තිබුණු රූපවාහිනී ආයතන තිබෙනවා. "ටීඑන්එල්" ආයතනය, "සිරස" ආයතනය වාගේ ආයතන තිබෙනවා. හැබැයි ඒ ආයතනවලට මේ frequencies - තරංග පරාසයන්- දෙන්නේ නැහැ. නමුත් 2011 මාර්තු මාසයේ පටන් ගත්ත මේ ආයතනයට ලංකාව වටේ ඕනෑ තැනක පෙන්වන්න තරංග පරාස දීලා තිබෙනවා. මේ නාලිකාවට මෙහෙම වැඩියෙන් සලකන්න තරම් ඔබතුමන්ලාට යම් කිසි ආදරයක්, ගෞරවයක් ඇතිවෙලා තිබෙන්නේ ඇයි? මම අහන්නේ ඒකයි. ඒ තරම් ආදරයක් තිබෙන්නේ ඇයි, තරංග පරාස ගණනාවක් දෙන්න.

මෙය විශාල තරංග පරාස ගණනාවක්. අවුරුදු 15ක්, 20ක් තිබුණු රූපවාහිනී ආයතනවලට කිසිම දෙයක් ලබා දීලා නැහැ. ඒක ක්‍රමානුකූලව බලලා දෙන්න තිබුණා නේ. ඇයි මේ කාල්ටන් ක්‍රීඩා නාලිකාවට විතරක් ඔබතුමන්ලා වැඩියෙන් සලකන්නේ?

මොකක් හරි සම්බන්ධයක් තිබෙනවාද? එහෙම නැත්නම් රාජ නියෝගයක් තිබෙනවාද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
නැහැ, නැහැ. ඔබතුමා වාගේම තමයි ඉල්ලපුවාම දෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
වෙන කට්ටියට දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ වෙන වෙන ඒවා නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මම දන්නේ නැහැ, මම කිව්වාය වෙන වෙන ඒවා කියලා? ඔබතුමා වෙන වෙන ඒවා ඉල්ලුවාම මම මොනවා කරන්නද? මම කිව්වේ ඉල්ලපුවාම දෙනවා කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාත් ඉල්ලපුවාම දෙනවා. ඔබතුමාත් එහෙමයි, ඉල්ලලා කාලා, ඇදගෙන වැටිලාත් තිබෙනවා නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒකට මට කරන්න දෙයක් නැහැ. මම ඉල්ලුවොත් විතරයි දෙන්නේ. එහෙම නැතිව ඔබතුමා වාගේ දෙන්නේ නැහැ. බලහත්කාරයෙන් දෙන්නේ නැහැ. ඉල්ලලා නැහැ. ඔබතුමා සඳහන් කළ අනෙක් රූපවාහිනී නාලිකා ඉල්ලලා නැහැ. [බාධා කිරීමක්] එහෙම ඉල්ලලා නැහැ. ඉල්ලපු ඒවාට දීලා තිබෙනවා. පුළුවන් ඒවා දීලා තිබෙනවා. ඉල්ලුවොත් දෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉල්ලලා කන්න ගියා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒක හරි. ඒක වෙනම ප්‍රශ්නයක්. ඉල්ලුවොත් දෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තරංග සැරයි, ඒකයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඉල්ලුවොත් දෙනවා ඕනෑ වෙලාවක. ඔබතුමාට පිටුපස්සේ ඉන්න කෙනාට නොවෙයි කියන්නේ, ඔබතුමාට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 4-2220/'12-(3), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொதுவசதிகள் பிரதி அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Construction, Engineering Services, Housing and Common Amenities)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ සභාවේදී එක එක නම් කියලා කථා කරන්න එපා. කථා කරන මන්ත්‍රීවරයා පමණයි කථා කරන්න ඕනෑ.

## ලියාපදිංචි ජනමාධ්‍යවේදීන් සහ ජනමාධ්‍ය ආයතන : විස්තර
## பதிவுசெய்த ஊடகவியலாளர்கள் மற்றும் ஊடக நிறுவனங்கள் : விபரம்
## REGISTERED MEDIA PERSONNEL AND MEDIA INSTITUTIONS : DETAILS

2503/'12

5. **ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී රජයේ ලියාපදිංචි වී සිටි ජනමාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

(ii) එම කාලය තුළදී අතුරුදන් වූ සහ ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂය වන විට ලියාපදිංචි කර ඇති පුවත් පත්, ගුවන් විදුලි සේවාවන්, රූපවාහිනී නාලිකා සහ වෙබ් අඩවි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

[ගරු තලතා අතුකෝරල මහත්මිය]

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා තහනම් කරන ලද මාධ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් මාධ්‍ය ආයතනය තහනම් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2005ஆம் ஆண்டு முதல் இற்றைவரை ஒவ்வொரு ஆண்டிலும் அரசாங்கத்தில் பதிவுசெய்து கொண்டுள்ள ஊடகவியலாளர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி காலகட்டத்தில் காணாமற்போன அல்லது கொலைசெய்யப்பட்ட ஊடகவியலாளர் களின் எண்ணிக்கை யாதென்பதையும்

வெவ்வேறாக அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) (2001) ஆம் ஆண்டாகின்றபோது பதிவுசெய்யப் பட்டிருந்த பத்திரிகைகள், வானொலிச் சேவைகள், தொலைக்காட்சிச் சேவைகள் மற்றும் இணையத்தளங்களின் எண்ணிக்கை வெவ் வேறாக எவ்வளவென்பதையும்;

(ii) 2005ஆம் ஆண்டு முதல் இற்றைவரை தடைசெய்யப்பட்ட ஊடக நிறுவனங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு ஊடக நிறுவனமும் தடை செய்யப்படுவதற்கான காரணம் யாதென்பதை யும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he state separately -

(i) the number of media personnel who had registered with the Government in each of the years during the period from the year 2005; and

(ii) the number of media personnel who disappeared and the number of media personnel who were killed during the aforesaid period?

(b) Will he inform this House -

(i) separately, the number of registered newspapers, radio channels, television channels and websites as at 2011;

(ii) the number of media institutions which were banned during the period 2005 up to now; and

(iii) the reasons for banning each of the aforesaid media institutions?

(c) If not, why ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි. මෙම ප්‍රශ්නයේ (අ) (i) සහ (ii) සඳහා දීර්ඝ විස්තරයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමිය පිළිතුර කියවන්න ඕනෑද, සභාගත කරන්නද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

සභාගත කරන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

එහෙමනම්, පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) **2005 වර්ෂය**

| | | |
|---|---|---|
| දේශීය මාධ්‍යවේදීන් | - | 2,723 |
| විදේශීය මාධ්‍යවේදීන් | - | 205 |
| 2004 සහ 2005 වර්ෂ සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් | - | 1,624 |

| **2006 වර්ෂය** | | **2007 වර්ෂය** | |
|---|---|---|---|
| දේශීය මාධ්‍යවේදීන් - | 2,904 | දේශීය මාධ්‍යවේදීන් - | 3,200 |
| විදේශීය මාධ්‍යවේදීන්- | 214 | විදේශීය මාධ්‍යවේදීන් - | 280 |

2006 සහ 2007 වර්ෂ සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්- 1,702

| **2008 වර්ෂය** | | **2009 වර්ෂය** | |
|---|---|---|---|
| දේශීය මාධ්‍යවේදීන් - | 4,055 | දේශීය මාධ්‍යවේදීන් - | 3,225 |
| විදේශීය මාධ්‍යවේදීන්- | 266 | විදේශීය මාධ්‍යවේදීන් - | 301 |

2008 සහ 2009 වර්ෂ සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්- 1,702

| **2010 වර්ෂය** | | **2011 වර්ෂය** | |
|---|---|---|---|
| දේශීය මාධ්‍යවේදීන් - | 4,088 | දේශීය මාධ්‍යවේදීන් - | 3,367 |
| විදේශීය මාධ්‍යවේදීන්- | 245 | විදේශීය මාධ්‍යවේදීන් - | 280 |

2010 සහ 2011 වර්ෂ සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන්- 1,702

**2012 වර්ෂය**

| | | |
|---|---|---|
| දේශීය මාධ්‍යවේදීන් | - | 2,884 |
| විදේශීය මාධ්‍යවේදීන් | - | 197 |
| 2012 සහ 2013 වර්ෂ සඳහා ප්‍රාදේශීය ජනමාධ්‍යවේදීන් | - | 1,278 |

(ii) **අතුරුදහන් වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| 2007 | - | 01 |
| 2010 | - | 01 |
| 2012.11.23 දක්වා | - | 01 |

**ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව**

| | | |
|---|---|---|
| 2005 | - | 02 |
| 2006 | - | 01 |
| 2007 | - | 02 |
| 2008 | - | 02 |
| 2009 | - | 01 |

(ආ) (i)

| | | |
|---|---|---|
| පුවත් පත් | - | 167 |
| ගුවන්විදුලි සේවාවන් | - | 62 |
| රූපවාහිනී නාලිකා | - | 24 |
| වෙබ් අඩවි | - | 51 |

(ii) ආයතන - 01
නාලිකා - 01

(iii) හිරු FM නාලිකාව මඟින් වැරැදි තොරතුරු ප්‍රවෘත්ති විකාශය හරහා ප්‍රචාරය කිරීම හේතුවෙන් ඒෂියා බ්‍රෝඩ්කාස්ටින් කෝපරේෂන් මාධ්‍ය ජාලය තහනම් කරන ලදී.

මාධ්‍ය ආචාර ධර්මවලට පටහැනි ආකාරයෙන් වැඩ සටහන් මෙහෙයවීම හේතුවෙන් රජ FM නාලිකාව තහනම් කරන ලදී.

(ඇ) අදාළ නොවේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. අතුරුදහන් වූ හෝ ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන්ගේ පවුල්වලට හෝ යැපෙන්නන්ට, ඒ වාගේම පහර දීමට ලක්වූ මාධ්‍යවේදීන්ට, ඔවුන්ගේ පවුල්වලට හෝ යැපෙන්නන්ට මේ කාලය තුළ යම්කිසි සහනයක් හෝ වන්දියක් සලසා තිබෙනවාද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

(අ) (ii)ට උත්තරය දුන්නේ නැහැ නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

(අ) (ii) ද?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඔව්.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

Table කළා නේ.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

(අ) (ii)ට උත්තරය.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

ඒ කොටසට අදාළ උත්තරය table කරනවාට ඒ ගරු මන්ත්‍රීතුමිය කැමැතියි කිව්වා නේ. ඔබතුමාට මොකද එක පාරට චූන් එකක් ගියේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමියනි, මා එය table කළා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු ඇමතිතුමනි, සමා වන්න ඕනෑ. කරුණාකර (අ) (ii)ට උත්තරය කියවන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

Table කළාම ඇති කියපු නිසා ඒක table කළා.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ඒ (අ) (i)ට අදාළ එකයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

(ii) අතුරුදහන් වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 2007 | - | 01 |
| 2010 | - | 01 |
| 2012.11.23 දක්වා | - | 01 |

ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන් සංඛ්‍යාව

| | | |
|---|---|---|
| 2005 | - | 02 |
| 2006 | - | 01 |
| 2007 | - | 02 |
| 2008 | - | 02 |
| 2009 | - | 01 |

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මා කලින් අතුරු ප්‍රශ්නයක් ඇහුවා. හරියට උත්තරය ලැබුණේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හරියට අහන්න. හරියට දෙයි.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මා ඒක තමයි ගරු කථානායකතුමනි, සැදී පැහැදී සිටින්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

අතුරුදහන් වුණු හෝ ඝාතනයට ලක් වුණු හෝ පහර දීමට ලක් වුණු මාධ්‍යවේදීන් වෙනුවෙන් හෝ ඔවුන්ගෙන් යැපෙන්නන් වෙනුවෙන් 2005 වර්ෂයෙන් පස්සේ ඔබතුමන්ලා යම් කිසි සහනයක් හෝ වන්දියක් සලසා දී තිබෙනවාද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මාධ්‍යවේදීන් සම්බන්ධව අපට වාර්තා ලබා දී තිබෙන්නේ පොලිස් දෙපාර්තමේන්තුවෙන් සහ වෙනත් අදාළ දෙපාර්තමේන්තු මඟිනුයි. ඒ අයට සාමාන්‍යයෙන් නීතියට අනුව කරන වන්දි ගෙවීම්වලට අමතරව විශේෂිත වූ වැඩ පිළිවෙළක් නැහැ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. ප්‍රගීත් එක්නැළිගොඩ මාධ්‍යවේදියා අතුරුදහන් වූ මාධ්‍යවේදියකු හැටියටද, එහෙම නැත්නම් ඝාතනය වුණු මාධ්‍යවේදියකු හැටියටද සලකන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
අපි හිතන්නේ අතුරුදහන් වෙලා කියලායි.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
හිතන එක නොවෙයි. මා ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
උත්තරය එයයි. දැනට තිබෙන්නේ ඒ විධියටයි. මොකද, වාර්තාවක් නැහැ. දැනට ලබා දී තිබෙන පොලිස් වාර්තාවන් අනුව අතුරුදහන් වුණු හැටියටයි තිබෙන්නේ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
අතුරුදහන් වුණු හෝ ඝාතනයට ලක් වුණු හෝ පහර දීමට ලක් වුණු මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් කිසිම සැලකිල්ලක් නැතුව පොලීසියේ තිබෙන තොරතුරු මත පමණක් කටයුතු කරමින්, laptop සහ පොලී රහිත ණය ලබා දෙන්නේ ඔවුන් අතුරුදහන් වුණු නිසා වෙන්න ඇති කියා මා හිතනවා.

ඒ ගොල්ලන්ට තවත් existence නැති නිසා වන්නට ඇති කියලා මා හිතනවා. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මාධ්‍ය ආයතනයක් තහනම් කිරීමේදී අනුගමනය කරනු ලබන නිර්ණායක මොනවා ද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒක තමයි මම කිව්වේ. ඒ නිර්ණායක තමයි, නාලිකාව මගින් ප්‍රවෘත්ති විකාශනය හරහා වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම, ආචාර ධර්මවලට පටහැනි ආකාරයෙන් වැඩසටහන් මෙහෙයවීම වැනි කරුණු. [බාධා කිරීමක්] සියලුම මාධ්‍ය ආයතනවලට ආචාර ධර්ම පිළිබඳ වාර්තාවක් අවුරුද්දකට සැරයක් ලබා දෙනවා. [බාධා කිරීමක්] හොඳයි. ඉල්ලීමක් කරන්නකෝ.

## ජාතික පාසල් : විස්තර
### தேசிய பாடசாலைகள் : விபரம்
### NATIONAL SCHOOLS : DETAILS

2526/'12

**6. ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) 2011 දෙසැම්බර් 31වන විට,

(i) මෙරට පැවති ජාතික පාසල් සංඛ්‍යාව;

(ii) එම පාසල්වල සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරුවරුන් සංඛ්‍යාව;

(iii) ජාතික පාසල් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් වෙන්කළ මුළු මුදල;

(iv) මේ වනවිට විදුහල්පති පුරප්පාඩු පවතින ජාතික පාසල් සංඛ්‍යාව;

(v) ජාතික පාසල්වල පළමුවැනි ශ්‍රේණියට ඇතුළුවීම සඳහා 2011 සහ 2012 වර්ෂ තුළදී ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව;

(vi) ඉල්ලුම් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාවෙන් එම පාසල්වලට ඇතුළත් කරගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இந்நாட்டில், 2011ஆம் ஆண்டு டிசம்பர் மாதம் 31ஆம் திகதியளவில் காணப்பட்ட தேசிய பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளில் கல்வி கற்கும் மாணவர்கள் மற்றும் ஆசிரியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) தேசிய பாடசாலைகளுக்கென 2012 ஆண்டின் பொருட்டு ஒதுக்கப்பட்ட மொத்தப் பணத்தொகை யாதென்பதையும்;

(iv) தற்போது அதிபர்களுக்கான வெற்றிடங்கள் காணப்படுகின்ற தேசிய பாடசாலைகளின் எண்ணிக்கை யாதென்பதையும்;

(v) தேசிய பாடசாலைகளில் முதலாம் தரத்தில் சேர்வதற்காக 2011 மற்றும் 2012ஆம் ஆண்டுகளில் விண்ணப்பித்திருந்த மாணவர்களின் எண்ணிக்கை;

(vi) விண்ணப்பித்திருந்தவர்களின் எண்ணிக்கையில் மேற்படி பாடசாலைகளுக்குச் சேர்த்துக்கொள்ளப்பட்ட மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House -

(i) the number of National Schools that were there in this country as at 31st December, 2011;

(ii) the number of students and the number of teachers at those schools;

(iii) the total amount of money allocated for National Schools for the year 2012;

(iv) the number of National Schools where vacancies for principals exist at present;

(v) the number of students who applied for admission to grade one of the National Schools in the years 2011 and 2012; and

(vi) the number of students who had been admitted to those schools out of those who applied for admission?

(b) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ජාතික පාසල් 342.

(ii) ශිෂ්‍ය සංඛ්‍යාව -799817 (හත් ලක්ෂ අනූනවදහස් අටසියදාහතයි)

ගුරුවරු සංඛ්‍යාව - 34396 (තිස් හතර දහස් තුන්සිය අනූහයයි.)

(iii) පුනරාවර්තන ප්‍රතිපාදන -රුපියල් 13,513,729,000.00(රුපියල් දහතුන් බිලියන පන්සිය දහතුන් මිලියන හත්ලක්ෂ විසිනවදාහයි)

ප්‍රාග්ධන වියදම - රුපියල් 983,350,000.00(රුපියල් නවසිය අසූතුන් මිලියන තුන්ලක්ෂ පනස් දාහයි.)

(iv) ජාතික පාසල් 103යි. ඇමුණුම **සභාගත*** කරමි.

(v) 2011 වර්ෂයේ දී අයදුම් පත්‍ර 107318 (එක්ලක්ෂ හත්දහස් තුන්සියදහඅටයි)

2012 වර්ෂයේ දී අයදුම් පත්‍ර 100612 (එක්ලක්ෂ හයසියදොළහයි)

(vi) 2011 වර්ෂයේ දී 33,517 (තිස්තුන්දහස් පන්සිය දාහතයි)

2012 වර්ෂයේ දී 32,819 (තිස්දෙදහස් අටසියදහනවයයි)

ප්‍රාථමික පාසල් ජාලය සඳහා ද්විතීයික පාසල් දහසක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන් යටතේ ජාතික පාසල් බොහොමයක පළමු ශ්‍රේණිය ඉවත් කර ඇති බැවින් 2012 වර්ෂයේ ජාතික පාසල්වලට ඇතුළත් වීමට කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව හා ඇතුළත් කර ගන්නා ලද දරුවන් සංඛ්‍යාව 2011 වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇත.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

| පාසලේ නම | ලිපිනය |
|---|---|
| **බස්නාහිර පළාත** | |
| 01. කො/මහානාම විද්‍යාලය | කොළඹ 03 |
| 02. කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය | කොළඹ 07 |
| 03. කො/හමීඩ් අල් හුසෙයින් විද්‍යාලය | කොළඹ 12 |
| 04. ජනාධිපති විද්‍යාලය | රාජගිරිය |
| 05. ආනන්ද ශාස්ත්‍රාලය | කෝට්ටේ |
| 06. වේල්ස් කුමර විද්‍යාලය | මොරටුව |
| 07. වේල්ස් කුමරි විද්‍යාලය | මොරටුව |
| 08. ගම/බණ්ඩාරනායක මධ්‍ය මහා විද්‍යාලය | ගම්පහ |
| 09. ගම/ක්‍රිස්තුරාජ මධ්‍ය මහා විද්‍යාලය | තුඩැල්ල |
| 10. ගම්/ගුරුකුල විද්‍යාලය | කැලණිය |
| 11. ගම/අල් මුබාරක් විද්‍යාලය | මල්වාන |
| 12. කළු/තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලය | හොරණ |
| 13. කළු/තිස්ස මධ්‍ය මහා විද්‍යාලය | කළුතර |
| 14. කළු/අල් හුමෛයිසරා මධ්‍ය මහා විද්‍යාලය | බේරුවල |
| **මධ්‍යම පළාත** | |
| 15. මහ/බද් උද්දීන් මහමුද් විද්‍යාලය | මහනුවර |
| 16. මහ/ගලගෙදර මධ්‍ය මහා විද්‍යාලය | ගලගෙදර |
| 17. මහ/අනුරුද්ධකුමාර ජාතික පාසල | නාවලපිටිය |
| 18. මහ/රණසිංහ ප්‍රේමදාස ජාතික පාසල | හසලක |
| 19. මහ/සහිරා විද්‍යාලය | අකුරණ |
| 20. මහ/පුස්සැල්ලාව හින්දු ජාතික පාසල | පුස්සැල්ලාව |
| 21. මහ/හතරලියද්ද මධ්‍ය මහා විද්‍යාලය | හතරලියද්ද |
| 22. මා/හින්දු විද්‍යාලය | මාතලේ |
| 23. නු/ශ්‍රී සුමංගල ජාතික පාසල | තිල්දණ්ඩාහීන්න |
| 24. නු/වික්ටෝරියා ජාතික පාසල | අධිකාරිගම |
| **දකුණු පළාත** | |
| 25. ගා/රේවත මධ්‍ය මහා විද්‍යාලය | බලපිටිය |
| 26. ගා/ශ්‍රී දේවානන්ද මධ්‍ය මහා විද්‍යාලය | අම්බලන්ගොඩ |
| 27. ගා/ක්‍රිස්තුදේව පිරිමි විද්‍යාලය | බද්දේගම |
| 28. ගා/තවලම විද්‍යාරාජ විද්‍යාලය | ගාල්ල |
| 29. ගා/දේවපතිරාජ ජාතික පාසල | රත්ගම |
| 30. ගා/ලබුදූව සිරිධම්ම විද්‍යාලය | ලබුදූව |
| 31. ගා/ගිංතොට සහිරා විද්‍යාලය | ගාල්ල |
| 32. ගා/බටේමුල්ල ජාතික පාසල | ගාල්ල |
| 33. මාර/විජිත මධ්‍ය මහා විද්‍යාලය | දික්වැල්ල |
| 34. මාර/දෙයියන්දර මධ්‍ය මහා විද්‍යාලය | දෙයියන්දර |
| 35. මාර/තිහගොඩ ජාතික පාසල | මාතර |
| 36. මාර/කොටපොල ජාතික පාසල | කොටපොල |
| 37. මාර/අල් මින්හාත් ජාතික පාසල | දික්වැල්ල |
| 38. මාර/ගොඩපිටිය මධ්‍ය මහා විද්‍යාලය | අකුරැස්ස |
| 39. මාර/තාරන්දෙනිය ජාතික පාසල | කඹුරුපිටිය |
| 40. හ/රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලය | වීරකැටිය |
| 41. හ/වලස්මුල්ල මධ්‍ය මහා විද්‍යාලය | වලස්මුල්ල |
| 42. හ/කටුවන ජාතික පාසල | කටුවන |
| 43. හ/ගැටමාන්න විජය ජාතික පාසල | ගැටමාන්න |
| 44. හ/දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලය | තිස්සමහාරාම |
| 45. හ/සහිරා මහා විද්‍යාලය | හම්බන්තොට |
| 46. හ/සූරියවැව මධ්‍ය මහා විද්‍යාලය | සූරියවැව |
| 47. හ/සුචි ජාතික පාසල | හම්බන්තොට |
| 48. හ/ශ්‍රී ලංකා සිංගප්පූරු මිත්‍රත්ව ජාතික පාසල | වීරකැටිය |
| 49. හ/රුහුණු විජයබා ජාතික පාසල | හම්බන්තොට |
| 50. හ/ථෙරපුත්ත ජාතික පාසල | අම්බලන්තොට |
| **උතුරුමැද පළාත** | |
| 51. අනු/අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය | අනුරාධපුර |
| 52. අනු/ස්වර්ණපාලි බාලිකා විද්‍යාලය | අනුරාධපුර |
| 53. අනු/ශ්‍රී සිද්ධාර්ථ මධ්‍ය මහා විද්‍යාලය | එප්පාවල |
| 54. පො/රාජකීය මධ්‍ය මහා විද්‍යාලය | පොළොන්නරුව |
| **ඌව පළාත** | |
| 55. බ/ආදාඋල්පත ජාතික පාසල | මහියංගනය |
| 56. බ/මහියංගනය ජාතික පාසල | මහියංගනය |
| 57. බ/වියලුව ඩී.එස්.සේනානායක විද්‍යාලය | කන්දකැටිය |
| 58. බ/බදුල්ල මධ්‍ය මහා විද්‍යාලය | බදුල්ල |
| 59. බ/විශාකා උසස් බාලිකා විද්‍යාලය | බදුල්ල |
| 60. බ/කන්දෙගෙදර ජාතික පාසල | කන්දෙගෙදර |
| 61. බ/ශ්‍රී ජනානන්ද මධ්‍ය මහා විද්‍යාලය | දියතලාව |
| 62. බ/වල්හපුතැන්න මධ්‍ය මහා විද්‍යාලය | හල්දුම්මුල්ල |
| 63. බ/කොස්ලන්ද මධ්‍ය මහා විද්‍යාලය | කොස්ලන්ද |
| 64. බ/ලුනුවත්ත ජාතික පාසල | ලුනුවත්ත |
| 65. බ/මීගහකිවුල ජාතික පාසල | මීගහකිවුල |
| 66. බ/හාලිඇල මධ්‍ය මහා විද්‍යාලය | හාලිඇල |
| 67. මො/වෙල්ලස්ස මධ්‍ය මහා විද්‍යාලය | බිබිල |
| 68. මො/මහානාම මධ්‍ය මහා විද්‍යාලය | මොණරාගල |
| 69. මො/රාජකීය මධ්‍ය මහා විද්‍යාලය | මොණරාගල |
| 70. මො/බුත්තල දුටුගැමුණු මධ්‍ය මහා විද්‍යාලය | බුත්තල |
| **සබරගමුව පළාත** | |
| 71. කෑ/දෙහිඕවිට මධ්‍ය මහා විද්‍යාලය | දෙහිඕවිට |
| 72. කෑ/දැරණියගල සිරිසමන් ජාතික පාසල | දැරණියගල |
| 73. කෑ/පින්දෙනිය මධ්‍ය මහා විද්‍යාලය | පින්දෙනිය |
| 74. කෑ/රුවන්වැල්ල රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය | රුවන්වැල්ල |
| 75. කෑ/මාවනැල්ල සහිරා මධ්‍ය මහා විද්‍යාලය | මාවනැල්ල |
| 76. ර/ෆර්ගසන් උසස් බාලිකා විද්‍යාලය | රත්නපුර |
| 77. ර/ගොඩකවෙල රාහුල මධ්‍ය මහා විද්‍යාලය | ගොඩකවෙල |
| 78. ර/කොළොන්න මධ්‍ය මහා විද්‍යාලය | කොළොන්න |
| 79. ර/ජෙයිලානි ජාතික පාසල | බලංගොඩ |
| **වයඹ පළාත** | |
| 80. කු/ශ්‍රී නිශ්ශංක මධ්‍ය මහා විද්‍යාලය | ඉඳුල්ගොඩකන්ද |
| 81. කු/පරගහදෙනිය මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය | පරගහදෙනිය |
| 82. කු/ජේ.ආර්.ජයවර්ධන මධ්‍ය මහා විද්‍යාලය | දුම්මලසූරිය |
| 83. කු/පන්නල මධ්‍ය මහා විද්‍යාලය | පන්නල |
| 84. කු/පොල්පිතිගම මධ්‍ය මහා විද්‍යාලය | පොල්පිතිගම |
| 85. කු/නක්කාවත්ත ජාතික පාසල | නක්කාවත්ත |
| 86. කු/නාරම්මල මයුරපාද මධ්‍ය මහා විද්‍යාලය | නාරම්මල |
| 87. කු/මදීනා ජාතික පාසල | සියඹලාගස්කොටුව |
| 88. හ/හලාවත ආනන්ද ජාතික පාසල | හලාවත |
| 89. පු/පුත්තලම ආනන්ද ජාතික පාසල | පුත්තලම |
| 90. පු/සහිරා මධ්‍ය මහා විද්‍යාලය | පුත්තලම |
| 91. පු/අල් අක්ෂා මධ්‍ය මහා විද්‍යාලය | කල්පිටිය |

[ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා]

නැගෙනහිර පළාත

| | |
|---|---|
| 92. කල්/කල්මුණේ සහිරා ජාතික පාසල | කල්මුණේ |
| 93. කල්/කාමෙල් ෆාතිමා මධ්‍ය මහා විද්‍යාලය | කල්මුණේ |
| 94. කල්/අඩ්ඩාලච්චේනයි ජාතික පාසල | අඩ්ඩාලච්චේනයි |
| 95. අම්/පදියතලාව ජාතික පාසල | පදියතලාව |
| 96. ත්‍රි/අග්‍රබෝධි ජාතික පාසල | කන්තලේ |
| 97. ත්‍රි/ශාන්ත මේරි විද්‍යාලය | ත්‍රිකුණාමලය |
| 98. ත්‍රි/ශාන්ත ජෝසප් විද්‍යාලය | ත්‍රිකුණාමලය |
| 99. ත්‍රි/රාජකීය විද්‍යාලෝක ජාතික පාසල | ත්‍රිකුණාමලය |
| 100. ත්‍රි/මූතූර් මධ්‍ය මහා විද්‍යාලය | ත්‍රිකුණාමලය |
| 101. ත්‍රි/කින්නියා මධ්‍ය මහා විද්‍යාලය | කින්නියා |

උතුරු පළාත

| | |
|---|---|
| 102. ව/රම්බයිකුලම් මධ්‍ය මහා විද්‍යාලය | වවුනියාව |
| 103. ම/ශාන්ත සර්වේසස් බාලිකා විද්‍යාලය | මන්නාරම |

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරෙන් සඳහන් කළා, ජාතික පාසල්වල විදුහල්පතිවරු 103දෙනකුගේ හිඟයක් තිබෙනවා කියා. මෙම ජාතික පාසල්වල විදුහල්පති ධුරයට පත් කිරීම සඳහා සුදුසුකම් ලබන ලද විශාල පිරිසක් ඉන්නවා. එක පැත්තකින් ජාතික පාසල්වලට සුදුසුකම් ලබන්න පිරිසක් සිටියදී, තව පැත්තකින් ජාතික පාසල්වල විදුහල්පතිවරුන්ගේ පුරප්පාඩු තිබෙනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔව්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මේ තිබෙන තත්ත්වය වෙනස් කොට ඒ සුදුසුකම් ලැබූවන්ගෙන් පුරප්පාඩු වී ඇති ජාතික පාසල්වල විදුහල්පති ධුර පුරවන්න ඔබතුමා තීරණයක් ගන්නේ කවදාද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු මන්ත්‍රීතුමනි, අපි මේ වන විට තීරණයක් අර ගෙන, පුවත් පත් දැන්වීම් දමලා ජාතික පාසල් තුන්සිය ගණනක විදුහල්පති තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳෙව්වත් සියයකට මඳක් වැඩි සංඛ්‍යාවක් තමයි ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙන්නේ.

ඒක එක ප්‍රශ්නයක්. අනික, -මේක මා දන්නා දේ- ජාතික පාසල් සඳහා සුදුසුකම් තිබෙන ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන්ට පත්වීම් ලබා දුන්නාම ඒ අය භාර ගන්න අකැමැති බව දන්වමින් පෞද්ගලිකවත් මා හම්බ වෙන්න ආවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

පාර්ලිමේන්තුවට ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන්න ඔබතුමාට පුළුවන්ද?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

පුළුවන්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, විනාඩියක් ඉන්න. ගරු කථානායකතුමනි, විදුහල්පතිවරුන් එන්න බැහැ කිව්ව කාරණාව සම්බන්ධයෙන් මම වාර්තාවක් ඉදිරිපත් කරන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

වැඩබලන විදුහල්පතිවරුන්-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

වැඩබලන කථාව නොවෙයි. පොඩ්ඩක් ඉන්න පනින්නේ නැතිව.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුරේ තිබුණා පාසල්වලට ළමුන් ඇතුළත් කර ගැනීමේ නව වැඩ පිළිවෙළ නිසා 2012 වසරේ ඉල්ලුම් කළ ප්‍රමාණයන් අඩු වෙලා තිබෙනවා කියලා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මඳක්.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක නොවෙයි මගේ ප්‍රශ්නය. ඒක නිසා වෙනත් ගැටලු ගණනාවක් මතු වෙලා තිබෙනවා. මෙහිදී මට එක කාරණයක් දැන ගන්න ඕනෑ. අද දවසේත් කොට්ටාව ධර්මපාල විද්‍යාලය ළඟ පාරේ දෙමාපියන් වාඩි වෙලා උද්ඝෝෂණය කරනවා, වාසුමති කියන පුංචි ඉස්කෝලයකට -ඉඩ නැති තැනකට- ඒ පාසලේ ප්‍රාථමිකය ගෙන යන නිසා. අපේ ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා මේ ප්‍රශ්නය ගැන විශේෂයෙන් දන්නවා. එතුමාගේ නියෝජිත මහත්වරුනුත් අද ඒ අවස්ථාවට සහභාගි වෙලා තිබුණා. දැනටත් ඒ දෙමාපියන්ට මේ සම්බන්ධයෙන් උත්තරයක් දීලා නැහැ. ඉතින් ඔබතුමාගෙන් මා ඉල්ලන්නේ මෙන්න මේ ප්‍රශ්නවලට විසඳුමක් දෙන්න කියලායි. විශේෂයෙන් කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ ප්‍රාථමිකය ඉවත් කිරීම කියන ප්‍රශ්නය අද වන කොට බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මොකද, ඒක විදුහල්පතිතුමාගේ අත්තනෝමතික තීන්දුවක් බවට පත් වෙලායි තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඔබතුමා ඉතා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. ඊයේ උපදේශක කාරක සභාවේදී මගේ ගරු ඇමතිතුමා -උපදේශක කාරක සභාවේ සභාපතිතුමා- තීන්දුවක් ගත්තා. එතුමා කිව්වා යම් කිසි කෙනකු විරුද්ධ නම් -[බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්නකෝ. යම් කිසි කෙනකු picket කරනවා නම්, පෙළපාළි යනවා නම්, විරුද්ධ වනවා නම් පාසල් දහසේ ව්‍යාපෘතියෙන් ඒ පාසල ඉවත් කරනවා කියලා. ඒ නිසා මම නියෝග කරනවා ඒ පාසල් දහසේ ව්‍යාපෘතියෙන් ඒ පාසල ඉවත් කරලා ප්‍රාථමිකය තිබුණු තැනම තියන්නය කියලා. [බාධා කිරීමක්] 1000 තුළ නැද්ද? නැත්නම් මට කරන්න දෙයක් නැහැ. එහෙනම් ඒක ගැන ඒ පළාතේ දේශපාලනඥයෝ බලා ගන්න ඕනෑ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා නියෝග කරන බව ඇත්තයි. මේ කොට්ටාව ධර්මපාල විද්‍යාලය සම්බන්ධ ප්‍රශ්නය ඊයෙත් මා ඔබතුමාගෙන් ඇහුවා. වහාම මේ ගැටලුව විසඳනවාය කියලා ඔබතුමා කිව්වා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ඒ කිව්වේ පාසල් දහසේ ව්‍යාපෘතියට අරගෙන තිබෙනවා නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

හැබැයි මේ පාසල ඒකට අයිති වෙන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලනවා, මේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ-

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

කවුරුවත් ඇපයට තියන්න ඕනෑ නැහැ. ප්‍රශ්නය අහන්නකෝ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

එතුමාත් ඉන්නවා, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත් ඉන්නවා. ගුණවර්ධන මැතිතුමන්ලා දෙදෙනෙක් ඉන්නවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

හරි, හරි. ඇපයට තියන්න ඕනෑ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

අතුරු ප්‍රශ්නය ගුණවර්ධන මැතිතුමාගේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, වැදගත් ප්‍රශ්නයක් මා ඇහුවේ.

ගුණවර්ධන මහත්වරු දෙන්නාම වෙනුවෙන්ම මා ප්‍රශ්නය අහන්නම්. මෙපමණ කාලයක් තිස්සේ තිබුණු කොට්ටාව ධර්මපාල විද්‍යාලය පැලැන්වත්තේ වාසුමතී විද්‍යාලය කියන කුඩා විද්‍යාලයකට අරගෙන ගිහිල්ලා ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලයක් හදන්න සූදානම් වෙනවා. පළාත් සභා මහ ඇමතිවරයාගේයි, ඒ අදාළ ප්‍රදේශයේ ඉන්න දේශපාලනඥයන් එක්කෙනෙක් දෙන්නෙකුගේයි අත්තනෝමතික තීරණයක් මේක. ගරු කථානායකතුමනි, මේ විධියට එක එක්කෙනාට ඕනෑ විධියට විද්‍යාල කොටස්වලට කඩලා එක තැනකට කොටසක් ගෙන යන්නයි, තවත් තැනකට තව කොටසක් ගෙන යන්නයි ඉඩ දෙන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා කරුණාකරලා මේ කාරණයට මැදිහත් වෙන්න කියලා. ඔබතුමා මැදිහත් වෙලා මේ සම්බන්ධව යම් කිසි තීන්දුවක් අරගෙන පළාත් සභාවත් දැනුවත් කර මේ විනාශය නතර කරන්න. කොට්ටාව ධර්මපාල විද්‍යාලය කියන්නේ පසු ගිය කාල වකවානුවේ ඉතාම උසස් ප්‍රතිඵල පෙන්වපු පාසලක්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

මට පැහැදිලියි. ගරු කථානායකතුමනි, මා දැන් අමාත්‍යාංශයට ගිය ගමන් බලනවා මේක ජාතික පාසලක්ද, පළාත් පාසලක්ද කියලා. කුමන වර්ගයේ පාසලක් වුණත් -

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක පළාත් පාසලක්.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

පළාත් පාසලක්. [බාධා කිරීමක්] හරි. ඉතින් ඔබතුමා පනින්නේ නැතුව ඉන්නකෝ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, පැහැදිලිව කෙටියෙන් උත්තර දෙන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු කථානායකතුමනි, මේ මාගල් වාගේ ප්‍රශ්න ඇහුවාම කෙටියෙන් උත්තර දෙන්නත් බැහැ නේ. විස්තර කියන්න එපා යැ. ගරු කථානායකතුමනි, මා ඒ ගැන සොයා බලා විසඳනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා, මේ ප්‍රශ්නය මේ ධර්මපාල විදුහලට විතරක් නොවෙයි මාගමටත් තිබෙනවා. හද්ද පිටිසරටත් තිබෙනවා. ඒ පළාතේ ළමයි ඇතුළු කර ගන්න ඉස්කෝල නැහැ. ඒ ඉස්කෝලවල ප්‍රාථමිකය වෙන තැන්වලට අරගෙන ගිහිල්ලා. මේවා ගැන බලන්න. මේවා ජනතාවගේ ප්‍රශ්න. මේ ප්‍රශ්න ප්‍රතිපත්තිවලට සීමා කරන්න එපා. පුළුවන් තරම් ප්‍රායෝගිකව බලන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු කථානායකතුමනි, ඒ සඳහා මැදිහත් වෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව උත්තරීතර නිසා, අජරාමර නිසා අපි කොහොම හරි මේ ප්‍රශ්නය පාර්ලිමේන්තුවෙන්ම විසඳමු.

## රත්තොට විවිධ සේවා සමුපකාර සමිතිය : මූල්‍ය අර්බුදය
## ரத்தோட்டை பலநோக்குக் கூட்டுறவுச் சங்கம் : நிதி நெருக்கடி
## RATTOTA MULTI PURPOSE CO-OPERATIVE SOCIETY : FINANCIAL CRISIS

2884/'12

**7. ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) (i) සමුපකාර සමිතිවල මූල්‍ය හා පරිපාලන බලතල නිලවරණයෙන් පත්වන සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හිමිවීමෙන් එම සමිතිවල දූෂණ හා අක්‍රමිකතා සිදුවන බවත්;

(ii) එම තත්ත්වය යටතේ මාතලේ, රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ මූල්‍ය පරිපාලනයේදී සිදුව ඇති වංචා හා දූෂණ හේතුවෙන් එය දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව ඇති බවත්;

(iii) මූල්‍ය අර්බුදය හේතුවෙන්, එම සමුපකාර සමිතියට තම ප්‍රාදේශීක සහ "කෝප්සිටි" පවත්වාගෙන යෑමට නොහැකිවීමෙන් පාරිභෝගිකයන් දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ,

(i) ප්‍රාදේශීක සහ "කෝප්සිටි" සංඛ්‍යාව හා දැනට ක්‍රියාකාරී තත්ත්වයේ ඇති ප්‍රාදේශීක සහ "කෝප්සිටි" සංඛ්‍යාව සහ සේවක සංඛ්‍යාව;

(ii) නිලවරණයට ප්‍රාදේශිකවලින් සහභාගි විය යුතු මහ සභා නියෝජිතයන් සංඛ්‍යාව සහ 2010.03.20 දින නිලවරණයට සහභාගී වූ නියෝජිතයන් සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සමුපකාර සමිතිවල පරිපාලන දුර්වලතා, දූෂණ හා අක්‍රමිකතා පිළිබඳව ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(ii) රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ සිදු වී ඇති අක්‍රමිකතා පිළිබඳව විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கூட்டுறவுச் சங்கங்களின் நிதி, நிருவாக தத்துவங்கள் தேர்தலினால் நியமிக்கப்படும் தலைவர் மற்றும் பணிப்பாளர் சபையிடம் கையளிக்கப்படுவதனால் குறித்த சங்கங்களில் ஊழல் மற்றும் முறைகேடுகள் இடம்பெறுகின்றன என்பதையும்;

(ii) இத்தகைய நிலைமையில், மாத்தளை-ரத்தோட்டை கூட்டுறவுச் சங்கத்தின் நிதி நிருவாகத்தில் இடம்பெற்றுள்ள மோசடி மற்றும் ஊழல் காரணமாக குறித்த சங்கமானது பாரிய நிதி நெருக்கடிக்கு முகம் கொடுத்துள்ளது என்பதையும்;

(iii) நிதி நெருக்கடி காரணமாக மேற்படி கூட்டுறவு விற்பனை நிலையங்கள் மற்றும் `கோப்சிட்டி' நடத்திச் செல்ல முடியாத நிலையில் உள்ள நுகர்வோர் மிகுந்த நெருக்கடிக்கு ஆளாகியுள்ளார்கள் என்பதையும்

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) ரத்தோட்டை கூட்டுறவுச் சங்கத்தின்,

(i) கூட்டுறவு விற்பனை நிலையங்கள், `கோப்சிட்டி', தற்போது இயங்கும் நிலையில் உள்ள கூட்டுறவு விற்பனை நிலையங்கள் அல்லது `கோப்சிட்டி' மற்றும் ஊழியர்களின் எண்ணிக்கை;

(ii) கூட்டுறவு விற்பனை நிலையங்களிலிருந்து தேர்தலில் கலந்துகொள்ள வேண்டிய பொதுச்சபை பிரதிநிதிகளின் எண்ணிக்கை மற்றும் 2010.03.20ஆம் திகதி நடைபெற்ற தேர்தலில் கலந்துகொண்ட மேற்குறிப்பிடப்பட்ட பிரதிநிதிகளின் எண்ணிக்கை

யாதென்பதை அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

(இ) (i) கூட்டுறவுச் சங்கங்களில் இடம்பெறும் நிர்வாகக் குறைபாடுகள், ஊழல் மற்றும் முறைகேடுகள் தொடர்பில் எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) ரத்தோட்டை பலநோக்குக் கூட்டுறவுச் சங்கத்தில் இடம்பெற்றுள்ள மோசடியான கொடுக்கல்வாங்கல்கள் தொடர்பில் முறையான விசாரணை மேற்கொள்ளப்படுமா என்பதையும்;

(iii) ஆமெனில், குறித்த திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?.

asked the Minister of Co-operatives and Internal Trade:

(a) Will he admit the facts that -

(i) vesting the financial and administrative powers of the co-operative societies in the elected chairmen and the board of directors, lead to corruption and malpractices in those societies;

(ii) the Matale, Rattota Multi Purpose Co-operative Society has plunged in to a huge financial crisis owing to fraud and

corruption that has occurred in the financial affairs of the Society within the aforesaid context; and

(iii) the customers are immensely inconvenienced owing to the inability of the Society to run its outlets and "Co-op Cities" due to the financial crisis ?

(b) Will he state separately and in relation to Rattota Multi Purpose Co-operative Society-

(i) the number of outlets and "Co-op Cities", the number of functioning outlets and "Co-op cities" and employees; and

(ii) the number of representatives of the General Assembly who should be present at an election from the outlets, and the number of such representatives who were present at the election held on 20.03.2010?

(c) Will he also state -

(i) the measures to be adopted regarding the incidents of administrative weaknesses, corruptions and malpractices in the co-operative societies;

(ii) whether a formal investigation will be conducted regarding the corruptions that have taken place in the Rattota Multi Purpose Co-operative Society ; and

(iii) if so, when ?

(d) If not, why ?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - கூட்டுறவு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)
(The Hon. Johnston Fernando - Minister of Co-operatives and Internal Trade)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දැනට පවත්නා සමුපකාර නීතිය අනුව සමුපකාර සමිතිවල නිලවරණයෙන් පත් වන සභාපති ඇතුව අධ්‍යක්ෂ මණ්ඩලය පරිපාලන හා මූල්‍ය කටයුතුවලින් ඉවත් කිරීමේ බලයක් නොමැත.

(ii) ඇමුණුමෙහි දක්වා ඇත.

(iii) 2000 වසරේ සිට මෙම සමුපකාර සමිතියෙන් සමෘද්ධි මුද්දර ඉවත් වූ බැවින් එතෙක් ක්‍රියාත්මක වූ ප්‍රාදේශික 26 ක්‍රමයෙන් වසා ඇත. 2007න් පසුව ආරම්භ කළ "කෝප් සිටිය" හා "මිනි කෝප්සිටි" 03 ඇතුළු වෙළෙඳ සැල් 04 දැනට අක්‍රියව පවතී.

(ආ) (i) ඇමුණුමෙහි දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(ii) සහභාගි විය යුතු මහ සභා නියෝජිතයින් සංඛ්‍යාව 126කි. සහභාගි වූ සාමාජිකයින් සංඛ්‍යාව 106කි.

(ඇ) (i) සමුපකාර සමිති ප්‍රඥප්තියේ 44 වගන්තිය අනුව 2010.09.30 දක්වා ව්‍යවස්ථාපිත විගණනය සිදු කර ඇති අතර, හඳුනාගත් කළමනාකරණ දුර්වලතා පිළිබඳව සමිතිය දැනුවත් කර ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇති බව මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් දන්වා ඇත.

(ii) මූලික පරීක්ෂණයක් සිදු කර මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 46(1) වගන්තියේ විවිවිධාන අනුව විමර්ශනයක් සිදු කිරීම සඳහා සැලසුම් කර ඇති බව මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් දන්වා ඇත.

(iii) මූලික පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව 2013.01.31 දිනට පෙර එකී පරීක්ෂණය ආරම්භ කරනු ලැබේ.

(ඈ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

(අ) (ii) මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සී/ස රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියේ රාජ්‍ය අරමුදල් හා මූල්‍ය පරිපාලනය කාර්යක්ෂමව කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සභාපති සහ සාමාජිකයන් දෙදෙනෙක් 2010.05.17 දින මධ්‍යම පළාත් කොමසාරිස්වරයා විසින් පත් කරන ලදී. අධිකරණයේ රිට් 12/2010 යටතේ පත් කරන ලද සභාපතිවරයා සහ සාමාජිකයින් ඉවත් කිරීමට තහනම් නියෝගයක් ලබා ගෙන ඉවත් කර එම සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය නැවත පත්වී ඇති නිසා දෙපාර්තමේන්තුවට ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇත.

(ආ) (i) ප්‍රාදේශික 26 - දැනට ක්‍රියාත්මක නොවේ.

කෝප්සිටි 01 - දැනට ක්‍රියාත්මක නොවේ.

රත්තොට

මිනි කෝප්සිටි 03 - දැනට ක්‍රියාත්මක නොවේ.

පල්ලේවේරගම

අඹගස්තැන්න

බණ්ඩාරපොළ

**සේවක සංඛ්‍යාව**

2000 වසරේ පිරිස්බල තක්සේරුව අනුව සේවකයින් 80ක් සිටි අතර 2012 සංශෝධිත පිරිස්බල තක්සේරුව අනුව සේවකයින් 26 දෙනෙකු අනුමත කර ඇත. මේ වන විට සේවක සංඛ්‍යාව 11ක් වන අතර ඉන් 03දෙනෙකු ප්‍රධාන කාර්යාලයේ හා ඉතිරි 08 දෙනා ග්‍රාමීය බැංකුවලට අනුයුක්තව සේවය කරනු ලැබේ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, රත්තොට විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ශාඛා 28ක් තිබෙනවා. මේ ශාඛා 28ම දැනට ක්‍රියාත්මක වෙන්නේ නැහැ, දූෂණ, අක්‍රමිකතා තිබෙන නිසා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා වූ පියවර මොකක්ද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, දැනට ක්‍රියාත්මක වෙන සමුපකාර පනත 1993 දී සංශෝධනය කර තිබෙනවා. දූෂණයක් සිදු වුණාම සමුපකාර කොමසාරිස්ට ගන්න තිබුණු සියලුම නීතිමය ක්‍රියා මාර්ග සම්පූර්ණයෙන්ම සමුපකාරයට පවරලා දීලායි තිබෙන්නේ. වීරසිංහ මල්ලිමාරච්චි ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ තමයි මේ බලය සම්පූර්ණයෙන්ම සමුපකාරයට ලබා දීලා තිබෙන්නේ. අද සමුපකාරයේ යම් දූෂණයක් ඇති වුණොත් ඒ දූෂණය ගැන සොයා බලන්න පුළුවන්. එහෙම සොයා බලා ඒ

[ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා]

වාර්තාව එවන්න ඕනෑ, දූෂිත අධ්‍යක්ෂ මණ්ඩලයටමයි. ඒ අධ්‍යක්ෂ මණ්ඩලය ඒ වාර්තාව ප්‍රතික්ෂේප කළොත් එතැනින් එහාට ක්‍රියාත්මක කරන්න කිසි බලයක් නැහැ. ඒ නිසා තමයි සමුපකාර පනත සංශෝධනය කරන්න අපි තීන්දු කරලා තිබෙන්නේ.

මේ පළාත් සභාවට අයිති විෂයයක්. ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්න පාර්ලිමේන්තුවේදී අහනවාට වඩා පළාත් සභාවේදී අහලා විසඳා ගන්න ඕනෑ. හැබැයි ඔබතුමා පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරයකු හැටියට මේ ප්‍රශ්නය ඇසීම සම්බන්ධව ගැටලුවක් නැහැ. ඔබතුමාගේ ප්‍රශ්නයට සම්බන්ධ ඒ සභාපතිවරයා ඉවත් කර වෙනම නිලධාරියෙකු පත් කරලා තිබෙනවා. නමුත් උසාවියෙන් රිට් ආඥාවක් අරගෙන නැවත වාරයක් ඒ සභාපතිවරයායි, ඒ අධ්‍යක්ෂ මණ්ඩලයයි පත් වෙලා තිබෙනවා. ඒ වුණත් මේ පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක වෙනවා. ඒ මොනවා වුණත්, මේ පනත සංශෝධනය කරන තෙක් සමුපකාරයේ ඇති වෙන දූෂණ වළක්වන්න හම්බ වෙන්නේ නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය. මේක තමයි යථාර්ථය.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු ඇමතිතුමනි, ඒ ශාඛා ක්‍රියාත්මක වෙන්නේ නැත්නම් ඒ නිලවරණය පවත්වන්නේ කොහොමද?

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒ නිලවරණය සම්බන්ධයෙන් ඔබතුමා අහන ප්‍රශ්නයට මට උත්තර දෙන්න බැහැ. ඒක පළාත් සභාවේ වැඩක්. පළාත් සභාවේ ප්‍රඥප්තියක් තිබෙනවා.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඇමතිතුමා යටතේ තමයි ඔහු ඉන්නේ. මොකද ඇමතිතුමාටයි වගකීම තිබෙන්නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
නැහැ. මගේ යටතේ නොවෙයි ඉන්නේ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඔබතුමාට විමසන්න පුළුවන්. පාර්ලිමේන්තුවට උත්තර දෙන්න ඔබතුමාට පුළුවන් නේ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
පළාත් සභාවල ප්‍රශ්න තිබෙනවා, කොමසාරිස්වරුන්ගේ ප්‍රශ්න තිබෙනවා, සමිතිවල ප්‍රශ්න තිබෙනවා. මා මේ කොමසාරිස්තුමා අපේ උපදේශක කාරක සභාවට ගෙන්වන්නම්. එතකොට ඔබතුමාට පුළුවන් ප්‍රශ්න අහලා එතුමාගෙන් ඒ තොරතුරු දැන ගන්න. මා එතුමා ගෙන්වා දෙන්නම්.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කිව්ව විධියට ගිය අවුරුද්දේ Co-op Cities ආරම්භ කරන්න රුපියල් ලක්ෂ 30ක් වැය කර තිබෙනවා. කළමනාකරණයේ දුර්වලකම නිසා දැන් මේ වන කොට ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. ස්ථාන තුනක තමයි ක්‍රියාත්මක වුණේ. නමුත් ඒ ස්ථාන තුනේම දැන් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
රත්තොට විතරක් නොවෙයි, විවිධ ප්‍රදේශවල එවැනි තත්ත්වයක් තිබෙනවා. රජයේ, පළාත් සභා කියලා අපි අත හැරලා නැහැ. අතිගරු ජනාධිපතිතුමා ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තාම ඒවාට අවශ්‍ය කරන මුදල් දෙනවා. හැබැයි ඒවායේ පරිපාලන කටයුතු සම්පූර්ණයෙන්ම තිබෙන්නේ පළාත් සභාවලට. ඒ නිසා අපි පළාත් සභාවලට අනවශ්‍ය ලෙස ඇඟිලි ගසන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ ප්‍රාදේශීයවල ප්‍රශ්න තිබෙනවා. එක්සත් ජාතික පක්ෂ රජයේ පාලන සමයේ -ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාලයේ- සමුපකාර ඇමතිතුමා තමයි මේ පනත සංශෝධනය කළේ. සංශෝධනය කර සමුපකාරය විනාශ කළා. තිබුණු බලතල සියල්ලම ඉවත් කර විනාශ කර දැම්මා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
1993 දී ඒ ගත්තා වූ වැරදි තීන්දු තීරණවල ඵලවිපාක තමයි දැන් අපට විඳ දරන්න වෙලා තිබෙන්නේ.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ඒවා සංශෝධනය කරන්න.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ඒවා සංශෝධනය කරනවා. එදාට ඔබතුමා අත් දෙක ඔසවලා උදවු කරන්න ඕනෑ ඒ පනත සංශෝධනය කරන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ මොහොත වන කොට මොරවක් කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතියේ ලොකු අර්බුදයක් ඇති වෙලා තිබෙනවා, මේ වාගේම ඒ සභාපතිවරයා, උප සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ දූෂණ වංචා හේතුවෙන්. සේවකයෝ වැඩ වරලා තිබෙනවා, සාමාජිකයෝ 45,000ක් අනාථ වෙලා ඉන්නවා, සේවකයෝ 700ක් අනාථ වෙලා ඉන්නවා. ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
මේ ප්‍රශ්නයේ පිළිතුරට අදාළ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
ගරු කථානායකතුමනි, ඒක මේ ප්‍රශ්නයට අදාළ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔව්. අදාළ නැහැ.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
මේ මන්ත්‍රීතුමා හදන්නේ බොර දියේ මාළු බාන්න. දේශපාලනය කරලා ඒකත් විනාශ කරන්න හදනවා. ඒක පළාත් සභාවට අයිති දෙයක්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු ඇමතිතුමා යෝජනා කළා, උපදේශක කාරක සභාවට සියලු දෙනා ගෙන්වනවා කියලා. ඉතින් සියලු දෙනාටම සහභාගි වන්නට පුළුවන්.

## අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් : වැටුප් සහ ප්‍රතිලාභ
## அமைச்சர்கள் மற்றும் பிரதியமைச்சர்கள் : சம்பளம் மற்றும் சலுகைகள்
## MINISTERS AND DEPUTY MINISTERS : SALARIES AND PERKS

1543/'11

**8. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (3):

(අ) (i) 2011 ජුනි මස 01 වැනි දින සිට කැබිනට් අමාත්‍යවරයෙකුට ගෙවනු ලබන මාසික වැටුප කොපමණද;

(ii) අමාත්‍යවරයකු සහ අමාත්‍යවරයකු සඳහා පත් කර ඇති කාර්ය මණ්ඩලය විසින් මාසිකව භුක්ති විඳින වෙනත් අමතර ප්‍රතිලාභ කවරේද;

(iii) 2011 ජුනි මස 01 වැනි දින සිට නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ගෙවනු ලබන මාසික වැටුප කොපමණද;

(iv) නියෝජ්‍ය අමාත්‍යවරයකු සහ ඔහුගේ කාර්ය මණ්ඩලය මාසිකව භුක්ති විඳින වෙනත් අමතර ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි මාසික වැටුප ගෙවනු ලබන්නේ නම්, එකී අමාත්‍යවරයා හෝ නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ලබා ගන්නා මාසික වැටුප කොපමණද;

(ii) අමාත්‍යවරුන්/ නියෝජ්‍ය අමාත්‍යවරුන් විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස ඉහත (අ) කොටසෙහි සඳහන් ප්‍රතිලාභ භුක්ති විඳින්නේද;

(iii) අමාත්‍යවරුන්ට/නියෝජ්‍ය අමාත්‍යවරුන්ට ප්‍රමාණවත් වැටුපක් ගෙවනු ලබන්නේද;

(iv) නොඑසේ නම්, එම කරුණ නිවැරදි කරනු ලබන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2011 யூன் 1ஆம் திகதி முதல் அமைச்சரவை அமைச்சர் ஒருவருக்கு செலுத்தப்பட்ட மாதாந்தச் சம்பளம் எவ்வளவு என்பதையும்;

(ii) அமைச்சரும் அமைச்சருக்கு வழங்கப்பட்டுள்ள பணியாட்டொகுதியினரும் மாதாந்தம் அனுபவித்து வரும் பிற சலுகைகளையும்;

(iii) 2011 யூன் 1 முதல் பிரதி அமைச்சர் ஒருவருக்கு செலுத்தப்பட்ட மாதாந்தச் சம்பளத்தையும்;

(iv) பிரதி அமைச்சர் ஒருவரும் அவரது பணியாட்டொகுதியினரும் மாதாந்தம் அனுபவித்து வரும் பிற சலுகைகளையும்

அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) (i) அமைச்சர் அல்லது பிரதி அமைச்சர் ஒருவருக்கு பாராளுமன்ற உறுப்பினர் ஒருவர் பெற அருகதையுள்ள மாதாந்தச் சம்பளத்தை வழங்கும் பட்சத்தில் அவர் பெற்றுக்கொள்ளும் மாதாந்தச் சம்பளம் எவ்வளவு என்பதையும்;

(ii) பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் அமைச்சர்கள்/பிரதி அமைச்சர்கள் மேற்படி (அ) இல் குறிப்பிடப்பட்ட நன்மைகளை அனுபவிக்கின்றனரா என்பதையும்;

(iii) அமைச்சர்கள்/பிரதி அமைச்சர்கள் ஆகியோருக்கு போதியளவு சம்பளம் வழங்கப்படுகின்றதா என்பதையும்;

(iv) அவ்வாறெனில், இதை எவ்வாறு நிவர்த்திக்க முடியுமென்பதையும்

அவர் கூறுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs :

(a) Will he inform this House of -

(i) the monthly salary payable to a Cabinet Minister from 1st June 2011;

(ii) the other perks that a Minister and the staff assigned to a Minister enjoy per month;

(iii) the monthly salary payable to Deputy Ministers from 1st June 2011 ; and

(iv) the other perks that a Deputy Minister and his staff enjoy per month?

(b) Will he also state -

(i) the monthly salary drawn by a Minister or a Deputy Minister if he or she is paid the monthly salary entitled to a Member of Parliament;

[ගරු රවි කරුණානායක මහතා]

(ii) whether the Ministers/Deputy Ministers enjoy the benefits referred to in part (a) as a Member of Parliament;

(iii) whether the Ministers/ Deputy Ministers are paid a sufficient salary; and

(iv) if so, as to how the matter is rectified?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) රුපියල් 65,000.00

(ii) දීර්ඝ විස්තරයක් තිබෙනවා. අදාළ විස්තර ඇමුණුම 1 හි දක්වා ඇත.

(iii) රුපියල් 63,500.00

(iv) අදාළ විස්තර ඇමුණුම 02 හි දක්වා ඇත.

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හිමි වැටුප ගෙවනු නොලැබේ.

(ii) අමාත්‍යවරුන් හා නියෝජ්‍ය අමාත්‍යවරුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සේ සලකා දීමනා ගෙවනු ලැබේ. අදාළ විස්තර ඇමුණුම 03 හි දක්වා ඇත.

ඇමුණුම සභාගත* කරමි.

(iii) ඔව්.

(iv) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම්:**
**சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
** Annexes tabled:*

| තනතුර | ලබා දී ඇති හිමිකම් | | | |
|---|---|---|---|---|
| | නිල වාහන | ඉන්ධන | නිල දූරකථන | දූරකථන වියදම් (මුළු එකතුව සඳහා උපරිම සීමාව) ** |
| ගරු අමාත්‍ය | 03 | **පෙට්‍රල් වාහන**<br>පෙට්‍රල් වාහන එකක් සඳහා බස්නාහිර පළාතෙන් පිටත පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන අමාත්‍යවරුන් සඳහා ලීටර් 750 කි.<br>බස්නාහිර පළාත තුළ පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන අමාත්‍යවරුන් සඳහා ලීටර් 600 කි.<br>**ඩීසල් වාහන**<br>ඩීසල් වාහන එකක් සඳහා බස්නාහිර පළාතෙන් පිටත පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන අමාත්‍යවරුන් සඳහා ලීටර් 600 කි.<br>බස්නාහිර පළාත තුළ පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන අමාත්‍යවරුන් සඳහා ලීටර් 500 කි. | කාර්යාල - 02<br>නිවාස - 02<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | කාර්යාල දූරකථන 02 සඳහා රු: 20,000/- කි.<br>රාජකාරි නිවාස දූරකථන 02 සඳහා රු: 20,000/- කි.<br>ජංගම දූරකථනය සඳහා රු: 10,000/- කි. |
| ගරු අමාත්‍යවරයකුගේ - පෞද්ගලික ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 240 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | රු: 6000/- |
| ගරු අමාත්‍යවරයකුගේ - සම්බන්ධීකරණ ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01 | රු: 5000/- |
| ගරු අමාත්‍යවරයකුගේ - මාධ්‍ය ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | රු: 5000/- |
| ගරු අමාත්‍යවරයකුගේ - මහජන සම්බන්ධතා නිලධාරී | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01 | රු: 5000/- |

**ඇමුණුම 1**

| තනතුර | ලබා දී ඇති හිමිකම් | | | |
|---|---|---|---|---|
| | නිල වාහන | ඉන්ධන | නිල දූරකථන | දූරකථන වියදම් (මුළු එකතුව සඳහා උපරිම සීමාව) ** |
| ගරු නියෝජ්‍ය අමාත්‍ය | 03 | **පෙට්‍රල් වාහන**<br>පෙට්‍රල් වාහන එකක් සඳහා බස්නාහිර පළාතෙන් පිටත පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ලීටර් 750 කි.<br>බස්නාහිර පළාත් තුළ පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ලීටර් 600 කි.<br>**ඩීසල් වාහන**<br>ඩීසල් වාහන එකක් සඳහා බස්නාහිර පළාතෙන් පිටත පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ලීටර් 600 කි.<br>බස්නාහිර පළාත තුළ පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය කරන නියෝජ්‍ය අමාත්‍යවරුන් සඳහා ලීටර් 500 කි. | කාර්යාල - 02<br>නිවාස - 02<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | කාර්යාල දූරකථන 02 සඳහා රු: 20,000/- කි.<br>රාජකාරි නිවාස දූරකථන 02 සඳහා රු: 20,000/- කි.<br>ජංගම දූරකථනය සඳහා රු: 10,000/- කි. |
| ගරු නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ - පෞද්ගලික ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 240 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | රු: 6000/- |
| ගරු නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ - සම්බන්ධීකරණ ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01 | රු: 5000/- |
| ගරු නියොජ්‍ය අමාත්‍යවරයකුගේ - මාධ්‍ය ලේකම් | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01<br>කාර්යාල - 01 (ෆැක්ස්) | රු: 5000/- |
| ගරු නියෝජ්‍ය අමාත්‍යවරයකුගේ - මහජන සම්බන්ධතා නිලධාරී | 01 | *පෙට්‍රල් / ඩීසල් ලීටර් - 218 | කාර්යාල - 01<br>නිවාස - 01<br>ජංගම - 01 | රු: 5000/- |

* රා.පරි.ච. 08/2010 හි උපදෙස් පරිදි මෙම දීමනාව මාසික දීමනාවක් ලෙස ගෙවනු ලබන අතර, අදාළ මාසයේ පළමුවන දින දේශීය වෙළඳ පොළෙහි පවතින ඉන්ධන මිල අනුව ඉන්ධන මිල තීරණය කළයුතු වේ

** මාසික ස්ථාවර ගාස්තුව හා බදු මුදල් හැර (අනුමත නිවාස, කාර්යාල, ජංගම දූරකථන හා ෆැක්ස් සඳහා වන දූරකථන වියදම් ද ජාත්‍යන්තර දූරකථන ගාස්තු වේ නම් එම ගාස්තු ද මෙම සීමාව තුළ දැරිය යුතුය)

ඇමුණුම 2

| තනතුර | ඉන්ධන දීමනාව | ජංගම දුරකථන දීමනාව | රැස්වීම් දීමනාව |
|---|---|---|---|
| ගරු අමාත්‍ය | දිස්ත්‍රික්කය අනුව වෙනස් වන ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ. එම වාර්තාව ඇමුණුමෙහි සඳහන් කර ඇත. ඇමුණුම **සභාගත*** කරමි. | රු. 2,000/- | පැමිණි දිනක් සඳහා රු. 500/- |
| ගරු නියෝජ්‍ය අමාත්‍ය | දිස්ත්‍රික්කය අනුව වෙනස් වන ඉන්ධන දීමනාවක් ගෙවනු ලැබේ. එම වාර්තාව ඇමුණුමෙහි සඳහන් කර ඇත. | රු. 2,000/- | පැමිණි දිනක් සඳහා රු. 500/- |

ඇමුණුම

| දිස්ත්‍රික්කය | අනුමත ඩීසල් ලීටර් ගණන | ඉන්ධන දීමනාව * (ලී.1ක් රු. 84.00) | ඉන්ධන දීමනාව ** (ලී.1ක් රු. 115.00) |
|---|---|---|---|
| කොළඹ | 258.13 | 21,682.92 | 29,684.95 |
| ගම්පහ<br>කළුතර | 323.25 | 27,153.00 | 37,173.75 |
| කෑගල්ල<br>කුරුණෑගල<br>රත්නපුර<br>ගාල්ල<br>මහනුවර | 387.59 | 32,557.56 | 44,572.85 |
| මාතලේ<br>පුත්තලම<br>මාතර<br>නුවරඑළිය | 451.93 | 37,962.12 | 51,971.95 |
| පොලොන්නරුව<br>බදුල්ල<br>හම්බන්තොට<br>වව්නියාව<br>මොණරාගල<br>අනුරාධපුර<br>ත්‍රිකුණාමලය<br>කිළිනොච්චිය | 517.05 | 43,432.20 | 59,460.75 |
| මුලතිව්<br>මඩකලපුව<br>මන්නාරම<br>අම්පාර<br>යාපනය | 581.39 | 48,836.76 | 66,859.85 |
| ජාතික ලැයිස්තුව | 258.13 | 21,682.92 | 29,684.95 |

* දැනට ගෙවනු ලබන දීමනාව

** සංශෝධිත මිල ගණන් අනුව මාර්තු මස 01 වන දින සිට ගෙවිය යුතුය. අමතර ප්‍රතිපාදන සඳහා මහා භාණ්ඩාගාරයට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම 3

***[මෙම ඇමුණුම් පුස්තකාලයේ ද තබා ඇත.]***

*[இந்த இணைப்புகள் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]*

*[This annexes is also placed in the Library.]*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ ඇමති මණ්ඩලය පවත්වා ගෙන යන්න දළ වශයෙන් මාසයකට රුපියල් මිලියන කීයක් විතර යනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා ඒ ප්‍රශ්නය අහලා නැහැ. අමාත්‍යවරු සංඛ්‍යාව අනුව ඒ මුදල අඩු වැඩි වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මගේ අතුරු ප්‍රශ්නය ඒක තමයි. අමාත්‍යවරු 140ක් ඉන්නවා. එක ඇමතිවරයකුට කීයක් යනවාද කිව්වොත්, ඒක වැඩි කරලා උත්තරය ලබා ගන්න පුළුවන්.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමාගේ කැමැත්ත පරිදි වැඩි කරලා හෝ අඩු කරලා උත්තරය ලබා ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ පාර්ලිමේන්තුව උත්තරීතරයි. ඒ නිසා අහන ප්‍රශ්නවලට උත්තර දෙන්න. අපට වෙන තැනකට යන්න අවස්ථාවක් නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඉතාම උත්තරීතර නිසා ඇමතිවරයකු හෝ නියෝජ්‍ය ඇමතිවරයකු විය හැක්කේ මන්ත්‍රීවරයකුට පමණයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

අපි ප්‍රශ්න අහන්නෙත් ජනතාව වෙනුවෙන් කියලා මතක තබා ගන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

වෙන රටවල්වල මන්ත්‍රීකමක් නැතුව ඇමතිකමක් දරන්න පුළුවන්. අපේ රටේ බැහැ. ඒකයි උත්තරීතරභාවයේ විශේෂ ලක්ෂණය. ඔබතුමා අහන ප්‍රශ්නයට මා ළඟ සම්පූර්ණ විස්තර නැහැ. ජනමාධ්‍යයට නේ මෙය අවශ්‍යය. වැඩි කරලා ගත හැකියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ජනමාධ්‍යයට ප්‍රථම ජනතා නියෝජිතයන් වශයෙන් අපි දැන ගන්න අවශ්‍යයි. විකෘති කරලා ලියනවාට වැඩිය-

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ඔබතුමා දන්නවා නේ ඇමතිවරයකු කීයක් ගන්නවාද, මන්ත්‍රීවරයකු කීයක් ගන්නවාද, telephones කීයක් එහෙන් ගන්නවාද, මෙහෙන් ගන්නවාද කියලා. ඒ ඔක්කෝම අපි දන්නා දේවල් නේ. ඉතින් අහන්නේ මොකටද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔබතුමන්ලා තමයි ඇමතිවරු. අපි ඇමතිවරු නොවෙයි. ඔබතුමන්ලා එහෙන් ගන්නවාද, කොහෙන් ගන්නවාද කියන එකයි අපි අහන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, පිළිතුරේ දීර්ඝ විස්තරයක් තිබෙනවා. ඒවා එකින් එක කියවන්න ගියොත් දීර්ඝ වේලාවක් ගත වන නිසා ඒ විස්තර සභාගත කර තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම වෙන අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
බොහොම ස්තුතියි. මන්ත්‍රීවරුන්ටත් සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ. ඒ වරප්‍රසාද ඔක්කෝම දෙන්න ඕනෑ. ඒක නේද අහන්නේ?

ප්‍රශ්න අංක 9, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, දැන් කාලය ගත වෙලා ඉවරයි. ප්‍රශ්න අංක 9 අහන්නය කියා මම ප්‍රකාශ කරලාත් ඉවරයි. උසාවියේ වාගේ තමයි. ආපස්සට යන්න බැහැ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතුමාට පොඩි චාන්ස් එකක් දෙමු, ගරු කථානායකතුමනි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම නම් කෙටියෙන් ප්‍රශ්නය අහන්න. කෙටියෙන් පිළිතුරු දෙන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාර්ලිමේන්තුව උත්තරීතර නිසා අපට ඕනෑ දෙයක් කරන්න පුළුවන් නේ, ගරු කථානායකතුමනි. ඔබතුමාට ඕනෑ දෙයක් කරන්න පුළුවන්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා ගෙදර, මෙහේ බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් ඒ වරප්‍රසාද ලැබෙන්න ඕනෑය කිව්වා. මා මෙහිදී කියන්න ඕනෑ, ඉතිහාසයේදී අපට තිබුණු වරප්‍රසාදයක් අනුව අපට අවශ්‍ය සංඛ්‍යාවක් මේ ගැලරියට ගෙන්වලා පාර්ලිමේන්තුව බලන්න අවස්ථාවක් ලබා දෙන්නට හැකියාවක් තිබුණු බව. මම මේ කාරණය කියන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. ඊයේ, පෙරේදා ඉඳලා, හය දෙනෙක් ගෙන්වනවා නම් එක පුද්ගලයෙකුගෙන් අය කරන ගණන රුපියල් 600 දක්වා වැඩි කර තිබෙනවා. ඒ සඳහා යම්කිසි මුදලක් වියදම් වන බව අපි දන්නවා. නමුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විධියට අපි ගමේ ඉන්න පිරිසක් මේ පාර්ලිමේන්තුවට කැඳවා ගෙන එන්නේ ඔවුන්ට මේ පාර්ලිමේන්තුව බලන්න අවස්ථාවක් ලබා දීලා සංග්‍රහයකුත් කරලා යවන්නයි. ඒක මන්ත්‍රීවරුන් හැටියට අපට තිබෙන අයිතිවාසිකමක්. ඉස්සර රුපියල් 10ට තිබුණු කෑම එක රුපියල් 150ක් කර ගත්තා. ඒකට කමක් නැහැ. දැන් ඒක රුපියල් 600ක් දක්වා වැඩි කර තිබෙනවා. දෙන්නෙක් ගෙන්වලා සංග්‍රහ කළාම අපට දිනකට ලැබෙන පැමිණීමේ දීමනාව ඉවරයි. ගරු කථානායකතුමනි, ඒ නිසා මම ඔබතුමාට ගෞරවයෙන් මතක් කරන්නේ මේ සම්බන්ධයෙන් යම්කිසි තීන්දුවක් ගන්නය කියායි. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් නම් අමාත්‍යාංශයට බිල දමනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහෙම බැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇත්තයි, එහෙම වෙනවා. ඊයේ දිවි නැගුම පනත් කෙටුම්පත විවාදයට ගත් අවස්ථාවේදී 150ක් ගෙන්නුවා. ඒ 150ටම කෑම දුන්නේ නියෝජ්‍ය කථානායකතුමා වෙනුවෙන් වෙන් වූ මුදල්වලිනුයි. එහෙම වුණත් අපි එළියට යනකොට අපට "හූ" කිව්වා. අපෙන් කෑම කාලා අපටම "හූ" කිව්වා. කරුණාකරලා ඒ වරප්‍රසාදය නැවත අපට ලබා දී යම්කිසි සාධාරණයක් ඉෂ්ට කරන්නය කියා මා ඉල්ලනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, මම ඒ ගැන සොයා බලන්නම්. නමුත් එහෙම දෙයක් වෙන්න බැහැ.

## මාවරල ප්‍රාදේශීය රෝහල : ප්‍රතිසංස්කරණය
### மாவரல பிரதேச வைத்தியசாலை : புனரமைப்பு
### MAWARALA DIVISIONAL HOSPITAL : RENOVATION

1889/’11

9. **ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, හක්මන ප්‍රදේශයේ පිහිටි මාවරල ප්‍රාදේශීය රෝහලෙහි මෘත ශරීරාගාරය ඉතා අබලන් වී ඇති බවත්;

(ii) ඉතා දුෂ්කර ප්‍රදේශයක පිහිටි එම රෝහලෙහි පවතින ඉහත අඩුපාඩුව නිසා ප්‍රදේශවාසීන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) මේ වනවිට ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதார அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை மாவட்டத்தின் ஹக்மன பிரதேசத்தில் அமைந்துள்ள மாவரல பிரதேச வைத்திய சாலையின் பிரேத அறை மிகவும் சேதமடைந் துள்ளது என்பதையும்;

(ii) மிகவும் கஷ்டப்பிரதேசத்தில் அமைந்துள்ள மேற்படி வைத்தியசாலையில் நிலவும் குறை பாடுகள் காரணமாக இப்பிரதேசவாழ் மக்கள் பெரும் கஷ்டங்களுக்கு முகம்கொடுத்துள்ளார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி கட்டிடத்தை துரிதமாக புனரமைப் பதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) இதற்காக தற்போது நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், புனரமைப்புப் பணிகள் எப்போது ஆரம்பிக்கப்படும் என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health:

(a) Is he aware that -

(i) the mortuary of the Mawarala Divisional Hospital situated at Hakmana area in Matara District is in a very dilapidated condition; and

(ii) the people of the area are faced with severe difficulties as a result of the aforesaid shortcoming prevailing at this Hospital, which is situated in a very difficult area?

(b) Will he inform this House -

(i) whether action will be taken to renovate the aforesaid building soon;

(ii) whether allocations have been made for this purpose by now; and

(iii) if so, the date on which the renovation work will be commenced?

(c) If not, why?

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) ඔව්. 2013 වර්ෂයේ සංවර්ධන සැලැස්මට ප්‍රතිපාදන වෙන් කර ඇති අතර ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රුපියල් 698,800කි.

(iii) 2013 වසරේ ප්‍රතිසංස්කරණය කිරීමට නියමිතය.

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ඔබතුමාට කාලය ඉතිරි කරන්න ඕනෑ නිසා මම අතුරු ප්‍රශ්න දෙකයි අහන්නේ. මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. හක්මන ප්‍රදේශයේ පිහිටා තිබෙන මෙම මාවරල රෝහලේ මෘත ශරීරාගාරය හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවටත්, ඒ ප්‍රදේශයට අදාළ මාතර දිස්ත්‍රික්කයේ ජනතාවටත් ප්‍රයෝජනවත් වෙනවා. මේ ඇස්තමේන්තුගත මුදලින් කෙරෙන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා කොපමණ කාලයක් ගත වෙනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මම හිතන හැටියට පළමුවැනි කරුණ ගැන මට වැඩිය හොඳට ඔබතුමා දන්නවා ඇති. මාවරල රෝහල ආසන්නයේ කඹුරුපිටියේ සහ දෙයියන්දර රෝහල් දෙකක් තිබෙනවා. දුර ප්‍රමාණය මම දන්නේ නැහැ. ඒ සම්බන්ධව මට වැඩිය, ගමේ සිටින ඔබතුමා දන්නවා ඇති නේ. මෘත ශරීරාගාර සම්බන්ධයෙන් යම් පුරවැසියෙකුට ප්‍රශ්නයක් ඇති වුණොත් ඒ රෝහල් දෙකෙන් ඒ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්. ඒ අතර තුර මේ ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට දැනට ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. රජයේ මුදල් රෙගුලාසි අනුව ටෙන්ඩර් පටිපාටි ක්‍රියාත්මක කර පළාත් සභාව මඟින් ඒ කටයුත්ත ඉතා ඉක්මනින් කරයි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මා දැන ගන්න කැමැතියි, මේ මෘත ශරීරාගාරයට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙන්නේ ගොඩනැඟිල්ල ඉදි කිරීම සඳහා පමණක්ද, එහෙම නැත්නම් ඒකට අවශ්‍ය අනෙකුත් බඩු භාණ්ඩ මිලදී ගැනීමටත් එක්කද කියලා.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මෙහි ඒ විස්තර සම්පූර්ණයෙන් දමා නැහැ. ඒක අදාළ පළාත් සභාවෙන් අහන්න ඕනෑ. අපට ලැබී තිබෙන තොරතුරු අනුව ඇස්තමේන්තුගත මුදල රුපියල් 698,000යි. මුළු ඇස්තමේන්තුවම අපට එවලා නැහැ. ඒවා අදාළ පළාත් සභාවෙන් බලා ගන්න ඕනෑ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මම තුන්වෙනි අතුරු ප්‍රශ්නයක් අහන්නේ නැහැ. ඒ බඩු භාණ්ඩත් අබලන් වෙලා තිබෙන නිසා ඒවා ලබා දෙන්න කියන ඉල්ලීම තමයි මම කරන්නේ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

සාමාන්‍යයෙන් අලුත් ගොඩනැඟිල්ලක් දෙන කොට අලුත් බඩු භාණ්ඩත් දෙනවා නේ. ඒක හැටියක් නේ.

## කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ ඉල්ලීම : කැසට් පට ආදිය
## கால்ரன் விளையாட்டு அலைவரிசையின் கோரிக்கை : ஒளிப்பதிவு ஆதியன
## REQUEST OF CARLTON SPORTS NETWORK: CASSETTES ET CETERA

1907/'11

**10.** ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) ජාතික රූපවාහිනිය සතු ක්‍රීඩා තරග පටිගත කළ කැසට් පට හෝ දෘඪ තැටි කාල්ටන් ක්‍රීඩා නාලිකාව (CSN) වෙත ලබා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දුන් පදනම කවරේද;

(iv) එම කැසට් පට ලබා ගැනීම වෙනුවෙන් කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් ජාතික රූපවාහිනිය වෙත ගෙවන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාව විසින් එම කැසට් පට හෝ දෘඪ තැටි ලබා දෙන ලෙස ඉල්ලීමක් කළේ නම්, එම ඉල්ලීම් කළ අයගේ විස්තර කවරේද;

(ii) එකී ඉල්ලුම් ලිපිය කුමක්ද;

(iii) ජාතික රූපවාහිනිය විසින් එකී කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමට බලය ලබා දුන් නිලධාරියාගේ නම සහ තනතුර කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தேசிய தொலைக்காட்சிக்குச் சொந்தமான, விளையாட்டுப் போட்டிகளை ஒளிப்பதிவு செய்துள்ள நாடாக்களை அல்லது இறுவட்டு களை கால்ரன் விளையாட்டு அலைவரிசைக்கு (CSN) வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அவ்வாறு வழங்குவதற்கான காரணங்கள் யாதென்பதையும்;

(iii) மேற்படி நாடாக்கள் அல்லது இறுவட்டுகள் வழங்கப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(iv) மேற்படி நாடாக்களை பெற்றுக்கொள்வதற்காக கால்ரன் விளையாட்டு அலைவரிசை தேசிய தொலைக்காட்சிக்கு செலுத்திய பணத்தொகை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(அ) (i) கால்ரன் விளையாட்டு அலைவரிசையினால் மேற்படி நாடாக்கள் அல்லது இறுவட்டுகளை பெற்றுத் தரும்படி வேண்டுகோள் விடுக்கப் பட்டிருப்பின் மேற்படி வேண்டுகோளை விடுத்த வரின் விபரங்கள் யாவையென்பதையும்;

(ii) மேற்படி வேண்டுகோள் கடிதம் யாதென்ப தையும்;

(iii) தேசிய தொலைக்காட்சியினால் மேற்படி நாடாக்கள் அல்லது இறுவட்டுகளை விடுவிப்ப தற்கு அதிகாரம் வழங்கிய உத்தியோகத்தரின் பெயர் மற்றும் பதவி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Mass Media and Information:

(a) Will he inform this House -

(i) whether arrangements have been made to provide the Carlton Sports Network (CSN) with cassettes or CDs belonging to the National Television, which contain recordings of sports events;

(ii) if so, the reasons for providing, them as mentioned above;

(iii) of the basis on which such cassettes or hard discs were provided; and

(iv) of the amount of money paid by the Carlton Sports Network to the National Television for obtaining those cassettes?

(b) Will he submit to this House -

(i) if the Carlton Sports Network has made a request to obtain those cassettes or hard discs, the details of persons who made that request;

(ii) the letter relevant to the aforesaid request; and

(iii) the name and the designation of the officer who gave permission for the aforesaid cassettes and hard discs to be released by the National Television?

(c) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(ආ) (i) කාල්ටන් ක්‍රීඩා නාලිකාවේ ක්‍රීඩා අධ්‍යක්ෂ ගිහාන් සමරනායක මහතා විසින් ඉල්ලීමක් කර ඇත.

(ii) එම ලිපිය 2011.08.04 වන දින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නිශාන්ත උබේවංශ මහතා වෙත එවා ඇත. රූපවාහිනී සංස්ථාව සතු පටිගත හා සංරක්ෂිත ක්‍රීඩා වැඩසටහන්වලින් තෝරා ගත් සමහරක දර්ශන පිටපත් ලබා දෙන ලෙස ඒ මඟින් ඉල්ලා තිබේ.

(iii) ජාතික රූපවාහිනිය විසින් කාල්ටන් ක්‍රීඩා නාලිකාව වෙත කැසට් පට හෝ දෘඪ තැටි නිදහස් කිරීමක් සිදු කර නොමැත.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා සිටින කාලයේ නොවෙයි මේක සිද්ධ වුණේ. ඒ ලිපියේ පිටපතක් මා ළඟ තිබෙනවා. එක එක්කෙනා ගහපු notes තිබෙනවා. ඒ notes වල තිබෙනවා, මේක වහාම ලබා දෙන්න කියලා. මම ඔබතුමාට ඒ ලිපියේ පිටපතක් දෙන්නම්. ඊට පස්සේ මම මේ සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කළා, අනෙක් ආයතනවලටත් මේක දෙන්නය කියලා.

අනෙකුත් රූපවාහිනී ආයතන තිබෙනවා. එහෙම නම් 1980 ගණන්වල ඉඳලා තිබෙන රූප රාමු ගන්න ඒ ගොල්ලන්ටත් මේ වාගේ අයිතියක් තිබිය යුතුයි. නමුත් ඒ ආයතනවලට සාමාන්‍යයෙන් ඒවා දෙන්නේ නැහැ. ඒවා සංරක්ෂිතව තබා ගෙන ඉන්නවා. නමුත්, ඒ නිලධාරින් මේ ලිපියට අනුව කාල්ටන් ආයතනයට විතරක් ඒවා දෙන්න ලක ලෑහැස්ති වෙලා තිබුණා. නමුත්, මම ලිපියක් යවලා යාන්තම් ඒක නතර කර ගන්න හැකියාව ලැබුණා. ගරු ඇමතිතුමනි, එම අයිතිය දෙනවා නම් කරුණාකරලා හැම රූපවාහිනී ආයතනයකටම දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. සාමාන්‍යයෙන් ජාතික රූපවාහිනියේ තිබෙන සංකරක්ෂිත දර්ශන වෙනත් ආයතනවලට දෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, නමුත් කිසිම ගෙවීමකින් තොරව එම දර්ශන දෙන්න කටයුතු කළ ලිඛිත තොරතුරු සාක්ෂි වශයෙන් මගේ ළඟ තිබෙනවා. කොහොම හරි ඒක නතර වුණා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමනි, ඒ විස්තර මේකේ පැහැදිලිව තිබෙනවා. ගරු කථානායකතුමනි, එහෙම ලබා දීලා නැහැයි කියන එක බොහොම පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා කියන්නේ ලබා දීමට සූදානමක් තිබුණාය, minutes තිබෙනවාය කියලා. ඒකේ අවසාන minute එකේ දෙන්න එපාය කියා සඳහන් කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කාල්ටන් එක සම්බන්ධව මම තව අහන්නම්. අද ඇවිල්ලා තිබෙන්නේ කාල්ටන් දවසක්. එම ආයතනය මඟින් විකාශනය කළ,-[බාධා කිරීමක්] සියලුම ක්‍රීඩාවන් විකාශනය කරන්න හොඳ නාලිකාවක් විධියට තමයි CSN නාලිකාව සඳහන් කරලා තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, මම ගිය සතියේ දවසක පාන්දර 5ට විතර නැඟිටලා ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා ක්‍රිකට් match එක බැලුවා. එක පාරටම match එකේ රූප රාමු නැති වුණා. CSN නාලිකාවේ රූප පේන්නේ නැති වුණා. විකාශනය නතර වෙලා. ඕස්ට්‍රේලියාවේ match එක ගහනවා, මෙහේ පේන්නේ නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)

මෙතුමා බොරුවට නිදි මරලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කාල්ටන් කියන එකේ තේරුම ඒකද? එහේ match එක ගහන කොට මෙහේ පේන්නේ නැති එකද? What has happened to Carlton Sports Network? ඇත්තටම එහේ ගහන එක මෙහේ පේන්නේ නැති එකද කාල්ටන් එකට වෙන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

කොයි වෙලාවේද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු කථානායකතුමනි, කාල්ටන් එකට වෙන්නේ එහේ ගහනවා මෙහේ පේන්නේ නැති එකද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු මන්ත්‍රීතුමනි, පාන්දරද ඕක වුණේ?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පාන්දර 5ට match එක පටන් ගන්නේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඇන්ටෙනා එක වැඩ කරන්නේ නැතිව ඇති, check කරලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මොකක්ද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔබතුමාගේ ඇන්ටෙනා එක වැඩ කරන්නේ නැතිව ඇති, check කරලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ඒ වෙලාවට ඇන්ටෙනා එක හොඳට වැඩ කරනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

පෙළක් අයගේ ඒවා පාන්දරට වැඩ කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

පාන්දර 5ට ඇන්ටෙනා එක හොඳට වැඩ කරනවා. පාන්දර 5ට කාල්ටන් එකේ ඇන්ටෙනා එක වැඩ කළේ නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

එක්කෝ ඒක වැඩ කරලා වැඩියි. ඒ නිසා දැන් වැඩ කරන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි, උත්තරය දුන්නා. මොකක්ද වැඩ කරන්නේ නැහැ කියලා කිව්වානේ. දැන් තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පාන්දර 5ට කාල්ටන් එකේ ඇන්ටෙනා එක,-

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
කරුණාකරලා ඇන්ටෙනා එක check කරලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඇන්ටෙනා එක check කරලා බලන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ ඇන්ටෙනා එක වැඩ කරපු නිසා තමයි අර කොහේද ගිහිල්ලා කඩාගෙන වැටුණේ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒක වැඩ කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ පැත්තෙන් මේ පැත්තට පනින්න ගිහිල්ලා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඔබතුමාගේ මිතුරන්, මිතුරියන් ඒකට සාක්ෂි දරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි, ඒ ඇන්ටෙනාව හොඳට වැඩ කළා නම් ඔය වාගේ තත්ත්වයක් වෙන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒවා අවශ්‍ය නැහැ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
අවේලාවේ match බලන්න එපා. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඉක්මනට ප්‍රශ්න අහන්න. නියමිත වේලාවක් තිබෙනවානේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පිදුරුතලාගල පිහිටි සම්ප්‍රේෂණ කුලුන කාල්ටන් ආයතනයට දීලා තිබෙනවා. ඔබතුමන්ලාගේ රූපවාහිනී සංස්ථාවට අයත් කුලුනු ටික කාල්ටන් ආයතනයටත් පාවිච්චි කරන්න ඉඩ දීලා තිබෙනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ආයතන ගණනාවක් විසින් පාවිච්චි කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැහැ.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
නැත්තේ මොකද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙන මොන ආයතනවලටද දීලා තිබෙන්නේ? තව ආයතනයක නමක් කියන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
මම ඒ විස්තරය දෙන්නම්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඉතින් කියන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඔබතුමා අහන විධියට කියන්න මම සූදානම් නැහැ. ඔබතුමා කවුද, "කියන්න, කියන්න" කියලා මගෙන් අහන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්නය අහන්න. ප්‍රශ්නය කෙටියෙන් අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කලබල වෙන්න එපා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
අනිකුත් නාලිකාවලට ලබා දීලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මාධ්‍ය ඇමතිතුමා විධියට, - මාධ්‍ය ඇමතිතුමා මේ පිළිබඳව දැන ගන්න වුවමනායි නේ, ගරු කථානායකතුමනි.- මොන ආයතනවලට ද දීලා තිබෙන්නේ කියලා එතුමාට කරුණාකරලා කියන්න කියලා මා ගෞරවයෙන් ඉල්ලනවා.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
ඒ නාලිකා සියල්ල පිළිබඳව විස්තරයක් තිබෙනවා. ඒක දෙන්නම්. විශාල විස්තරයක් තිබෙනවා. අලුතින් දාපු tower එකෙන් ඔක්කොටම දීලා තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙන වෙන නාලිකා ගැන ඔය කියන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 11-2221/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன )
(The Hon. Lasantha Alagiyawanna)
ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ඉතාලියට සහ මැලේසියාවට යවන ලද ශ්‍රී ලාංකිකයන් : රැකියා
## இத்தாலி மற்றும் மலேசியாவுக்கு அனுப்பப்பட்ட இலங்கையர்: வேலைவாய்ப்பு
## SRI LANKANS SENT TO ITALY AND MALAYSIA : EMPLOYMENT

1849/'11

**12. ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2004 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ එක් එක් වර්ෂයේ දී රජය විසින් ඉතාලිය සහ මැලේසියාව යන රටවලට රැකියා සඳහා යවන ලද ශ්‍රී ලාංකිකයින්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) ඉතාලියට සහ මැලේසියාවට පුද්ගලයින් යැවීමේ දී ඒ සඳහා පාදක කරගත් නිර්ණායකය කවරේද;

(iii) එම රටවල රැකියාවක් ලබා දීම සඳහා එක් පුද්ගලයෙකුගෙන් අයකරගත් මුදල කොපමණද;

(iv) ඉහත කී රටවලට රජය විසින් යවන ලද පුද්ගලයෙකුගේ රැකියාවට අදාළ ගිවිසුමේ කාල සීමාව කොපමණද;

(v) එම රටවල රැකියාවක නියුතු පුද්ගලයෙකුගේ සාමාන්‍ය වැටුප කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தினால் 2004ஆம் ஆண்டு முதல் இற்றைவரை வேலைவாய்ப்புகளுக்காக இத்தாலி, மலேசியா ஆகிய நாடுகளுக்கு அனுப்பிவைக்கப்பட்டுள்ள இலங்கையர்களின் எண்ணிக்கையை வருட வாரியாகவும்;

(ii) இத்தாலி, மலேசியா ஆகிய நாடுகளுக்கு நபர்களை அனுப்புவதன் மூலப்பிரமாணங்களையும்;

(iii) அந்நாடுகளில் வேலை ஒன்றை வழங்குவதற்கு ஒவ்வொரு நபரிடமும் இருந்து அறவிடப்பட்டுள்ள தொகையையும்;

(iv) அரசாங்கத்தினால் மேற்படி நாடுகளுக்கு அனுப்பி வைக்கப்பட்டுள்ள நபர் ஒருவரினது வேலை ஒப்பந்தத்திற்கான கால அளவையும்;

(v) அந்நாடுகளில் தொழில்புரியும் நபர் ஒருவரின் சராசரி வேதனத்தையும்

அவர் கூறுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Employment Promotion and Welfare:

(a) Will he state -

(i) the number of Sri Lankans that have been sent to Italy and Malaysia for employments by the Government from 2004 to date on per year basis;

(ii) the criteria in sending the people to Italy and Malaysia;

(iii) the amount that has been charged from each person to provide a job in those countries;

(iv) the duration of a job contract of a person sent by the Government to aforesaid countries; and

(v) the average salary of a person working in those countries?

(b) If not, why?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா )
(The Hon. Dilan Perera)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| වසර | මැලේසියාවේ රැකියා සඳහා පිටත් වූ ලාංකිකයින් සංඛ්‍යාව | | | | ඉතාලියේ රැකියා සඳහා පිටත් වූ ලාංකිකයින් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය මගින් | වෙනත් ඒජන්සි ආයතන මගින් | ස්වයං ලියාපදිංචි මගින් | එකතුව | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය මගින් | වෙනත් ඒජන්සි ආයතන මගින් | ස්වයං ලියාපදිංචි මගින් | එකතුව |
| 2004 | 0 | 153 | 82 | 235 | 4 | 0 | 12 | 16 |
| 2005 | 0 | 1021 | 147 | 1168 | 0 | 0 | 64 | 64 |
| 2006 | 0 | 3421 | 163 | 3584 | 0 | 0 | 7 | 7 |
| 2007 | 0 | 817 | 226 | 1043 | 0 | 0 | 24 | 24 |
| 2008 | 0 | 857 | 436 | 1293 | 0 | 0 | 17 | 17 |
| 2009 | 11 | 544 | 495 | 1050 | 0 | 0 | 22 | 22 |
| 2010 | 60 | 3021 | 609 | 3690 | 0 | 0 | 15 | 15 |
| 2011 | 28 | 1843 | 590 | 2461 | 0 | 0 | 15 | 15 |
| එකතුව | 99 | 11677 | 2748 | 14524 | 4 | 0 | 176 | 180 |

(ii) 1. තානාපති කාර්යාලවලින් පරීක්ෂා කර සහතික කරන ලද රැකියා ඇණවුමක් ලබා තිබීම;

2. දේශීය රැකියා නියෝජිත ආයතනවල ඇති වලංගුභාවය පරීක්ෂා කිරීම;

3. විදේශ රැකියා ඇණවුමෙහි ඇති සේවා හා කොන්දේසි කාර්යාංශයේ නීති රීතිවලට අනුකූල වීම;

4. දේශීය රැකියා නියෝජිත ආයතනවල ඇති පෙර පැමිණිලි පරීක්ෂා කර බැලීම;

5. විදේශ රැකියා ඒජන්ත අසාදු ලේඛනගත වී ඇති දැයි පරීක්ෂා කිරීම;

6. විදේශ රැකියා ඇණවුමෙහි වැටුප් කාර්යාංශයේ අනුමත වැටුප්වලට වඩා අඩු නොවීම.

(iii) ඉතාලි රට සඳහා 2004 සහ 2009 වසර සඳහා පමණක් ඒජන්සි ආයතනවලින් අනුමැතිය ලබා ඇති අතර එම කාල වකවානුවෙහි ඒජන්සි ආයතන සඳහා අනුමත අය කිරීමක් කාර්යාංශයෙන් ලබා දී නොමැත.

මැලේසියා රටට ගෘහ සේවිකා සඳහා අය කිරීමක් නොමැත. අනෙකුත් රැකියාවන් සඳහා ඔවුන්ගේ වැටුප, කොන්ත්‍රාත් කාලය, විනිමය අනුපාතය සලකා බලා එම අගයෙන් සියයට 10ක ප්‍රමාණය ඔවුන්ගේ අනුමත අය කිරීම ලෙස සැලකේ.

(iv) ඉතාලි රට සඳහා රජය විසින් යවන ලද පුද්ගලයෙකුගේ රැකියාවට අදාළ ගිවිසුමේ කාල සීමාව වසර 02ක් පමණ වේ.

මැලේසියා රට සඳහා රජය විසින් යවන ලද පුද්ගලයෙකුගේ රැකියාවට අදාළ ගිවිසුමේ කාල සීමාව වසර 02ත්, 03ත් පමණ වේ.

(v) ඉතාලි රටෙහි රැකියාවක නියුතු පුද්ගලයෙකුගේ සාමාන්‍ය වැටුප යූරෝ 375ක් පමණ ද,

මැලේසියානු රටෙහි රැකියාවක නියුතු පුද්ගලයෙකුගේ සාමාන්‍ය වැටුප මැලේසියානු රිගිට් 850ක් පමණ වේ.

(ආ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඉතාලියට සහ මැලේසියාවට කී දෙනෙක් දැනට ගිහිල්ලා තිබෙනවාද කියලා කියන්න පුළුවන්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මන්ත්‍රීතුමනි, 2004 ඉඳලා 2011 දක්වාම මැලේසියාවට ගිහිල්ලා තිබෙන්නේ 14,524 දෙනායි. ඒකෙන් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය මඟින්, ඒ කියන්නේ ආණ්ඩුවට අයිති ආයතනය මඟින් ගිහිල්ලා තිබෙන්නේ 99 දෙනායි. වෙනත් රැකියා ඒජන්සි ආයතන මඟින් මැලේසියා රැකියා සඳහා පිටත් වූ සංඛ්‍යාව 11,677යි. ඒජන්සි ආයතනයෙන් තොරව, ස්වයං ලියා පදිංචි මඟින් මැලේසියා රටට ගොස් තිබෙන ලාංකිකයින් සංඛ්‍යාව 2,748යි. 2004 ඉඳලා 2011 දක්වාම ඉතාලියේ රැකියා සඳහා පිටත් වූ සම්පූර්ණ ලාංකිකයින් සංඛ්‍යාව 180යි.

එයින් ස්වයංව ගිහින් තිබෙන්නේ 176යි. 4 දෙනෙකු ශ්‍රී ලංකා ආණ්ඩුවට අයිති ඒජන්සි ආයතනය මඟින්. වෙනත් ඒජන්සි ආයතනවලින් කවුරුත් ගිහින් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා ටිකක් ඕනෑකමින් එතැන වෙනසක් කරන්න බලාපොරොත්තුවෙන් සිටින ඇමතිවරයෙක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

Thank you.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ පිරිසිදු කර ගෙන යන ගමනේදී ඔබතුමාට පෙනිලා තිබෙනවාද, -ඉතාලියේ අය කරන ගාස්තු තුළින්- රක්ෂාව සඳහා යන පුද්ගලයින්ට ඒ වාගේ වරප්‍රසාදයක් ලැබෙනවා කියලා? අපි දැකලා තිබෙනවා, ප්‍රශ්නයක් ඇති වෙලා තානාපති කාර්යාලයට ගියාම හුඟ දෙනෙකුට මොනවත් ලැබෙන්නේ නැහැ කියලා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ඉතාලිය ගැන කියන්නට ඕනෑ. ඉතාලියට යන ක්‍රමය පිළිබඳව විශාල ප්‍රශ්න තිබුණ නිසා පසු ගිය අවුරුද්දේ, -ඉතාලි රටේ ප්‍රශ්න තිබියදීත්- අපට හැකියාව ලැබුණා, ඉතාලියේ කම්කරු ඇමතිතුමාත් සමඟ ඉතාලියට ශ්‍රී ලාංකිකයින්

රැකියා සඳහා පිටත් කර හැරීම සම්බන්ධයෙන් ආණ්ඩු දෙක අතර ගිවිසුමක් අත්සන් කරන්නට. ඒ ගිවිසුමෙන් පසුව දැන් ආණ්ඩු දෙක අතර සාකච්ඡා කෙරෙනවා. ඒ අයගේ කම්කරු දෙපාර්තමේන්තුවත් -ලැබ්රෝ එකත්- අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයත් එකතු වෙලා දැන් යාන්ත්‍රණයක් හදනවා, -ආණ්ඩු දෙක අතර අත්සන් කළ ගිවිසුම හරහා- ශතයක්වත් සල්ලි ගන්නේ නැතිව ඉතාලියට රැකියා සඳහා පිටත් කර හැරීමට. ඔබතුමා දන්නවා මේ දවස්වල ඉතාලියේ යම් ආකාරයක ආර්ථික ප්‍රශ්නයක් තිබෙන බව. ඒ නිසා ඒ යාන්ත්‍රණය නිර්මාණය වෙමින් පවතින්නේ බොහොම හෙමින්. ගරු මන්ත්‍රීතුමනි, මැලේසියාව සම්බන්ධයෙන් තත්ත්වය ඔබතුමා කියන තත්ත්වයට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කියන පරිදි මේ අවුරුදු 6ට ඉතාලියට ගිහින් තිබෙන්නේ 180යි. ඊට වැඩිය බෝට්ටුවේ ගිහින් තිබෙනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ඒ නිසා තමයි පසු ගිය අවුරුද්දේ ආණ්ඩු දෙක අතර මේ අවබෝධතා ගිවිසුම අත්සන් කළේ. එතකොට යන කාට වුණත් බෝට්ටුවලින් යන්නේ නැතිව, ලොරිවලින් යන්නේ නැතිව ක්‍රමානුකූලව යන්න සූදානම් කරන්න පුළුවන්. මැලේසියාව සම්බන්ධයෙන් ඔබතුමා කියන කාරණයේ යම් සත්‍යයක් තිබෙනවා. මැලේසියාවේ අපට තිබෙන රැකියා අවස්ථාවන් ලබා ගැනීම සඳහා අපි මැලේසියාවත් සමඟ මීට අවුරුදු ගණනාවකට පෙර අත්සන් කළ අවබෝධතා ගිවිසුම නැවත සංශෝධනයට ලක් කළ යුතුයි කියලා මම ගිය අවුරුද්දේ මැලේසියාවට ගියාම විදේශ ශ්‍රමිකයින් සම්බන්ධයෙන් කටයුතු කරන ඒ රටේ නියෝජ්‍ය ඇමතිවරියට කිව්වා. එතුමියත් පිළිගත්තා එය සංශෝධනයට ලක් කරන්නේ නැතිව මැලේසියාවට රැකියා සඳහා යන ශ්‍රී ලාංකිකයින්ගේ රැකියා තත්ත්වය ආරක්ෂා කිරීමත් ඒ වාගේම පුහුණු ශ්‍රමිකයින් යැවීමත් අපහසුයි කියලා. ඒ නිසා අපි උත්සාහ කරනවා මේ අවුරුද්දේ මැලේසියාව සමඟ දැනට අත්සන් කර තිබෙන අවබෝධතා ගිවිසුමේ ඇති කරන සංශෝධනයක් හරහා - විශේෂයෙන් දැනට සිංගප්පූරුවේ expansion එක ඉඩ මදි නිසා, මැලේසියාවේ කොටසකට එවැනි expansion එකක් එනවා.- ලක්ෂ 10ක පමණ අලුත් රැකියා ප්‍රමාණයක් එහේ නිර්මාණය වෙන්න තිබෙනවා. ඒ රැකියා ප්‍රමාණය සඳහා අපේ පුහුණු ශ්‍රමිකයින්ට අවස්ථාව ලබා ගන්නට අපි කල්පනා කරනවා. මැලේසියාව සමඟ අත්සන් කරන අවබෝධතා ගිවිසුමෙන් අපට ඒ හැකියාව ලැබෙයි.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

වෙලාව ගතවෙනවා. ගරු මන්ත්‍රීතුමා, දැන් වෙලාව පස් වරු 2.00යි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම කෙටියෙන් අහන්නම් ගරු කථානායකතුමනි. මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. යම් රටක් තම රට වැසියන් විදේශ සේවයට යවන්නේ ඒ රටේ සේවා නියුක්තිය අඩුවෙන් තිබෙන අවස්ථාවකයි. ගරු ඇමතිතුමනි, නමුත් දැන් ඔබතුමන්ලා දැනුවත් කර තිබෙනවා ලංකාවේ විරැකියාව සියයට 6ට, 4ට අඩු වෙලා තිබෙනවා කියලා. මා එය පිළිගන්නේ නැහැ. පිට රට රැකියාවලට යන එක අඩු කරන්න ඇමතිතුමා වශයෙන් ඔබතුමාට හරි, ආණ්ඩුවට හරි බැරිද? අපේ රටේ ශ්‍රමය පිට රටවලට ගිහින් ඒ රටවල් සංවර්ධනය වන කොට මේ රටේ සංවර්ධනය ඇණ හිටීම පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙනවා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මන්ත්‍රීතුමා, රැකියා වර්ග අනුව වෙනසක් තිබෙනවා. මේ වන කොට මැද පෙරදිග රටවල වාගේ රටවල ගෙවන වැටුපට අපේ රටෙන් රැකියා සොයා ගන්න බැරි තත්ත්වයක් තිබෙනවා. ඒ, ඔබතුමා ඔය කියපු කාරණය, එනම් මේ රටේ රැකියා බොහෝ ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබීම කියන කාරණය නිසයි.

හැබැයි සමහර රැකියා තිබෙනවා අපේ රටේ ගෙවන වැටුපට වඩා වැඩිපුර වැටුපක් පිට රටවලදී ගෙවන. උදාහරණයක් හැටියට ඒ රටවල ගෘහ සේවිකා වාගේ රැකියාවලට කරන ගෙවීම අපේ රටේ ගෙවනවාට වඩා වැඩියි. මම උත්සාහ කරනවා විවිධ රෙගුලාසි දමලා ගෘහ සේවිකාවන් හැටියට පිට රට යන එක අධෛර්යයට පත් කරන්න. ඒ නිසාම ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට ගිය අවුරුද්දේ තමයි පිට රට රැකියාවලට ගිය කාන්තාවන්ට වඩා පිරිමි ප්‍රමාණය වැඩි වුණේ. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවටයි එවැන්නක් සිදු වුණේ. විදේශ සේවයට ගිය සංඛ්‍යාවෙන් සියයට 51ක් ගියේ පිරිමි. සියයට 49ක් වුණා කාන්තාවන්ගේ ප්‍රමාණය. හැබැයි විදේශ සේවයට යන කාන්තාවන්ගේ ගොඩෙනුත් වැඩි පුර යන්නේ ගෘහ සේවිකාවන් විධියටයි. හේතුව මේකයි. ගෘහ සේවිකාවන් හැටියට පිට රට යන අයට තිබෙන සුදුසුකම් අනුව ඔවුන් ලංකාවේ හිටියත් කිසිම රැකියාවක් කරන්න බැහැ.

ගරු මන්ත්‍රීතුමනි, ඒ අය පුහුණුවට යැව්වාම, ඒ අයට අරාබි භාෂාව පුහුණු කරවන කොට අපට තේරුම් ගිහින් තිබෙනවා අරාබි භාෂාව පුහුණු කරන්න පෙර ඒ අයගෙන් සමහර අයට තමාගේ මවු භාෂාව උගන්වන්න ඕනෑ කියා. ඒ අය සිංහල නම් සිංහල භාෂාව උගන්වන්න ඕනෑ; දෙමළ නම් දෙමළ භාෂාව උගන්වන්න ඕනෑ. තමන්ගේ මවු භාෂාවවත් ලියන්න බැරි, කථා කරන්න බැරි උදවිය තමයි සමහර වෙලාවට ඒ රැකියාවලට යන්නේ. එවැනි අය ලංකාවේ සිටියා නම් ලංකාවේදී වෙනත් රැකියාවක් සොයා ගන්න කොහෙත්ම බැරි තත්ත්වයකුත් තිබෙනවා. එවැනි රැකියාවලට යන කොට එය නැවැත්වීම වුණත් අපට එහෙමපිටින් කරන්න බැහැ. හේතුව, ඒ අය බොහෝ විට යන්නේ ඒ අයට තිබෙන දැනුම සහ ඒ අයට තිබෙන-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ගෘහ සේවිකාවන් විධියට තමයි සියයට 85ක් යන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් ඇති.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මා තවත් එක අතුරු ප්‍රශ්නයක් අහනවා ගරු කථානායකතුමනි. ගෘහ සේවිකාවන් විධියට තමයි සියයට 85ක්, 90ක් පමණ යන්නේ. ඒ කියන්නේ කිසිම පළපුරුද්දක් නැති-

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

දැන් විදේශ රැකියාවලට යන අයගෙන් සියයට 49ක් යන්නේ කාන්තාවන්. සියයට 51ක් පිරිමි. ඒ සියයට 49ක් වූ කාන්තාවන්ගේ ගොඩෙන් සියයට 85ක් තවම යන්නේ ගෘහ සේවිකාවන් විධියට තමයි. ඒ කාරණය හරි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, රිසානා නෆීක් සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත් වෙලා කටයුතු කර තිබෙනවා. අද පත්තරවල ඇය ගැන වාර්තා වෙලා තිබෙනවා; පරස්පර මතයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එක වෙලාවක කියනවා 'ඔව්' කියලා. අද කියනවා "Imminent hanging will take place" කියා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු මන්ත්‍රීතුමා, මේක විදේශ කටයුතු අමාත්‍යාංශයට අදාළ වුණත් මා ඒ කාරණය පැහැර හරින්නේ නැහැ. මොකද, අපේ අමාත්‍යාංශය යටතේ ලියා පදිංචි වෙලා ගිය කෙනෙක් නිසා. මේ පිළිබඳව මමත් අවසාන වශයෙන් දැක්කේ ලංකාවේ සෞදි අරාබියේ තානාපතිතුමා ගිය සතියේ පුවත් පත්වලට කරපු ප්‍රකාශයක් තුළිනුයි. එතුමා තමයි සෞදි අරාබියේ රජතුමා නියෝජනය කරන ලංකාවේ තානාපතිතුමා. එතුමා ඒ සම්බන්ධයෙන් පුවත් පත්වලට කියා තිබුණා. සෑම පුවත් පතකම පළ වුණා, රිසානා සහෝදරියගේ නිදහස් වීම පිළිබඳව බොහොම සාධනීය ආකාරයට අපි බලාපොරොත්තු වන තත්ත්වයට තිබෙනවා කියලා. ඒ එක්කම website එකක තවත් වාර්තාවක් මා දැක්කා. මේ තත්ත්වයට ප්‍රතිවිරුද්ධ වාර්තාවක් තමයි එහි පළ වෙලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එහි සත්‍ය කථාන්දරය මෙයයි. රිසානා සහෝදරියට අධිකරණවලින් දෙවරක් මරණ දඬුවම නියම වෙලා තිබෙනවා. හැබැයි ඒ මරණ දඬුවම ක්‍රියාත්මක නොකර රිසානාට සමාව දීම බලාපොරොත්තුවෙන් රජය, ජනාධිපතිතුමා, විරුද්ධ පක්ෂයේ තමුන්නාන්සේලා, ඒ රටේ චීන තානාපතිතුමා, යුරෝපීය රටවල තානාපතිවරුන්, අපේ තානාපති කාර්යාල වෙන වෙනම එකහ වෙලා කාලයක් තිස්සේ කරපු ඉල්ලීම් සියල්ලම නිසා තමයි ඒ සහෝදරියගේ මරණ දඬුවම ක්‍රියාත්මක නොවී තවමත් ඇය බන්ධනාගාරගතව ඉන්නේ. අපි තවමත් බලාපොරොත්තු වනවා, අපේ ශ්‍රී ලංකාවේ ඉන්න සෞදි තානාපතිතුමා ප්‍රකාශ කළ විධියටම ඒ සාධනීය තත්ත්වයන් තවත් වර්ධනය වෙමින් ඒ සහෝදරියට සමාව ලබා ගන්න හැකි වේවි කියලා. [බාධා කිරීමක්] කොහොමටත් පාර්ලිමේන්තුව තමයි උත්තරීතර.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දැන් කාලය අවසන් වෙලායි තිබෙන්නේ.

## ඉන්දියානු සමාගමකට ලබා දුන් වරාය අධිකාරියේ ගුදම : විස්තර

## இந்தியக் கம்பனிக்கு வழங்கிய துறைமுக அதிகாரசபைக் களஞ்சியசாலை : விபரம்

## WAREHOUSE OF SRI LANKA PORTS AUTHORITY GIVEN TO INDIAN COMPANY : DETAILS

1940/'11

**13. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ භාණ්ඩ ගබඩා කිරීමට වෙන් කර තිබූ ගුදම් අංක 04 මන්නාරමේ තෙල් කැණීමේ නිරත ඉන්දියානු සමාගමකට ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගුදම ඉන්දියානු සමාගමට ලබා දීමට හේතු කවරේද;

(ii) එය ලබා දී ඇති පදනම කවරේද;

(iii) එම ගුදම ඉන්දියානු සමාගමකට ලබා දීමෙන් අපේක්ෂිත ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) இலங்கை துறைமுக அதிகார சபையில் பொருட்களை களஞ்சியப்படுத்துவதற்கென ஒதுக்கப்பட்டிருந்த 04ஆம் இலக்க களஞ்சியசாலை மன்னாரில் எண்ணெய் அகழ்வில் ஈடுபட்டுள்ள ஓர் இந்தியக் கம்பனிக்கு வழங்கப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இக்களஞ்சியசாலை இந்தியக் கம்பனிக்கு வழங்கப்பட்டமைக்கான காரணங்கள் யாவை;

(ii) இது எந்த அடிப்படையில் வழங்கப்பட்டுள்ளது;

(iii) இக் களஞ்சியசாலை இந்தியக் கம்பனியொன்றுக்கு வழங்கப்பட்டதன் மூலம் எதிர்பார்க்கப்படும் வருமானம் யாது

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Is he aware that the warehouse No. 04 that had been allocated for the storage of items of the Sri Lanka Ports Authority has been provided to an Indian company engaged in oil excavation in Mannar?

(b) Will he inform this House -

(i) the reasons for providing that warehouse to the Indian company ;

(ii) the basis on which it has been provided ; and

(iii) the income expected through the provision of that warehouse to the Indian company?

(c) If not, why?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

ගරු කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්, කොළඹ වරායේ බණ්ඩාරනායක ජැටියේ පිහිටි අංක 04 ගුදම නොව අංක 02 දරන ගුදමෙහි කොටසක් කෙටි කාලීන පදනමක් මත තෙල් ගවේෂණ කටයුතුවල යෙදෙන සමාගමකට බදු දී ඇත.

(ආ) (i) මන්නාරම් බොක්කේ තෙල් ගවේෂණ කටයුතු සඳහා එම සමාගමට අවශ්‍ය උපකරණ ද්‍රව්‍ය හා සේවා සැපයුම් සම්පාදනයට පහසුකම් සැලසීම සඳහාය.

(ii) බිම් කුලී පදනම මත හා 2012 අගෝස්තු 01 දින සිට මාස 12ක කාලයකට.

(iii) අපේක්ෂිත මාසික ආදායම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 23,242.20

(ඇ) පැන නොනඟී.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. නැව් මඟින් ලංකාවට ගෙනැවිත් වරාය තුළදීම වෙන් කරන භාණ්ඩ ගබඩා කරන්න, සුනාමි අවස්ථාවේදී සුනාමි භාණ්ඩ ගබඩා කරන්න, ඇතැම් අවස්ථාවලදී යුද උපකරණ ගබඩා කරන්න පාවිච්චි කළ මේ ගුදම දැන් මේ විධියට බදු දුන්නාම මෙවැනි ගබඩා පහසුකම් සඳහා විකල්ප ස්ථාන සහ විකල්ප වැඩ පිළිවෙළක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට තිබෙනවාද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු කථානායකතුමනි, මේ ගුදම් සංකීර්ණය අපි දැඩි ලෙස පාවිච්චි කළේ යුද්ධය පැවැති කාල වකවානුව තුළ උතුරට ගෙන යෑම සඳහා හමුදාවේ සොල්දාදුවන්ට, නිලධාරින්ට අවශ්‍ය කරන දේවල් ගබඩා කිරීමට සහ ඒ සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළටයි.

එයින් පසුව, ඒ කියන්නේ 2009 වර්ෂයෙන් පස්සේ මේ ගුදම් සංකීර්ණය පාවිච්චි කළේ නැහැ. පාවිච්චි කරන්නට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. ඔබතුමා කියන අනෙකුත් කටයුතුවලට අවශ්‍ය ගුදම් තිබෙනවා. මේක අප බදු දුන්නේ ජාතික අවශ්‍යතාවකට ඉල්ලන නිසායි. ඒ තාවකාලික බදු දීම තුළින් අපට යම් ආදායමකුත් ලැබෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ගුදම් සංකීර්ණයේ බදු දුන් කොටස මේ සමාගම් පාවිච්චි කරන්නේ පරිපාලන කටයුතු සඳහා පමණක් ද, එසේ නැත්නම් ඔවුනුත් පරිපාලන කටයුතුවලින් එහා ගිය විවිධ ගබඩා කිරීම් සඳහා, වෙනත් කටයුතු සඳහා පාවිච්චි කරනවා ද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ගරු කථානායකතුමනි, මන්නාරම් බොක්කේ තමයි මේ තෙල් ගවේෂණ කටයුතු කරන්නේ. විශේෂයෙන් ඒ කටයුතුවලට වරායක් අවශ්‍යයි. ඔවුන්ගේ ද්‍රව්‍ය, උපකරණ සියල්ල ආරක්ෂිතව රඳවා තබා ගැනීමට තමයි මෙය පාවිච්චි කරන්නේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ගුදම බදු දුන් කාල සීමාව තව දීර්ඝ කරන්න රජය බලාපොරොත්තු වෙනවා ද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)

ඒ අය අපෙන් ඉල්ලීමක් කළා, 2012 අගෝස්තු මාසයේ 01 වන දා සිට තව වසරකට බදු කාල සීමාව දීර්ඝ කර දෙන්නටය කියා. ලබන අවුරුද්දේ අගෝස්තු මාසය වන තුරු අප ඒ කාල සීමාව දීර්ඝ කර දී තිබෙනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ප්‍රශ්න අංක 15-2222/'12-(2), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

දෙවන වටය.

## රජය සතු පෞද්ගලික සමාගම් : විස්තර
அரசாங்கத்துக்குரிய தனியார் கம்பனிகள்: விபரம்
PRIVATE COMPANIES OWNED BY GOVERNMENT : DETAILS

1986/'11

**14. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக )
(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara )

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4) :

(අ) (i) මේ වන විට රජය සතු පෞද්ගලික සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම් සහ ඒවා අදාළ වන අමාත්‍යාංශය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

[ගරු ජෝන් අමරතුංග මහතා]

(iv) එම එක් එක් සමාගම්වල ශ්‍රී ලංකා රජය සතු කොටස්වල ප්‍රතිශතය සහ පෞද්ගලික අංශය විසින් ආයෝජනය කර ඇති කොටස්වල ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික ආයෝජකයින්ගේ නම් සහ ලිපිනයන් එක් එක් සමාගම අනුව කවරේද;

(vi) එම එක් එක් සමාගම 2009 සහ 2010 වර්ෂවලදී ලබා ඇති ශුද්ධ ලාභය හෝ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தற்போது அரசாங்கத்துக்குச் சொந்தமாகவுள்ள தனியார் கம்பனிகளின் எண்ணிக்கை எத்தனையென்பதையும்,

(ii) இக்கம்பனிகளின் பெயர்களும் அவை உரியதாகவுள்ள அமைச்சுக்களும் தனித்தனியாக யாவையென்பதையும்,

(iii) ஒவ்வொரு கம்பனியினதும் பணிப்பாளர் சபை அங்கத்தவர்களின் பெயர்களும் முகவரிகளும் யாவையென்பதையும்,

(iv) மேற்படி ஒவ்வொரு கம்பனியிலும் இலங்கை அரசாங்கத்துக்குச் சொந்தமாகவுள்ள பங்குகளின் சதவீதம் மற்றும் தனியார் துறையினால் முதலீடு செய்யப்பட்டுள்ள பங்குகளின் சதவீதம் தனித்தனியாக எவ்வளவு என்பதையும்,

(v) தனியார் முதலீட்டாளர்களின் பெயர்களும் முகவரிகளும் ஒவ்வொரு கம்பனிவாரியாக யாவையென்பதையும்,

(vi) மேற்படி ஒவ்வொரு கம்பனியும் 2009 மற்றும் 2010 ஆம் ஆண்டுகளில் பெற்றுள்ள தேறிய இலாபம் அல்லது நட்டம் தனித்தனியாக எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல் ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he state -

(i) the number of private companies owned by the Government at present;

(ii) separately, the names of those companies and the relevant ministries;

(iii) the names and the addresses of the members of the Board of Directors of each of the companies;

(iv) separately, the percentage of the shares owned by the Government and the percentage of the shares owned by the private sector in each of the aforesaid companies;

(v) the names and the addresses of the private investors who have invested money in each of the companies; and

(vi) separately, the net profit earned or the loss incurred by each of the aforesaid companies in the years 2009 and 2010?

(b) If not, why?

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| |
|---|
| රජය සතු කොටස් අයිතිය 50% ට වැඩි සමාගම් 42කි. විස්තර ඇමුණුම 1*, II* සහ III* හි සඳහන් වේ. |
| (රජය සතු කොටස් අයිතිය 50%ට අඩු සමාගම් 48) |

(ii) ඇමුණුම 1හි (i) හා (ii) යටතේ සඳහන් වේ.

(iii) ඇමුණුම II හි සඳහන් වේ.

(iv) ඇමුණුම 1හි (iii) හා (iv) යටතේ සඳහන් වේ.

(v) ඇමුණුම IIIහි සඳහන් වේ.

(vi) ඇමුණුම 1හි (v) යටතේ සඳහන් වේ. ඇමුණුම් 1, II සහ III ඉදිරිපත් කරමි.

ඇමුණුම් පුස්තකාලයේ තබා ඇත.

(ආ) පැන නොනගී.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ටෙන්ඩර් කැඳවීමකින් තොරව මිනරල් අළෙවි කිරීම
### கேள்வி கோரப்படாது கனியப்பொருள் விற்பனை
### SALE OF MINERALS WITHOUT ADHERING TO TENDER PROCEDURES

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 23/2 යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මම බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ටෙන්ඩර් කැඳවීමකින් තොරව පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාව සතුව පවතින මිනරල් මෙට්‍රික්ටොන් 65,000ක් අළෙවි කිරීම සම්බන්ධව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවනවා.

මෙම මිනරල් තොගයේ අද මිල ගණන් අනුව මුළු වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 25ත්-26ත් අතර වනවා. අද පවතින මේ මිල ඉදිරියේදී වැඩි වීමට පුළුවන්. වෙළෙඳ පොළ තත්ත්වය අනුව මෙම මිල ගණන් වෙනස් වනුයේ චීන සමාගම්වල ඉල්ලීමට අනුවයි. චීන සමාගම් තව තව වැඩිපුර ඉල්ලුවොත් මෙම මිල ඉහළ යාමට ඉඩ තිබෙනවා.

කඩිනම් කැබිනට් අනුමැතිය ලබා ගෙන මෙම ඛනිජ වැලි තොගය විකිණීමට යන්නේ, ඔවුන්ගේ තැරැව්කාර සමාගම වන Gold Medal Consortium (Pvt.) Limited මාර්ගයෙන් මෙට්‍රික්ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 400-450ත් අතර ගණනකටයි. දැනටමත් මොවුන් විසින් චීනයේ සමාගම්වලට ඔවුන්ගේ තැරැව්කාර සමාගම් හරහා ටෙන්ඩර් පටිපාටියෙන් තොරව මේ මිල ගණන්වලට විකිණීමට අයදුම් කර තිබෙනවා. තවම ඔබතුමන්ලා අනුමැතිය දී නැහැ.

BOI ව්‍යාපෘතියක් යනුවෙන් රවටා මේ ඛනිජ වැලි තොගය මුළුමනින්ම චීනයට විකිණීමට ටෙන්ඩර් පටිපාටියෙන් තොරව දැනටමත් චීන සමාගම්වලින් අයදුම් කර තිබෙනවා. ඔවුන් විසින් මේ වටිනා ඛනිජ වැලි තොගය ඉවත දමන වැලි යනුවෙන් රජය නොමඟ යවා Gold Medal Consortium ආයතනය ඉල්ලන මිලට දීමට යෝජනා කර තිබෙනවා. ඒ සඳහා පසු ගිය බ්‍රහස්පතින්දා ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව මා සතුව තිබෙනවා. එක්තරා අමාත්‍යවරයකු විසින් ඒකට නිර්දේශ අවශ්‍යයි කිව්වා. ඒ විද්‍යාත්මක කටයුතු ජ්‍යෙෂ්ඨ අමාත්‍යතුමායි. ඒ නිසා හෙට දිනයේ ඒ කැබිනට් පත්‍රිකාව නැවත කැබිනට් මණ්ඩලයට ගෙන ඒමට නියමිතව තිබෙනවා. එකතු කළ වටිනාකම ගැනීම ටෙන්ඩර් පටිපාටියෙන් තොරව කළ නොහැකියි. මෙම ඉල්ලීම අනුමත වුවහොත් Gold Medal Consortium ආයතනය ඉල්ලන මිලට ඉදිරියේදී වරින් වර අඩු මිලට මේ තොගය විකිණීමට සිදු වෙනවා.

මෙම ඛනිජ වැලි මෙට්‍රික් ටොන් 65,000 ඉතා වටිනා ඛනිජ වැලි බව කියන්නට කැමැතියි. මේ තොගයේ ilmenite, zircon, rutile වැනි ඉතා වටිනා මිනරල් වැඩිම ප්‍රතිශතයක් තිබෙනවා. ඒ බව පුල්මුඩේ ඛනිජ වැලි රසායනාගාරයේ පරීක්ෂණ වාර්තාවලින් සනාථ වෙනවා. ඒ Test Report මා ළඟ තිබෙනවා. පරීක්ෂණ වාර්තා අනුව මේවා ඉතාමත් පිරිසිදු ඛනිජ වැලි කියලා අනුමත කර තිබෙනවා. තමුන්නාන්සේලා අද මේවා හඳුන්වන්නේ කසළ වැලි කියලායි. මෙම වටිනා ඛනිජ වැලි තොගයේ නියම වටිනාකම ගැනීමට නම් ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීමක් කරන්න ඕනෑ. එහෙම කළොත් මෙහි ඇත්ත වටිනාකම සොයා ගන්න පුළුවන්.

මෙම ඛනිජ වැලි තොගයෙන් මෙට්‍රික් ටොන් 10,000ක් පසු ගිය 2012 නොවැම්බර් මාසයේ මෙට්‍රික් ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 394.30 බැගින් ටෙන්ඩර් මඟින් විකුණා තිබෙනවා. මෙම ඛනිජ වැලි තොගයෙන් මෙට්‍රික් ටොන් 20,000ක් පසු ගිය ජූලි මාසයේ මෙට්‍රික්ටොන් එකක් ඇමෙරිකානු ඩොලර් 539කට ටෙන්ඩරයක් ලැබුණා. මේ අය විසින් එම මිල සඳහා ටෙන්ඩරය දුන් ආයතනයෙන් කොමිස් මුදලක් ඉල්ලා තිබෙනවා. මෙය ඉතා වගකීමෙන් කියන්නේ. මුළු ටෙන්ඩරයේ වටිනාකම මෙට්‍රික් ටොන් 20,000ක් සඳහා එකවර මුළු මුදලට ණයවර ලිපි යැවීමට අයදුම් කළත් එය අවලංගු කර ඔවුන්ගේ රුපියල් මිලියන 60ක තැන්පත් මුදලක් රාජ සන්තක කළා. මේක තමයි තමුන්නාන්සේලා ගත් තීරණය. රටට ඉතාමත්ම වාසි සහගත ගනුදෙනුවක් අත්හැරියා.

ඊළඟට මෙම non-magnetic minerals වෙන් කිරීමේ හා titanium සෑදීමේ කර්මාන්තශාලාවක් චීනය සමඟ ලංකාවේ පටන් ගැනීමට සූදානම් කියන මුවාවෙන් තමයි මේක දෙන්න හදන්නේ. හැබැයි ගරු කථානායකතුමනි, ඒ සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 200කට වඩා වැඩි මුදලක් යනවා. නමුත් BOI එකට ඉදිරිපත් කරන ලද ඔවුන්ගේ අයැදුම් පත්‍රයේ ඔවුන්ගේ ආයෝජන මුදල පිළිබඳ කිසිදු ආකාරයකින් සඳහන් කරලා නැහැ. ඒ නිසා මේ එකතු කළ අගය මත කර්මාන්තශාලාවක් ගොඩ නැඟීමට යනවා කියන එක මිථ්‍යාවක්; අසත්‍යයක්. ඒ සඳහා මේ ආයතනය සතුව සල්ලි නැහැ. අවුරුද්දක කාලයක සිට මේ වටිනා minerals තොගය, මෙට්‍රික් ටොන් 65,000ක් ටෙන්ඩර් නොකර එකතු කළේත් මේ සැලසුම සූදානමින් තිබූ නිසායි. එය පුල්මුඩේ කර්මාන්තශාලාවේ සියලු දෙනා දන්නා කාරණයක්. ජනතාව නොමඟ යැවීමට මෙම minerals තොගය දැන් ඉවත දමන ලද වැලි කියලා නම් කළත් පසු ගිය ටෙන්ඩර් දෙකටම මේ මෙට්‍රික්ටොන් 65,000ම නම් කර තිබුණේ Hi-Ti non-magnetic Heavy Minerals යනුවෙනි. ඉතාමත් වටිනා minerals කියලායි තමුන්නාන්සේලා කලින් මේ ටෙන්ඩරය දැම්මේ. අද කියනවා කසළ වැලි කියලා. එහෙම වෙන්නේ කොහොමද? දැන් මේ අය සූදානම් වනුයේ, ඉවත දමන වැලි නමින් නම් කර, විනිවිදභාවයකින් තොරව විටින් විට අඩු කළ මිල ගණන් වෙළෙඳ පොළ මිල ගණන් නමින් දක්වා ටෙන්ඩර් පටිපාටියෙන් තොරව අතරමැදි ආයතනය සමඟ චීන සමාගමකට විකුණා දැමීමටයි. ඒ සඳහා තමයි කැබිනට් පත්‍රිකාව තමුන්නාන්සේ ගිය සතියේ දැම්මේ. ඒක තමුන්නාන්සේ දැන ගෙන හිටියාද කියලා මා දන්නේ නැහැ. කැබිනට් පත්‍රිකාවේ තමුන්නාන්සේගේ අත්සන තිබෙනවා. හෙට ඒක ඒමට නියමිතව තිබෙනවා. ඒක ඔබතුමා හැදූ එකක්ද කියන්න මා දන්නේ නැහැ. මට ලැබී තිබෙන තොරතුරු අනුව එහෙම නොවෙයි කියලා මා හිතනවා.

මෙම තත්ත්වය තුළ මතු වන පහත ගැටලු කෙරෙහි විෂය භාර අමාත්‍යවරයා පිළිතුරු ලබා දෙනු ඇතැයි මා අපේක්ෂා කරනවා. කොහොම වුණත් ගරු ඇමතිතුමනි, ඔබතුමා විෂය භාර අමාත්‍යතුමායි. ඉතින් කවුරු මොනවා කළත් ඔබතුමාට උත්තර දෙන්න වෙනවා. මේ ගනුදෙනුව ඇත්තටම කරන්නේ කවුද කියලාත් අපි හොඳින් දන්නවා. එහි සභාපතිවරයකු පත් නොකොට එම ආයතනය ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු හරහා මෙහෙයවන්නේ ඇයි කියලාත් අපි දන්නවා. පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාවට තවම සභාපතිවරයකු පත් කරලා නැහැ. හැබැයි ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු හැටියට ඉන්නවා, ඉතාමත් ළපටි කොලු ගැටයෙක්.

ගරු කථානායකතුමනි, මේක තමයි ඇත්ත කථාව. මේ පිළිබඳව ගරු ඇමතිතුමා මේ ගරු සභාවට පිළිතුරු දෙන්න ඕනෑ.

01. ටෙන්ඩර් කැඳවීමකින් තොරව මෙම mineral තොගය අළෙවි කිරීමට තීරණය කළේ ඇයි?

02. මීට පෙර අළෙවියන් හා සංසන්දනය කරන විට සිදු වන පාඩුව ගණනය කර තිබේද?

03. මේ සඳහා කැබිනට් මණ්ඩලය ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාව අනුමත කොට තිබේද?

04. කැබිනට් මණ්ඩලයට මෙම කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීමට පෙර පුල්මුඩේ ඛනිජ වැලි සංස්ථාවේ සිටින අධ්‍යක්ෂ මණ්ඩලය හරහා මෙම කැබිනට් පත්‍රිකාව අනුමත කළාද? එහෙම නැතිව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වුවාට පසුව අධ්‍යක්ෂ මණ්ඩලයට මෙම කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළාට පස්සේ පසු ගිය සිකුරාදා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කළාද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා (රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறித திசேரா - அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Dayasritha Thissera - Minister of State Resources and Enterprise Development)

ගරු කථානායකතුමනි, ටෙන්ඩර් කැඳවීමකින් තොරව අළෙවි කිරීමට තීරණය කළේ ඇයි කියලා ගරු මන්ත්‍රීතුමා නැඟූ ප්‍රශ්නවල ඇහුවා. නමුත් ටෙන්ඩර් කැඳවනවාද, නැද්ද කියලා තවම අපි තීන්දුවක් අරගෙන නැහැ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

කැබිනට් පත්‍රිකාවේ ඒක දාලා-

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

මම උත්තර දෙන්නම්. කරුණාකර මට උත්තර දෙන්න අවස්ථාව ලබා දෙන්න.

ඒ එක්කම ඔබතුමා දෙවනුව අසා තිබෙනවා මීට පෙර අළෙවියන් හා සංසන්දනය කරන විට සිදු වන පාඩුව කොපමණද කියලා. ඒ ගැන තීන්දුවක් ගන්න බැහැනේ. ඒ වාගේම මේ සඳහා කැබිනට් තීරණයක් ගෙන තිබේද කියා ඔබතුමා අසා තිබෙනවා. ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් යොමු කර තිබෙනවා. ඒ කැබිනට් පත්‍රිකාවේ තීරණය අනුවයි මම අමාත්‍යාංශය තුළ කටයුතු කරන්නේ. ඒ ප්‍රශ්න තුන තමයි ඔබතුමා අසා තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ගත්තාද?

**ගරු දයාශ්‍රිත තිසේරා මහතා**
(மாண்புமிகு தயாசிறித திஸேரா)
(The Hon. Dayasritha Thissera)

මේක unsolicited යෝජනාවක් හැටියට ආපු එකක්. ඒ අනුව මේ යෝජනාව මම SCARC එකටත්, BOI එකටත් ඉදිරිපත් කෙරුවා. ඒ අනුව BOI එකෙනුත්, SCARC එකෙනුත් අපට යොමු කර තිබෙනවා ආයතනයට පාඩු නොවන ආකාරයට, වෙළෙඳ පොළ තුළ යන මිල ගණන් අනුව මේ ව්‍යාපෘතිය සඳහා අපේ ආයතනය තුළ තිබෙන වැලි ලබා දෙන්න කියලා.

ඒ අනුව මට මේ ගැන තීන්දුවක් ගන්න බැරි නිසා, මේ සඳහා ගත යුතු පියවර කුමක්ද කියන එක ගැන විමසන්න අපේ රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 444.1 වගන්තිය යටතේ මම මේක Cabinet එකට ඉදිරිපත් කළා. මේ වැලි තොගය ලබා දෙන්නේ කෙසේද කියලා මට තවම Cabinet එකෙන් තීරණයක් දීලා නැහැ. මේවා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරලා දෙනවාද, නැත්නම් ටෙන්ඩර් පටිපාටියෙන් තොරව දෙනවාද කියන තීරණය මට තවම ලැබිලා නැහැ.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා බොහොම විශ්වාසයක් ඇතිව තමයි මට මේ අමාත්‍යාංශය භාර දීලා තිබෙන්නේ. මම මේ අමාත්‍යාංශය භාර ගන්න කොට, මේ ආයතනය රුපියල් මිලියන 280ක ලාභයක් තමයි ලැබුවේ. මේ වර්ෂ දෙක ඇතුළත මේ ආයතනය මිලියන 2,000ත් ඉක්මවා භාණ්ඩාගාරය වෙත මුදල් ලබා දීමට කටයුතු කර තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ අප ජාත්‍යන්තර ටෙන්ඩර් පටිපාටිය දක්වා ගිහින් තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම semi-projectsවලට අයින් කරන non-magnetic අබලි වැලි හැටියට තමයි මේවා හඳුන්වන්නේ. ඒකට හේතුව මේකයි. ඔබතුමා කිව්වා වාගේ මේවා තුළ rutile සහ zircon කියන වටිනා අමු ද්‍රව්‍ය අඩංගු වෙලා තිබෙනවා. අප මේ අමාත්‍යාංශය භාර අරගෙන මේ ආයතනය හරහා මේ කටයුතු කර ගෙන යද්දී ඩොලර් 30ට, 50ට තමයි මේ වැලි විකිණිලා තිබෙන්නේ. නමුත් පසු ගිය දිනවල අප ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කළා. ඔබතුමා කිව්වා වාගේ මේ වැලි 539ට ගියා. ඒ ගැණුම්කරු ආවේ නැහැ. කවුරුත් එහෙම අල්ලසක් නම් ඉල්ලුවේ නැහැ. ඒ ප්‍රකාශය කරුණාකර ඉල්ලා අස් කර ගන්න කියන්න. අප එහෙම අල්ලස් ඉල්ලන්නේ නැහැ. මේ වැලි 539ට ඉල්ලුවා. දෙවැනි ඉල්ලුම්කරු 489ටත් ඉල්ලා තිබෙනවා. නමුත් ඒ දෙන්නාම ආවේ නැහැ. මොකද ඒ කාලය තුළ වෙළෙඳ පොළේ වැටීමක් ඇති වුණා. නොවැම්බර් මාසයේ ඒ ටෙන්ඩරය යද්දී වෙළෙඳ පොළේ වැටීමක් ඇති වුණු නිසා මේ ඉල්ලුම්කරුවන් ආවේ නැහැ. ඉන් පසු අප නැවත මෙට්‍රික් ටොන් 10,000ක් ටෙන්ඩර් කළා. ඒක 394කට මිල වුණා. ඒ ඉල්ලුම්කරු ඒක ගත්තා. ඒ අනුව මේ ආපු ආයෝජකයා ඒ මිල අනුව අපෙන් මේක ඉල්ලුවා. ඒ නිසා මේකට අපට තීන්දුවක් ගන්න බැහැ. [බාධා කිරීමක්] අප BOI එකෙන්, SCARC එකෙන් විමසුවාම ආපු පිළිතුර ගැන මම සෑහීමකට පත් වුණේ නැහැ. ඒ නිසා මම කිව්වා, "මේක Cabinet එකට ඉදිරිපත් කරලා එහිදී ගන්න තීන්දුව අනුව අපි කටයුතු කරමු" කියලා.

ඒ අනුව කටයුතු කිරීමට තමයි මම බලා ගෙන ඉන්නේ. මම හිතන හැටියට හෙට Cabinet එකේදී ඒ සඳහා පිළිතුරක් ලැබේවි. ඒ අනුව ආයතනයට, රටට හානියක් නොවන ආකාරයට මේ ආයතනය රැක ගන්නවාය කියන -[බාධා කිරීමක්] එහෙම වෙන එකක් නැහැ. Cabinet එක තුළ ගන්න තීන්දුව හොඳ තීන්දුවක් වෙයි කියන මතය තුළ තමයි මම ඉන්නේ. BOI එකෙන්, SCARC එකෙන් ආපු තීරණය අනුව මට තීන්දුවක් ගන්න අපහසුයි. ඒ නිසා Cabinet එකෙන් ලැබෙන තීන්දුව අනුව මම කටයුතු කරනවා. ඒ තීන්දුවත් හොඳ තීන්දුවක් වෙයි කියලා මම හිතනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

බොහොම ස්තුතියි ගරු ඇමතිතුමනි.

මීළඟට අමාත්‍යාංශ නිවේදන. ගරු රවුෆ් හකීම් මහතා.

## නීති විද්‍යාල ප්‍රවේශය - 2013 : අධිකරණ අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## சட்டக் கல்லூரி அனுமதி 2013 : நீதி அமைச்சரினது கூற்று
## LAW COLLEGE ENTRANCE 2013 : STATEMENT BY MINISTER OF JUSTICE

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Speaker, I wish to make a Ministerial Statement regarding the controversy relating to the Law College Entrance Examination.

2013 වසර සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නිකුත් වීමෙන් අනතුරුව සිවිල් සංවිධාන ගණනාවක් සහ එක් දේශපාලන පක්ෂයක් මාධ්‍ය වෙත අදහස් දක්වමින් නීති විද්‍යාල ප්‍රවේශ විභාගය පැවැත්වූ ආකාරය පිළිබඳව හා අවසන් ප්‍රතිඵලය සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල කරමින් ප්‍රකාශ නිකුත් කරන ලදී. ඉන් අනතුරුව මෙම සංවිධාන තවත් ශිෂ්‍ය සංවිධාන කීපයක් හා එකතුව විවිධ උද්ඝෝෂණ හා පෙළපාළි සංවිධානය කරමින් සිටිති.

මාධ්‍ය වාර්තාවලට අනුව මෙම වසරේ නීති විද්‍යාල ප්‍රවේශය සඳහා මුස්ලිම් ජාතික සිසුන් 78 දෙනෙකු තේරී පත් වීම අසාමාන්‍ය කරුණක් ලෙස මෙම විරෝධතා හා උද්ඝෝෂණ පවත්වන සංවිධාන ප්‍රකාශ කර සිටිති. තවදුරටත් ඔවුන් ප්‍රකාශ කරන්නේ මෙම ප්‍රවේශ විභාගයේදී ඉහළින්ම සමත් වී ඇති සිසුන් තිදෙනාම මුස්ලිම් ජාතිකයන් වීමත්, නීති විද්‍යාලය සඳහා තෝරාගෙන ඇති පළමු සිසුන් 50 දෙනා අතරට මුස්ලිම් ජාතිකයන් 28 දෙනෙක් තේරී පත්ව සිටීමත් නිසා නීති ප්‍රවේශ විභාගය පිළිබඳව ඇති සැකය තවදුරටත් වර්ධනය වන බවකි.

මුල් අවස්ථාවල පැවැත් වූ විරෝධතා සහ උද්ඝෝෂණවලදී මතු කළ එක් ප්‍රධාන චෝදනාවක් වූයේ නීති විද්‍යාල ප්‍රවේශ විභාග ප්‍රශ්න පත්‍ර ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම සඳහා කටයුතු කළ ඇතැම් පුද්ගලයන් එම ප්‍රශ්න පත්‍රය මුස්ලිම් ජාතික විභාග අපේක්ෂකයන් වෙත කලින්ම ලබා දීම හේතුවෙන් එම විභාග අපේක්ෂකයන්ට විශේෂ වාසි සහගත තත්ත්වයක් ලැබී තිබූ බවත්, එම නිසා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍ය විභාග අපේක්ෂකයන්ට බරපතළ අසාධාරණයක් සිදු වූ බවත් ය. මුස්ලිම් ජාතික විභාග අපේක්ෂකයන් 78 දෙනෙකු නීති විද්‍යාලයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලබා තිබීම සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යවරයා ලෙස මා වෙතද විවිධාකාරයේ චෝදනා එල්ල කරන ලදී. මෙහිදී විශේෂයෙන් මතු කරනු ලැබූ කරුණක් වූයේ, අධිකරණ අමාත්‍යවරයා ලෙස මා විසින් නීති විද්‍යාල ප්‍රවේශ විභාගය පැවැත්වීම සහ ඉන් පසු සිදු වූ ක්‍රියාවලියේදී අනිසි මැදිහත්වීමක් සිදු කර මුස්ලිම් ජාතික විභාග අපේක්ෂකයන් වෙත විශේෂ සැලකිල්ලක් දක්වා ඇති බවයි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කළමනාකරණය සහ පරිපාලන කටයුතු මෙහෙයවනු ලබන්නේ නීති අධ්‍යාපන පනත යටතේ පත් කරනු ලබන නීති අධ්‍යාපන සභාව මඟිනි. මෙම සභාවේ සභාපති ධුරය සඳහා නිල බලයෙන් අග්‍ර විනිශ්චයකාරවරයා පත් වෙන අතර එහි සෙසු සාමාජිකයන් වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙක්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, නීතිපතිතුමා, සොලිසිටර් ජනරාල්තුමා, ශ්‍රී ලංකා නීති සංගමය නම් කරනු ලබන දෙදෙනෙක් සහ අධිකරණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් වේ.

ඉහත සඳහන් පනතේ විධිවිධානවලට අනුව අධිකරණ අමාත්‍ය ධුරය හොබවන තැනැත්තාට නීති විද්‍යාලයේ කටයුතු සම්බන්ධයෙන් මැදිහත් වීමට ඇති අවස්ථා ඉතාම අල්ප වේ. ඒ අතර, නීති අධ්‍යාපන සභාවේ අධ්‍යක්ෂවරුන් නම් කිරීම එම සභාව විසින් පනවනු ලබන රීති සඳහා එකඟත්වය ලබා දීම සහ එම රීති අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත යොමු කිරීම සඳහන් කළ හැක. එම කරුණුවලට පරිබාහිරව අධිකරණ අමාත්‍යවරයාට නීති විද්‍යාලයේ දෛනික කටයුතුවලට හෝ වෙනත් විශේෂ කටයුතු සඳහා මැදිහත් වීමට කිසිදු අවස්ථාවක් නැත.

නීති අධ්‍යාපනය ශ්‍රී ලංකා සිසුන් අතරේ ජනප්‍රිය වීමත් සමඟම නීති විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් පත් විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් වීම නිසා 2000 වසරේ සිට නීති විද්‍යාල ප්‍රවේශ විභාගය පැවැත්වීමේ කාර්යය විභාග දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. නීති විද්‍යාල ප්‍රවේශ විභාගය පැවැත්වීමේදී නීති විද්‍යාලය කිසිදු මැදිහත් වීමක් සිදු නොකරන අතර, විභාගය පැවැත්වීමෙන් අනතුරුව විභාග දෙපාර්තමේන්තුව විසින් සමස්ත ප්‍රතිඵලය නීති විද්‍යාලය වෙත දන්වා යවනු ලැබේ. එම ප්‍රතිඵල ලැබීමෙන් පසු නීති අධ්‍යාපන සභාව රැස් වී අදාළ වසර සඳහා කොපමණ සිසුන් සංඛ්‍යාවක් ඇතුළත් කර ගන්නේද යන කාරණයත්, ඒ සඳහා අවශ්‍ය කඩඉම් ලකුණු සංඛ්‍යාව කොපමණද යන්නත් තීරණය කරනු ලබයි. ඉන් අනතුරුව නීති විද්‍යාලය විසින් එකී තීරණය විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා යවනු ලබන අතර, විභාග දෙපාර්තමේන්තුව විසින් එම නිර්ණායකයන්ට අනුකූලව නීති විද්‍යාලයට ප්‍රවේශ වීමට සුදුසුකම් ලබන සිසුන්ගේ ලැයිස්තුවක් නීති විද්‍යාලයට එවනු ලබයි. ඉන් අනතුරුව නීති විද්‍යාලය විසින් නීති විද්‍යාලයට අතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ සිසුන් වෙත ලිඛිතව දන්වා යවනු ලැබේ.

නීති විද්‍යාලයේ ප්‍රවේශ විභාගය පිළිබඳව පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය සම්බන්ධයෙන් මේ වන විටත් නීති අධ්‍යාපන සභාව, නීති විද්‍යාලයේ විදුහල්පති සහ විභාග කොමසාරිස්වරයා මාධ්‍ය වෙත ප්‍රකාශ නිකුත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ නීති ප්‍රවේශ විභාගය නිසි පරිදි රහසිගත ආකාරයෙන් පවත්වා ප්‍රතිඵල නිකුත් කර ඇති බවයි. විභාග කොමසාරිස්වරයා මේ සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ නීති ප්‍රවේශ විභාග ප්‍රශ්න පත්‍රය සැකසීම, උත්තර පත්‍ර ඇගයීම් සහ ලකුණු ලබා දීම විභාග පැවැත්වීමේ සම්මත ක්‍රමය අනුව විනිවිදභාවයකින් යුතුව සිදු කර ඇති බවයි. විවිධ සිවිල් සංවිධාන විසින් එම වසරේ නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල ජාතිවාදී ස්වභාවයෙන් විග්‍රහ කිරීමට පෙලඹීම කනගාටුදායක කරුණක් බව සඳහන් කරන්නට කැමැත්තෙමි.

මේ අයුරින් මුස්ලිම් ජාතික අපේක්ෂකයන් 78 දෙනෙකු නීති විද්‍යාල ප්‍රවේශ විභාගය සමත්වීම කෙරෙහි විභාගය පැවැත්වීමේ අක්‍රමිකතාවක් සිදු වූයේද නැතහොත් එම විභාග අපේක්ෂකයන්ගේ දක්ෂතාව මත සිදු වූයේද යන්න පිළිබඳව ගැඹුරින් සලකා බැලීම සුදුසු යැයි සිතමි. නමුත් මේ වන විටත් අදාළ බලධාරින්, එනම් නීති අධ්‍යාපන සභාව, නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා සහ විභාග කොමසාරිස්තුමා නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ විශ්වාසනීයභාවය පිළිබඳව කරුණු ඉදිරිපත් කර ඇති බැවින් මෙම ප්‍රශ්නය හුදෙක් මුස්ලිම් ජාතික අපේක්ෂකයන් වැඩි පිරිසක් සමත් වීම නිසාම පමණක් සැකයට භාජන නොකළ යුතු බව මාගේ විශ්වාසයයි. මේ අර්බුදය මතු වීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් මම විවිධ පාර්ශ්වයන් හමු වී සාකච්ඡා කර තොරතුරු ලබා ගතිමි. මෙහිදී අනාවරණ වූ එක් කරුණක් වනුයේ 2009 වසර වන තෙක් දෙමළ මාධ්‍යයෙන් ඉදිරිපත් වන විභාග අපේක්ෂකයන්ගේ පහසුව සඳහා නීති විද්‍යාලය විසින් නිකුත් කරන ලද අත් පොතේ පරිවර්තන කටයුතුවලදී වැරදි ගණනාවක් තිබූ බවත්, එම නිසා දෙමළ මාධ්‍යයෙන් ප්‍රවේශ විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ට බලවත් ප්‍රශ්න ගණනාවකට මුහුණ දීමට සිදු වූ බවත්, පසුව ඒ පිළිබඳව නීතිඥවරුන් පිරිසක් කරුණු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම අත් පොත නිවැරදි කරන ලද බවත්ය. තවද මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වනු ලැබූ නීතිඥවරුන් පිරිසක් විසින් නීති විද්‍යාල ප්‍රවේශ විභාගයට දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටීමට සූදානම් වන අය සඳහා උපකාරක පන්ති ගණනාවක් ප්‍රධාන නගර කීපයකම පවත්වන ලද අතර, ඒ හා සමගාමීව නීති විද්‍යාල අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් දක්වන පිරිස් දැනුවත් කිරීමේ ව්‍යාපාරයක්ද සිදු කරන ලදී. මේ හේතුවෙන් 2009 වර්ෂයෙන් පසු නීති අධ්‍යාපනය සඳහා දෙමළ මාධ්‍යයෙන් පෙනී සිටීමට ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ සංඛ්‍යාවේ වර්ධනයක් සිදු වූ බව පැහැදිලි වේ.

අවසාන වශයෙන්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ සියලු දෙනාටම අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම අවස්ථා ලබා දීම මූලික ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන ඇති හෙයින් නීති අධ්‍යාපනය සම්බන්ධයෙන්ද මෙතෙක් පැවැති ආකාරයටම සියලු දෙනා වෙනුවෙන් විවෘත බවත්, සියලු දෙනාටම කිසිදු භේදයකින් වෙන් කර සැලකීමකින් තොරව අවස්ථාව ලබා දීමට ඉදිරියටත් කටයුතු කරන බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

Thank you.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු ඇමතිතුමා අවධානය යොමු කළේ, මේ වන විට සමාජයේ විශාල ආන්දෝලනයකට තුඩු දීලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙන්. අද මා දැක්කා, විභාග කොමසාරිස්තුමා ප්‍රකාශයක් කරලා තිබෙනවා, නීති විද්‍යාලයේ විදුහල්පතිතුමා ඉල්ලීමක් කරනවා නම් මේ පිළිබඳ නැවත සමීක්ෂණයක් පවත්වන්න විභාග කොමසාරිස්වරයා සූදානම් කියලා. මේ ප්‍රශ්නය අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජාතිකත්ව අතර ගැටුමක් නිර්මාණය කිරීම දක්වා තල්ලු වෙන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳව ඉතා හොඳින් අවධානය යොමු කරලා මේ පාර්ලිමේන්තුව තුළ විවෘත සංවාදයක් ඇති කර ගන්න අපට පුළුවන් නම් වඩාත් හොඳයි. මොකද, අවුරුදු 30ක යුද්ධයකින් බැටකාපු ජනතාවක් අපි. ඒ නිසා එවැනි කවර හෝ ජාතිකත්වයන් අතර තවත් ගැටුමක් නිර්මාණය කිරීම කිසි සේත්ම යෝග්‍ය වන්නේ නැහැ. ඒ නිසා මේ පිළිබඳ සත්‍යතාව මේ පාර්ලිමේන්තුව තුළ කෙරෙන විවාදයකින් තහවුරු කර ගත යුතුයි කියලා ඉල්ලනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ කල් තැබීමේ විවාදයක්වත් පැවැත් විය යුතුයි කියලා මා යෝජනා කරනවා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 6.30 දක්වා විය යුතුය. අ.භා. 2.00ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### එක්සත් මුස්ලිම් උම්මාහ් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஐக்கிய முஸ்லிம் உம்மா (கூட்டிணைத்தல்) சட்டமூலம்
### UNITED MUSLIM UMMAH (INCORPORATION) BILL

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the United Muslim Uammah."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the* Minister of Social Services *for report.*

### ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### ஸ்ரீ லங்கா ஹிரா பௌன்டேஷன் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SRI LANKA HIRA FOUNDATION (INCORPORATION) BILL

**ගරු හුනෙයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
I move,

"That leave be granted to introduce a Bill to incorporate the Sri Lanka Hira Foundation."

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත සමාජ සේවා අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5) இன்படி சமூக சேவைகள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 47(5), to the* Minister of Social Services *for report.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

## ගංවතුරින් විපතට පත් වූවන්ට සහන
## வெள்ளத்தினால் பாதிக்கப்பட்டோருக்கு நிவாரணம்
## RELIEF FOR FLOOD VICTIMS

[අ.භා. 2.30]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමාට මා මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා, මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්.

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මාස කිහිපයකට පෙර ශ්‍රී ලංකාව දැඩි නියඟයකට මුහුණ දුන්නේය. අද වන විට අපි රට පුරා පවතින ගංවතුර තත්ත්වයකට මුහුණ දී සිටිමු. එවැනි උපද්‍රවයන්ට මුහුණපාන ජනතාවට සහන සැලසීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිහිටුවනු ලැබීය. මේ වන විට මිලියන එකකට අධික ජනතාව ගංවතුරෙන් පීඩාවට පත්ව ඇති අතර, 3,50,000ක් පමණ දෙනාට උන්හිටි තැන් අහිමි වී ඇත. එසේ පීඩාවට පත් සියලුම ජනතාවට අවශ්‍ය උපකාර සහ පහසුකම් ලබා දී ඇති බව හැඟෙන තත්ත්වයක් රූපවාහිනිය හරහා නිර්මාණය කරනු ලැබුවද, රජය හෝ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් එසේ අසරණ වූ ජනතාවට ප්‍රයෝජනවත් ලෙස සහන සපයා දීමට අපොහොසත් වී තිබේ.

ගංවතුරෙන් විපතට පත් වූවන්ට සහන සැපයීම සඳහා අද වන විට ශ්‍රී ලංකා රුපියල් මිලියන 190ක ප්‍රතිපාදන වෙන් කර ඇති බව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ජනතාවට ප්‍රකාශ කරන නමුත් එක් දිනකට එක් පුද්ගලයකු වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් 10/-ක මුදලක්වත් වෙන් කර නොමැති බව එයින් අදහස් කෙරෙයි.

තම සහන සැපයීමේ කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාණවත් මුදලක් වෙන් කර දී නැති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති සමෘද්ධි නිලධාරින් සහ ග්‍රාම නිලධාරින් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන අතර, තාවකාලික සහන සපයා දීමට හැකි වන පරිදි අවම වශයෙන් ශ්‍රී ලංකා රුපියල් මිලියන 8,000 -10,000ක මුදලක් වහාම වෙන් කර දෙන ලෙස ඔවුහු ඉල්ලා සිටිති.

එබැවින්,

1. එවන් උපද්‍රව තත්ත්වයක් මෙහෙයවීමට අමාත්‍යාංශය පෙර සූදානමින් සිටියේද, එසේ නම් එය මෙහෙය වූයේ සහ සහන සපයා දුන්නේ කෙසේද ;
2. එක් පුද්ගලයකුට එක් දිනක් වෙනුවෙන් කොපමණ මුදලක් වෙන් කර සහ වැය කර තිබේද;
3. උන් හිටි තැන් අහිමි වූ පුද්ගලයින් සංඛ්‍යාව, දිවයින පුරා ගංවතුරෙන් පීඩාවට පත් වූ පුද්ගලයින් සංඛ්‍යාව සහ වාර්තා වූ මරණ සංඛ්‍යාව කවරේද;
4. දිවයිනපුරා ඇති වූ මෙම විනාශකාරී ගංවතුරෙන් සිදු වූ සමස්ත පාඩුව කොපමණද;
5. රටේ එවන් විනාශකාරී තත්ත්වයක් පැන නැඟී තිබියදී පවා රජය විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකිරීමට හේතුව කවරේද;

යන්න ගරු අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ යුතු යැයි මෙම ගරු සභාව යෝජනා කර සිටියි. "

මේ මොහොතේ රටේ උග්‍ර ස්වාභාවික ව්‍යසනකාරී ප්‍රශ්නයක් තමයි ඇති වෙලා තිබෙන්නේ. මීට මාස තුනක හතරකට ඉස්සෙල්ලා මේ රටේ දිස්ත්‍රික්ක කිහිපයකම අධික නියඟයක් තිබිලා, පසු ගිය දෙසැම්බර් මාසයේ සිට දිස්ත්‍රික්ක හත අටකට විතර බලපාන විධියට ඇති වුණ අධික වර්ෂාපතනයත් සමඟ අද ගංවතුර තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

මෙවැනි ආපදා තත්ත්වයන් ඇති වන නිසා තමයි, මීට අවුරුදු තුන හතරකට පෙර ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් ඇති කළේ. ගරු ඇමතිතුමනි, මම මුලින්ම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ඔබතුමාගේ අමාත්‍යාංශය මෙවැනි ආපදා තත්ත්වයන්වලට මුහුණ දීමට සූදානමින් සිටිනවාද කියලා. මම ඊට පසුව මතක් කර දෙන්න කැමැතියි, ඔබතුමාගේ අමාත්‍යාංශයේ තිබෙන දුර්වලතා ගැන. සමහර විට ඔබතුමා මෙම අමාත්‍යාංශය භාර ගන්න ඇත්තේ මෑතකදී වෙන්න පුළුවන්. ඒ නිසා ඉදිරියේදී ඔබතුමා කටයුතු කරන්න සූදානමින් ඉන්නේ කොහොමද කියන කාරණයත් මම අහන්න කැමැතියි.

මම මේ කියන අවස්ථාවේදී ප්‍රථමයෙන්ම ඔබතුමන්ලාගේ නිලධාරින් සමඟ ආපදාවලට ලක් වූ දිස්ත්‍රික්ක හතර, පහකට ගිහිල්ලා, ඒ ගම්මානවල ගෙයින් ගෙට ගමන් කරලා, ඒ තිබෙන ප්‍රායෝගික ප්‍රශ්න හඳුනා ගත්තා. කල් තැබීමේ යෝජනාවක් ගෙන ඒම තුළින් ඒ ගැටලු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ඕනෑය කියලා මා සිතුවා. ඒකෙන් ඇති වන වාසිය මොකක්ද? අද ලක්ෂ ගණනාවක අහිංසක ජනතාවක් මේ ගංවතුර උවදුරට ලක් වෙලා තිබෙනවා. රජයේ මාධ්‍ය තුළින් ගංවතුර උවදුරට ලක් වූ සංඛ්‍යාව ලක්ෂ තුනක්, හතරක් වනවාය කිව්වාට, මා දන්නා විධියට ලක්ෂ නවයක, දහයක විතර පිරිසකට -ලියා පදිංචි වුණු හා ලියා පදිංචි නොවුණු සංඛ්‍යාව- මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම ගංවතුරෙන් විනාශ වුණු නිවාස ගැනත් කියන්න ඕනෑ. අපි දන්නා විධියට නිවාස ලක්ෂ තුනක් විතර සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙනවා. සම්පූර්ණයෙන් විනාශ වෙලා නැතිනම් අඩු ගණනේ කොටසක් හෝ විනාශ වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් ගැනයි අද අපි මේ කථා කරන්නේ. ගරු ඇමතිතුමනි, අද උදේ ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් තොරතුරු -මේ ආපදා සම්බන්ධයෙන් කොතරම් මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවාද කියන තොරතුරු- ලබා දී තිබෙනවා.

ඇත්ත වශයෙන් මට පුදුම හිතුණා, නිල වශයෙන් අපට දුන්නු තොරතුරු සම්බන්ධයෙන්. දෙසැම්බර් මාසයේ 17වැනිදා සිට දෙසැම්බර් මාසයේ 31වැනිදා වන තෙක් රුපියල් මිලියන 87ක් - රුපියල් ලක්ෂ 870ක්- වෙන් කර තිබෙනවා. ජනවාරි මාසයේ පළමුවැනිදා ඉඳලා අද දක්වා රුපියල් මිලයන 70ක් -රුපියල් ලක්ෂ 700ක්- වෙන් කර තිබෙනවා. මම මීට පෙර මාධ්‍ය තුළින් දැන ගත්තේ රුපියල් මිලියන 150ක් විතර වෙන් කර තිබෙනවාය කියන එකයි. ඇත්ත වශයෙන්ම දැන් ඒක ස්ථිර වෙලා තිබෙනවා. මෙවැනි දරුණු ආපදා තත්ත්වයක් ඇති වෙලා තිබෙන කොට, ව්‍යසනයක් ඇති වෙලා තිබෙන කොට රුපියල් මිලියන 150කින් කරන්න පුළුවන් වන්නේ මොනවාද, ඇමතිතුමනි? ඒ නිසා මම ඔබතුමාගෙන් අහනවා, මීට පෙර මේ වාගේ තත්ත්වයන් ඇති වුණාම ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින්ම කටයුතු කර තිබෙන අවස්ථා ගැන. මීට මාස 11කට විතර පෙර කොළඹ ගංවතුර ගැලුවා. ඒ අවස්ථාවේදී ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මොනවාද කළේ? ඒක මට තවමත් මතකයි.

[ගරු රවි කරුණානායක මහතා]

එදා අපි උතුරු කොළඹ, මැද කොළඹ, බොරැල්ල, කොළොන්නාව, කඩුවෙල හා අවිස්සාවේල්ල වැනි ප්‍රදේශවලට යන කොට, උතුරු කොළඹ සහ මැද කොළඹ ප්‍රදේශයේ අපි දැක්කේ ෆවුසි ඇමතිතුමාව විතරයි. එතුමා ඇවිල්ලා, ඒ තිබෙන ප්‍රශ්න මොනවාද කියලා අහලා, අපිට සල්ලි ප්‍රශ්නයක් තිබෙනවාය කියලා, කථා කරලා තමයි ගියේ. අද වන තුරු ඒ අයට මෙලෝ දෙයක් දීලා නැහැ. මම හිතන හැටියට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් මෙම අමාත්‍යාංශයට ලැබෙන්නේ සුළු මුදල් ප්‍රමාණයක් වෙන්න ඇති. නමුත් මේ රටේ ජනතාව ආපදාවට ලක් වෙලා තිබෙනවා. කරුණාකරලා මේ සම්බන්ධයෙන් මීට වැඩිය ප්‍රායෝගිකව, මානුෂිකව කටයුතු කරන්න ඕනෑය කියලා මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ ඒ අවස්ථාවල වෙන් කළ මුදල් ප්‍රමාණය ඔබතුමා ප්‍රසිද්ධ කළා.

එදා කොළඹ දිස්ත්‍රික්කයේ ගංවතුර ගැන කථා කරද්දී, ඒ ව්‍යසනයට ලක් වෙලා තිබුණ පුද්ගලයන් ගණනින් බෙදුවාම, ඒ වෙන් කළ මුදල් ප්‍රමාණයෙන් එක පුද්ගලයකුට රුපියල් තුනක්වත් ලැබුණේ නැහැ. මම හිතන්නේ නැහැ ඊට වැඩිය වෙනසක් අද වෙලා තිබෙනවා කියලා. මොකද, ඔබතුමාගේ අමාත්‍යාංශය තුළින් අද රුපියල් මිලියන 150ක් වෙන් කර තිබෙනවාය කියන කොට, ඒක අවතැන් වූ ලක්ෂ ගණනාවෙන් බෙදුවාම, මම හිතන්නේ නැහැ එදාට වැඩිය වෙනසක් අද ඇතිවෙලා තිබෙනවාය කියලා. ගරු කථානායකතුමනි, අද පෙර වරු 11.50ට ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබුණු උත්තරයක් මම **සභාගත*** කරනවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ජනවාරි 8 වැනිදා "අද" කියන පත්තරයට කියලා තිබෙනවා, සහනාධාර ලබා දීම සියයට 95ක් සාර්ථකයි කියලා. ඔබතුමා සාර්ථකයි කියන්නේ, මේ රුපියල් මිලියන 150 ඒ අයට බෙදලා තිබෙනවා කියන එකද? මේ මුදල එක දිස්ත්‍රික්කයකට, එක ගම්මානයකට මදි වෙලා තිබෙන කොට සාර්ථකයි කියන්නේ මොන විධියටද? දිස්ත්‍රික් ලේකම්තුමන්ලා ඒ ගම්මානවලට යන්නේ නැහැ. මොකද, ගියොත් ඔවුන්ට කරන්න පුළුවන් වන්නේ මොනවාද? මම නම් වශයෙන් පස්සේ කියන්නම්. ඔබතුමාට දැන ගන්න පුළුවන් ප්‍රායෝගික ප්‍රශ්න මොනවාද?

ඊට පස්සේ සමෘද්ධි නියාමකයන් ගිහිල්ලා එතැන දේශපාලන කටයුත්තක් කරනවා. බොහොම ඕනෑකමින් හලාවත ප්‍රදේශයේ ගම්මානයක ඒක කරනවා. මම ඒ ගම්මානය නම් කරන්නම්. ඒ ප්‍රදේශයේ පවුල් 212ක් අවතැන් වෙලා සිටියා. ඒ අයගෙන් පවුල් 27කට දීලා, දේශපාලන අරමුණින් අනෙක් අයට නොදී අරගෙන ඇවිත් තිබෙනවා. මෙවැනි දේවල් සිදු වෙනවා.

ග්‍රාම නිලධාරින් බොහොම ඕනෑකමින්, මඩේ ගිහිල්ලා කටයුතු කර තිබෙනවා.

**ගරු මහින්ද අමරවීර මහතා ( ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා නම් කරලා කියනවා නම් වඩා හොඳයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම නම් කරලා කියන්නම්. ගරු ඇමතිතුමා අහපු නිසා දැන් මම නම් කරලා කියන්නම්. නමුත් තව ටිකක් පහු වෙලා ඒක කියන්නයි මම බලාපොරොත්තු වුණේ. හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අශෝකා මහත්මියගේත්, සමෘද්ධි නියාමක අනෝමා මහත්මියගේත්, ප්‍රාදේශීය ලේකම්තුමිය වන එස්.අයි.එම්.පී. කුමාරි මහත්මියගේත් නම් තමයි මෙහිදී සඳහන් කරන්නට පුළුවන් වෙන්නේ. පසුව මම නම්වලින් කියන්නම්, ඒ අය කොහේද ඉන්නේ කියලා. ඒ අය යම් හොරකමකට අසු වී තිබෙනවා. ඒ නිසා ඒ අය ඒ ප්‍රදේශයේ ජනතාවට සාප කරලා කටයුතු කරනවාය කියන එක එතැන සිටි අනික් වැදගත් නිලධාරි මහත්වරුත් කියා තිබෙනවා. ඉතින් ඒක හරි අපරාධයක්. එස්.අයි.එම්.පී. කුමාරි සහ ආර්. අනෝමා යන අයගේ නම් තමයි මේ සම්බන්ධයෙන් තිබෙන්නේ. මම මේ කියන්නේ ඒ අයගේ නම් ප්‍රදේශවාසීන් කියපු නිසයි. ඒ නිසා තමයි මම ගරු ඇමතිතුමාට ඒ නම් ඉදිරිපත් කළේ. එහෙම නැත්නම් කියාවි, දේශපාලන අරමුණකින් යුතුව ඒ නම් සඳහන් කළාය කියා. මගේ කිසිම දේශපාලන අරමුණක් නැහැ.

මීට දවස් තුන, හතරකට ඉස්සෙල්ලා ඒ ප්‍රදේශයට ගිය අවස්ථාවේදී අහිංසක ජනතාව ගැන මගේ ඇස්වලින් දැකපු කාරණයක් තමයි මම ගරු ඇමතිතුමාට වාර්තා කළේ. ඇත්ත වශයෙන්ම මම එතැන ඉඳගෙනම, ගරු ඇමතිතුමාට මේ ගැන දුරකථනයෙන් කියන්න උත්සාහ කළා. එහෙම නැත්නම් ආණ්ඩුවට තමයි බණින්නේ. ඒ කරලා තිබෙන අපරාධ ගැන බැලුවාම එහෙම කරන්න අවශ්‍යයි, ඒක කළ යුතුයි. යම් විධියකින් ඇමතිතුමාටත් ඒ ශාපයෙන් කොටසක් ලැබෙනවා. මොකද, නිසි ආකාරයෙන් ඒ කටයුතු කෙරෙනවාය කියා සිතුවාට, ඊට වඩා හාත්පසින්ම වෙනස් විධියකට තමයි කටයුතු සිදු වෙලා තිබෙන්නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
සමෘද්ධි නිලධාරින් හරහා මේ සහනාධාර ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මොකක්ද, ඇමතිතුමා කිව්වේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
සමෘද්ධි නිලධාරින් හරහා නොවෙයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කළේ. ග්‍රාම නිලධාරින් හරහායි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. සමෘද්ධි නිලධාරින් හරහායි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා කියන මේ සිද්ධිය පිළිබඳව පැය ගණනක් ඇතුළත මම පරීක්ෂා කරනවා. එහෙම වැරැද්දක් වෙලා තිබෙනවා නම් අනිවාර්යයෙන්ම ඒ නිලධාරියාට විරුද්ධව අපි කටයුතු කරනවා.

---

**ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
*ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.*
*Document not tendered.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මෙතැනදී කියැවෙන්නේ ආණමඩුව ප්‍රාදේශීය ලේකම්තුමිය ගැනයි.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ආණමඩුව?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්. ආණමඩුව හැටියට තමයි නම් කර තිබෙන්නේ. එතැනදී සමෘද්ධි නිලධාරින් තමයි කෙළින්ම කටයුතු කර තිබෙන්නේ. ඒ පුද්ගලයන් කිව්වේ, ලොරියකින් ආධාර ද්‍රව්‍ය ගෙනාවාය; ඒ පැත්තේ තිබෙන්නේ එක්සත් ජාතික පාක්ෂිකයන්ගේ ගෙවල්ය කියා කිව්වාම, ඒ පැත්ත අමතක කර දමා තිබෙනවාය කියන එකයි. ඊට අදාළ පුද්ගලයන් නම් වශයෙන්ම කිව්වා. එතැන ග්‍රාම නිලධාරි මහත්මයෙක් හිටියා. එතුමා බොහොම දක්ෂ කෙනෙක්; අපක්ෂපාතීව වැඩ කරපු කෙනෙක්. එතුමා තමයි කිව්වේ. ඒ වාගේම මම මේ අවස්ථාවේදී කියන්නේ -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, විවිධ කණ්ඩායම් විසින් භාණ්ඩ ගෙනෙන අවස්ථා තිබෙනවා. මට දැන ගන්න ඕනෑ, මීට අදාළ භාණ්ඩ රජයේ ඒවාද කියලායි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේවා රජයේ භාණ්ඩ. ගරු ඇමතිතුමනි, මම මේවා කියන්නේ ඔබතුමාගේ චරිතය ඝාතනය කිරීමට නොවෙයි. මොකද, මෙවැනි දේ තුළින් අපි යමක් ඉගෙන ගන්න ඕනෑ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා ගැන ද්වේෂයෙන් නොවෙයි, මම මේ කථා කරන්නේ. එවැනි දෙයක් සිදු වෙලා තිබෙනවා නම් අපි ඒ සම්පූර්ණ වගකීම භාර ගෙන, ඒ නිලධාරියාට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් නොවෙයි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් තව ඉල්ලීමක් කරනවා. ඊයේ දිනයේ මම ඔබතුමාට ලිපියක් එව්වා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වැඩ කටයුතු අරලියගහ මන්දිරයේදී පවත්වන එක ගැන. මොකද ඒ? සාමාන්‍යයෙන් ඒක ජාතික මට්ටමෙන් කළ යුතුව තිබෙන දෙයක්. මේ ගැන මීට පෙරත් කියා තිබෙනවා. මෙවර නවවන රැස්වීම අරලියගහ මන්දිරයේ පවත්වා තිබෙනවා. ඇයි, ඒක අරලියගහ මන්දිරයේ පවත්වන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඒක අමාත්‍යාංශයේ කටයුත්තක් නොවෙයි. ගරු කථානායකතුමා තමයි ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ අවසාන නිර්දේශය දෙන්නේ, ඔබතුමන්ලාගේ නම් පිළිබඳව. එහි සභාපතිවරයා වන්නේ ජනාධිපතිතුමායි. මා නියෝජනය කරන අමාත්‍යාංශයේ ලේකම්තුමිය තමයි එහි ලේකම්තුමිය හැටියට කටයුතු කරන්නේ. අපි ඒ කමිටුවේ සාමාජිකයිනුයි. ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා, ඔබතුමා ඇතුළු පක්ෂ නායකයින් ගොඩාක් ඒ කමිටුවට ඉන්නවා. ඒක ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන රැස්වීමක්. අරලියගහ මන්දිරයේ ජනාධිපතිතුමාගේ රාජකාරි කරන කාර්යාලයට තමයි ඒ සඳහා කැඳවන්නේ. ඒක පෞද්ගලික ස්ථානයක් නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා -

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ඇති නේ, විපක්ෂ නායකතුමාත් අරලියගහ මන්දිරයට යන බව. විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු යනවා. ඉතින් ඒ නිසා ඒක ප්‍රශ්නයක් කර ගන්න එපා. ඔබතුමාත් එතැනට එන්න. ඒක ජනාධිපතිතුමාගේ නිල නිවාසයත් නොවෙයි, නිල කාර්යාලය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මම මෙතැනදී ඉල්ලීමක් කරනවා, කරුණාකරලා පාර්ලිමේන්තුවේ කටයුත්තක් පාර්ලිමේන්තුවේ තියන්නය කියා. එහෙම නැතිව එතැනට ගියොත් වෙනත් අර්ථ කථන දෙනවා. කරුණාකරලා ඒ රැස්වීම පාර්ලිමේන්තුවේම පවත්වන්න. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ කටයුතුවලට මෙහාට එනවා, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ කටයුතුවලට මෙහාට එනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු මන්ත්‍රීතුමනි, එතැන පැවැත්වෙන්නේ මහා විශාල රැස්වීමක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතැනට ගියාම වෙන වෙන අර්ථ කථන නේ දෙන්නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඉතින් විපක්ෂයේ මන්ත්‍රීවරුත් සම්බන්ධ වෙනවා නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින් එහෙම ගියාම කෝපි බොන්න යනවාය කියනවා; තමුන්නාන්සේලාගේ ජාතික රූපවාහිනියෙන් වෙන වෙන කථා කියනවා. ඉතින් මොකටද, ඒවා අහගන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
The Hon. Mahinda Amaraweera)
සුමන්තිරන් මන්ත්‍රීතුමා හැම වතාවකදීම ඒකට සම්බන්ධ වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි, ඒකට කමක් නැහැ. ඉතින් මම කියපු දෙය කරන්න. මම ගරු කථානායකතුමාට කියනවා, කරුණාකරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියා. සභානාධාරවලින් සියයට 95ක්ම සාර්ථකව බෙදා දුන්නාය කිව්වා. නමුත් මම අහනවා, මොනවාද සාර්ථකව බෙදා දී තිබෙන්නේ කියා. ඒ නිසා මා ඔබතුමාට කියනවා, කරුණාකරලා ඇමති මණ්ඩලයේදී මීට වඩා සටන් කරලා ඔබතුමාගේ අමාත්‍යාංශයට මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ලබා ගන්න කටයුතු කරන්නය කියා.

ඇමති මණ්ඩලයේ හැටහුටහමාරක ඇමතිවරු ප්‍රමාණයක් ඉන්නවා. කරුණාකරලා මේ සම්බන්ධයෙන් ඔබතුමා මීට වැඩිය ඕනෑකමින් සටන් කරලා ඔබතුමාගේ අමාත්‍යාංශයට මීට වැඩිය රුපියල් මිලියන ගණනක් ලබා ගන්න. නැත්නම් ඔබතුමා නායකත්වය ලබා දෙන අමාත්‍යාංශය අසාර්ථක අමාත්‍යාශයක් බවට පත් වනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම ඔබතුමාගේ කාලය ගන්නවා නොවෙයි. මට කෙටි වේලාවක් ලබා දෙන්න. ඔබතුමා අවශ්‍ය නම් මගේ වෙලාවෙන් ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාගේ වේලාවෙන් මට දෙනවා නම් කථා කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒ විනාඩි ගණන මගෙන් දෙන්නම්. ගරු මන්ත්‍රීතුමනි, එක මොහොතක් මට දෙන්න. මේ මුදල් සඳහා ඉල්ලීම් කරන්නේ දිසාපතිවරු සහ ප්‍රාදේශීය ලේකම්වරු. ඉල්ලීම් කරන ඒ හැම එකක්ම අපි දීලා තිබෙනවා. සල්ලි බලෙන් දෙන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අද මාත් එක්ක මේ මොහොතේ ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමා කථා කරන්නයි හිටියේ. හලාවත, වට්ටක්කලිය කියන ප්‍රදේශයේ 5,800ක විතර පිරිසක් තවම ගංවතුරට යට වෙලා සිටිනවා. එතැනට උදව් කරන්න බැරි ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ආණ්ඩුවෙන් කිසිසේත්ම උදව් කරලා නැහැයි කියලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම අපි සිංහපුර ලැයිම, කොරියවත්ත, සිත්තගල කියන ප්‍රදේශවලටත්, ආරච්චිකට්ටුව, වටවත ප්‍රදේශය, මැල්වත්ත, කුරුඳුවත්ත කියන මේ වාගේ ප්‍රදේශවලටත් ගිහිල්ලා ඒ තැන් ප්‍රායෝගිකව දැකලා තමයි ඒ සම්බන්ධයෙන් මම මෙතැන වාර්තා කරන්නේ. ගරු ඇමතිතුමනි, රජයේ නිලධාරි මේ සමහර ප්‍රදේශවලට යන්නේ නැහැ. ඔවුන් යන්නේ නැති වුණාම අපි අනෙක් අයගෙන් ඇහුවා, ඇයි ඔවුන් යන්නේ නැත්තේ කියලා. "අපි ගිහිල්ලා වැඩක් තිබෙනවාද? අපට සල්ලි නැහැ, මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. ඒ නිසා ගියාම එහෙන් නිකම් බැනුම් අහනවා විතරයි." කියලා කිව්වා. ඒ නිසා තමයි සමෘද්ධි නිලධාරින් යවන්නේ; ඊට පස්සේ ග්‍රාම නිලධාරින් යවන්නේ. මම වග කීමකින් මේ දේවල් කියන්නේ. ඔබතුමා උත්තර දෙන කොට ඒ ගැන කථා කරන්න.

ආනමඩුවේ මම කියපු ප්‍රාදේශීය ලේකම් මැතිනිය සම්බන්ධයෙන් කරුණාකරලා විධිමත් පරීක්ෂණයක් කරන්න. එතැන පවුල් 167ක් ඉන්නවා. ඒ පවුල් 167 ඇතුළේ 522ක පිරිසක් ඉන්නවා. එතැනට ගිහිල්ලා බත් පැකට් එකක් දෙන්න බැරි තත්ත්වයක් තමයි දවස් හතරක් තිස්සේ තිබුණේ. ඒ ප්‍රදේශයේ හිටපු ස්වාමීන් වහන්සේ තමයි ඉදිරිපත් වෙලා නායකත්වය දීලා ඒ කටයුතු කළේ. මේ අවස්ථාවේදී ආණ්ඩුවේ සිටින අය මේවා දැක - දැක, මේවා බල - බලා රූපවාහිනිය ඉස්සරහා ගිහිල්ලා රඟපානවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මමත් එතැනට ගියා. ඔබතුමා කියන තැනට ඊට පසුවදා මම ගියා. ඒ අවස්ථාවේදී ඒ අය සම්පූර්ණයෙන් ඔබතුමා කියපු කථාව ප්‍රතික්ෂේප කළා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
පොදුවේ ඔබතුමාත්, මමත් හෙට යමු. ගිහිල්ලා බලමු, ප්‍රතික්ෂේප කරනවාද, නැද්ද කියලා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මම ඔබතුමාට ආරාධනා කරනවා, මමත් එක්ක යමු කියලා. අපි යමු. මම යන්න කැමැතියි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ කියන මොහොතේ ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීතුමාත් එතැන සිටිනවා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
යමු, ඔබතුමා එන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, අපි යන්න සූදානම්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා හෙට යන්න කැමැති නම් අපි යමු.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හෙට යන්න පුළුවන් නම් අපි යනවා. නමුත් ඔබතුමන්ලා හදිසියේ දෝෂාභියෝගය පිළිබඳ විවාදය හෙට ගෙනැල්ලා තිබෙනවා. ඒක කල් දමන්න පුළුවන් නම් අපි යනවා.

ඒ වාගේම 23 වෙනිදා අපි මඩකලපුවට ගියා. ඒ යන අවස්ථාවේදී වාකරේ, මඩකලපුව ටවුම, පාවන්කර්නි කියන තැන, වෙරුගල් ඒ වාගේ තැන්වල පාලම් කැඩිලා තිබුණා. කිසිසේත්ම රජයේ කටයුත්තක් එතැන සිදු වන බව පෙනුණේ නැහැ. ඒ ප්‍රදේශවල ජනතාව අසරණ තත්ත්වයට පත් වෙලා. නාවික හමුදාවෙන් තමයි යම් කටයුතු කරන්න පටන් අරගෙන තිබෙන්නේ. ප්‍රාදේශීය ලේකම්වරු ඒ පැත්ත පළාතක සිටියේ නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
නාවික හමුදාවෙන් යෙදෙව්වේ අපි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හමුදාව ඉන්න පුළුවන්. නමුත් ප්‍රාදේශීය ලේකම්වරු නැහැ. රජයේ නිලධාරින් කියන්නේ නාවික හමුදාව නොවෙයි නේ. ප්‍රාදේශීය ලේකම්වරු එතැන සිට මේවා කරන්න ඕනෑ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමාට තේරෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට තේරෙන්නේ නැහැ තමයි. ගංවතුරට යට වෙලා සිටින ඒ අහිංසක අයට කියලා දෙන්න, නාවික හමුදාව තමයි මේ දේවල් කරන්නේ කියලා. ඔවුන්ට ශත පහක් ලැබිලා නැහැ, බත් පැකට් එකක් දීලා නැහැ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
අපි නාවික හමුදාවෙන් 25 ගණනේ හැම කඳවුරකටම අනුයුක්ත කරලා තිබෙනවා. අපි බෝට්ටු ලබා දීලා තිබෙනවා, අවශ්‍ය උපකරණ ලබා දීලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නාවික හමුදාවේ අය ගන්න පුළුවන්. නමුත් ප්‍රාදේශීය ලේකම්වරු ඒ සමඟ සිටින්න අවශ්‍යයි. දෙමළ කථා කරන අයත් එක්ක එතැන කොහොමද සිංහල කථා කරන අය සිටින්නේ? ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරු තමයි ඒ තැන්වල නායකත්වය දෙන්න ඕනෑ. ඔබතුමා ඒ පැත්ත පළාතක ගිහිල්ලා නැහැ. තව මොනවාද කථා කරන්නේ?

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
තමුන්නාන්සේ මේවා දන්නේ නැහැ. ඒ කඳවුරුවල සිටින්නේ හමුදාව.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ප්‍රදේශවලට ගිහිල්ලා තිබෙන පුද්ගලයෙක් විධියටයි මම කථා කරන්නේ.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඔබතුමා දන්නේ නැහැ. ඔය එක දවසක් ගිහිල්ලා. හැම කඳවුරකම හමුදාවෙන් 25ක් ඉන්නවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අනුරාධපුරයේ ගෙවල් 5,200ක් ගංවතුරට යට වෙලා තිබෙනවා. [බාධා කිරීම්] කරුණාකරලා අහගන්න. වැඩේ කරන්නෙත් නැහැ; සල්ලිත් නැහැ. නිකම් බොරුවට සද්ද කර කර ඉන්නවා. තමාගේ ආසනය වන හම්බන්තොටවත් හරියට වැඩ කරන්නේ නැහැ. නිකම් බොරුවට සද්ද කළා කියලා ප්‍රශ්න විසඳෙන්නේ නැහැ.

බලන්න, අනුරාධපුරය ප්‍රදේශය. දවස් දෙකකට ඉස්සෙල්ලා "ඩේලි නිවුස්" පත්තරයේ තිබෙනවා, රුපියල් මිලියන පණහක් වෙන් කරනවා කියලා. තවම සල්ලි ලැබිලා නැහැ. අපේක්ෂා කරනවා කියලා තිබෙනවා. ගෙවල් 5,200ක් යට වෙලා තිබෙනවා. ඔබතුමා කියලා තිබෙනවා, එක ගෙයකට ලක්ෂයක් දෙනවා කියලා.

එතකොට ගරු කථානායකතුමනි, ගෙවල් 500කට විතරයි. මේක මොන ප්‍රෝඩාවක්ද? රූපවාහිනියට කියනවා, ඔක්කොම ප්‍රශ්න විසඳනවාය කියා. [බාධා කිරීමක්] මාතලේට ජනාධිපති හෙලිකොප්ටර් එකෙන් යනවා. හෙලිකොප්ටර් දෙකක් යන විට රුපියල් ලක්ෂ 75ක් යනවා. ගරු කථානායකතුමනි, මෙතැන රුපියල් මිලියන 50ක් වෙන් කරනවා. නමුත් තවම ලබා දී නැහැ. මෙතුමන්ලා කරන්නේ මොකක්ද? මෙතුමන්ලා මෙතැන ශබ්දය වැඩියෙන් පෙන්නුවාම වැඩය ඉවරයි. [බාධා කිරීමක්] මේ වාගේ කල් තැබීමේ යෝජනා ගෙනෙන්න අවශ්‍ය නැහැ. [බාධා කිරීමක්]

වැඩය කරලා නැති නිසා මෙතැන ඇවිත් ශබ්ද කරනවා. ඔබතුමන්ලා රූපවාහිනියේ රඟපානවා. ජනාධිපතිත් එක්ක හෙලිකොප්ටර් එකෙන් මාතලේට ගිහින් ලියුම් භාර ගන්නවා. හලාවත, කුරුණෑගල, අනුරාධපුර, මඩකළපුව, මන්නාරම ප්‍රදේශවල අහිංසක මිනිසුන්ගේ ගෙවල්දොරවල් සම්පූර්ණයෙන්ම ගංවතුරට යට වෙලා. ඒ අයට බත් පැකට් එකක් ලැබෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. ඔබතුමා බොහොම ඕනෑකමින් අසා ගෙන සිටිනවා. ඔබතුමා දන්නවා, හම්බන්තොට ප්‍රදේශයේ මොනවාද වෙලා තිබෙන්නේ කියා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එහේ ප්‍රශ්නයක් නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම දැක්කා, මගේ මිත්‍ර සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහින් උදව් කරනවා. මොකුත් නැත්නම් නිකරුණේ ගිහින් උදව් කරන්න ඕනෑද? නැහැ. ප්‍රශ්නයක් තිබෙනවා, මොකුත් නැහැ කියා ආණ්ඩුවෙන් ප්‍රකාශ කර තිබුණාට.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඒ සද්භාවයෙන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ විපක්ෂයේ -එක්සත් ජාතික පක්ෂයේ- සජිත් ප්‍රේමදාස මැතිතුමා ගිහින් උදව් කර තිබෙනවා. මෙන්න අපි වැඩ කර තිබෙන ආකාරය. ඉතින්, තව මොනවාද කියන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා හැම දාම බෙදනවා නේ. ඒ නිසා ඉතින් අලුත් දෙයක් නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින්, කොතරම් හොඳද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
එතුමා සද්භාවයෙන් කරන වැඩක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ අවස්ථාවේදී අනුරාධපුරය ප්‍රදේශයට රුපියල් මිලියන 50ක් -රුපියල් ලක්ෂ 500ක්- වියදම් කරන්න අපේක්ෂා කර තිබෙන බව කියා තිබෙනවා. කවදාද එය ලබා දෙන්නේ කියා අපි අහන්න කැමැතියි. මේ අවස්ථාවේදී මුළු රටටම දවස් 22කට රුපියල් මිලියන 157ක් වෙන් කර තිබුණා. මේ ගැන බලනකොට එක පුද්ගලයෙකුට දවසකට රුපියල් 7යි වෙන් කර තිබෙන්නේ. මේක ඇතිද? මොන විහිළුවක්ද? මොනවාද මේ කථා කරන්නේ? මීට මාස 11කට ඉස්සෙල්ලා කොළඹ ප්‍රදේශයට ගංවතුර පැවැති අවස්ථාවේ එක් කෙනෙකුට වෙන් කළ මුදල රුපියල් 2යි, ගරු කථානායකතුමනි. විලි ලජ්ජාවක් නැහැ. මේවාටද ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් අවශ්‍ය වන්නේ? මීට හොඳයි ඒක වහලා දමන්න; ඒක බද්ධ කරන්න; ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළින් ඒ වැඩ කටයුතු කර ගෙන යන්න. මේවා තමයි සංඛ්‍යා ලේඛන සමඟ පෙන්වන්නේ.

දැන් මුදල් නැහැ කියනවා. මුදල් නැහැ කියන කථාව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන්න අවශ්‍යයි. මොකද, මේ ආණ්ඩුවට මුදල් නැහැ කිව්වාට රෑ රේස් දුවන්න රුපියල් මිලියන 350ක් වියදම් කරනවා. දැන් රුපියල් මිලියන 350ක් වියදම් කරන්නේ කොහෙන්ද? පාරවල් හදන්න කොළඹ නගර සභාවට රුපියල් මිලියන 150ක් දෙනවා. ඊට පසු වැලි ගෝනි ගෙනෙන්න රුපියල් මිලියන 53ක් වෙන් කර තිබෙනවා. ටෙන්ට් ගහන්න රුපියල් මිලියන 11ක් වෙන් කර තිබෙනවා. රෑ රේස් දුවන්න රුපියල් මිලියන 353ක් ගිහින් තිබෙනවා. මේවාට මුදල් තිබෙනවා. ගංවතුර ආපදාව වෙනුවෙන් දවස් 22කට වෙන් කර තිබෙන්නේ රුපියල් මිලියන 157යි. විලි ලජ්ජාවක් නැද්ද? ඒ වාගේම මිහින් ආයතනයට රුපියල් මිලියන 507ක් වෙන් කර තිබෙනවා. මෙහෙම කර වැඩි කාලයක් නැහැ. ඒ මාස දෙකකට ඉස්සෙල්ලා. මිහින් ලංකා ආයතනයට රුපියල් මිලියන 507ක් වෙන් කළා. බංකොලොත් වීම නිසා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනයට රුපියල් කෝටි 1900ක් පාඩු වෙනකොට මිහින් ලංකා ආයතනයට රුපියල් මිලියන 507ක් වෙන් කරන්න මුදල් තිබෙනවා. ගංවතුර නිසා දුකට පත් වී සිටින අහිංසක කෙනෙකුට බත් පැකට් එකක් දෙන්න මුදල් නැති තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

දවස් දෙකකට ඉස්සෙල්ලා ඇඹිලිපිටිය කඩදාසි කම්හල ගැන ආණ්ඩුවෙන්ම ප්‍රකාශ කළා. ඒකේ රුපියල් මිලියන 450ක් සම්පූර්ණයෙන් අපතේ ගිහින්. ලංකා බැංකුවෙන් ණයක් අරගෙන රුපියල් මිලියන 650ක් නැති වෙලා. එහෙම නම් ඕස්ට්‍රේලියන් කොම්පැනියට කවුද දුන්නේ? ආණ්ඩුව. මේවා සම්බන්ධයෙන් කවුද කථා කරන්නේ? මේ මුදල් නාස්ති කරන්න පුළුවන් අවස්ථාවක්ද? ඔබතුමන්ලා ගංවතුර නිසා කරදරයට පත් වූ අය වෙනුවෙන් රුපියල් මිලියන 150ද වෙන් කර තිබෙන්නේ? [බාධා කිරීමක්] ඒ නිසා තමයි කීයක් දෙන්න ඕනෑද කියා පාර්ලිමේන්තුවේ හෙළිදරවු කරන්න කියන්නේ? ඒකට ඉස්සෙල්ලා අපට අමාත්‍යාංශයෙන් මෙච්චර මුදල් වෙන් කර තිබුණා කියා දැන ගන්න ලැබුණා. ඒ වාගේම ෂැන්ග්‍රි-ලා හෝටලයට රුපියල් මිලියන 1237ක් වෙන් කරනවා.

අපේ කොළඹ නගර සභාව සුමාන තුනකට ඉස්සෙල්ලා කිව්වා, "කරුණාකර, පාරවල් හදන්න; වතුර ලබා දෙන්න; sewage lines දමන්න" කියා. අපි කොළඹ නගර සභාවට කිව්වා, ඔබතුමාගේ කාර්ය භාරය වන්නේ ඡන්ද දුන්න අයට වැඩ කිරීම මිසක් ෂැන්ග්‍රි-ලා හෝටලයට උදව් කිරීම නොවෙයි කියා. ඊට පසු ආණ්ඩුව මොනවාද කිව්වේ? සල්ලි නැත්නම් අපි සල්ලි ලබා දෙන්නම් කිව්වා. දුන්න ප්‍රමාණය කීයද? රුපියල් මිලියන 1280යි. මේ රුපියල් මිලියන 1280ත් දෙන්නේ මහ ආණ්ඩුව. ඒ ජනතාව ගෙවන බදු තුළිනුයි. කොළඹ නගර සභා බල ප්‍රදේශයේ ගෙවල් කඩලා දැම්ම ඒ අහිංසක මිනිසුන්ගේ ගෙවල් හදන්න බැරි ආණ්ඩුවක් ෂැන්ග්‍රි-ලා හෝටලය සඳහා රුපියල් මිලියන 1200ක් වෙන් කරනවා. එතකොට ගංවතුර ගලන විට මුදල් නැහැ කියන්නේ කොහොමද? සුමාන තුනකට ඉස්සෙල්ලා තමයි ඒ මුදල් වෙන් කළේ? මේවා කියන්න අවශ්‍ය කාටද? සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා ඊයේ ප්‍රකාශ කළා, සුමාන තුනකට ඉස්සෙල්ලා විදුලිබල අමාත්‍යාංශයේ අවශ්‍යතාව අනුව L/C විවෘත කර තිබෙනවා කියා.

මිලියන 8200කට L/C ඇරලා තිබෙනවා. ඒක දැන් ප්‍රතික්ෂේප කර තිබෙනවා. ඒ නිසා දැන් සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා කියනවා, "ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේක දැන් ලොකු ප්‍රශ්නයක් වෙනවා, කරුණාකරලා මේක ඕගොල්ලන් භාර ගන්න, එහෙම නැත්නම් මිලියන 8200ක අලාභයක් සිදු වෙනවා" කියලා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට සල්ලි නැහැ කියලා කියනවා. රුපියල් මිලියන 150යි දැන් වෙන් කර තිබෙන්නේ. එහෙම නම් රුපියල් මිලියන අටදහස් ගණනක් මේ වාගේ නාස්තියකට වෙන් කරන්නේ කොහොමද? හෙජින් සූදුවට සල්ලි තිබෙනවා, මේ වාගේ අයට සල්ලි වෙන් කරන්නේ නැහැ. මාස 11කට ඉස්සර ඇති වුණු කොළඹ ගංවතුර ප්‍රශ්නය සම්බන්ධයෙන් දවසකට රුපියල් දෙකයි වෙන් කර තිබුණේ. එහෙම නම් මේ අමාත්‍යාංශය මේ කටයුතු කරන්නේ කොහොමද? ඒ නිසා තමයි මා ඉතා ඕනෑකමින් කිව්වේ, මේක අපි ඉදිරිපත් කර තිබෙන්නේ ප්‍රායෝගිකව ඒ ජනතාවට තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් හෙළිදරවු කරන්නය කියලා. හැබැයි, ඒක ඇමතිතුමාට ප්‍රශ්නයක් වෙනවා, මොකද අමාත්‍යාංශයට සල්ලි ලැබිලා නැති නිසා. ඒ නිසා කරුණාකරලා උත්තර දෙන කොට, තර්ක විතර්ක කරනකොට සාක්ෂි සහිතව මේවා ඔප්පු කරන්න. අපි මේවා ඉදිරිපත් කරන්නේ ඔබතුමාගේ චරිත ඝාතනයකට නොවෙයි. ආණ්ඩුව කරන ප්‍රෝඩාව හෙළිදරවු කිරීම විතරයි අවශ්‍ය වන්නේ. ඉතින් ඒ නිසා කරුණාකරලා සල්ලි නැහැයි කියලා කියන්න ඉදිරිපත් වෙන්න එපා. ඒ විතරක් නොවෙයි -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා තව කොච්චර කාලයක් ගන්නවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

තව මිනිත්තු දෙක, තුනක් පමණ ගරු කථානායකතුමනි. ඉතින් මේ සල්ලි නැහැයි කියලා කියනවා. අපි දන්නවා, නිවාඩ් කබ්රාල් මැතිතුමා කියලා තිබෙනවා රුපියල අවප්‍රමාණ වීම නිසා රුපියල් කෝටි 27,800ක් පසු ගිය අවුරුද්දේ අලාභයට ලක් වෙලා තිබෙනවා, ණයබරතාව තවත් වැඩි වෙලා තිබෙනවා කියලා. එතකොට මේ රුපියල් කෝටි 27,800ක මුදල වැය වුණේ කන්නද, බොන්නද, සංවර්ධනය කරන්නද? නැහැ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 111 සිට 135 දක්වා අවප්‍රමාණය කිරීමේ ප්‍රතිවිපාකය නිසා රුපියල් කෝටි 27,800ක් නැති වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. අපි මේවා ගැන පසු ගිය අවුරුද්ද තුළ කථා කළාම මේවා ප්‍රතික්ෂේප කළා; හාස්‍යයට ලක් කළා. අන්තිමට පසු ගිය සතියේ මේක පිළිගන්නට සිදු වුණා. ඒ පිළිගැනීම තුළ මේ රටේ ඒක පුද්ගල ණයබරතාව 2004 වසරේ දී රුපියල් 84,000ක් තිබුණු එක, අද රුපියල් 3,33,000කට වැඩි වෙලා තිබෙනවා. කාටද මේවා කියන්න අවශ්‍ය වන්නේ? නමුත් ජාතික ආර්ථිකයක් ගැනයි කථා කරන්නේ.

මේ රටේ ස්වභාව ධර්මය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ප්‍රශ්නයක් සම්බන්ධයෙනුයි අපි මේ කථා කරන්නේ. ඒ සඳහා තමයි ආපදා කළමනාකරණ අමාත්‍යාංශයක් ඇති කරලා තිබෙන්නේ. ඒ අයගේ වගකීම වන්නේ මොකක්ද? මෙවැනි ප්‍රශ්න රටේ හැමදාමත් ඇති වන්නේ නැහැ. එහෙම වෙන්න එපා කියලාත් අපි ප්‍රාර්ථනා කරනවා.

නමුත් ප්‍රශ්නයක් ඇති වුණු අවස්ථාවකදී ඒ අහිංසක ජනතාවට උදවු කරන්න සූදානමින් සිටිය යුතුයි. ඒ උදවු කිරීම තුළින් තමයි රටක් ඉදිරියට යන්න පුළුවන්ද, බැරිද කියන එක තීරණය වන්නේ. අද ගෙවල් දහස් ගණනින් නැති වෙලා තිබෙනකොට, රුපියල් මිලියන 150ක් නොවෙයි, අඩු ගණනේ රුපියල් බිලියන 80ක් විතර අවශ්‍යයි. ඒ කියන්නේ රුපියල් මිලියන 8,000ක් විතර අවශ්‍ය වෙනවා මේ කටයුතු හරියාකාරව ඉදිරියට කරගෙන යන්න. ඒ නිසා සල්ලි නැහැයි කියලා කියන්න එපා, සල්ලි ඕනෑ තරම් තිබෙනවා. මුදල් දූෂණයට ලක් වෙලා තිබෙන, නාස්තියට ලක් වෙලා තිබෙන මෙවැනි අවස්ථාවක අපි ඉතාමත් ඕනෑකමින් කියන්නේ පුම්බත්වය දැනගෙන කටයුතු කරන්නට ඕනෑය කියන එකයි.

මේ අමාත්‍යාංශය භාර ඇමතිතුමා කථා කරලා අවසන් වන විට කරුණාකරලා දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ කොයි ආකාරයටද කියන එක ගැන අපව දැනුවත් කරන්න. මම හිතන හැටියට මම වාගේම මගේ පක්ෂයේ සිටින අනෙක් මන්ත්‍රීවරුනුත් තමන්ගේ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්න සම්බන්ධව හෙළිදරවු කරාවි. මෙය යම් විධියකට එක පුද්ගලයෙකුව එක තැනකට ඉලක්ක කර තැබීමක් නොවෙයි. මෙහිදී ආණ්ඩුව සම්පූර්ණයෙන්ම අසාර්ථක භාවයට ලක් වෙලා තිබෙනවා. මුදල් වෙන් කරන්නට තිබෙන තැනට මුදල් වෙන් කරන්නේ නැතිව රූපවාහිනී රඟපෑමක් විතරයි කරලා තිබෙන්නේ කියන එකත් මතක් කරනවා. මීන් පසුව ස්වභාව ධර්මය නිසා ඇති වන ප්‍රශ්නවලට මුහුණ දෙන්නට සූදානමින් ඔබතුමාගේ අමාත්‍යාංශය සිටිය යුතුයි කියන එකත් මතක් කරමින් මා නිහඬ වනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා යෝජනාව ස්ථිර කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මට කොපමණ වෙලාවක් තිබෙනවාද ගරු කථානායකතුමනි?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

ඔබතුමාට විනාඩි 25ක් තිබෙනවා.

[අ.භා. 2.55]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, රවි කරුණානායක මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාලෝචිත යෝජනාව ස්ථිර කරමින් මමත් අදහස් උදහස් කිහිපයක් මේ විවාදයට එකතු කිරීමට බලාපොරොත්තු වෙනවා. පසු ගියදා ඇද හැලුණු මහා වර්ෂාව -

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள்* [மாண்புமிகு சந்திம வீரக்கொடி] *தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *took the Chair.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගියදා ඇද හැලුණු මහා වර්ෂාව සහ එයත් සමඟ උද්ගත වුණු ගංවතුර තත්ත්වය සහ නාය යාම් මත මහා ව්‍යසනකාරී තත්ත්වයක් අපේ රටේ ඇති වුණා. අපේ රටේ විශාල ප්‍රමාණයකට උන්හිටි තැන් අහිමි වුණා.

දුක් මහන්සියෙන් හම්බ කර ගත් තමන් සතු දේ, තමන්ගේ සියලුම සම්පත් ඒ මහා ජල ධාරාවට මුළුමනින්ම සෝදා ගෙන ගියා. ජීවිත ගණනාවක් අහිමි වුණා. ජන ජීවිතය කඩා වැටුණා. බොහෝ දෙනෙකුට මහා කනගාටුදායක, ඒ වාගේම ඛේදනීය, ශෝචනීය තත්ත්වයන් උදා වුණා. තම තමන්ගේ ජීවන ගමනේ ගොඩ නඟා ගත් සිහින මාළිගා ඇස් ඉදිරිපිට කඩා වැටුණා. අපේ රටේ ලක්ෂ 5කට අධික පිරිසක් විපතට පත් වන කොට, පවුල් 150,000කට වැඩි ප්‍රමාණයක් අසහනයට පත් වන කොට, නිවාස 40,000කට ආසන්න ප්‍රමාණයක් හානිදායක තත්ත්වයකට පත් වන කොට, ලක්ෂ ගණනකට ජීවනෝපාය මාර්ග අහිමි වන කොට අපි මේ ආර්ථික, සමාජයීය පසුතලය තුළ මෙන්න මේ මහා ව්‍යසනය පිළිබඳව යම් හැදෑරීමක් සිද්ධ කරන්නට ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ජගත් පුෂ්පකුමාර ඇමතිතුමාට ආරාධනා කරනවා මගේ කථාවෙන් පසුව එතුමාගේ කථාවේදී පැහැදිලි කිරීම් කරන ලෙස. විශේෂයෙන්ම මම එතුමාට ස්තුතිවන්ත වෙනවා මගේ පහසුව පිණිස එතුමාගේ කාලය විඩංගු කිරීම ගැන. නමුත්, මට මගේ කථාව කරගෙන යන්නට අවස්ථාව ලබා දෙන්න කියලා මගේ සහෝදර, මගේ හිතවත් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ලක්ෂ 5කට ආසන්න පිරිසක්, පවුල් 150,000කට ආසන්න ප්‍රමාණයක්, නිවාස 40,000කට ආසන්න ප්‍රමාණයක් මේ මහා ගංවතුර ව්‍යසනය තුළින් හානියට ලක් වී තිබෙන මොහොතක එම ව්‍යසනයත් සමඟම අපට යම් නිගමනයන් ගණනාවකට එළැඹෙන්නට පුළුවන්කම ලැබෙනවා. මම මේ ඉදිරිපත් කරන නිගමනයන් හුදෙක්ම මේ රටේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය ශක්තිමත් කරන්නට, නවීකරණය කරන්නට, ඒ වාගේම ආපදාවකදී ලබා දිය යුතු විසඳුම්වලට පරිණතභාවයක් එකතු කරන්නට ඉදිරිපත් කරන යෝජනා මිස, දේශපාලන ද්වේශයකින් ඉදිරිපත් කරන යෝජනා නොවෙයි කියන එක මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමැතියි.

ගරු ඇමතිතුමනි, එක දෙයක් පැහැදිලිවම ඉදිරිපත් කරන්නට පුළුවන්. ඍජුවම කියන්නට පුළුවන්, සහන ලබා දීමේ ක්‍රියාවලිය පිළිබඳවත්, ඒ වාගේම සහන ලබා දෙන ප්‍රමාණයන් පිළිබඳවත් නැවත සොයා බැලීමක් කළ යුතුව තිබෙන බව. සහන ලබා දීමේ ක්‍රියාවලියේ ඌනතාවන්, අඩු පාඩුකම් රැසක් තිබෙනවා. ඒ වාගේම ලබා දෙනු ලබන සහනවල ප්‍රමාණයන් පිළිබඳවත් ගැටලු රැසක් තිබෙනවා. විශේෂයෙන්ම මේ සියල්ලක්ම වර්ධනාත්මක සංශෝධනවලට ලක් විය යුතුයි කියන එක මම යෝජනා කරනවා. විශේෂයෙන්ම එම ක්‍රියාවලිය පිළිබඳවත්, සහන පිළිබඳවත් අපට කිසිසේත්ම සෑහීමකට පත් වන්නට බැහැ.

අපි හැමෝම දන්නවා, ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික කවුන්සලය - National Council for Disaster Management - මාස තුනකට වරක් රැස් වෙනවා කියා. මාස තුනකට වරක් ඉහළ මට්ටමින් රැස් වුණාට අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. රැස්වීම්වලදී එළඹෙන්නා වූ නිගමනයන්, ගන්නා වූ නිර්දේශ, යෝජනා, තීන්දු පහළට ගලා යාමේදී බරපතළ ගැටලු ගණනාවක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මම මෙම කාරණය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නට කැමැතියි. ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික කවුන්සලයක් තිබුණත් දිස්ත්‍රික් ආපදා කමිටු ක්‍රමයේ අඩු පාඩුකම් රැසක් තිබෙන බව ඔබතුමා පිළිගන්නට ඕනෑ.

විශේෂයෙන්ම බොහෝ තැන්වල දිස්ත්‍රික් ආපදා කමිටු ක්‍රමය බොහෝ අවස්ථාවල අඩ පණ වෙලා; අක්‍රිය වෙලා. ඉහළින් ගන්නා තීන්දු තීරණ පහළට යන කොට කාන්දු වීමක් සිදු වෙනවා; දුර්වල වීමක් සිදු වෙනවා; අක්‍රිය වීමක් සිදු වෙනවා; ඒ තුළට අකාර්යක්ෂමතාව ඇතුළු වෙනවා. දිස්ත්‍රික් ආපදා කමිටු ක්‍රමයේ ගුණාත්මක, හරාත්මක, ධනාත්මක වෙනසක් සිදු විය යුතුයි කියන එක මම යෝජනා කරනවා. වැඩි ක්‍රියාශීලීත්වයක් තිබෙන, වැඩි කාර්ය ශූරත්වයක් තිබෙන කණ්ඩායමකට දිස්ත්‍රික් ආපදා කමිටු යාන්ත්‍රණය භාර දෙන්නට ඕනෑ. දිසාපතිවරයා හෝ දිස්ත්‍රික් ලේකම්වරයා කේන්ද්‍ර කර ගෙන යන ක්‍රියාවලියට සහ ආපදා කළමනාකරණ අංශයට වැඩි හඬක් ලබා දෙන, වැඩි බලයක්, වැඩි තැනක්, වැඩි බරක් ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ.

හැම දිස්ත්‍රික්කයකටම පත් කරලා තිබෙන ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂවරයා, දිස්ත්‍රික් ලේකම් -දිසාපති- ප්‍රමුඛ ඒ යාන්ත්‍රණය තුළ මනා සබඳතාවක් තිබිය යුතුය කියන කාරණය මා යෝජනා කරනවා. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, මේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු අක්‍රිය වීම පිළිබඳව, අකාර්යක්ෂම වීම පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරලා, අක්‍රිය දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු සක්‍රිය කරන්නට යම් පැහැදිලි වැඩ පිළිවෙළක් යොද වන්න කියලා. මේ ආපදා කළමනාකරණය දිස්ත්‍රික් මට්ටමට පමණක් ගියාට මදියි. ගරු ඇමතිතුමනි, මේක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයටත් විමධ්‍යගත වෙන්නට ඕනෑය කියලා මා විශ්වාස කරනවා. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ආපදා කළමනාකරණ කමිටු ස්ථාපිත කරලා, උපදිසාපති කොට්ඨාස 335 තුළම ශක්තිමත් ආපදා කළමනාකරණ යාන්ත්‍රණයක් තිබිය යුතුයි කියන එකයි මගේ අදහස.

රටේ හැම උපදිසාපති කොට්ඨාසයකම වග කිව යුතු, වග කිව හැකි, වග වන, ආපදා කළමනාකරණ තීන්දු තීරණ ගැනීමේ පැහැදිලි නිලධාරිවරයෙක් පත් කරන්නට ඕනෑ. ඒ, දිස්ත්‍රික් මට්ටමින් නොවෙයි, උපදිසාපති කොට්ඨාස මට්ටමිනුයි. ආපදාවක දී දිස්ත්‍රික් ලේකම් මත පමණක් පදනම් නොවී ප්‍රාදේශීය මට්ටමට විහිදුන පැහැදිලි යාන්ත්‍රණයක් තිබිය යුතුයි කියන කාරණය මා මේ අවස්ථාවේ යෝජනා කරනවා. විශේෂයෙන්ම මා ඔබතුමාට නැවත වරක් කියන්න ඕනෑ, අනිවාර්යයෙන්ම සහන ලබා දීමේ වර්ධනයක් කරන්නට ඕනෑය කියලා. දැන් මේ සහනවලට අදාළව තිබෙන්නේ යල් පැන ගිය චක්‍රලේඛයි. මේවා වහාම ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරලා විපතකදී, විපතට පත් වුණු ජනතාවට බඩ කට පිරෙන්නට කන්න දෙන්න ඕනෑ. ලෙව කන්න දීලා මදියි. බඩ කට පිරෙන්නට ආහාර පාන ප්‍රමාණවත්ව ලබා දෙන්නට ඕනෑ. ලෙව කන්න දීලා හරි යන්නේ නැහැ. ලෙව කන්න දෙන්න පොරොන්දු වෙලා නොවෙයි, මේ ආණ්ඩුව මහා ජන වරමක් ලබා ගත්තේ. අනිවාර්යයෙන්ම රටට ආශ්චර්යයක් උදා කරන ආණ්ඩුව සැබැවින්ම අසහනයක දී, පීඩනකාරී තත්ත්වයක දී විපතට පත් වුණු ජනතාවගේ ජන ජීවිතයට ආශ්චර්යවත් සහන ලබා දෙන්නට කැප වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපතට පත් වුණු සෑම පවුලකටම සහන පැකේජයක් සැලැස්විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. විශේෂයෙන්ම අග හිඟකම්වලින් තොර සහන පැකේජයක් ලබා දීමට වාගේම, ජනතාවට බඩ කට පිරෙන යුගයක් උදා කරලීම උදෙසාත්, දුකේ දී මුහුණට සිනහවක් ගෙන දෙන්නටත්, ගත සිත පිනවන සහනයක් ලබා දෙන්නටත් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය කටයුතු කරන්නට ඕනෑ.

මා ගරු ඇමතිතුමාට පුංචි උදාහරණයක් කියන්නම්. බලන්න, අද සහන ලබා දෙන්නට යනකොට තුන්දාහේ ආදායම් සීමාව ප්‍රශ්නයක් වෙලා තිබෙන ආකාරය. තුන්දාහේ ආදායම් සීමාව ඉක්මවන අයට, රුපියල් ලක්ෂයේ නිවාස සහනය දෙන්නේත් නැහැ. මේක සාධාරණද? ඇත්ත වශයෙන්ම මේ තුන්දාහේ

ආදායම් සීමාව තුළ පමණක් සහන ලබා දීම ලොකු අසාධාරණයක් හැටියටයි මා දකින්නේ. මේ ලබා දෙන රුපියල් ලක්ෂය ඔබතුමා කැබිනට් පත්‍රිකාවක් හරහා දෙගුණ කරන්න උත්සාහ කරනවාය කියලා මට දැන ගන්න ලැබුණා. මේ ලබා දෙන රුපියල් ලක්ෂය දෙගුණ කරනවා වෙනුවට අඩුම ගණනේ මෙය රුපියල් ලක්ෂ පහ දක්වාවත් වැඩි කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. නිවාසවලට හානි සිද්ධ වුණු ඒ පවුල්වලට රුපියල් ලක්ෂ පහක සහනයක් ලබා දෙන්නට ඔබතුමාගේ කැබිනට් පත්‍රිකාව සංශෝධනය කර ගන්න කියලා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ආපදාවක දී පිසූ ආහාර ලබා දෙනවාය කියනවා. මේ පිසූ ආහාර ලබා දීමේ දී ඒ ලබා දෙන ආහාරවල ගුණාත්මකභාවය සුරක්ෂා කරන්න යම් කිසි පැහැදිලි ක්‍රියාවලියක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම වියළි ආහාර සලාක ලබා දීමේ දී මේ ආහාර සලාකවල ගුණාත්මකභාවය පවත්වාගෙන යන්නට යම් කිසි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ඒ නිසා මා විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඉක්මනින්, නොපමාව, කඩිනම්ව මේ පිසූ ආහාර වාගේම වෙනත් සහන ලබා දීමේ ක්‍රියාවලිය විවාදයකට තුඩු නොදෙන ආකාරයට පැහැදිලි නිශ්චිත ක්‍රමවේදයක් හරහා ක්‍රියාත්මක කරන්න කියලා.

මම ඇමතිතුමාට රුපියල් 3,000 සීමාව ගැන කිව්වා. ඒ වාගේම තවත් ප්‍රශ්නයක් තිබෙනවා ඇමතිතුමනි. මෙවැනි අවස්ථාවකදී රජයේ සේවකයෙක් නම් කිසිම සහනයක් ලැබෙන්නේ නැහැ. ඒකත් අසාධාරණයි. ඒ මොකද ස්වාභාවික විනාශයකදී, සහන ලබා දීමේදී විපතට පත් වූ ජනතාව තෝරන්නට යනවා නම් ඒක මහා බලවත් අසාධාරණයක් හැටියටයි මම දකින්නේ. ගංවතුරක් එන විට, නාය යෑම් සිදු වන විට ආදායම් මට්ටම බලලා නොවෙයි විපතට පත් වෙන්නේ; ආදායම් භේදයකින් තොරවයි. එහිදී රජයේ සේවකයෙක්ද, නැද්ද කියන කාරණය අදාළ වන්නේ නැහැ. විපතක් එන විට හැමෝටම එක හා සමානව විපත එනවා. [බාධා කිරීමක්] ඔබතුමා පසුව උත්තර දෙන්න. මහා ව්‍යසනකාරී තත්ත්වයක් ඇවිත් ඉවක් බවක් නැතිව හැමෝම එයට ගොදුරු වුණු විට සහන ලබා දෙන විට කරුණාකරලා සාධාරණ ක්‍රමවේදයක් යොදවන්න. රජයේ සේවකයෙක් කියලා, මාසයකට රුපියල් 3,000කට වැඩි ආදායමක් ලබනවා කියලා සහන ලැබිය යුතු පුද්ගලයින්ගේ සහන මේ ආශ්චර්යවත් ශ්‍රී ලංකාවේ කප්පාදු කරන්න එපා කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ සහන ලබා දීමේ ක්‍රියාවලියේ අද බරපතළ අඩු පාඩුවක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කාරණයටත් පොඩ්ඩක් සවන් දෙන්න. විශේෂයෙන්ම විපතකදී සහන සැලසීමේ ක්‍රියාවලියට බිම් මට්ටමෙන් සම්බන්ධ වන ප්‍රධාන නිලධාරියා තමයි ග්‍රාම නිලධාරිවරයා. මම මේකේ ලොකු අඩු පාඩුවක් දකිනවා. මොකද, ග්‍රාම නිලධාරි වසම් ගණනාවක වැඩ ආවරණය කරන ග්‍රාම නිලධාරිවරුන් බොහෝ දෙනෙකු සිටිනවා. තනි පුද්ගලයකුට මේක කරන්නට අමාරුයි. ඒ නිසා විශේෂයෙන්ම ග්‍රාම නිලධාරි වසමකට සිටින සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයා, කෘෂි පර්යේෂණ නිලධාරිවරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, අලුතින් පත්වීම් ලබා දුන් උපාධිධාරින් සහ ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් කියන මේ සියලුම කණ්ඩායම් එකතු කරලා, -ග්‍රාම නිලධාරිවරයා මත පමණක් බර පටවන්නේ නැතිව- බිම් මට්ටමේ සහන ලබා දීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කරන්නට කියලා, ශක්තිමත් යාන්ත්‍රණයක් ගොඩ නඟන්න කියලා මම යෝජනා කරනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාට කියන්නට කැමැති කාරණයක් තිබෙනවා.

ග්‍රාම නිලධාරිවරයාට පමණක් පිසූ ආහාර දෙන්න බැහැ; අනාථ කඳවුරු නඩත්තු කරන්නට, පරීක්ෂා කරන්නට සහ අධීක්ෂණය කරන්නට බැහැ. ඒ වාගේම වියළි සලාක දෙන්නට බැහැ. ඒ වාගේම දත්ත සහ සංඛ්‍යා ලේඛන සකස් කිරීමේ ක්‍රියාවලිය තනි පුද්ගලයකුට කරන්නට බැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා කරුණාකරලා සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයාත්, කෘෂි පර්යේෂණ නිලධාරිවරයාත්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, උපාධිධාරි පත් වීම් ලැබූ අය සහ ත්‍රිවිධ හමුදා නිලධාරින් කියන මේ කණ්ඩායමම මේ වැඩසටහනට යොමු කරන්න කියලා. ගරු ඇමතිතුමනි, එතකොට කවුරුත් ආවේ නැහැ, කවුරුත් බැලුවේ නැහැ, කවුරුත් කෙරුවේ නැහැ, කවුරුත් උදවු කළේ නැහැ, කවුරුත් පියවර ගත්තේ නැහැ කියන මැසිවිලි ඔබටත්, මටත්, අපි කාටත් අහන්නට ලැබෙන්නේ නැහැ. ඒ වාගේම හදිසියේ -කඩිමුඩියේ- මේ උපාධිධාරින් මේවාට යොමු කරනවා වෙනුවට ඒ අයව පුහුණු කරන්නට වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ඒ පුහුණු වැඩසටහනක් හරහා මේ සහන වැඩසටහන ක්‍රියාත්මක කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරන පනත පැහැදිලි සංශෝධනයකට ලක් වන්නට ඕනෑ කියලා මම යෝජනා කරන්නට කැමැතියි. විශේෂයෙන්ම අද මේ පනත හරහා ආපදා කළමනාකරණයට ලබා දීලා තිබෙන්නේ සම්බන්ධීකරණ බලය පමණයි. Enforcement powers නැහැ; coordination powers විතරයි තිබෙන්නේ. හරි නේද? ඒක නේ ඇත්ත කථාව. ඒ නිසා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත ක්‍රියාත්මක කිරීමේ බලය- enforcement powers - ලබා දෙන්නට නම් මේ පනත පැහැදිලිවම සංශෝධනය කරලා ආපදා කළමනාකරණය සක්‍රීයව ක්‍රියාත්මක කිරීම සඳහා නෛතික බලය ලබා දීමට වහාම ක්‍රියාත්මක වන පරිදි, ඔබතුමාගේ වැඩ සටහන් ක්‍රියාත්මක වන මේ පනත සංශෝධනයට ලක් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ආයතන ගණනාවක් තිබෙනවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ආපදා සහන සේවා මණ්ඩලය තමයි ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන.

ගරු ඇමතිතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ගැන ඔබතුමාට අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට මම කැමැතියි. ඇත්තම කථා කරනවා නම් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව නවීන ආම්පන්න නැත.

කාලගුණ අනාවැකි පැහැදිලිව ප්‍රකාශ කරන්න අවශ්‍ය රේඩාර් පද්ධති නැහැ ගරු ඇමතිතුමනි. මා දන්නවා ඔබතුමන්ලා රුපියල් මිලියන 400ක් වැය කරලා ගොන්ගල ප්‍රදේශයේ weather radar පද්ධතියක් පිහිටුවා තිබෙන බව. ගොන්ගල ප්‍රදේශයේ තිබෙන ඒ රේඩාර් පද්ධතියෙන් දකුණ, සබරගමුව, බටහිර යනාදි පළාත් පමණයි ආවරණය වන්නේ. ඒ වාගේම අපි දන්නවා රිවස්ටර්න්හි තවත් weather radar පද්ධතියක් ස්ථාපනය කරන්න ඔබතුමන්ලා කටයුතු කරගෙන යන බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා ම දන්නවා ඒ weather radar පද්ධතිය ස්ථාපනය කිරීමේ කටයුතුවලදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුව -මුදල් අමාත්‍යාංශයේ ERD එක- proposal එක තියාගෙන 2010 ඉඳලා කල් මරමින්, කල් යවමින්, තටම තටමා ඉබි ගමනින් ක්‍රියා කළ බව. ඇයි ඒ? මේ රටට සල්ලි නැහැ කියලා ජාත්‍යන්තර අරමුදල් -ලෝක කාලගුණ සංවිධානයේ අරමුදල්- එන තෙක් බලාපොරොත්තුව සිටියා. දැන් එය JICA Proposalsවලට දමා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ කටයුත්තට විදේශ ආධාර ලැබෙන තෙක් ඉන්න එපා. කරුණාකර දේශීය සම්පත්වලින් රිවස්ටර්න්හි weather radar පද්ධතියත් ස්ථාපනය කරන්න. ගොන්ගල weather radar පද්ධතියක් ස්ථාපනය කළා නම් මේ කටයුත්තත් කරන්න.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ බරපතළ හිඟයක් තිබෙනවා. විද්‍යාත්මක නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. එම දෙපාර්තමේන්තුවේ නිලධාරින් මනා පුහුණුවකට ලක් කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, සුනාමි අවදානම රටට දැනුම් දීම සඳහා අවශ්‍ය වන පාවෙන බෝයා ක්‍රමයක් අපේ රටේ ඇති කරන්න. 2004 දී සුනාමියක් ආවා. සුනාමි අවදානම ගැන, මුහුදු ජල මට්ටම ඉහළ යෑම පිළිබඳව දැන ගන්න පුළුවන් පාවෙන බෝයා -සුනාමි බෝයා- ස්ථාපනය කරන්න මේ ආශ්චර්යවත් රජය මේ මොහොත වන විටත් අපොහොසත් වෙලා තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. ඒ නිසා නවීන ආම්පන්න නොමැති තැනට නවීන ආම්පන්න ලබා දෙන්නත්, පුහුණු සේවක මණ්ඩලයක් නොමැති තැනට පුහුණු සේවක මණ්ඩලයක් ලබා දෙන්නත් කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ කටයුතු කරන නිලධාරි මණ්ඩලයට දිරි දීමනා ලබා දෙන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරින් අවුරුදු හතරක් පහක් තිස්සේ නියමිත පුහුණුවලට ගිහින්, workshopsවලට ගිහින්, seminarsවලට ගිහින්, පිට රට ශිෂ්‍යත්වවලට ගිහින් ඒ මාතෘකාව ගැන ඉගෙන ගන්නවා. ඒ ඔක්කෝම කරලා ඉවර වුණාට පස්සේ -අවුරුදු හතරකට පමණ පස්සේ- ඒ අය වෙනත් ආයතනවලට යනවා. කොහේටද යන්නේ? රේගුවට යනවා; එහෙම නැත්නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යනවා. ඇයි ඒ? රේගුවේත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේත් දෙනවා තුනෙන් එකේ incentive bonus එකක්. එහෙම නේද ගරු ඇමතිතුමනි? ඒවායේ දිරි දීමනාවක් දෙනවා. ඒ නිසා බොහෝ දෙනා ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් පිට වෙලා යනවා. ඒ හේතුවෙන් දක්ෂ පක්ෂ, හපන්කම් තිබෙන, උසස් හැකියාවක් තිබෙන නිලධාරින් රඳවා ගන්න පැහැදිලි වැඩසටහනක් -දිරි දීමනා ලබා දෙන වැඩ සටහනක්- අමාත්‍යාංශය තුළත්, ඒ ආයතන තුළත් ස්ථාපනය කරන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තවත් ඉල්ලීමක් කරනවා ගරු ඇමතිතුමාගෙන්. ගරු ඇමතිතුමනි, ආපදා කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන්න සම්පත් ලබා ගන්න ඔබතුමා යම් වැඩ පිළිවෙළක් යොදන්න. ඔබතුමා අමනාප වන්න එපා මා මෙහෙම කියනවාට. ඔබතුමාගේ pool එකේ දැනට තිබෙන්නේ වෑන් එකකුයි, three-wheeler එකකුයි විතරයි. වෑන් එකකුයි, three-wheeler එකකුයි විතරක් තියාගෙන කොහොමද අපේ රටේ ආපදා කළමනාකරණය කරන්නේ?

නමුත් බලන්න, ලැම්බෝගිනි සංදර්ශනයට දැන් රුපියල් ලක්ෂ 2,000ක් වැය කරනවා. හැබැයි බඩගිනි වැඩ පිළිවෙළට වෑන් එකයි three-wheeler එකයි විතරයි. මේවා ඇත්ත කථා. මේවා අසත්‍ය නොවෙයි. මා විශේෂයෙන් ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි, කොළඹ ඉඳගෙන, නිලධාරින් ටික කොළඹ තියා ගෙන ආපදා කළමනාකරණය කරන්න බැරි බව. ආපදාවකදී අවශ්‍ය වන වාහන ටික ලබා ගන්න ගරු ඇමතිතුමනි. ඔබතුමාගේ අමාත්‍යාංශයට 365 දවසේම, 24 පැයේම වාහන අවශ්‍ය නැහැ. නමුත් ආපදාවකදී, වාහන අතිරික්තයක් තිබෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් හරි වාහන ටිකක් ගෙන්වා ගන්න. එසේ වාහන ගෙන්වාගෙන ආපදාවකදී විපතට පත් වූ ජනතාවට සහන ලබා දෙන්න යම්කිසි පැහැදිලි වැඩසටහනක් ඔබතුමා ක්‍රියාත්මක කරන්න.

ගරු ඇමතිතුමනි, සංවර්ධන ව්‍යාපෘතියක් කරන කොට බොහෝ විට EIA එකක්, ඒ කියන්නේ පාරිසරික ඇගයීම් වාර්තාවක් හෙවත් Environmental Impact Assessment එකක් කරන බව ඔබතුමා දන්නවා. ඉදිරියේදී සංවර්ධන ව්‍යාපෘති වැඩ කටයුතු ක්‍රියාත්මක කරන කොට EIA එකක් කරනවා වාගේම Disaster Impact Assessment එකකුත් කරන්න කියලා. ඒ ආපදා ඇගයීම් වාර්තාවකුත් සකස් කරන්න යම් ප්‍රතිපාදනයක් යොදන්න කියා මා ඉල්ලීමක් කරනවා. මා එහෙම කියන හේතුව කියන්නම්. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ කිවුලේකඩ ප්‍රදේශයේ කිවුලේකඩ ජලාශයට මොකක්ද සිදු වුණේ?

මීට වසර කිහිපයකට පෙර කිවුලේකඩ ජලාශය කඩා ගෙන ගියා. එම ජලාශය ප්‍රතිසංස්කරණය කරන්න රජය රුපියල් මිලියන ගණනාවක් යෙදෙව්වා. ප්‍රදේශයේ ගොවි ජනතාව කිව්වා, "ජලාශය ප්‍රතිසංස්කරණය කරන කොට පිට වානක් සමඟ ඒ කටයුත්ත කරන්න" කියලා. එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමා මේ විස්තරය දන්නවා. නමුත් ඒ ජලාශය ප්‍රතිසංස්කරණය කෙරුණේ පිට වානක් නැතුවයි. මෙදා පාර මොකද වුණේ? මේ මහා ගංවතුරත් සමඟම කිවුලේකඩ ජලාශය නැවත කඩා ගෙන ගියා; කුඹුරු සියල්ලක්ම සම්පූර්ණයෙන්ම විනාශ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් උදාහරණයක් මා කියන්නම්. දැන් මොරගහකන්ද ව්‍යාපෘතිය ක්‍රියාත්මක වනවා. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ අඹන්ගඟ හරහා ඉදි වුණු බාල පාලම් සියල්ලම කඩා ගෙන ගියා. සංවර්ධනයේ නාමයෙන් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වුණත්, ආශ්චර්යවත් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බාල ව්‍යාපෘති නවත්වන්නට ඇමතිතුමනි, කරුණාකර ආපදා ඇගැයීම් වාර්තාවක් සකස් කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. අපි හැම විටම උත්සාහ කරන්නට ඕනෑ, මේ මහා විනාශය සෞභාග්‍යයට පරිවර්තනය කරන්න. You must try to turn disaster into prosperity. මා ඒ සඳහා ඔබතුමාට යෝජනා කරනවා, ඔබතුමාගේ අමාත්‍යාංශය තුළ වෙනම ම ඒකකයක් ස්ථාපනය කරන්න; රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වන්න; ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධ වන්න; තානාපති කාර්යාල සමඟ සම්බන්ධ වන්න; අලුත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න කියලා. Facebook හරහා, websites හරහා, e-mails හරහා, Twitter හරහා මේ නවීන තොරතුරු තාක්ෂණ විප්ලවයේ සියලුම අංගෝපාංග උපයෝගි කර ගෙන, මේ සිදු වන ව්‍යසනයන් සෞභාග්‍ය කරා පරිවර්තනය කරන්නට ඔබතුමා අලුත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා පිට රටින් ලබා ගන්න පුළුවන් උපරිම සහන ටික රට වෙනුවෙන් ලබා ගන්න. ඔබතුමා මේ රටේ සම්පත්වලින්ම යැපෙන්න යන්න එපා. පිට රටවලින් ලබා ගත හැකි උපරිම සහන ටික ලබා ගන්නට යම් ක්‍රමෝපායයක් යොදවන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

මගේ කථාව අවසන් කරන්නට පෙර විශේෂයෙන්ම මේ කාරණය කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, අපට තිබෙනවා, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩි දෙකක් දෙන්න.

ස්වාභාවික විපත් පිළිබඳව පිට රටවල් අනුගමනය කරන ක්‍රියා මාර්ගවලින් අපට යම් පාඩමක් ඉගෙන ගන්න තිබෙනවා. මා කියන්නේ නැහැ, පිට රටවල ක්‍රම ගෙනැවිත් ඒවා මේ රටේ ක්‍රියාත්මක කරන්න කියලා. නමුත් පිට රටවල ක්‍රියාත්මක වන විවිධ වැඩසටහන්වලින් යම් යම් පාඩම් ඉගෙන ගන්නට අපට පුළුවන්. මේ කරුණු කෙරෙහි ඇමතිතුමාගේ අවධානය මා යොමු කරනවා. ජර්මනියේ බර්ලිං නගරයේ පාවිච්චි කරනවා, 3D citi models. තොරතුරු තාක්ෂණය යොදවා ගෙන නගරයේ වැසියන් නිරන්තරයෙන් දැනුවත් කරලා ආපදා කළමනාකරණය කරන වැඩසටහන් ජර්මනියේ බර්ලිං නගරයේ ක්‍රියාත්මක වනවා. ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්තයේ disaster management arrangements ක්‍රියාත්මක වනවා. ඒ වාගේම චීනයේ National Commission for Disaster Reduction ක්‍රියාත්මක වනවා. ඒ වාගේම ඇමෙරිකාවේ disaster mitigation plan එකක් ක්‍රියාත්මක වනවා. ජපානයේ International Rescue Team Japanese Fire-Service ක්‍රියාත්මක වනවා. සිංගප්පූරුවේ OPS Civil Emergency Plan ක්‍රියාත්මක වනවා. මා මෙම තොරතුරු අඩංගු ලේඛන සියල්ලම **සභාගත*** කරනවා, ගරු ආපදා කළමනාකරණ ඇමතිතුමාගේ අවධානය පිණිස. මේ සියලුම සැලසුම්වලින්, මේ සියලුම වැඩසටහන්වලින්, යම් කිසි ආපදාවකදී ඒ ආපදාව නිර්මාණශීලීව කළමනාකරණය කිරීම තුළින් ආපදාවට ලක් වන ජනතාවට ඇති වන ආපදාව අවම කරන්නට අපට රටක් හැටියට පාඩම් රැසක් ඉගෙන ගන්නට පුළුවන්.

ඒ විතරක් නොවෙයි, ගරු ඇමතිතුමනි. නිවාස කැඩුණාම ඔබතුමන්ලා සමීක්ෂණයක් කරනවා. වැව් ටික කැඩුණාම ඔබතුමන්ලා සමීක්ෂණයක් කරනවා. ඒ වාගේම වගා හානි සිදු වුණාමත් සමීක්ෂණයක් කරනවා. හැබැයි මේ සමීක්ෂණ, ගවේෂණ, පර්යේෂණ, අධීක්ෂණ යන හැම ක්‍රියාවලියකින්ම පස්සේ සහන ලබා දීම ක්‍රියාත්මක වන්නේ වෙනත් ආයතනවලින්. නිවාස ප්‍රශ්නයට සහන ලැබෙන්නේ ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අරමුදල් සහිතව. වගා හානි සිදු වුණු අයට සහන ලැබෙන්නේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන්. ඒත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අරමුදල් සහිතව. ඒ වාගේම වැව් අමුණු කැඩුණාම ඒවාට සහන ලැබෙන්නේ මහා වාරි, පළාත් වාරි, සුළු වාරි අයිති මධ්‍යම අණ්ඩුවේ ආයතනවලින් සහ පළාත් සභාවේ ආයතනවලින්.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් මේ නිවාස ප්‍රශ්නය ගැන මා ඊයේ ප්‍රශ්නයක් ඇහුවා. 2005 දී පොරොන්දු වුණා, පැල්පත් 65,000ක ජීවත්වන ජනතාව වෙනුවෙන් නිවාස හදන්න. පැල්පත්වල ජීවත් වන ජනතාව වෙනුවෙන් මේ අවුරුදු 6කටම, අවුරුදු 7කටම හදා තිබෙන්නේ නිවාස 999යි. ඒ වාගේම රජයේ සේවකයන්ට පසු ගිය කාලය පුරාවටම ඉදි කර දීලා තිබෙන්නේ නිවාස 672යි. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මෙවර නිවාස හානියට ලක් වූ ජනතාවට ගෙයක් හදා ගන්න සහන ලැබෙන්නේ කවදාද කියලා. මා එහෙම අහන්නේ ඇයි? 2004 දී සුනාමි ව්‍යසනයක් ඇති වුණා.

අදටත්- මේ මොහොත වන විටත් - සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වුණු ජනතාව නිවාස නැතිව ඉන්නවා, කොළඹ දිස්ත්‍රික්කයේ අඟුනුවර, මොරටුව කොට්ඨාසයේ, දෙහිවල කොට්ඨාසයේ, රත්මලාන කොට්ඨාසයේ, විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ සයින්දමරදු ප්‍රදේශයේ. ගරු මහින්ද අමරවීර ඇමතිතුමනි, ඔබතුමා මේවා ඔක්කොම දන්නවා. නිහඬව ඉන්නේ ඒවා ඇත්ත නිසායි. [බාධා කිරීම්] විශේෂයෙන්ම මම කියන්න කැමැතියි ගරු ඇමතිතුමනි, 2004 දී ඇති වුණ සුනාමි ව්‍යසනය නිසා නිවාස 40,000ක් විනාශ වී තිබෙනවා කියලා. 2013 වන විටත් ඒ ගෙවල් ටික හැදිලා නැහැ. ඒ නිසා 2012 විපතට පත් වුණු ජනතාවගේ ගෙවල් ටික හැදෙන්නේ 2020ද කියලා මම අහන්න කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Thank you. ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර 30ක් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඔබතුමා විනාඩි පහක් වැඩිපුර කථා කර තිබෙනවා. තත්පර 30න් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවයේ නාමයෙන් මට තව තත්පර 30ක කාලයක් දෙන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තත්පර 30ක් දෙන්නම්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසාන වශයෙන් ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරීතරභාවයටද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අවසාන වශයෙන් මම ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට අපට තොරතුරු දැන ගැනීමේ අයිතිය තිබෙනවා. පසු ගිය දවසක මම රජයේ නිලධාරිවරයකුට කථා කරලා ගංවතුරින් විපතට පත් වුණු ජනතාව ගැන තොරතුරු ඇහුවා. එතුමා මට කිව්වා, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලන්න කියලා. මම මහජන මන්ත්‍රීවරයෙක්. මම යම් කිසි වැඩක් කරන්නයි උත්සාහ කළේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

අවසාන වශයෙන් මම කියන්නේ මේ ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයේ සේවය කරන හොඳ අයට යම් කිසි දිරිගැන්වීමක් කරන්න කියලායි; Rewards system එකක් පටන් ගන්න කියලායි. බිංගිරිය ප්‍රාදේශීය ලේකම්තුමා කළ ඒ උත්තරීතර කාර්ය භාරය ගැන ඔබතුමාත් දන්නවා. ඒ අය ඇගයීමට ලක් කරන්න. ඒ වාගේම තමන්ගේ රාජකාරිය හරියට ක්‍රියාත්මක නොකළ අයට නීතිය යටතේ දැඩි දඬුවම් ලබා දෙන්න කටයුතු කරන්නය කියන ඉල්ලීමත් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි. ගරු එස්.එම්. චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 3.23]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය දිනවල ඇති වුණ ගංවතුර උවදුරින් අපේ ජනතාව බේරා ගන්න, ඒ වාගේම ඒ අයට පහසුකම් සපයන්න කියලා අතිගරු ජනාධිපතිතුමා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඇතුළු අදාළ සියලුම අංශවලට දැනුම් දුන්නා. ඒ අනුව රජයක් හැටියට අපි ඒ සියලුම කටයුතු හරියාකාරව කළා. අපේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවා. දැන් එතුමා පෙනෙන්නත් නැහැ. මොනවා මොනවා හරි අතහැරලා යන්න ගිහිල්ලා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

එතුමා ඉන්නවා. ඔබතුමා කථා කරන්න.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

එතුමා ඉන්න එපායැ. හුඟාක් දේවල් දන්නේ නැතිවයි කථා කරන්නේ. දැන් කිව්වා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට තිබෙන්නේ වෑන් එකකුයි ත්‍රීවීලර් එකකුයි විතරයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඇත්ත නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

තමුන්නාන්සේලා අනුරාධපුර පැත්තේ ආවා නම් වාහන කීයක් තිබෙනවාද කියලා බලා ගන්න තිබුණා. ඒ පළාත හුඟාක් ගංවතුරට අසු වුණා. මේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හැදිලා තිබෙන හැටි, එහෙම නැත්නම් ඒ ආයතනවල කටයුතු කරන හැටි තමුන්නාන්සේලා දන්නේ නැහැ. ජාතික ආපදා කළමනාකරණ කමිටුව තිබෙනවා. ඒක අතිගරු ජනාධිපතිතුමා, ගරු විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා, අදාළ විෂය භාර ඇමතිතුමාගෙන් සමන්විත වෙනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා කියනවා අරලියගහ මන්දිරයට ගියොත් එක එක කථා හැදෙයිලු. ඒ හැදෙන කථා මොනවාද දන්නේ නැහැ. [බාධා කිරීමක්] ගිහිල්ලා කෝපි නොබී ආවා නම් හරි. එතුමා අරලියගහ මන්දිරයට ගියේ නැහැයි කියමුකෝ.

ඊළඟට තිබෙනවා පළාත් ආපදා කළමනාකරණ කමිටුවක්. තමන්ට වැඩ කරන්න අවශ්‍ය නම්, තොරතුරු සොයන්න අවශ්‍යනම්, ජනතාවට සේවය කරන්න අවශ්‍ය නම් ඒකට යන්න පුළුවන්. ඒ වාගේම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව තිබෙනවා. ඒකටත් යන්න පුළුවන්.[බාධා කිරීමක්] ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට බාධා කළේ නැහැ නේ. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කමිටු තිබෙනවා. ඒවාට සම්බන්ධ වන්නටත් පුළුවන්. එහෙම නැත්නම් ග්‍රාම නිලධාරි මහත්මයායි, සමෘද්ධි නිලධාරිවරයායි, කෘෂිකර්ම පර්යේෂණ නිලධාරිවරයායි, අදාළ පොලීසිවල නිලධාරිනුයි එකතු වෙලා කටයුතු කරනවා. ආපදා ඇති වුණාම අපි වැඩ කළ හැටි දකින්න, බලන්න එන්න ඕනෑ. ඉතින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ සියලු දෙනාම එකතු වෙලා මේ සඳහා විශාල සේවයක් කළා.

සමහර අය ගිහිල්ලා සහල් පැකට් දෙකක් තුනක් බෙදලා සංදර්ශන පැවැත්වූවාට අපට කරන්න දෙයක් නැහැ. අපේ මැති ඇමතිවරු වතුරේ ගිහිල්ලා ඒ කටයුතු කළා. අර ගරු ෂෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා ගිය බෝට්ටුව ගිලෙන්නත් ගියා. තමුන්නාන්සේලා ඒවා බලන්න ඕනෑ. අපේ ආපදා කළමනාකරණ ඇමතිතුමාත් ගිහිල්ලා වැස්සේ තෙමී තෙමී ඒ ජනතාවට අවශ්‍ය සේවාවන් කළා. තමුන්නාන්සේලාට ඒවා පෙනෙන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට ඒවා තේරෙන්නේ නැහැයි කියලා අපි දන්නවා නේ. එතුමා යුද්ධ කාලයේ කිව්වේත් කිලිනොච්චියේ යනවා කියලා මැදවච්චියේ ගියා කියලායි. අන්තිමට ගියේ කිලිනොච්චියේද, මැදවච්චියේද කියලා කවුරුත් දැක්කා නේ. ගිය තැන රටේ මිනිස්සු දන්නවා නේ. ඒ වාගේ තමයි ආපදා කළමනාකරණය ගැනත් කොළඹ ඉඳන් විවේචන කරන්නේ. අඩු ගණනේ ගිහිල්ලා සහල් පැකට් එකක් බෙදපු අය නම් මේවා කිව්වත් කමක් නැහැ. කිසිම දෙයක් කරන්නේ නැතිව මෙහාට වෙලා ඉන්නවා. ටයි එකයි කෝට් එකයි ගහ ගෙන ඉඳලා අන්තිමට මෙතැනට ඇවිල්ලා, අව්වට වේලිලා, වැස්සට තෙමිලා මහන්සි වුණු අය ගැන, ගංවතුරේ ගිලෙන්න ගිහිල්ලා පණ බේරා ගත් අය ගැන අවලාද නඟනවා. ඒක ඉතාම කනගාටුදායකයි.

විශේෂයෙන්ම ගංවතුර නිසා දිස්ත්‍රික්ක 16ක විතර ජනතාව තද බල විධියට අසරණ වුණා. අපේ ආපදා කළමනාකරණ ගරු ඇමතිතුමා ඒ ප්‍රදේශවලට ගිහිල්ලා අපිත් එක්ක එකතු වෙලා ඒවා ගැන පෞද්ගලිකවම සොයා බැලුවා.

අපේ ගරු ඒකනායක අමාත්‍යතුමා ඉන්නවා. ගංවතුර පටන් ගත් දවසේ සිට අප ඒ අය කවුරුවත් බඩගින්නේ තැබුවේ නැහැ. ප්‍රාදේශීය ලේකම්වරුන් හුඟක් මහන්සි වුණා. මහන්සි වුණේ නැති එක්කෙනෙක් දෙන්නෙක් ඇති. එහෙම අය නැහැ කියනවා නොවෙයි. නිලධාරිවරුනුත් හුඟක් මහන්සි වුණා. ග්‍රාම නිලධාරිවරු මහන්සි වුණා. ඒ අයත් ගංවතුරට අහු වෙලායි හිටියේ. තමන්ගේ ගෙයත් යට වෙලා තිබෙද්දී ඒ අය අනුන්ට සේවය කරන්නට ගියා. අප ඒ අයට ස්තුතිවන්ත වන්නට ඕනෑ. අප ඒ අයට අවලාද නඟන්නට හොඳ නැහැ. අපේ මැති ඇමතිවරු ඒ අවස්ථාවේදී මේ කාර්යයට ගිහින් සම්පූර්ණයෙන්ම බැහැලා වැඩ කළා. සමහර අය තමන්ගේ පෞද්ගලික වියදමෙන් කන්න බොන්න දුන්නා. ඒ වාගේම වෙලාවට පිසූ ආහාර ලබා දුන්නා.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විතරක් නොවෙයි. පළාත් සභාවලිනුත් මේ සඳහා මැදිහත් වෙලා විශාල ආධාර කොටසක් ලබා දුන්නා. ඒ අයත් ගිහින් ඒ ජනතාවගේ සැප පහසුකම් සොයා බැලුවා. වෛද්‍ය සේවයෙන් සෞඛ්‍ය පහසුකම් ලබා දුන්නා. කරන්නට පුළුවන් උපරිම දෙය කළා. මේවා කෙරුණේ නැහැ කියා ජනතාව කොහේවත් කියා නැහැ. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් තමයි මේවා කියන්නේ.

ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමා අනුරාධපුරයේ අවතැන් වූවන්ගේ කඳවුරෙන් කඳවුරට ගිහින් ඒ අයගෙන් විමසුවා, "තව මොනවාද අඩු පාඩු තිබෙන්නේ?" කියා. එතුමා කිව්වා, "අඩු පාඩු තිබෙනවා නම් ප්‍රසිද්ධියේ කියන්න"ය කියා. නිලධාරීන් ආරක්ෂා කරන්නට යන්න එපා, අඩු පාඩු තිබෙනවා නම් කෙළින්ම කියන්න කියා අප කිව්වා. ඒ කඳවුරුවල ඉන්න ජනතාව කිව්වේ, "කිසිම දෙයක් අඩුවක් නැහැ ගරු ඇමතිතුමා. අපට කෑම බීම ටික හම්බු වුණාය" කියායි. අප බඩු මුට්ටු වැඩිපුරත් එක්ක ඒ අයට ගිහින් දුන්නා. ගංවතුරට අහුවුණා ද, අවතැන් වුණා ද කියන එක තේරෙන්නේ නැති තත්ත්වයට අප ඒ කටයුතු ටික කළා. කාටවත් ඒක නැහැ කියන්නට බැහැ. එම නිසා ගංවතුර ප්‍රදේශවල හිටපු අය හැටියට, ගංවතුරට අහුවුණු අය හැටියට අපි අතිගරු ජනාධිපතිතුමාට, ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාට සහ එයට අදාළව කටයුතු කළ සියලුම අංශවලටත් අපේ ස්තුතිය, ගෞරවය හා ප්‍රණාමය පුද කරනවා.

ගෙවල් ලක්ෂ තුන හතරක් විනාශ වෙලා -විනාශ වී තිබෙන තත්ත්වයටත් වඩා -තිබෙනවාය කියා කවුරු හෝ වැරදි තොරතුරු දෙනවා. තිබෙන තත්ත්වයට වඩා තුන් හතර ගුණයකින් දහස් ගුණයකින් වැඩි කර කියන අයත් ඉන්නවා. විශේෂයෙන් මේ ගංවතුරෙන් වැඩිහරියක් හානි වුණේ කුඹුරුවලටය කියන එක අප දන්නවා. වී ගොවීන්ට හානි සිදු වුණා. දිස්ත්‍රික්ක 12ක - අනුරාධපුරය, පොළොන්නරුව, කුරුණෑගල, හම්බන්තොට, අම්පාරේ, ත්‍රිකුණාමලය, මඩකලපුව, මන්නාරම, මාතලේ, පුත්තලම, වවුනියාව සහ මුලතිව් යන දිස්ත්‍රික්කවල- ගොවීන්ට හානි සිදු වුණා. මේ දිස්ත්‍රික්කවලට අප පුළුවන් තරම් ගිහින් ඒ ගොවීන් මුණ ගැසී ඔවුන්ගේ අඩු පාඩුකම් සොයා බැලුවා. අතිගරු ජනාධිපතිතුමා කිව්වා, ඒ අයට නැවත වගා කරන්නය කියා. රජය ගොවීන්ට රුපියල් 350ට පොහොර මිටියක් දෙන්නේ රුපියල් 3,500ට ගෙනැල්ලයි. භාණ්ඩාගාරය මේ සඳහා සියයට 90ක වැය බරක් දරනවා. සියයට 10යි ගොවියා ලබා දෙන්නේ. රජයෙන් රුපියල් 3,500ට පොහොර මිටිය ගෙනැවිත් රුපියල් 350ට දුන්නා. ගංවතුර එනකොට මේ දිස්ත්‍රික්කවලට පොහොර සහනාධාරය දීලායි තිබුණේ. ඒ පොහොර පාවිච්චි කරලායි තිබුණේ. ඒ සියලුම පොහොර ගහගෙන ගිහින් තිබුණා. නමුත් රජය නැවතත් පොහොර ටික නොමිලයේ ලබා දෙන්න, බිත්තර වී ටික නොමිලයේ ලබා දෙන්න කටයුතු කරනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයට ඒවා සම්පූර්ණයෙන්ම දැන් යවා තිබෙනවා. අනුරාධපුර, කුරුණෑගල ප්‍රදේශවලට ගොවිජන සේවා පොර්තමේන්තුව හැටියට ඒ පහසුකම අප ලබා දී ගෙන යනවා. ඒ වාගේම ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් ඒ අයගේ නිවාස සාදා ගැනීම සඳහා අවශ්‍ය ආධාර උපකාර කර ගෙන යනවා.

සමහර ඉල්ලීම් දේශපාලන ඉල්ලීම් බව අප දන්නවා. සමහරු ඉල්ලනවා, ගෙවල් හදා ගන්න රුපියල් ලක්ෂ පහ දහය දෙන්නය කියා. දේශපාලන වාසි ගන්නයි එහෙම කියන්නේ. එහෙම දෙන ක්‍රමයක් තිබෙන්න එපායැ. ඒ වාගේම දෙන්නට පුළුවන් ගණනක් ගැන කියන්නත් එපායැ. පුළුවන් ගණන් තමයි දෙන්නේ. ජනතාව සතුටු වෙනවා, මෙච්චරයි ආණ්ඩුවට දෙන්නට පුළුවන් කියා. ඊට එහායින් කරන ඉල්ලීම් මොනවාද? මොකද සමහරු මේ වෙලාවේ රැවුලට ගිනි ගත්තාම සුරුට්ටුපත්තු කර ගන්නත් හදනවා. කියන්න ලේසියි. කරන්න ගියාම තමයි අමාරුව පේන්නේ. අප විපක්ෂයේ සිටි අවස්ථාවක යෝජනාවක් ගෙනාවා. මමයි ඒ යෝජනාව ගෙනාවේ. රුපියල් 500කට පොහොර මිටියක් දෙන්නයා කියා ඉල්ලුවා. තමුන්නාන්සේලාගේ මහ ලේකම්තුමා -තිස්ස අත්තනායක මැතිතුමා- කිව්වා, එහෙම දෙන්න නම් ඇලඩින්ගේ පුදුම පහන වෙන්න ඕනෑය කියා. එහෙම දෙන්න පුළුවන්ද කියා ඇසුවා. අප විපක්ෂයේ ඉඳගෙන රුපියල් 500ට පොහොර සහනාධාරය දෙන්නය කියා ඉල්ලුවාම, "එහෙමනම් ඉතින්ඇලඩින්ගේ පුදුම පහන වාගේ වෙන්න ඕනෑය" කිව්වා. ඒ කියන්නේ එහෙම දෙන්න බැහැ කියලා නේ. ඒ පහන පත්තු කරලා, අප පන්සියයෙනුත් අඩු කරලා රුපියල් තුන්සිය පණහට පොහොර සහනාධාරය දැන් දී ගෙන යනවා. [බාධා කිරීම්] තමුන්නාසේලාත් එහෙම තමයි -[බාධා කිරීම්]

ඔය ගණන් කියනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් එහෙම තිබුණා නම් ඔය සොච්චමවත් දෙන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපේ දිසාපතිවරුන්ට ස්තුතිවන්ත වෙනවා. දිසාපතිවරු රෑ දවල් නොබලා මහන්සි වුණා. රෑ දවල් නැතිව ඒ යුතුකම් ඉෂ්ට කළා. අපේ හැරිසන් මන්ත්‍රීතුමා කිව්වා; අයියයි, මල්ලියි දෙදෙනා මාධ්‍ය සංදර්ශන පැවැත්වූවා කියා. අපි ගිහින් මේවා බෙදන විට සංදර්ශනය වෙනවා තමයි. මාධ්‍යවේදීන් කැමරා අල්ලනවා. කොළඹට වෙලා ඉන්න අය ඒ සංදර්ශනවලට අහු වෙන්නේ නැහැ. අපි ඒකට මොනවා කරන්නද? තමුන්නාන්සේලා සංදර්ශනයක් දෙකක් දැම්මා නම් හරි. අපි කිහිප දෙනෙක්ම සංදර්ශන පැවැත්වූවා. අනෙක් අය එහෙමවත් කළේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේ රජයක් හැටියට අපේ යුතුකම්, වගකීම් හරියාකාරව ඉෂ්ට කර තිබෙනවා.

2010, 2011 අවුරුදුවල ගංවතුර ආවා. රජය හැටියට අප ඒ තත්ත්වයට මුහුණ දුන්නා. එයින් අපේ කුඹුරු විශාල ප්‍රමාණයක් විනාශ වුණා. මේ පැත්තෙන් මඩකළපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පොළොන්නරුව, අනුරාධපුර ආදී දිස්ත්‍රික්ක පහක් ගංවතුරේදී හානි වුණා. ඒ වෙලාවේ හුඟක් දෙනෙක් හිතුවේ හාල් හිඟයක් එයි, ජනතාවට කන්න බොන්න නැති වෙයි කියා. නමුත් සහල් අතිරික්තයක් ලබා ගන්න තරම් අපේ රජය ශක්තිමත් වුණා. අපේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය හොඳයි.

ඊළඟට 2011, 2012 අවුරුදුවල නියඟය ආවා. ගිය වර්ෂයේ අග භාගයේත් මේ වර්ෂයේත් විශාල නියඟයක් ආවා. එයින් විශාල වශයෙන් වගා හානි වුණා. නමුත් අපේ රජයේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය නිසා අපි ආහාර හිඟයකට මුහුණ දුන්නේ නැහැ. අපට හාල් ඇටයක්වත් පිට රටින් ගෙනෙන්න වුණේ නැහැ. මේ වතාවේත් ගංවතුර ආවා. හුඟක් දෙනෙක් අපෙන් ඇහුවා, මේ වතාවේත් හාල් හිඟයක් එයි නේද; පිට රටින් හාල් ගෙනෙන්න වෙයි නේද කියා. මම තමුන්නාන්සේලාට කියන්න කැමැතියි, මෙවර අපේ සහල් අතිරික්තය සියයට 25ක් බව. තව ගංවතුර දහයක් ආවත් ආහාර හිඟයක් ඇති වන්නේ නැහැ.

ඒ මොකද, අපේ රජයේ කෘෂි කාර්මික ප්‍රතිපත්තිය නිසයි. ගංවතුරට, ස්වාභාවික විපත්වලට හොඳට ඔරොත්තු දෙන වැඩ පිළිවෙළවල් සකස් කරන්න පුළුවන් රජයක් හැටියට ඒ කටයුතු කර ගෙන යනවා. වෙන ආණ්ඩු තිබුණා නම් බඩගින්නේ ඉන්න වෙනවා. ඒක අනිවාර්යයයි. නමුත් එහෙම - [බාධා කිරීමක්] වෙන ආණ්ඩුවක් තිබුණා නම් තමුන්නාන්සේලා, අපි ඔක්කොටම බඩගින්නේ නිදා ගෙන ඉන්න වෙනවා. [බාධා කිරීමක්] අපි කර තිබෙන දේවල් බලන්න අධිවේග පාරවල් දිගේ යන්න; පාරවල් දිගේ යන්න. කලින් පැය පහක් ගිය පාරේ දැන් පැය දෙකෙන් යන්න පුළුවන්. තමුන්නාන්සේලා පැය පහක් ගාටපු පාරවල දැන් අපි පැය දෙකෙන් යනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේට දැදුරු ඔය හදා ගන්න බැරි වුණා.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

තමුන්නාන්සේ වාරිමාර්ග ඇමති හැටියට කටයුතු කළා. දැදුරු ඔය හරවා ගන්න බැරි වුණා. අපි හැරෙව්වා. යාං ඔය හැරෙව්වා. මොරගහකන්ද පටන් ගත්තා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා බොරුවට කයිය ගහන්න එපා. අපි තමයි වැඩ කරන්නේ. තමුන්නාන්සේලා කයිය ගහනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.36]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබී තිබෙන්නේ විනාඩි කිහිපයක් නිසා සියල්ලටම උත්තර දෙන්න බැහැ. නමුත් මේ සභාව හරහා රටේ ජනතාව නොමඟ යවන ප්‍රකාශ කිහිපයක් ඉදිරිපත් වුණා. මේ විවාදයේදී අපේ විරුද්ධ පාර්ශ්වයේ ගරු රවි කරුණානායක මැතිතුමා පළමුවෙන්ම කථා කළා. එතුමා කිව්වා, ලක්ෂ ගණනක නිවාස සංඛ්‍යාවක් විනාශයට පත් වෙලා තිබෙනවාය කියා. මම එතුමාට බොහොම පැහැදිලිව ප්‍රකාශ කරනවා, "සම්පූර්ණයෙන් විනාශ වුණු නිවාස සංඛ්‍යාව 4833යි කියා. අර්ධ හානි පැමිණි සංඛ්‍යාව 27,459යි" කියලා. එච්චරයි තිබෙන්නේ. මම සමස්තයක් වශයෙන් රට ගැන කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

මම බලාපොරොත්තු වන්නේ අපේ දිස්ත්‍රික්කය පදනම කර ගෙන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න. අපේ දිස්ත්‍රික්කයේ විපතට පත් වුණු පවුල් ගණන 1204යි. එයින් රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 567යි, දිස්ත්‍රික්කයේ සාමාජිකයන් 3771යි. මේකෙන්ම ඔය ගොල්ලන්ට පෙනෙනවා, කොයි තරම් වැරදි ඉලක්කම්ද කලින් කියා තිබෙන්නේ කියා. එයින් රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිවාස 1155යි. පූර්ණ හානියට පත් නිවාස 142යි. එයින් 15ක්ම රත්තොට. අර්ධ හානි 227යි. එයින් 80ක් රත්තොට. දිස්ත්‍රික්කයේ සිදු වුණු මරණ සංඛ්‍යාව 8යි. එයින් 5ක් රත්තොට කොට්ඨාසයේ. තුවාල ලැබූ සංඛ්‍යාව 13යි. එයින් 7ක් රත්තොට කොට්ඨාසයේ. අපේ ජීවිත 8ක් අතුරුදහන් වුණා. එයින් 7ක් රත්තොට කොට්ඨාසයේ.

අතිගරු ජනාධිපතිතුමා කල් යල් බලා කොහොම හෝ අමාත්‍යාංශයක් පිහිටුවා තිබුණු නිසා, වැඩ කරන්න පුළුවන් තරුණ මන්ත්‍රීවරයෙකුට මේ ඇමතිකම දුන්න නිසා, අපි කොළඹ ඉඳගෙන එතුමාට දැනුම් දුන්නා විතරයි, අවශ්‍ය ප්‍රතිපාදන සියල්ල සමඟ, කඳවුරුවලට අවශ්‍ය සියලු බඩු භාණ්ඩ -මෙට්ට, මදුරු දැල්- එතුමා පිටත් කර හැරියා. ඒ ගැන මම ඉතාමත්ම ස්තුතිවන්ත වනවා. මාතලේ අපේ කඳවුරු 14ක් තිබෙනවා. එයින් 6ක් රත්තොට. මේ සියල්ලටම ගියා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා මාතලේ දිස්ත්‍රික්කයේ සියලුම කඳවුරුවල අය රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක තැනකට කැඳවා ඒ සියලු දෙනා අභිමුඛයේ ආධාර දීලා යම් අඩුපාඩුවක් තිබෙනවාද කියන එක ප්‍රසිද්ධියේ ප්‍රශ්න කළා. ඒ සියලු දෙනාම පින් දුන්නා. කිසිම අඩු පාඩුවක් නැහැ කියන එක ප්‍රකාශ කළා.

අපේ සජිත් ප්‍රේමදාස මැතිතුමා හොඳ යෝජනා රාශියක් ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව අපත් ස්තුතිවන්ත වෙනවා. එහෙම තමයි විපක්ෂයේ අපට යහපත් යෝජනා දෙන්න ඕනෑ. අපි දෙගොල්ලන්ම එකතු වෙලා රටේ ප්‍රශ්න විසඳනකොට එහෙමයි කටයුතු කෙරෙන්න ඕනෑ.හැබැයි, එතුමා උපාධිධාරී අභ්‍යාසලාභීන් ගැන වැරැදි අදහසක් කිව්වා. ඒ ගොල්ලෝ පත් වෙලා මාස කිහිපයයි. ඒ ගොල්ලන්ට ඔය කියන පුහුණුව තියා හුඟක් පුහුණු තවම දෙන්න බැරුව ගිහින් තිබෙනවා. හැබැයි, ඒ පුහුණුව නැති වුණාට තනිවම ග්‍රාම නිලධාරි මහත්වරුන්ගේ පිටම බර පැටවුවේ නැහැ. ඒ උපාධිධාරිනුත්, සමෘද්ධි නිලධාරිනුත්, කෘෂි පර්යේෂණ නිලධාරිනුත්, ඔබතුමා කියපු ග්‍රාමීය මට්ටමේ නිලධාරිනුත් කිසිම තරාතිරමක් හෝ කිසිම වෙහෙසක් නොබලා මේ ආපදාවේදී කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාවේ අය විශාල වැඩ කොටසක් කළා. විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කයේ මහ දිසාපති හෙලන් මීගස්මුල්ල මැතිනිය, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සජීව මැදවත්ත මහතා, රත්තොට ප්‍රාදේශීය ලේකම් විජය බණ්ඩාර මැතිනිය, උකුවෙල ප්‍රාදේශීය ලේකම් එගොඩවෙල මහතා ඒ වාගේම ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂ සංජීව අමරවීර මහත්මා පුදුමාකාර මහන්සියකින් රෑ දවල් නොබලා ගිහිල්ලා වැඩ කළා. ප්‍රාදේශීය සභා සභාපති ටී.ඩී. ජයතිස්ස මහතා, උප සභාපති ජයන්ත මුණවීර මහතා කිසිම තරාතිරමක් නැතිව, පංගුබෙරුවක් නැතිව කටයුතු කළා. ඒ වාගේම ඒ ප්‍රදේශයේ වෛද්‍ය අධිකාරි නිලංග මහතා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ඉඹුලපිටිය මහත්මා මා කැඳවපු රැස්වීමට ඇවිල්ලා මේ ඉඩම් කොහෙද තිබෙන්නේ කියන එක ගැන සම්පූර්ණ විස්තර වාර්තාවක් දුන්නා. මොකද, කන්න බොන්න දෙන එකට වඩා අපට තිබුණු දැවෙන ප්‍රශ්නය තමයි අවතැන් වුණු හා අනතුරුදායක තැන්වල ජීවත් වන අය නැවත පදිංචි කිරීම සඳහා සුදුසු ඉඩම් ලබා දීම. ඒ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න ඒ අය ඇවිල්ලා තොරතුරු ලබා දුන්නා. අපට ඒ අනුව කටයුතු කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ සහකාර අධ්‍යක්ෂ මොරේමඩ මහත්මාත් පැමිණියා. මේ අය කිසිම විවේකයක් ගත්තේ නැහැ. වර්ෂාව වෙලාවේදීම ගිහින් ඒ වැඩ කටයුතුවලට සහයෝගය දුන්නා. ඒ වාගේම යුද හමුදාවේ බ්‍රිගේඩියර් විජේරත්න මහතා ඇතුළු ඒ නිලධාරි මහත්වරු වැස්සේ ගිහිල්ලා ජීවිත ගණනාවක් බේරා ගත්තා. රජයේ නිලධාරින් මේ විධියට සාමූහික වශයෙන් එකට එකතු වෙලා උපරිම සහයෝගය දුන්නා. මැති ඇමතිවරුනුත් එහෙමයි. අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, අඹන් ගඟේ පාලම් සේරම කඩා ගෙන ගියා කියලා. නැහැ, ගරු මන්ත්‍රීතුමනි. කඩා ගෙන ගියේ එක පාලමයි. ඒ පාලම දින පහක් ඇතුළත හදලා දුන්නා. අමාත්‍යාංශයෙන් ලක්ෂ හතරයි දුන්නේ. ඊට පස්සේ අපේ ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මන්ත්‍රීතුමා එතුමාගේ පෞද්ගලික ධනය ලක්ෂ හතක් වියදම් කරලා දවස් පහක් ඇතුළත ඒක හදලා දුන්නා. අතිගරු ජනාධිපතිතුමා ඒක විවෘත කළා. තව ගම් කිහිපයක ප්‍රශ්න ඇති වුණා. නැත්තේ නැහැ. ඒ වාගේම රත්තොට ප්‍රදේශයේ තවත් පාලමක් - [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔක්කෝම කැඩුණේ නැහැ. පොඩි පාලමකුයි කැඩුණේ. බස් යන පාරක පාලමක් කැඩුණේ නැහැ. ඒ කැඩුණු පාලමත් දවස් පහකින් හදලා දුන්නා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. සම්පූර්ණයෙන් වැරදි මතයක් ඇති කරන්න හදන්න එපා. මේ ජනතාව අනතුරුදායක ප්‍රදේශවලින් ඉවත් කරන එක ගැනයි අපට ප්‍රශ්න තිබෙන්නේ. අනෙක් ප්‍රශ්න සේරම නිරාකරණය වන තත්ත්වයට කටයුතු කළා. කිසිම අඩුවක් තිබුණේ නැහැ. තමුන්නාන්සේලා ඒ ජනතාවගේ බඩගින්න ගැන කථා කළා. කිසිම කඳවුරක කිසිම කෙනෙක් බඩගින්නේ හිටියේ නැහැ. අතිගරු ජනාධිපතිතුමාත්, ගරු මහින්ද අමරවීර ඇමතිතුමාත් කිහිප වතාවක්ම ඒ තැන්වලට ගියා. එතුමාගේ නිලධාරිනුත් ඒ තැන්වලට ගියා. [බාධා කිරීමක්] මට

විනාඩි 10යි තිබෙන්නේ. කථා කරන්න ඉඩ දෙන්න. මම තමුන්නාන්සේලාට බාධා කළේ නැහැ, බොහොම නිශ්ශබ්ද වෙලා හිටියා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කයිය ගහන වෙලාවේ-

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
කයිය නොවෙයි, මේ කියන්නේ යථාර්ථය. තමුන්නාන්සේලායි ඔතැන ඉඳගෙන කයිය ගහන්නේ. ඔබතුමන්ලා ඒ ප්‍රදේශවලට ගියේ නැහැ. ඔබතුමන්ලාගේ දිස්ත්‍රික්කයේ විස්තර කියන්න, නොගිය තැන්වල ඒවා කියන්න එපා. අපි කියන්නේ අපේ දිස්ත්‍රික්කය ගැන.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කියන්න කැමැතියි අද බොහොම කනගාටුදායක දවසක් බව. රිසානා නෆීක් මෙනෙවිය මරා දමා තිබෙනවා මේ වන කොට.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
කවුද? [බාධා කිරීමක්] ඒක මේකට අදාළ නැහැනේ. තමුන්නාන්සේ - [බාධා කිරීමක්] මොකද, ගංවතුර නිසාද? නියඟය නිසාද? ආපදාවක් නිසාද? නැහැනේ. ඒක වෙන කාරණාවක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා තව කථාවක් කිව්වා. "හැම දාම ගංවතුර වරෙන්, හැමදාම නියඟය වරෙන්" කියලා-[බාධා කිරීමක්] එහෙම අදහසක් තමයි අතීතයේ එතුමන්ලා තුළ තිබිලා තිබෙන්නේ. [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කනගාටු වෙන්න ඕනෑ- [බාධා කිරීමක්] අපි සෑහෙන කාලයක් මහන්සි වුණා, රිසානා නෆීක් මෙනෙවිය බේරා ගන්න. ඇය මේ වන විට මරා දමා තිබෙනවා. මේකටද මේ ආණ්ඩුව මෙච්චර කල් කටයුතු කෙරුවේ?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ පිළිබඳව අපි සියලු දෙනාම කනගාටු වෙනවා. නමුත් ඒ ගැන නියමිත අවස්ථාවේදී කථා කරන්න. ගරු නන්දිමිත්‍ර ඒකනායක ඇමතිතුමා කථා කරන්න. [බාධා කිරීමක්]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඔබතුමන්ලා කරුණාකර, යටි හිතේ එකක් තියා ගෙන කථා කරන්න එපා. බොර දියේ මාළු බාන්න හිතන්න එපා. තමුන්නාන්සේලා මේ වෙලාවේ පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරන්න ඕනෑ. හැබැයි ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා එතුමාගේ ජනසරණ ව්‍යාපාරය යටතේ හෝ ආධාර ටිකක් දීපු බව ඇත්ත. අපි ඒකත් අගය කරනවා. නමුත් ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ද්වේෂයෙනුයි කථා කළේ. සම්පූර්ණ ද්වේෂයෙන් කථා කළේ. එහෙම කරන්න එපා. මේක ජාතික ආපදාවක්. ජාතික ආපදාවකදී පක්ෂ භේදයෙන් තොරව එකතු වෙන්න ඕනෑ. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ සිදු වීම ගැන අපි කනගාටුව ප්‍රකාශ කරනවා. නමුත් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව ක්‍රියාත්මක විය යුතුයි. ගරු ඇමතිතුමා කථා කරන්න.[බාධා කිරීමක්]

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
මෙතුමා යහපත් වැඩක් කළා. ඒක මම පිළිගන්නවා. මෙතුමා ආධාර බෙදන්න ගියා. ඒ වාගේ අනෙක් අයත් ඉන්න ඕනෑ. [බාධා කිරීමක්] ඔය කියන දේවල් මට ඇහෙන්නේ නැහැ. කොහොම කළත් අද මේ වාගේ වෙලාවක තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණා නම් ජනතාව බඩගින්නේ මැරෙනවා. අපි එක් කෙනකුවත් බඩගින්නේ තිබ්බේ නැහැ.

ඇමතිතුමාට කියන පරක්කුවෙන් මෙට්ට ටික, අවශ්‍ය පැදුරු ටික, අවශ්‍ය කළමනා ටික, කඳවුරුවලට උයන්න අවශ්‍ය හට්ටි, මුට්ටි ආදී සියල්ල ලබා දුන්නා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කරුණාකරලා මේ මාතෘකාවට අදාළ දේවල් පමණක් කථා කරන්න.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
සියලුම රජයේ නිලධාරින් එකා වාගේ මහන්සි වෙලා ඒ කටයුත්ත කරපු නිසා ජනතාව අද පින් දෙනවා. අප මේ අවතැන් වුණු අය ඉතා ඉක්මනින් ඒ කඳවුරුවලින් පිටත් කිරීමේ වැඩ පිළිවෙළට දැන් අවතීර්ණ වෙලා ඉන්නවා. අප රැස්වීම් දෙකක් කැඳෙව්වා. ඒ අවතැන් වුණු අයට නැවත නිවාස හදා දීලා පිටත් කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය පිළිබඳව සාකච්ඡා කරන්න අද අප රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රැස්වීමක් කැඳවා තිබෙනවා. ඒකයි විය යුත්තේ. නමුත් මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයක් ගැන කථා කරන අවස්ථාවක, ජනතාව නොමඟ යවන්න, ආණ්ඩුව පෙරළන්න කථා කරනවා නම් ඒක ඉතාම ඛේදනීය තත්ත්වයක් බව මම ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා මේ හැම තැනටම ගියා. හානි සිදු වූ ප්‍රදේශවලට ගියා, රත්තොටට ගියා. එතුමා ගිහින් ඒ ජනතාව හමු වුණා. එතුමා රටේ නායකයා

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

විධියට ආදර්ශයක් දුන්නා. ඒ ජනතාව හම්බ වෙලා එතුමා විස්තර ඇහුවා. ඔවුන්ට තිබෙන ප්‍රශ්න මොනවාද කියලා ඇහුවා. කිසි කෙනෙක් කිව්වේ නැහැ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ ආකාරයටයි එතුමා කටයුතු කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කට තිබෙනවා නම් ඇට නැති දිවෙන් ඕනෑ දෙයක් කියන්න පුළුවන්. [බාධා කිරීමක්] ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ ඇට්ටිම්බෙන්ද කථා කරන්නේ? තමුන්නාන්සේ ඇට්ටිම්බ කියන වචනයේ තේරුම දන්නවාද? [බාධා කිරීමක්] හරි. තමුන්නාන්සේ ඇට්ටිම්බෙන් කථා කරන්නේ. නැත්නම් ඔහොම කියන්නේ නැහැ. මේ කථාවට බාධා කරන්නේ නැහැ. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කථා කළා හොඳයි. එතුමා පැහැදිලි, වැදගත් යෝජනා කීපයක් ඉදිරිපත් කළා. ආපදා කළමනාකරණ කමිටු ප්‍රාදේශීය මට්ටමට ගේන්න කිව්වා. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, දැනටත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු හරහා අප ඒ කටයුත්තත් සාකච්ඡාවට ගන්නවා. නැත්තේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේගේ හොඳ යෝජනා අපේ ඇමතිතුමා පිළිගනීවි.

තමුන්නාන්සේට මම තව එක කාරණයක් කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාහන ප්‍රශ්නය ගැන. අපේ කච්චේරිවලට ඇවිත් බලන්න. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ වාහන නැද්ද කියලා. ඒ සේරම දේවල් - [බාධා කිරීමක්] මට ඇහෙන්නේ නැහැ ඔබතුමා කියන එක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
හොඳයි. [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට රත්තොට ඔක්කොම හරි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඔක්කොම හරි නැහැ. විශේෂයෙන් තිබෙන්නේ ඉඩම් ප්‍රශ්නය. ඒ ඉඩම් ප්‍රශ්නය විසඳා ගන්න ඕනෑ. එක පාලමක් තිබෙනවා, ඒක හදන්න පුද්ගලයෙක් ඉදිරිපත් වුණා. පළාත් මහාමාර්ග අමාත්‍යාංශයෙන් හදන්නම් කියලා කිව්වාට පස්සේ ඒක නතර වුණා. ඒක හදපු ගමන් ඒ ගම සම්බන්ධ වෙනවා. මීගලව පාලම හදන්න යුද හමුදාව ඉදිරිපත් වුණා. ඒක හැදුවාට පසුව වෙන් වුණු ඒ ගම එකතු වෙනවා. හැබැයි ඒවා බස් යන, මහා ලොකු පාරවල් නොවෙයි. එක පාරයි තිබුණේ. ලක්ෂ්මන් වසන්ත පෙරේරා මන්ත්‍රීතුමා මුල් වෙලා ඒක හැදුවා. අපේ ඇමතිතුමා ලක්ෂ හතරක් යැව්වා. අපේ මන්ත්‍රීතුමා ලක්ෂ හතක් දුන්නා. ඒ මුදල් යොදවලා ජනතාවගේ ශ්‍රමයත් අරගෙන, හමුදාවෙත් සහයෝගයත් අරගෙන ඒ පාලම හදලා ඉවර කළා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.47]

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල් තැබීමේ විවාදය පැවැත්වෙන මේ මොහොතේ අපේ මුළු රටම, මේ මුළු පාර්ලිමේන්තුවම අවධානය යොමු කළ යුතු කාරණාවක් මට කියන්න තිබෙනවා. අපේ රටේ පුරවැසියෙක් හැටියට, ලංකාව වෙනුවෙන් සේවය කරන්න ගිය රිසානා නෆීක් දැරිය අද දහවල් 12.00ට පමණ සවුදි අරාබියේදී මරණ දණ්ඩනයට ලක් කර තිබෙනවා. ඒ බව වාර්තා වුණා. මේ මුළු පාර්ලිමේන්තුවමත්, අපේ රටේ පුරවැසියන් සියලු දෙනාමත්, රට විරුවන් හැටියට සලකන විදේශගත ශ්‍රී ලාංකිකයන් සියලු දෙනාමත් මේ අපරාධය හෙළා දකිමින් අපේ ශෝකය පළ කළ යුතුය කියලා මා විශ්වාස කරනවා.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
අපි විනාඩියක කාලයක් ඒ වෙනුවෙන් ශෝකය පළ කරමු.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බොහොම ස්තුතියි. මේ අවස්ථාවේ අපි සියලු දෙනාම ආසනවලින් නැඟිටලා ඒ වෙනුවෙන් විනාඩියක කාලයක් ශෝකය පළ කරමු කියලා මා යෝජනා කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එසේ කරමු.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
හොඳයි.

***[අනතුරුව සභාවේ විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වාගෙන යන ලදී.]***
*[அதன் பிறகு, சபை ஒருநிமிடம் மௌனம் அனுஷ்டித்தது]*
*[Whereupon the Hon. Members observed a minute's silence.]*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලා සියලු දෙනාටම මා ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් මා බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ ප්‍රවෘත්තිය අපට දැන් තමයි ලැබුණේ. නමුත් විෂය භාර අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා අද පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කළා. මට හිතෙන්නේ ඒ කථා කරන වෙලාව වන කොට එතුමා මේ සිද්ධිය ගැන දැන ගෙන හිටියා කියලායි. හැබැයි එතුමා කථා කළේ රිසානා දැරිවිය බේරා ගන්න කටයුතු කරනවා කියලායි. එතුමා ඒ කථා කරපු වෙලාව වන කොට එහේදී මේ මරණ දඬුවම ක්‍රියාත්මක වෙලා වාගේ කියලායි මම දන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් මාතෘකාවට එන්නම්. ඇත්තටම සමාජ අධ්‍යයනය විෂයය තුළින් අප අපේ රට ගැන ඉගෙන ගෙන තිබෙන්නේ මොකක්ද? ඔබතුමන්ලා වැඩිහිටියන් හැටියට ප්‍රජාචාරය විෂය යටතේ ඉගෙන ගත්තේ මොකක්ද? අපේ රට කියන්නේ නියං සාය නැති, කලට වැසි වසින, වතුර හොඳට තිබෙන, කඳු කඩා වැටෙන්නේ නැති, නාය යන්නේ නැති, ස්වාභාවික විපත් නැති බොහෝම වටිනා ස්වාභාවික සම්පත් තිබෙන රටක් හැටියට තමයි අපේ වයසේදී සමාජ අධ්‍යයනයටත්, වැඩිහිටියන්ගේ වයසේදී ප්‍රජාචාරයටත් ඉගෙන ගත්තේ.

අද අපට නිතර දෙවේලේ අහන්න, දකින්න තිබෙන්නේ මොකක්ද? නාය යනවා. කඳු කඩා වැටෙනවා. මහා ගං වතුර එනවා. සුනාමි විපත් එනවා. ස්වාභාවික ආපදාවන්ට වැඩියෙන්ම ලක් වෙන රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ නිසා ස්වාභාවික විපත් ගැන අවබෝධයක් තිබෙන, ඒ සඳහා මැදිහත් වෙන ගරු අමාත්‍යතුමෙක්, අමාත්‍යාංශයක් අපට හදන්න සිද්ධ වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය නිර්මාණය වුණේ කොහොමද කියන එක තමයි ඇත්තටම වැදගත් වන්නේ. අද අපට මේ විවාදය ඉවර කරලා ඊ ළඟ දවසේ මෙවැනි සිද්ධියක් නිර්මාණය වුණාම ඔන්න අපට නැවත වතාවක් මෙවැනි විවාද කරන්න පුළුවන්; කථා කරන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගේ අවධානයට මේ කාරණය යොමු කර වන්න කැමැතියි. 2004 දෙසැම්බර් මාසයේ 26වැනි දා සුනාමි ව්‍යසනය ආවාට පස්සේ 2005 දී මේ පාර්ලිමේන්තුවම පත් කළා, මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන විශේෂ කාරක සභාවක් - Select Committee එකක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ විශේෂ කාරක සභාවේ වාර්තාව මගේ ළඟ තිබෙනවා. එවකට විපක්ෂයේ ප්‍රධාන සංවිධායක මහින්ද සමරසිංහ ඇමතිතුමා තමයි -අද ඒ පැත්තේ ඇමතිතුමා තමයි- ඒ කාරක සභාවේ සභාපතිතුමා හැටියට හිටියේ. ඒ කමිටුව වාර්තාව හැදුවා. ස්වභාවික විපත් පිළිබඳව -මෙවැනි තත්ත්වයන් පිළිබඳව- භූගෝල විද්‍යාව පිළිබඳව පර්යේෂණ කළ අය සහ මේ සම්බන්ධයෙන් දැනුම තිබෙන සියලුම ආයතනවල සහ පුද්ගලයන් 104කගේ අදහස් ඒ වාර්තාවේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාර්තාව හදන්න මේ කමිටුවේ අය විදේශ රටවලට ගිය විස්තර මේ වාර්තාවේ 12වැනි පිටුවේ තිබෙනවා. ඉන්දුනීසියාවට ගියා; නැරඹුවා. ඕස්ට්‍රේලියාවට ගියා; නැරඹුවා. තුර්කියට සහ ජර්මනියට ගියා; නැරඹුවා. ජපානයට සහ කොරියාවට ගියා; නැරඹුවා. එක්සත් රාජධානියට ගියා. ඇමෙරිකා එක්සත් ජනපදයට ගියා. මොකටද? මේ ස්වභාවික විපත් පිළිබඳව අපේ පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවේ සාමාජිකයන්ට ඒ ගැන අධ්‍යයනය කරන්නයි. අවුරුදු හතකට පස්සේ -සුනාමියෙන් අවුරුදු 7කට පස්සේ- මම අහනවා, "ඒ විශේෂ කාරක සභාව ඇති කිරීමේ ප්‍රතිඵලය මොකක්ද, මේ වාර්තාවේ ප්‍රතිඵලය මොකක්ද?" කියලා.

තමුන්නාන්සේලා දෝෂාභියෝගය ගෙනැල්ලා ශිරානි බණ්ඩාරනායක අගවිනිසුරුතුමියට අදාළව හදා තිබෙන වාර්තාවේ පිටු 1,600ක් තිබෙනවා. පැය 24ක් ඇතුළත ඒ වාර්තාව හදලා එය භාෂා තුනෙන්ම -සිංහලෙන්, දෙමළෙන්, ඉංග්‍රීසියෙන්- සකස් කර පාර්ලිමේන්තුවේ අපට ලැබෙන්න සැලැස්වූවා. වාර්තාව නිකුත් කළා. පිටු 1,600ක් තිබෙනවා.

හැබැයි අවුරුදු හතක් ගත වෙලාත්, අපේ රටේ ස්වාභාවික විපත් පිළිබඳව හැදූ වාර්තාව තවම සිංහල භාෂාවට, දෙමළ භාෂාවට පරිවර්තනය කර ගන්න බැරි වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගේ අවධානයට මේ කාරණය යොමු කරවනවා. මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන ව්‍යසනයන් පරීක්ෂා කර බලා ඒවා වැළැක්වීම පිණිස ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන විශේෂ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තු පුස්තකාලයේ තිබෙන්නේ තවම ඉංග්‍රීසි භාෂාවෙන් විතරයි. ඔන්න අපේ රටේ තත්ත්වය. ඒ වාර්තාව හදන්න කොච්චර මුදලක් වියදම් කළාද? රටවල් කීයක සංචාරය කළාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කමිටුවේ සිටි මන්ත්‍රීතුමන්ලා දැන් ඇමතිවරු වෙලා ඉන්නවා. හකීම් ඇමතිතුමා ඒ කමිටුවේ ඉඳලා තිබෙනවා. ඒ අයටත් සැලකිල්ලක් හැටියට මම ඒ අය ගැනත් කියන්නම්. ඒ කමිටු වාර්තාවේ නිර්දේශ ගණනාවක් තිබෙනවා. මේ ආණ්ඩුව හැටියට, විෂය භාර ඇමතිතුමා හැටියට තමුන්නාන්සේලා මේ එක නිර්දේශයක්වත් ක්‍රියාත්මක කරලා තිබෙනවාද? මේ ගැන රට දන්නවාද? සුනාමියෙන් පස්සේ, පසු ගිය ස්වාභාවික විපත්තිය වාගේ විපත්ති කීයකට අපි මුහුණ දුන්නාද? ඉතින් මෙවැනි වාර්තා හදන්න පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් විසින් ගත කළ කාලය, මුදල් ගැන හිතන්න. ඒවාත් මේ රටේ මහජනතාවගේ සල්ලි. අන්තිමට ඒවාට වග කියන්නේ කවුද? කල්පනා කරලා බලන්න. ඒකත් විපත්තියක් තමයි. ගංවතුර, නාය යෑම් -ස්වාභාවික විපත්- වාගේම තමයි අපේ රටේ බදු ගෙවන ජනතාවගේ ඒ මුදල්වලට කරන විපත්තිය. අඩු තරමේ එය සිංහල, දෙමළ භාෂාවන්වලට පරිවර්තනය කරලා මේ රටට ඉදිරිපත් කරන්නවත් මේ පාර්ලිමේන්තුවේ අපට බැරි වෙලා තිබෙනවා.

උත්තරීතර පාර්ලිමේන්තුවට! උත්තරීතර පාර්ලිමේන්තුවට ඒක කරන්න බැරි වෙලා තිබෙනවා කියා අපි කියනවා. හැබැයි පිටු එක්දහස් හයසීයක් පමණ තිබෙන දෝෂාභියෝග වාර්තාව භාෂා තුනටම පරිවර්තනය කරන්න තමුන්නාන්සේලාට පැය විසිහතරක් ගියේ නැහැ. ඒ කියන්නේ වුවමනාව. හැබැයි මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන ව්‍යසනයන් පරීක්ෂාකර බලා ඒවා වැළැක්වීම පිණිස ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වන විශේෂ කාරක සභාව පත් කර අවුරුදු හතක් ගත වෙලාත් ඒ වාර්තාව හරියට රටට ඉදිරිපත් කරන්න තිබෙන වුවමනාවයි, දෝෂාභියෝගය සම්බන්ධයෙන් පැවැති විශේෂ කාරක සභා වාර්තාව පැය විසිහතරෙන් පරිවර්තනය කරලා -එම විශේෂ කාරක සභාවේ සභාපතිතුමා හැටියට හිටපු අපේ අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා මේ අවස්ථාවේදී ගරු සභා ගර්භයේ ඉන්නවා- ඒ වාර්තාව ඉදිරිපත් කළ වේගයයි සලකා බලන්න. මේ ගැන කල්පනා කර බලන්න කියලා මේ රටේ ජනතාවගෙන් අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී බොහෝ ගරු මන්ත්‍රීතුමන්ලා තමන්ගේ ආසනයේ, තමන්ගේ දිස්ත්‍රික්කයේ, තමන්ගේ ප්‍රදේශයේ වුණු විපත්තිය ගැන කරුණු කාරණා කිව්වා. හැබැයි හෙට දවසේ වෙනත් ආසනයක් විපත්තියට ලක් වෙන්න පුළුවන්. මීට අවුරුදු 41කට කලින් අපේ පක්ෂයේ නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා 1971 අප්‍රේල්වල හැමන්ඩ්හිල් බන්ධනාගාරයේ ඉන්න කොට සීඅයිඩී එකේ මහත්වරු ඇවිල්ලා ඔහුව එළියට ගෙනිහිල්ලා ප්‍රශ්න කළා, "ඇයි මේ දේශපාලන ව්‍යාපාරයක් හැදුවේ, මොකක්ද මේකේ බලාපොරොත්තුව?" කියලා. ඒ වෙලාවේදී ඒ දුන් කට උත්තරයේ අපේ රට ගැන, මේ අද අපි මුහුණ දෙන විපත්තිය ගැන ඉතා පැහැදිලිව කියලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එහිදී අපේ රට ගැන ඉතා පැහැදිලි විග්‍රහයක් කරලා තිබෙනවා. අපේ රට කියන්නේ ඉතාම වටිනා විධියට මධ්‍ය කඳුකරයක් තිබෙන, ඒ මධ්‍ය කඳුකරයෙන් රට පුරා ගලා බහින දිය දහරාවන් තිබෙන, ගංගා පද්ධතියක් තිබෙන, ස්වභාවිකව නිර්මාණය වුණු මේ පෘථිවියේ තිබෙන විශිෂ්ට නිර්මාණයක්; ඒක එහේ මෙහේ කරනවා නම්, ඒකට අත තියනවා නම් දේශපාලන තීන්දු තීරණ අනුව නොවෙයි කරන්න ඕනෑ කියලා රෝහණ විජේවීර සහෝදරයා එදා කිව්වා. අපේ රටේ මාධ්‍යවල ඒ ගැන පළ වුණ නිසා ඒ කාරණා කීපයක් මම උපුටා දක්වන්නම්. රෝහණ විජේවීර සහෝදරයා මෙන්න මෙහෙම කියනවා :

> "දැන් අපේ රටේ තියෙන ප්‍රශ්නෙ තමයි මෙහේ ගංවතුර. අනික් පැත්තේ නියඟය. එහෙමනම් අපි මේ තෙත් කලාපෙ තියෙන වැඩි වතුර වියළි කලාපෙට ගෙනියන සැලසුමක් හදන්න ඕන."

එතකොට ප්‍රශ්න කරන සීඅයිඩී එකේ මහත්මයා අහනවා, "එතකොට මහවැලි යෝජනා ක්‍රමය එහෙම සැලසුමක්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

නොවෙයිද?" කියලා. "නැහැ. මේ කරන්නේ වතුර වැඩි ප්‍රදේශයක තියෙන ගඟක් වතුර නැති ප්‍රදේශයකට හරවන එක නොවෙයි. මේක මූලික සිද්ධාන්තයෙන්ම වැරදියි. මහවැලි ගඟ තෙත් කලාපයේ වතුර අරන් වියළි කලාපය තෙත් කරමින් ගලා ගිහින් ත්‍රිකුණාමලෙන් මුහුදට වැටෙනවා. මේ කරන්නෙ වියළි කලාපය හරහා ගලන එකම ගංගාව වියළි කලාපයේම වෙන පැත්තකට හරවන එක. ඒකෙන් වෙන්නේ අනෙක් පැත්ත සහමුලින්ම කාන්තාරයක් වෙන එක. මම කියන්නේ මහවැලි යෝජනා ක්‍රමය මූලික වශයෙන්ම වැරදි බව. දැන් ගඟ, උතුරු ගම්පොළ හරහා හැටන් හරහා කටුගස්තොටට මෙහාට, එනවා. ඒ හරියේ හැම අවුරුද්දෙම ජල ගැලීම් අනිවාර්යයි. ගම්පොළ රේල් ඉස්ටේෂමේ බලන්න අවුරුදු ගණන්වල ගලපු මට්ටම් මාර්ක් වෙලා තියෙනවා, මිනිහෙකුට වඩා උසින්. ඒ කියන්නේ ජල ගැලීම් ජනතාවට විනාශයක් වෙලා.

අපි රටට ජනතාවට ආදරේ කරන ආණ්ඩුවක් නම් මේ ජල ගැලීම් විද්‍යාත්මකව නවත්වලා දෙන්න ඕන. මේ බවට භූගෝල විද්‍යාත්මක විසඳුම් තිබෙනවා. මහවැලිය එහෙම විසඳුමක් නෙමෙයි. එතන වෙන්නේ නැඟෙනහිරට ගලන එකම ගඟේ වතුර උතුරට හැරවීම, වියළි කලාපෙට වතුර ගන්න ඕන ජලධාරිතාව වැඩි ගංගාවලින්."

"ධාරිතාව කිව්වෙ කැපැසිටි එකද?" කියලා සීඅයිඩී එකේ මහත්මයා අහනවා. "ඔව්. කැපැසිටි එක වැඩිම ගඟ තමයි කළුගඟ. මහවැලි ගඟ හැතැප්ම 206ක් දිග වුණාට වැඩිම වතුර කඳක් මුහුදට ගෙනියන්නෙ කළු ගඟ, ඊළඟට කැලණි ගඟ. එතකොට මේ ගංගා දෙකේම ජල ගැලීම්. අරහෙ සිරිපා අඩවියෙ වදුරෝ ගස්වල අතු හෙළෙව්වත් මෙහේ තොටළඟ සේදවත්ත පැත්තේ මිනිස්සු සුමානයක් දෙකක් කැලණි පාලම උඩ පදිංචි වෙන්න ඕන."

ශ්‍රී පාද අඩවියේ වඳුරෝ ගස්වල අතු හොළවන කොටත් මෙහේ සේදවත්තේ මිනිස්සු කැලණි පාලම උඩ පදිංචි වෙන්න ඕනෑ කියලා ඔහු කියනවා. ඒ කියන්නේ මේ ස්වාභාවික ක්‍රියාවලියේ තිබෙන තත්ත්වය.

"මේ කැලණි ගඟේ, කළු ගඟේ ජල ගැලීම් නවත්වන්න නම් මේ ගංගාවල වතුර කඳුකරයේදී උතුරට තල්ලු කරන්න ඕන." කියලා ඔහු වැඩිදුරටත් කියනවා.

ඇත්තටම මේකට අදාළ සැලැස්මක් රෝහණ විජේවීර සහෝදරයා ඉදිරිපත් කළා. ඒ ගැන මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. ඔහු කිසිම ලියකියවිල්ලක් නැතිව, කොළයක් අතට අරගෙන පෑනකින් සිතියම ඇඳලා ඒ සීඅයිඩී එකේ මහත්වරුන්ට පෙන්වනවා, මේ ගඟේ ස්වාභාවිකව ගලා ගෙන යන නැඟෙනහිර පළාතේ වතුර ටික ගලාගෙන යන්න දීලා මධ්‍ය කඳුකරයේ වතුර ටික උතුර පැත්තට ගෙනියන්නේ කොහොමද කියලා. උතුරට ගෙනියන්න ඕනෑ වතුර ටික නොවෙයි ගෙන ගියේ, එය වෙන පැත්තකටයි ගෙන ගියේ, මෝසම් වැහි දෙකක් අපේ රටට වහිනවා, ඒ මෝසම් වැහිවල නිවැරදි ස්වාභාවික තත්ත්වය තේරුම් අරගෙන නොවෙයි ඒ සැලසුම හැදුවේ කියලා ඔහු කිව්වා. එහිදී ඔහු මෙහෙම කියනවා:

"දැන් 'ටී' අකුරේ කඳ උතුරට බැවුම් වෙනවා. එක පැත්තකට වතුර වැඩියි. අනෙක් පැත්තට වතුර නෑ. මේ හරියෙ නුවර සානුව. දැදුරු ඔය, මාඔය වාගේ ගංගාත් මෙහාට ගලනවා. දැන් නුවර සානුවේදී කැලණි ගඟ වාගේ ගංගාවල ජලය රඳවා ගත්තොත් ස්වාභාවික පිහිටීම උපයෝගී කරගෙන උතුරට ගෙනියන්න පුළුවන්."

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමාට නියමිත වෙලාව අවසානයි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අවසන් කරන්නම්.

මීට අවුරුදු 42කට කලින් රෝහණ විජේවීර සහෝදරයා දැක්කා පුත්තලමේ සිට යාපනය දක්වා කොටසේ හිරිගල් පද්ධතිය යට බනිජ තෙල් තිබෙන බව. එහෙම දකින්න දැක්මක් තිබෙන්න ඕනෑ; නිවැරදි දැක්මක් තිබෙන්න ඕනෑ. අද ඇති වෙලා තිබෙන්නේ ස්වාභාවික විපත්තියක් නොවෙයි. විනාඩි පහක් වහින කොට, එහෙම නැත්නම් පැයක් දෙකක් වහින කොට පිටාර ගලන වැව් නොවෙයි රජ කාලයේ ඉඳලා තිබුණේ. රජවරු හදපු ඒ වැව දවසක් වහින කොට වාන් දමන වැව් නොවෙයි. මේ ස්වාභාවික ජල පද්ධතිය, මධ්‍ය කඳුකරයේ ඉඳලා ගලන ගංගා පද්ධතිය වියළි කලාපයේ -තැනි තලා බිම් ටිකේ- වැව් තටාකවලට එකතු කර ගෙන ඒ බිම් අස්වද්දා ගත්ත ඒ පද්ධතිය විනාශ කර ගත්තේ අපේ වැරදි සංවර්ධන ප්‍රතිපත්තිවලින්; වැරදි සංවර්ධන සැලසුම්වලින්. දුර දිග බලන්නේ නැතුව, අනාගතය දිහා බලන්නේ නැතුව, ඇහැට පෙනෙන දුර, නහයේ දුර දැකලා හදපු වැරදි සංවර්ධන ප්‍රතිපත්තිවලින් තමයි අද අපේ මේ රට යට වෙලා තිබෙන්නේ. හලාවත නගරය යට වෙන්නේ, අපි හිතපු නැති නගර යට වෙන්නේ ඒ නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කවුරුත් දන්නවා දහඅට වංගුව. ස්වාභාවිකව තිබුණු දහඅට වංගුව නාය යන්නේ නැහැ. ඒ දහඅට වංගුවේ තිබෙන බෑවුම, නාය යන බෑවුමක් නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ කාරණාව කියලා මා අවසන් කරනවා. නමුත් දැන් වෙලා තිබෙන්නෙ මොකක්ද? දැන් ඒ ස්වාභාවික බෑවුම වෙනස් කළාට පස්සේ දහඅට වංගුවත් නාය යනවා. ඒ නිසා ඉතාම පැහැදිලියි මෙන්න මේ වැරැද්ද-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අවසන් කරන්න.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා.

[අ.භා. 4.01]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா - சுற்றாடல் அமைச்சர்)
(The Hon. Anura Priyadharshana Yapa - Minister of Environment)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථමයෙන්ම මා කියන්න ඕනෑ, සවුදි අරාබියේ අධිකරණයක් මඟින් දෙන ලද තීන්දුවකින්

රිසානා නෆීක් දැරිය අද දිනයේදී මරණ දඬුවමකට ලක් කර තිබෙන බව. ඒ ගැන අපි ඉතාම කනගාටු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිද්ධිය දැන ගත්ත දවසේ ඉඳලා, ඒ කියන්නේ ඇයගේ අතින් යම් වරදක් සිදු වුවා යැයි කියලා දැන ගත්ත දවසේ ඉඳලා, අපේ රජයත්, සියලු දෙනාමත් විශාල මහන්සියක් ගත්තා ඒ දැරිය බේරා ගන්න. ඒ සඳහා අන්තර් ජාතික කාන්තා සංවිධාන පවා එකතු වුණා. නමුත් සවුදි අරාබියානු නීතිය අනුව, ඒ පවුලේ අය සමාව දෙන තුරු ඒ දැරිය වෙනුවෙන් කිසිම දෙයක් ඒ රජ්‍යටවත් කරන්න පුළුවන්කමක් නැහැ. සවුදි අරාබියාවේ රජතුමා පවා මේ වෙනුවෙන් මහන්සි වුණා. අපි ඒක කියන්න ඕනෑ. නමුත් අවාසනාවකට වාගේ ඒ දැරියට සමාව දීමට ඒ පවුලේ අය තුළ තිබුණ අකැමැත්ත නිසා රිසානා නෆීක්ට මරණ දඬුවම ලැබුණා. මා දන්නවා, ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා අවසාන මොහොත දක්වා ඒ සඳහා මහන්සියක් ගත්ත බව. එතුමාගේ අමාත්‍යාංශයත්, විදේශ කටයුතු අමාත්‍යාංශයත්, රජයත්, ජනාධිපතිතුමාත් ඇතුළු සියල්ලෝම අවසාන මොහොත දක්වා විශාල මහන්සියකින් ඒ වෙනුවෙන් කටයුතු කළා. ඒ නිසා රජය වෙනුවෙන් මා අප සියලු දෙනාගේම කනගාටුව මේ සිද්ධිය වෙනුවෙන් ප්‍රකාශ කරන්න කැමැතියි. නමුත් ඒ අතරතුර අප විසින් ඒ වෙනුවෙන් කරන ලද කර්යය පිළිබඳවත් කථා කරන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම අද අප සාකච්ඡාවට ලක් කරමින් ඉන්නේ අපට වැස්සෙන් ඇති වුණු විශාල හානි පිළිබඳවයි. ඔබතුමන්ලා දන්නවා, මිලිමීටර් 300කට අධික වර්ෂාපතනයක් ලංකාවේ විවිධ තැන්වලට ලැබුණ බව. ගංවතුර හානි සිදු වුණු දිස්ත්‍රික්ක අතරින් කුරුණෑගල දිස්ත්‍රික්කයත් එකක්. මා හිතන හැටියට ඒ දිස්ත්‍රික්කයේ නිවාස 919ක් වාගේම- [බාධා කිරීමක්] පවුල් 6,000කට ආසන්න ප්‍රමාණයක් ආපදාවට ලක් වුණා. ඒ බොහෝ තැන්වලට අපත් ගියා; බැලුවා. සමහර නිවාස විනාශ වෙලා තිබෙනවා. සමහර ඒවා දැන් ප්‍රකෘති තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, මා ඔබතුමා එක්ක සම්පූර්ණයෙන් එකඟ වෙන්නේ නැහැ. විශේෂයෙන්ම ආපදා කළමනාකරණ අමාත්‍යාංශය පිහිටෙව්වාට පස්සේ මේ කටයුතු සම්බන්ධ විශාල වෙනස්කමක් ඇති වුණා. මේ ආපදාවලට යුහුසුලුව මැදිහත් වීමක් පෙනුණා. මේ ආපදා සිදු වූ අවස්ථාවේදී මා අමාත්‍යතුමාට කථා කළා. එතුමා මට බොහොම පැහැදිලිව කිව්වා, අවශ්‍ය කටයුතු කරන්න අවශ්‍ය මුදල් දිසාපතිතුමන්ලාට යවා තිබෙනවා කියලා. ඒ වාගේම දිස්ත්‍රික්ක භාර නිලධාරින්, ප්‍රදේශ භාර අපේ ආණ්ඩු පක්ෂයේ නියෝජිතයන් වාගේම සමහර අවස්ථාවලදී විපක්ෂයේ නියෝජිතයන් පවා මේ අවස්ථාවට ඉදිරිපත් වෙලා හොඳ වැඩක් කළා.

ඇත්තටම මේ කාරණාවේ දී අපි මතක තබා ගත යුතු දෙයක් තිබෙනවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේ දී කිව්වා, එතුමන්ලාගේ හිටපු නායක රෝහණ විජේවීර මැතිතුමා කරපු කථාවක් ගැන. කවුරුත් එහෙම කථා කරනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ අද වාගේ දවසක අපි කොහොමද මේ ප්‍රශ්න ගැන බලන්නේ කියන එකයි. ඇත්ත වශයෙන්ම ඔබතුමන්ලා දන්නවා, අපි කොයි තරම් සාර්ථකව මේ කටයුතු කර තිබෙනවාද කියලා. සමහර දියුණු යැයි සම්මත රටවල් ගැන සඳහන් කරමින් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, ඒ රටවල් අනුගමනය කරන්න කියලා. එතුමා අනුගමනය කරන රටවල් අපි අනුගමනය කළා නම්, අදත් මේ කිසි දෙයක් සිදු වෙලා නැහැ. [බාධා කිරීමක්] එතුමන්ලා අල්ලේ තියාගෙන ඉන්න ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවරට විශාල සුළි සුළඟක් එක්ක වතුර ආවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සැන්ඩි කුණාටුව.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
සැන්ඩි කුණාටුව ආවා. මේ ඊයේ පෙරේදා තමයි ඒ ආපදාවට පත් වුණු අයට උදවු කරන්න කොංග්‍රස් මණ්ඩලය මුදල් අනුමත කළේ. ඒ සිද්ධිය සිදු වෙලා කී කාලයකට පසුවද? තවමත් ඒ නිව්යෝක් නගරයට සිදු වුණු අලාභය එහෙමමයි. ගරු මන්ත්‍රීතුමාට මා මතක් කරන්නට කැමැතියි, විශේෂයෙන්ම අද කාලයේ අපේ ආණ්ඩුවල ක්ෂණික මැදිහත් වීම - අපේ ආණ්ඩු කියන්නේ ලංකාවේ තිබුණු කොයි ආණ්ඩුවක් වුණත්- අවතක්සේරු කරන්න ක්‍රියා කරන්න එපා කියලා. අපේ ඇමතිතුමා ආසනයෙන් ආසනයට ගිහිල්ලා ඒ අවශ්‍ය කටයුතු කළ බව මා දන්නවා. අපි දන්නේත් නැති වෙලාවක එතුමා අපේ ආසනවලටත් ඇවිල්ලා ගිහින් තිබෙනවා. බිංගිරිය ආසනයට ඇවිල්ලා ගියා; නිකවැරටිය ආසනයට ඇවිල්ලා ගියා; හලාවතට ඇවිල්ලා ගියා. ඒ සෑම තැනකටම ගිහිල්ලා ඒ අඩු පාඩු සොයා බලා අවශ්‍ය කටයුතු එතුමා කළා.

ඇත්ත වශයෙන්ම අද අපි පිළිගන්නට ඕනෑ,- [බාධා කිරීමක්] සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා පසු ගිය 31වැනිදා රාත්‍රියේ කොහේද හිටියේ? හම්බන්තොටද? රමාඩා එකේද? ඔබතුමා 31වැනිදා රමාඩා හෝටලයේ හිටියා නේ. ඉතින් ඔබතුමා වුණත් හරියට රාජකාරිය කරලා නැහැ නේ. [බාධා කිරීමක්] රමාඩා හෝටලයේ 31වැනිදා රාත්‍රිය ගත කරපු ඔබතුමා මෙහෙම කථා කරන එක වැරදියි නේ. අපි සම්පූර්ණ සාධාරණ වෙමු කෝ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා හිටියේ ලක්ෂ්මන් සෙනෙවිරත්න ඇමතිතුමා එක්ක. [බාධා කිරීමක්]

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මා දන්නේ නැහැ ඒක. [බාධා කිරීමක්] බොහොම හොඳයි. අලුත් ආරංචි දෙන එක හොඳයි. නමුත් මට තිබෙන ආරංචි අනුව, ඔබතුමා 31වැනිදා රාත්‍රිය බොහොම කෙළි දෙලෙන්, ප්‍රීති ප්‍රමෝදයෙන් ගත කළා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා හිටියේ බැංකොක්වල.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, මම බැංකොක් ගියේ නැහැ. ඉතින් ඒ නිසා අපි මොකක් හරි -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විස්තර කියන්නද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
කියන්න, කියන්න. ඕනෑ එකක් කියන්න. මොකක් හරි කරනකොට ඔය මට්ටමට පහළට යන්නේ නැතිව අපි පොඩ්ඩක් ඉහළින් කථා කරන්න ඉගෙන ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සිදු වුණු විනාශය යූඑන්පී ද, ශ්‍රී ලංකා ද කියලා සිදු වුණේ නැහැ. එය කාටත් සිදු වුණා. ඒ නිසා අපි ඒ කාටත් සැලකුවා. අපි, තමුන්නාසේලා වාගේ එක්කෙනෙකුට එක විධියකටත්, තව කෙනකුට තව විධියකටත් සලකන ආණ්ඩුවක් හැටියට ක්‍රියා කරන්නේ නැහැ කියලා කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ලෝක තත්ත්වයත් එක්ක - [බාධා කිරීමක්] ඔබතුමා එතැන සිටියේ නැහැ නේ. ඔබතුමා අග්‍රවිනිශ්චයකාරතුමිය එක්ක යටින් යටින් කථා කරලා ගිය එක මා දන්නවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හැන්දෑවේ හතහමාරට ලියුම් දාහක් විතර දීලා, ඊළඟ දවසේ උත්තර බඳින්න කිව්වා. ලජ්ජා නැද්ද?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
ඒක බලා ගන්න බැරි යැ. ඔබතුමා මොකද ඔච්චර කේන්තියෙන් දඟලන්නේ? ඇත්ත කියනකොට බය වෙන්නේ මොකද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒක මට කථා කරන්න තිබෙන අයිතිය.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මටත් අයිතිය තිබෙනවා. මාත් එහෙම කථා කරනවා. මේ මනස්ගාතවලට සවන් දෙන්න ගියොත් මගේ කාලය ගත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ සිදු වෙලා තිබෙන මේ දේවල් මේ තරම් පුළුල්ව සිදු වන්නේ මුළු ලෝකය පුරාම සිදු වන ක්‍රියාවලියක් නිසායි. ඒ ගරු මන්ත්‍රීතුමා ඔළුවේ තබාගෙන සිටින බටහිර රටවල් විශේෂයෙන්ම කාර්මික විප්ලවයෙන් පස්සේ, මේ ලෝකයට කරපු විශාල විනාශය දැන් අප වෙත එල්ල වෙමින් තිබෙනවා. අද අපි ලෝකයේ ඉතාම අඩු කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණයක් පිට කරන රට. ටොන් එකකට දශම හයයි. නමුත් බටහිර රටවල මේ තත්ත්වය ඉතාම දරුණුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අද ලෝකය උණුසුම් වෙමින් යනවා. මේ තත්ත්වය පිළිගන්න. ඒ ගැන කාටවත් බණ කියලා හරියන්නේ නැහැ. ලෝකය උණුසුම් වනවා. විද්‍යාඥයන් මත පළ කර තිබෙනවා, මේ ලෝකයේ සිදු වන උණුසුම තව සෙන්ටිග්‍රේඩ් අංශක දෙකකින් ඉහළ ගියොත්, මාලදිවයින විතරක් නොවෙයි, ඇමෙරිකාව ඇතුළු සියලු රටවල්වල විශාල ජල ගැලීම් සිදු වන බව. මොකද, මුහුදේ ජල ප්‍රමාණය ඉහළ යන නිසා. මේක තමයි ඇත්ත කථාව. ඒ නිසා දැන් අපි මේවා ගැන තාක්ෂණික වශයෙන් කටයුතු කරගෙන යනවා.

මේවා කොහොමද වෙන්නේ කියලා ඒ මඟින් අපි සොයා බලනවා. විශාල ජල කඳක් එක පාරට හැළෙන කොට ඒකට ඔරොත්තු දෙන්න පුළුවන් වන විධියේ තත්ත්වයක් ගංගාවලටත් නැහැ, වෙන කාටවත් හෝ නැහැ. ඒ නිසා මේ හැම අංශයක් ගැනම අපි කටයුතු කරන්න ඕනෑ.

දැන් මා ළඟ තිබෙනවා, ව්‍යසන කළමනාකරණය - disaster management - සඳහා වූ කමිටුව සම්බන්ධ තොරතුරු. අද මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාත් මේ ව්‍යසන කළමනාකරණ කමිටුවට ගිහිල්ලා නැහැ. කලින් එක දවසක්ද කොහෙදෝ ගිහිල්ලා තිබෙනවා. මෑතකදී එක දවසක්වත් ගිහිල්ලා නැහැ. මා ළඟ ඒ තොරතුරු තිබෙනවා. ඒ නිසා පක්ෂ වන්න පුළුවන්, විපක්ෂ වන්න පුළුවන්, ව්‍යසනයකදී අපි කවුරුත් එක අදහසක ඉන්න ඕනෑ.

ඇත්තටම අපි නැවත වතාවක් කියන්න ඕනෑ, මේ අමාත්‍යාංශය ඉතාම හොඳ මෙහෙයක් කරනවා කියන එක. ඒක අපියි දන්නේ. අපි එක්කයි ඔවුන් වැඩ කරන්නේ. අපියි ඒ ගැන කටයුතු කරන්නේ. ව්‍යසනයකදී මුදල් අවශ්‍ය වුණු කිසිම අවස්ථාවක, කිසිම තැනකට, මහා භාණ්ඩාගාරය වෙන්න පුළුවන්, අතිගරු ජනාධිපතිතුමා වෙන්න පුළුවන්, ගරු ඇමතිතුමා වෙන්න පුළුවන් මුදල් නොයවා ඉඳලා නැහැ. මේක තමයි ඇත්ත කථාව.

අපට සමහර අංශවල දියුණුව අවශ්‍යයි. ඔබතුමා කියපු ඒ කරුණ මම පිළිගන්නවා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ දියුණුවක් ඇති කිරීම සඳහා ඒ යන්ත්‍ර සූත්‍ර දියුණු කිරීම අවශ්‍යයි. ඒ වාගේම යම් යම් අය පුහුණු කිරීමත් අවශ්‍යයි. නමුත් ඒ නිසා මේ Disaster Management Centre එකට මුකුත් වෙලා නැහැ කියලා කියන එක සම්පූර්ණ වැරැදියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවුද කිව්වේ?

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
අපේ ප්‍රදේශවලත් ගංගා ගලා ගෙන යනවා. මම නියෝජනය කරන ආසනයේත් ගංගා කීපයක් තිබෙනවා. මේ ගංගා කීපය අපට ඉතුරුවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, කුරුණෑගල නගරය මෙවර ගංවතුරට යට වුණේ 1950 ගණන්වලට පස්සේ කියලා. ඒ සම්බන්ධයෙන් මේ අමාත්‍යාංශයේ සියලු දෙනාම කටයුතු කළා. ඉතින් ඒ නිසා අපි මේ තත්ත්වයන් තේරුම් අරගෙන ක්‍රියා කිරීමයි වඩා වැදගත් වන්නේ. මේ සම්බන්ධයෙන් වැඩ කිරීමට අප සියලු උත්සාහයන් අරගෙන තිබෙනවා. මේ බලන්න, අපේ දිස්ත්‍රික්කයට දීලා තිබෙන භාණ්ඩ ප්‍රමාණය. Tents 181ක්, මුළුතැන් ගේ උපකරණ කට්ටල 78ක්, bedsheets 2,000ක්, ප්ලාස්ටික් පැදුරු 2,000ක්, කෝප්ප 2,000ක්, පිඟන් 2,000ක්, බාල්දි 2,000ක්, මදුරු දැල් 500ක්, ළමා මදුරු දැල් 150ක්, කුඩ, කුප්පි ලාම්පු, ජීවිත ආරක්ෂක කබා, ක්ලෝරීන් පෙති, ගස් කපන කියත් කියන මේ සියල්ලම අපට ලබා දීලා තිබෙනවා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, අපේ ප්‍රදේශයේත් ගංවතුර ගලන නිසා මම ගිය අවුරුද්දේ අපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට එන්ජිමකුත් සවි කරලා බෝට්ටුවක් දෙන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලුවා. එතුමා ඒකත් මට ලබා දුන්නා.

විශේෂයෙන් පසු ගිය ගංවතුර අවස්ථාවේ පඬුවස්නුවර ප්‍රදේශයේ ජනතාව බේරා ගන්න අවශ්‍ය සහනවලට ඒ බෝට්ටුව

අපි යෙදෙව්වා. මේ ව්‍යසනවලදී අපි කවුරුත් අපේ ශක්ති ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් වැඩ කර තිබෙනවා. ආණ්ඩුවේ සිටින මැති, ඇමතිවරු වැඩ කළේ නැහැ කියලා ඔබතුමන්ලා හිතනවාද? මම දන්නවා, ඒගොල්ලන් තමන්ගේ මහන්සියෙන් සොයා ගත් භාණ්ඩ ගෙනියලා අමාත්‍යාංශයෙන් ලබා දුන් ඒවාට අතිරේක වශයෙන් ඒ ජනතාවට ලබා දුන්නාය කියලා. ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඒ භාණ්ඩ මේවාට සම්බන්ධ නැහැ. ඒ භාණ්ඩ අතිරේක වශයෙන් ලබා දුන් ඒවායි.

තමුන්නාන්සේලාට ඒ තොරතුරු එන්නේ නැත්තේ තමුන්නාන්සේලා ළඟ ඉන්න මිනිස්සු ඒවා කියන්නේ නැති නිසයි. ඒකයි ඒ තොරතුරු එන්නේ නැත්තේ. ඒවා කියන්නත් බැහැ නේ. තමුන්නාන්සේටත් කියන්න බැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තමුන්නාන්සේගේ ක්‍රියාකාරකම් ගැන මම කථා කළේ නැහැ. තමුන්නාන්සේ මගේ කථාව අහගෙන හිටියේ නැහැ නේ.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
නැහැ, මම සම්පූර්ණයෙන්ම කථාව අහගෙන හිටියා. ඒකේ ව්‍යංගයෙන් කියන දේ එහි සැඟවුණු දේ මට තේරෙනවා. සැඟවුණු ඔක්කොම ඒ කථාවේ තිබුණා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ කථාවේ සැඟවුණු දේවල් නැහැ, තිබුණේ ප්‍රගතිශීලී අදහස්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
තමුන්නාන්සේ කවදාවත් ප්‍රගතිශීලී අදහස් ඉදිරිපත් කරන්නේ නැහැ. තමුන්නාන්සේ රටේ සිටින ලොකු ප්‍රතිගාමියෙක්. තමුන්නාන්සේ කොහොමද ප්‍රගතිශීලියෙක් වෙන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ප්‍රගතිශීලීන් කවුද කියලා හෙට බලා ගන්න පුළුවන්.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
මම කියන්න කැමැතියි, මේ වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරලා-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විශේෂ කාරක සභාවෙන් ලැබුණු ආකල්ප.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
හරි, හරි. ඒක තමුන්නාන්සේ කියන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ව්‍යසන සම්බන්ධයෙන් මේ විධියේ ඉතාමත්ම විධිමත් වැඩ පිළිවෙළක් අපි ගෙන යනවා. ඉදිරියේදී විශේෂයෙන්ම අපේ රට මේ ව්‍යසන ගැන බලාපොරොත්තු වන්න ඕනෑ. ව්‍යසන බලාපොරොත්තු වෙමින්, ඒවාට මුහුණ දීමට සූදානම් වන්න ඕනෑ. පරිසර ඇමතිවරයා හැටියට මට කියන්න තිබෙන්නේ, ලෝකයේ පරිසරය වෙනස් වන ආකාරය අනුව ශ්‍රී ලංකාව විතරක් තනි වන්නේ නැහැ කියන එකයි.

අනෙක් රටවල් එක්ක තමයි ගෝලීය වශයෙන් ඇති වන මේ තත්ත්වයට අපටත් මුහුණ දෙන්න වෙන්නේ. අද ලෝකයේ තිබෙන ලොකුම දේ තමයි කාලගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව. ඒ සමුළුවත් එක්ක ක්‍රියාත්මක වන අනෙකුත් කාරණා නිසා මුළු ලෝකයම උත්සාහ කරනවා, විශාල අරමුදලක් -ඩොලර් මිලියන 100ක අරමුදලක්- හදන්න, විශේෂයෙන්ම උෂ්ණත්වය වැඩිවීම පාලනය කිරීමේ වැඩ පිළිවෙළවල් සඳහා. අද ඒවා සඳහා අවශ්‍ය බොහෝ කරුණු සම්බන්ධ කරලා තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා සියලු දෙනාටම මම කියන්න කැමැතියි, රජය මේ තත්ත්වයට මුහුණ දෙනවා විතරක් නොවෙයි, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු මැදිහත්වීම් කරන්නත් සූදානම්ය කියන එක.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා හිතනවා නම් සල්ලි අඩුයි කියලා, අපි සල්ලි දෙන්න කැමැතියි. සල්ලි ලබා දීමට කටයුතු කරන්න කැමැතියි. මොකද, එම අමාත්‍යාංශය ඉල්ලන සියලු දේවල් ලබා දීලා තිබෙනවා. ඒ නිසා මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විශේෂයෙන්ම අපේ දිස්ත්‍රික්කයේ ජල ගැලීම් ඇති වුණු වෙලාවේ සියලු දෙනාම ඒකට සම්බන්ධ වුණා. අපේ දිස්ත්‍රික්කයේ දේශපාලන මත ගැටුම් අඩුයි. අපි හැමෝම එකතු වෙලා එකට වැඩ කළා. ඒ නිසා අපේ ප්‍රදේශවල ජනතාවට සහන දෙන්න අපට පුළුවන් වුණා. ඒ ගොල්ලන්ගේ නිවාස සාදා ගැනීමට අවශ්‍ය කරන කටයුතු වෙනුවෙන් රජය මුදල් දීමට සූදානම් වෙලා තිබෙනවා. ඉදිරියේදී අපි ඒ කටයුතුවල නිරත වෙනවා. එම නිසා ඉදිරියේදී ඇති වන ව්‍යසනවලට සූදානම් වීමට අපි අපේ රට තුළ ශක්තිමත් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන බවත් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
The next speaker is the Hon. Murugesu Chandrakumar. You have got seven minutes.

[பி.ப. 4.16]

**ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு முருகேசு சந்திரகுமார் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Murugesu Chandrakumar - Deputy Chairman of Committees)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வெள்ள அனர்த்தம் பற்றிய ஒத்திவைப்புப் பிரேரணை மீதான இன்றைய விவாதத்திலே எனக்கும் உரையாற்றச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நான் நன்றி தெரிவிக்கின்றேன். குறிப்பாக, வெள்ள அனர்த்தம் என்பது நாங்கள் எதிர்பார்த்துக் காத்திருக்கின்ற ஒன்று அல்ல. அது இயற்கையின் தாக்கம். இந்த இயற்கையின் தாக்கத்தால் ஏற்படும் அனர்த்தங்கள் நாட்டுக்கும் மக்களுக்கும் பொதுவானது. எனவே, இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு அரசாங்கக் கட்சி, எதிர்க்கட்சி என்பதற்கு அப்பால் நாம் எல்லோரும் ஒன்று சேர்ந்து சேவை செய்ய வேண்டிய பொறுப்பிருக்கின்றது என்பதை முதலில் நான் இங்கு வலியுறுத்திக் கூற விரும்புகின்றேன்.

[ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා]

இந்த வெள்ள அனர்த்தம் கடந்த சில நாட்களாக நாடு முழுவதும் பாதிப்புக்களை ஏற்படுத்தி வருகின்றது. குறிப்பாக வட மாகாணத்தின் வெள்ள அனர்த்தம் தொடர்பாக நான் இந்தச் சபையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். அனர்த்த முகாமைத்துவ அமைச்சு மற்றும் மாவட்ட செயலகங்கள் எல்லாம் ஒன்றிணைந்து இந்த வெள்ள அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்குக் கணிசமான அளவு உதவியிருக்கின்றன என்று நான் நினைக்கின்றேன். அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட மக்களுக்கு குறிப்பாக அனர்த்த முகாமைத்துவ அமைச்சர் கௌரவ மஹிந்த அமரவீர அவர்கள் பல்வேறு அவசர உதவிகளை மேற்கொண்டு வருகின்றார். அவருக்கு நான் இந்த அவையிலே நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். தொலைபேசியின் ஊடாக எந்த நேரத்தில் தொடர்புகொண்டாலும் அவர் எங்களது பிரச்சினைகளைப் பொறுமையாகக் கேட்டு, உடனடியாகத் தீர்த்து வைப்பார். அந்த வகையில் அவரும் அவரது அமைச்சின் அதிகாரிகளும் உடனடியாகச் செயற்பட்டு மிகவும் மகத்தான பணியைச் செய்து வருகின்றார்கள்.

நான் மீண்டும் வட மாகாணத்தின் பாதிப்புக்கள் தொடர்பாகத் தங்களின் கவனத்தை ஈர்க்கின்றேன். வட மாகாணத்தில் ஏற்பட்ட வெள்ள அனர்த்தங்களின்பொழுது மேதகு ஜனாதிபதி அவர்கள் சம்பந்தப்பட்டவர்களுக்கு உரிய பணிப்புரைகளை வழங்கியதன்மூலம் பாதிக்கப்பட்ட மக்களுக்கு உடனடி நிவாரணம் கிடைப்பதை உறுதி செய்திருக்கின்றார். குறிப்பாக வவுனியா, முல்லைத்தீவு, யாழ்ப்பாணம், கிளிநொச்சி, மன்னார் போன்ற மாவட்டங்களில் இன்றும்கூட அதிகபட்ச மழை பெய்துவருகின்றது. இன்று அங்குள்ள குளங்களில் வெள்ள நீர் நிரம்பிப் பாய்கின்ற நிலைமையால் மக்கள் தங்கள் குடியிருப்புக்களிலிருந்து இடம்பெயரவேண்டிய துர்ப்பாக்கிய நிலைமை தோன்றியிருக்கின்றது. வவுனியாவிலே கடந்த சில வாரங்களாகப் பெய்துவருகின்ற மழையினால் 190 குளங்கள் அழிவைச் சந்தித்தித்துள்ளன. நான்கு அணைக்கட்டுக்கள் உடைப்பெடுத்திருக்கின்றன; 24 வீதிகள் அழிவடைந்திருக்கின்றன. இன்று காலை வரை மொத்தமாக 14,551 குடும்பங்கள் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. இவற்றில் 4,551 குடும்பங்கள் விவசாயக் குடும்பங்கள் ஆகும். வவுனியா மாவட்டத்திலே 292 வீடுகள் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. கிட்டத்தட்ட 11,523 ஏக்கர் நெல்வயல்கள் அழிவடைந்துள்ளன. மேட்டுநிலப் பயிர்ச்செய்கைகூடப் பாதிக்கப்பட்டிருக்கின்றது. 3,675 ஏக்கரில் மேற்கொள்ளப்பட்ட மரக்கறிச் செய்கை, பழப் பயிர்ச் செய்கை மற்றும் தானியப் பயிர்ச் செய்கைகள் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன.

இந்த வெள்ள அனர்த்தம் கிளிநொச்சி மாவட்டத்தில்தான் அதிக பாதிப்புக்களை உருவாக்கியிருக்கின்றது. இதனால் கிட்டத்தட்ட 18,155 குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளன. 2,639 வீடுகள் அழிந்துள்ளன. இவை எல்லாம் மீள்குடியேறிய மக்களின் தற்காலிக வீடுகள். இதனால் இந்த மக்கள் மிகுந்த நெருக்கடியைச் சந்தித்திருக்கின்றார்கள். கிளிநொச்சி மாவட்டத்திலே 7,219 ஏக்கர் நெற்பயிர்ச் செய்கை அழிவுக்குள்ளாகியிருக்கின்றது. 313 ஏக்கர் மேட்டுநிலப் பயிர்ச் செய்கை பாதிப்புக்குள்ளாகியுள்ளது. இதேநேரத்தில் கிளிநொச்சி மாவட்டச் செயலகமும் அனர்த்த முகாமைத்துவப் பிரிவும் இணைந்து, இடம்பெயர்ந்து இடைத்தங்கல் முகாம்களிலே தங்க வைக்கப்பட்டுள்ள மக்களுக்குத் தாராளமாகச் சமைத்த உணவை வழங்கி வருகின்றன. அதுமட்டுமல்ல, பல்வேறு தொண்டர் ஸ்தாபனங்களும் கூட்டுறவுத் துறையும் வட மாகாண ஆளுநரின் உதவியுடன் பால்மா பக்கட்டுக்கள் உட்பட பல்வேறு பெறுமதிமிக்க உணவுப் பொருட்களைத் தாராளமாகவும் திருப்திகரமாகவும் வழங்கி வருகின்றன. அங்கு இன்னமும் தொடர்ந்து கனமழை பெய்து வருகின்றது. இரணைமடுக் குளத்தின் எல்லா வான் கதவுகளும் திறந்துவிடப்பட்ட நிலையில் அவற்றினூடாக நீர் பாயும் பகுதிகளில் இருக்கின்ற மக்கள் தொடர்ச்சியாக மிகுந்த பாதிப்புக்களைச் சந்தித்துவருகின்றார்கள். இரணைமடுக் குளத்தில் கிட்டத்தட்ட 33 அடி நீர் நிரம்பியிருப்பதாக மதிப்பிடப்பட்டுள்ளது. 30 அடி வரை நீர் நிரம்பியதும் மிகுதி வெளியேற்றப்பட வேண்டும். அந்தவகையில் தொடர்ச்சியாக நீர் உள்ளே வந்துகொண்டிப்பதால் எல்லா வான்கதவுகளும் திறந்த நிலையில் காணப்படுகின்றன. இங்கு குறிப்பாக நான் தெரிவிக்க விரும்புவது என்னவென்றால், ஏராளமான போக்குவரத்து வீதிகள் இந்த வெள்ளத்தினால் மிகவும் பாதிக்கப்பட்டிருக்கின்றன என்பதைத்தான். மக்களின் போக்குவரத்து பல இடங்களில் தடைப்பட்டிருக்கின்றது. இவைகளையும் சீர்செய்யவேண்டிய கட்டாயம் எங்களுக்கு இருக்கிறது.

அதேபோல, மன்னார் மாவட்டத்திலும்கூட 6,758 குடும்பங்கள் வெள்ளப் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. குறிப்பாக, இவற்றில் 5,838 குடும்பங்கள் விவசாயக் குடும்பங்களாகும். அங்கு 10,735 ஏக்கர் நெற்பயிர்ச்செய்கை முற்றுமுழுதாக அழிவடைந்துள்ளது. அதேவேளை, 262 ஏக்கர் மேட்டுப் பயிர்ச்செய்கையும் அந்த மாவட்டத்திலே அழிவுக்குள்ளாகியிருக்கிறது. அத்துடன் அங்குள்ள 92 குளங்கள் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. 7 வீதிகள் முற்றுமுழுதாக அழிவுக்குள்ளாகியிருக்கின்றன.

இதேபோல, முல்லைத்தீவு மாவட்டத்தில் 6,821 வீடுகள் முழுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. இவையெல்லாம் அநேகமாக தற்காலிக வீடுகளாகும். மேலும் 3,563 குடும்பங்கள் கடுமையான பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. கேப்பாப்பிலவு போன்ற இடங்களில் மீள் குடியேற்றம் செய்யப்படாமல் இருக்கும் குடும்பங்கள் எதிர்நோக்கும் பாதிப்புக்கள் இதைவிட அதிகமாகுமென்பதை நான் இந்த அவையிலே குறிப்பிட விரும்புகின்றேன். முல்லைத்தீவு மாவட்டத்திலே 1,512 ஏக்கர் நிலப்பரப்பில் மேற்கொள்ளப்பட்ட நெற்பயிர்ச்செய்கையும் பாதிப்புக்குள்ளாகியிருக்கின்றது. மேலும் 1,690 ஏக்கர் நிலப்பரப்பில் மேற்கொள்ளப்பட்ட மேட்டுப் பயிர்ச்செய்கையும் பாதிக்கப்பட்டிருக்கின்றது. குறிப்பாக பழச்செய்கை, மரக்கறி விவசாயிகளுக்கு இது பாரியளவில் பாதிப்புக்களை ஏற்படுத்தியிருக்கிறது. புதிதாகப் புனரமைக்கப்பட்ட A-35 வீதியிலுள்ள பெரிய பாலமொன்று தகர்ந்திருக்கிறது. முல்லைத்தீவு மாவட்டத்தில் மொத்தமாக 137 உள்ளூர் வீதிகளும் 11 பிரதான வீதிகளும் பெரும் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. இந்த அனர்த்தம் ஒட்டுமொத்த வட மாகாண மக்களின் சகஜ நிலைமைகளைப் பாதிப்புக்குள்ளாக்கியிருக்கிறது.

யாழ். மாவட்டத்தில் நேற்றும் இன்றும் அதிகளவில் மழைவீழ்ச்சி ஏற்பட்டுள்ளது. இதனால் அங்கு 1,668 குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன. 1,522 வீடுகள் மிகவும் பாதிப்புக்குள்ளாகியிருக்கின்றன. குறிப்பாக காரைநகர், ஊர்காவற்றுறை போன்ற பிரதேசங்களில் இந்த பாதிப்புக்கள் ஏற்பட்டிருக்கின்றன. யாழ். மாவட்டத்தில் மொத்தம் 2,612 குடும்பங்கள் இந்த வெள்ள அனர்த்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்றன. மிகவும் பாதிக்கப்பட்டிருக்கின்ற நெற்பயிர் மற்றும் மேட்டுப் பயிர்ச்செய்கை விவசாயிகளுக்கு நிச்சயமாக ஏதாவது நட்டஈடு வழங்கியே ஆக வேண்டும். நாட்டில் ஏற்பட்ட வரட்சி காரணமாகக் கடந்த சிறுபோகப்

பயிர்ச்செய்கையிலும்கூட மிகவும் பாதிப்புக்குள்ளாகியிருந்த நெற்பயிர்ச்செய்கை விவசாயிகள் மிகவும் நம்பிக்கையுடன் பெரும்போகப் பயிர்ச்செய்கையில் ஈடுபட்டார்கள். இருந்தபோதிலும், இந்த அனர்த்தம் மீண்டும் அவர்களுக்குப் பாதிப்பை ஏற்படுத்தியிருக்கிறது. ஈடுசெய்ய முடியாத பாதிப்புக்களை அவர்கள் எதிர்கொண்டிருப்பதால் அனர்த்த முகாமைத்துவ அமைச்சும் மேதகு ஜனாதிபதி அவர்களும் இவர்களின் விடயத்தில் கூடுதலான கவனம் செலுத்த வேண்டுமென்று நான் இந்த அவையினூடாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதேநேரத்தில் சிறு மழை பெய்தால்கூட வெள்ள அனர்த்தம் ஏற்படக்கூடிய காரணிகளை கண்டறிந்து அவற்றைத் தீர்க்க வேண்டும். குறிப்பாக எமது பகுதிகளிலே 30 ஆண்டுகால யுத்தம் எல்லாக் கட்டமைப்புக்களையும் சீர்குலைத்துவிட்டது. ஆகவே, சீராக நீர் வடிந்தோடும் தன்மையை உருவாக்குவதற்கான பொறுப்பை அனர்த்த முகாமைத்துவ அமைச்சு ஏற்று உரிய நடவடிக்கையை முன்னெடுக்க வேண்டுமென்பதையும் நான் இந்த அவையிலே தெரிவிக்க விரும்புகின்றேன். மேதகு ஜனாதிபதி அவர்கள் இந்த விடயத்தில் அதிக கவனம் செலுத்தி வருவதுபோல அனர்த்த முகாமைத்துவ அமைச்சும் இந்த விடயத்தில் கூடுதலான அக்கறை எடுக்க வேண்டுமென்று வலியுறுத்தி, விடைபெறுகின்றேன். நன்றி.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මීළඟට ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා. Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Udith Lokubandara to the Chair?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)

I propose that the Hon. Udith Lokubandara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே,* மாண்புமிகு உதித் லொக்குபண்டார *அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. UDITH LOKUBANDARA *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 4.25]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම ඛේදනීය දෙයක් තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. අපි බලාපොරොත්තු වුණා, විශ්වාස කළා රිසානා නෆීක් මෙනවිය නිදහස් කරයි කියලා, එතුමියගේ මෑණියන් පවා ඒ රටට ගොස් විශාල බලාපොරොත්තුවක් ඇති කර ගෙන හිටපු අවස්ථාවක අපට ඉතාම ඛේදනීය, කනගාටුදායක තත්ත්වයකට පත් වෙන්න සිද්ධ වුණා. ඒ පිළිබඳව අපත් ශෝක වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි බලාපොරොත්තු වුණේ නැති ආපදා තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. දැනුත් වහිනවා. වැහැලා දැනුත් ගංවතුර ඇති වෙලා තිබෙනවා. නුවරඑළිය, මාතලේ, හම්බන්තොට, කතරගම ප්‍රදේශත් යට වෙලා තිබෙනවා. අනෙක් පැත්තෙන් යාපනයේ ඉඳලා අනුරාධපුරය දක්වා ඔක්කෝම ප්‍රදේශ යට වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ගංවතුර නිසා කුඹුරු ටික විනාශ වෙනවා, අනෙක් පැත්තෙන් කීඩෑවන් නිසා කුඹුරු විනාශ වෙනවා. "දෙවෝ වස්සතු කාලෙන" කියන එක තමයි දැන් සිද්ධ වෙන්න අවශ්‍ය වන්නේ. අවුරුදු 50කට පස්සේ පෑවිල්ලක් ආවා. ඊළඟට ගංවතුරක් ආවා. ඊට පස්සේ තවත් ගංවතුරක් ආවා. දැන් තුන්වැනි ගංවතුරත් ඇවිල්ලා තිබෙනවා. දැන් මාතලේ ජනතාවට සිද්ධ වෙනවා, කුරුණෑගල දිහාවට පල්ලම් බැහැලා පදිංචියට එන්න. නුවරඑළියේ ඉන්න අයටත් එන්න සිද්ධ වෙනවා.

අය වැය විවාදය අවස්ථාවේ පරිසර අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාදයේදී මම මේ කාරණය පාර්ලිමේන්තුවේදී කිව්වා. මොකක්ද මේ "Early Warning System" කියලා කියන්නේ? මොකක්ද ඒකෙන් කියන්නේ? There should be an early warning or action should be taken after the incident. දැන් සිද්ධ වෙලා තිබෙන්නේ අන්න ඒකයි. කනගාටුදායක තත්ත්වයක් තමයි දැන් ඇති වෙලා තිබෙන්නේ. මොකද, මමත් පරිසරයට හරිම හිතකාමී කෙනෙක්. ප්‍රධාන ඇමතිවරයෙක් විධියට පමණක් නොවෙයි, විපක්ෂයේ ඉඳගෙනත් නාරම්මල, ගිරිඋල්ල, පන්නල යන ප්‍රදේශවල මම ගස් හිටෙව්වා. ඒ මොකද, මම පරිසරයට ආදරෙයි. ඒක මගේ හදවතේ තිබෙන දෙයක්. මම කටින් බතල සිටුවන කෙනෙක් නොවෙයි.

ඇමතිතුමා, ඔබතුමන්ලා එක කාරණයක් ඉගෙන ගන්න ඕනෑ. එක පාර වැහි එන්නේ නැහැ. මම හැම දාම පාන්දර 5.00ට නැඟිටලා බලන්නේ CNN එක. CNN, BBC වාගේ ඒවායේ හරියටම predict කරනවා, ලෝකයේ වැහි එන පළාත් මොනවාද කියලා. ලංකාවට මෙන්න මේ කාලයේ දී ආපදා එනවා කියලා අපට පැය 48කට ඉස්සෙල්ලා වාගේ දැන ගන්න පුළුවන් වෙනවා. මේ තත්ත්වය යටතේ කුරුණෑගලට මිලිමීටර් 300 ගණනක් වහිනවාය කියන එක අපි දන්නවා. ඒ සඳහා ගත්ත පියවර මොකක්ද? දොඩන්ගස්ලන්ද, මාතලේ දිහාවට වැස්සාම දැදුරු ඔයෙන් ජලය එනවා. හලාවතට වැහැලා නැහැ. මේ වතුර එන්න පැය හතක්, අටක් යනවා. ඔබතුමන්ලාගේ අමාත්‍යාංශය නැත්නම් රජය මොකක්ද කළේ? අර ජයලත් ජයවර්ධන මැතිතුමාගේ siren ටිකක්වත් අරගෙන දුන්නා නම් කමක් නැහැ. පැය හත, අටක කාලය තුළ කුරුණෑගල, වාරියපොළ පැත්තේ ඉඳලා නිකවැරටිය පැත්තෙන් හලාවත මුහුදට වතුර එන තුරු TV හෝ ගුවන් විදුලි හෝ පොලීසියෙන් හෝ වෙනත් මාර්ගවලින් මේ මහා විනාශය ගැන ජනතාව දැනුවත් කිරීමක් කර නැහැ. කරුණාකරලා මේ ගැන තමුන්නාන්සේලා පියවර ගන්න ඕනෑ. මම මේ විවේචනාත්මකව කථා කරනවා නොවෙයි, අර්ථවත්ව කථා කරන්නේ. මේ පියවර ගන්නේ නැතිනම් මොකද වන්නේ? දැන් ආපසු වැහි ඇවිල්ලා තිබෙනවා. මේක නිකම් දේව ශාපයක් වාගේ වෙලා. මම දන්නේ නැහැ, මේ ශාපය ඇවිල්ලා තිබෙන්නේ මොකද කියලා.

පරිසරය මිනිසා විනාශ කරනවා. බලන්න, අර මාවතගම සිද්ධිය ගැන. මොකක්ද කළේ? වල්පොල කන්ද කියන තැන

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

තමයි වළගම්බා රජතුමාගේ රාජධානිය තිබුණේ. ඒකේ රත්රන් ඇඳවල් එහෙම තිබුණා ලු. මේ මහා ගල කඩන්න පටන් ගත්තා. ඒකේ කඳු දිගටම තිබෙනවා. ඒ කන්ද කුරුණෑගලට පෙනෙනවා. මිනිස්සු කියනවා, රත්රන් ඇඳවල් ටිකයි ඔක්කොම ගත්තාය කියලා. අන්තිමට මොකද වුණේ? වල්පොල කන්දේ බම්බා විහාරය කියන තැන නාය යෑමක් ආවා. අද ඒ ගමේ ජනතාව අනාථ කඳවුරුවල ඉන්නේ. අද ඔවුන්ට කිසිම දෙයක් ඉතුරු වෙලා නැහැ. මේ සිද්ධ වුණු විනාශයන් දිහා බලන්න. මීට හත් මාසයකට ඉස්සෙල්ලා රෑ Jeeps, Defenders දැදුරු ඔයේ dam එක ළඟින් යනකොට ඩෝං ඩෝං කියලා ශබ්දයක් ආවා. මොනවාද අරගෙන ගියා. පහුවැනිදා බලනකොට ඉංජිනේරු නෝනාගේ සාරිය machine එකට අහුවෙලා පැටලිලා එතුමිය මැරිලා තිබුණා. දැදුරු ඔයේ සිදු වුණු සිද්ධියට ගත්ත පියවර මොකක්ද? Private sector එකේ අයගෙන් මම ඇහුවා, "ඔය කට්ටියගේ machinesවලට මොකද වුණේ?" කියලා. "අපි සර්, වේලාසනින් දැදුරු ඔය බැම්මෙන් ඉහළට ගත්තා"ය කියලා කිව්වා. Machine ඔක්කොම ජලයට යට වෙලා. දූකේ බැහැ, ඒක බලද්දී කනගාටුයි. පුදුම විනාශයක් වුණා. ඇයි? Driverලා, machine operatorලා ඔක්කොම ගෙවල්වලට ගිහිල්ලා. නිලධාරිනුත් ගිහිල්ලා. අර කරපු අපරාධය නිසා තව අවුරුදු ගණනාවකට දැදුරු ඔය බැම්ම හැදිල්ල එහෙමම කොට උඩ නැවතිලා තිබෙන්නේ. ඇයි තමුන්නාන්සේලා මේ කාරණා සඳහා පියවරවල් ගන්නේ නැත්තේ? මම අහනවා, මේ කාරණා සඳහා පියවර ගන්න බැරි මොකද කියලා.

මමත් ඔය අමාත්‍යාංශවල හිටියා. මමත් මේ කටයුතු කළා. 1958, මම පාසල් යන කුඩා කාලයේ අනුරාධපුරයට ගංවතුරක් ආවා. 1977- 1978 මඩකලපුවට සුළි සුළඟක් ආවා. ඒ වෙලාවේ මම හිටියේ දිසා ඇමති රැස්වීමේ. ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමාත් ඒ රැස්වීමට ඇවිල්ලා හිටියා. අපි ඒ වෙලාවේ එකට හිටියේ. ගංවතුර ගැන පණිවුඩ එන්න ඒ කාලයේ telephones තිබුණේ නැහැ. Radio messages නැහැ. ගංවතුරට මුහුද ගැලුවාය කිව්වා. අපට දිසා ඇමති රැස්වීමේදී ජේ.ආර්. ජයවර්ධන උන්නැහේ කිව්වා, "යන්න" කියලා. පාරවල්වලින් ගියේ. නමුත් කොහෙන් කොහෙන් ගියාද කියලා මම දන්නේ නැහැ. දැදුරු ඔය පැත්තේ, නිකවැරටිය දිහාවේ ගිහිල්ලා අපි ඔක්කොම ජනතාව බේරා ගන්න අපි එදා පියවර ගත්තා. ඒ සඳහා පියවර ගැනීමක් කරන්නේ නැතුව අපි tents මෙච්චර දුන්නා, මෙච්චර කෑම දුන්නාය කියලා වැඩක් නැහැ. මොනවාද තමුන්නාන්සේලා මේ කථා කරන්නේ? මේ සඳහා පියවර ගන්න. ගරු මහින්ද යාපා අබේවර්ධන ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, 2003 -රනිල් වික්‍රමසිංහගේ යූඑන්පී ආණ්ඩුව කාලයේ- මාතරට ගංවතුරක් ආවාය කියලා. මාතර සමන් දේවාලයේ මහා මංගල්‍යය පැවැත් වූ දවස්වල ලොකු ගංවතුරක් ආවා. මාතර දිහාවේ ගෙවල් කැඩිලා ගියා. තුන් මාසයෙන් ගෙවල් 47,331ක් හැදුවා, එදා කරු ජයසූරිය මැතිතුමා ප්‍රධාන කමිටුවකින්. තුන් මාසයෙන් ගෙවල් 47,331ක් සකස් කළා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
කීය ගණනේ දුන්නාද?

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට ඒවා ගැන කථා කරන්න වැඩක් නැහැ. සල්ලි නොවෙයි ඕනෑ. සල්ලි කෝටි ගණන් ගහන එක නොවෙයි කරන්න ඕනෑ. ඒ ආයතනය හදලා දෙන එකයි කරන්න ඕනෑ. සල්ලි ගහනවා, පිල්ලි ගහනවා. කථා කරන්න එපා. ඒ අහිංසක මිනිස්සු. ළමයින්ගේ පොත් පත් ටික නැහැ. අවුරුදු පනහක් ජීවිතයේ හම්බ කරපු ඒවා ඉවරයි. ලංකාවේ මිනිස්සු ජීවිත කාලයේ දී හම්බ කරපුවා මේ ගංවතුර නිසා ඉවරයි. නිකම් අසත්‍ය කථා කරන්න එපා. සල්ලිවලින් මනින්න කථා කරන්න එපා, ගරු ඇමතිතුමා. මම ඔබතුමා විවේචනය කළේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ඔබතුමාට මතක ඇති, සෝමාවතිය මාසයක් වතුරින් යටවෙලා තිබුණු බව. ගරු මහින්ද අමරවීර මැතිතුමනි, ඔබතුමාට මතකයි නේ, පුතාත් එක්ක යද්දී මට හමු වුණා. අද පාලම් කඩලා ගිහිල්ලා. බුදු රජාණන් වහන්සේගේ දක්ෂිණ දළදා වහන්සේ වැඩ සිටින සෝමාවතී චෛත්‍ය මාසයක් තිස්සේ වතුරින් යට වුණා.

ගොවිතැන් විනාශ වෙලා යනවා. මම කථා කරන්නේ කළ යුතු වැඩ ගැනයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී අහිංසක මිනිසුන් හම්බ කළ සියල්ලම විනාශ වුණා. දැන් ආයෙත් විනාශ වෙනවා. මේ අයට සහන සැලසීම සඳහා පියවර ගන්න ඕනෑ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ ගොවිජන සේවා මධ්‍යස්ථානය හෝ ගමේ කමිටුව හෝ දැනුවත් කරලා වැස්ස වැඩි වන විට ජලාශවල, වැව්වල වතුර අඩු කරන්න, වතුර ඉවත් කරන්න කටයුතු කරන්න ඕනෑ. ඒ සඳහා කලින්ම දැනුවත් කර තිබෙන්නට ඕනෑ. ඒවා මොනවත් සිදු වෙලා නැහැ. පසු ගිය දවස්වල පෑවිල්ල නිසා විනාශයක් සිදු වුණා. දැන් තුන්වෙනි වතාවටත් වැව්වල වාන් දොරටු අරින්න සිදු වනවා. තමුන්නාන්සේලා මේවා ගැන සුළුවෙන් හිතන්න එපා. ස්වභාව ධර්මයේ නොපෙනෙන හස්තයක් අද දඬුවමක් දෙන්න පටන් අරගෙන තිබෙනවා. මේක නවත්වන්නට කාටවත් බැහැ. දැහැමිව පාලනය ගෙන යන්න ඕනෑ; දැහැමිව ක්‍රියා කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුවන්වැලි සෑය ළඟ ගත්ත රූප මා ළඟ තිබෙනවා. රුවන්වැලි සෑය ළඟ, ශ්‍රී මහා බෝධීන් වහන්සේ ළඟ ගත්ත ෆොටෝ තිබෙනවා. රාත්‍රී 9.00ට දම් පාටට, ලේ පාටට අහස තිබුණා. මගේ ළඟ කැමරාව තිබෙනවා, මට photo දෙන්න පුළුවන්. මේ රටට මොන විපතක් වෙන්න යනවාද කියලා මට මහා භයක් ඇති වෙලා තිබෙනවා. රුවන්වැලි සෑයට උඩින්, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට උඩින් අහස දම් පාටට සහ ලේ පාටට තිබුණා. මහා භයානක අනාගතයක් එන්නේ. ඒකයි කියන්නේ පියවර ගන්න කියලා. අද මේ කල් තැබීමේ විවාදය තුළින් අපි ඉල්ලන්නේ දැදුරු ඔය ජලාශයේ තිබෙන විනාශය ගැන පියවර ගන්න කියලා විතරක් නොවෙයි. මේ ප්‍රදේශවල සිටින පවුල්වලට සජිත් ප්‍රේමදාස මැතිතුමා සහල් කිලෝ 10 ගණනේ දෙනවා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. මම එතුමාට ගරු කරනවා. මම ඒ ගැන කියන්නේ ආඩම්බරයෙනුයි.

[අ.භා. 4.34]

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම පළමුවෙන්ම කනගාටු වෙනවා, රුවන්වැලි සෑයෙන් බුදු රැස් විහිදෙන විට මීට පෙර කථා

කළ මන්ත්‍රීතුමා භයෙන් වෙවුලනවාය කිවූ එක ගැන. එතුමාට තමන් කළ දේවල් පේනවා ඇති. බුදු රැස් විහිදෙන විට වෙවුලනවා නම් එතුමා බෞද්ධයෙක්ද කියන එක අපට ගැටලුවක් වෙනවා. [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා පසු ගිය ගංවතුර ව්‍යසනයේදී ආණ්ඩුවක් වශයෙන් ක්‍රියා කළ ආකාරය වැරදියි කියන තර්කය ඉදිරිපත් කළා. 2010-11 ගංවතුර ව්‍යසනය පිළිබඳව අපට අත් දැකීමක් තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කමිටුව 2012.11.05 වෙනි දින රැස් වෙලා ගංවතුරක් එහෙම නැත්නම් මෙවැනි විනාශයක් ඉදිරියේදී ඇති වෙයි කියා අවශ්‍ය පියවර ගන්න තීරණය කළා.

ඒ අනුව අපි 2012.12.18 වන දින දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව රැස් වී එදා තිබුණු තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරලා එදා හවස 4.00ට කලාවැවේ වාන් දොරටු අරින්නට උපදෙස් දුන්නා. ඒ වාගේම හවස 3.00ට නාච්චාදූව වැවේ වාන් දොරටු අරින්නට උපදෙස් දුන්නා. පසු දින වන විට එයින් ආපදාවට පත් වෙලා කඳවුරුවල සිටි ජනතාව මුණ ගැසිලා ඒ අයට අවශ්‍ය කරන සියලුම පහසුකම් ලබා දුන්නා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආපදා කළමනාකරණ කමිටුව, දිසාපති ඇතුළු දේශපාලන ක්ෂේත්‍රයේ නිලධාරින් ඉමහත් කැප කිරීමක් සහ මැදිහත් වීමක් කරලා එයින් විපතට පත් ජනතාවට කරන්නට පුළුවන් උපරිම සේවාවන් ලබා දීමට කටයුතු කළා.

මෙම කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා කිව්වා මේ සඳහා අවශ්‍ය කරන මුදල් භාණ්ඩාගාරයෙන් අරගෙන දෙන්න කියලා. මම හිතන හැටියට වෙනත් අමාත්‍යාංශ වාගේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට ස්ථාවරව යන ගමනක් නැහැ. යම් කිසි විධියක විපතක් සිදු වුණු අවස්ථාවක ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අතිගරු ජනාධිපතිතුමාගෙන් ලබා ගැනීම තමයි සිදු වුණේ. මෙතෙක් කෙරිලා තිබෙන්නෙත් ඒකයි. ඇත්ත වශයෙන්ම ඒ සඳහා අතිගරු ජනාධිපතිතුමා අපට හරියාකාරව ප්‍රතිපාදන ලබා දීලා තිබෙනවා.

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ එක් අයෙකු වෙනුවෙන් වෙන් කළේ රුපියල් 2ක් නොවෙයි. පාන් රාත්තලක් අරන් දෙන්න පුළුවන් මුදලක් නොවෙයි රුපියල් 2ක් කියන්නේ. අපි භය නැතිව කියනවා අපේ ප්‍රදේශයේ විපතට පත් ජනතාවට කිසිම අඩු හිඟකමක් නැතිව සහන සලසන්නට හැකි වුණා කියලා. ආපදා කළමනාකරණ නීති රීති අනුව ප්‍රතිපාදන දෙන්න ක්‍රමයක් නැති වුණාම අපට සමහර අවස්ථාවල ප්‍රශ්නයක් ඇති වුණා. අපි ඒ ප්‍රදේශවල සිටින දානපතීන් සමඟ සම්බන්ධ වෙලා ළමයින්ට අවශ්‍ය කරන කිරි පිටි ලබා දුන්නා. දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ දුරකථනයෙන් කථා කරලා, ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කළා.

අපේ දිස්ත්‍රික්කයේ නම් ඔය කියන විධියේ ගැටලු ඇති වෙන්න අපි ඉඩ දුන්නේ නැහැ. ඒ වනකොට දිස්ත්‍රික් කළමනාකරණ කමිටුවේ සභාපතිවරුත් සම්බන්ධ වෙලා ආධාර ලබා ගැනීම සඳහා ස්වේච්ඡා සංවිධාන -සායි සංවිධානය, රතු කුරුස සංවිධානය, ජ්ලැන් ශ්‍රී ලංකා සංවිධානය වැනි සංවිධාන- පොළඹවා අවශ්‍ය කරන උපකරණ ලබා දුන්නා. 18 වන දා සමීක්ෂණ වාර්තා අරගෙන රාත්‍රි 11.00 විතර වනකොට කටියාව ප්‍රදේශයේත්, රාජාංගනය ප්‍රදේශයේත්, ගල්නෑව ප්‍රදේශයේත් කඳවුරුවල හිටපු ආපදාවලට ලක් වූ ජනතාවට අවශ්‍ය උපකරණ බෙදා දෙන්න අපට පුළුවන් වුණා.

ඇත්ත වශයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් කළමනාකරණ කමිටු ඒ අවස්ථාවේදී ක්‍රියා කරපු ආකාරය පිළිබඳව අපි සෑහීමට පත් වෙනවා; ඒ ප්‍රදේශයේ ජනතාවත් සෑහීමට පත් වෙනවා. මොකද, එහිදී අපේ අත් දැකීම් අනුව ක්‍රියාශීලී ආකාරයෙන් ඒ කටයුතු කළා. ඒ වාගේම ආපදා කළමනාකරණ ඇමතිතුමා අපට දුරකථනයෙන් කථා කරලා විටින් විට මේ ප්‍රදේශයේ තිබෙන තත්ත්වය මොකක්ද කියා ඇහුවා. ඇත්ත වශයෙන්ම අපි එතුමාට ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. සමස්ත ලංකාවම ගංවතුර ආපදාවට ලක් වෙලා තිබෙන අවස්ථාවක දේශපාලන ක්ෂේත්‍රය වෙනුවෙන් එතුමා අපට දුරකථනයෙන් කථා කරලා, ආපදාවට පත් වූ ඒ ප්‍රදේශවල ජනතාවගේ අඩු පාඩු සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කිරීම පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ ප්‍රදේශයට මීටත් වැඩි විනාශයක් වෙන්න තිබුණා. නමුත් අපට ඒ විනාශය වළක්වා ගන්නට හැකි වුණේ, අතිගරු ජනාධිපතිතුමා එදා ගොවින්ට දුන්නු පොරොන්දුවක් අනුව අපේ කුඩා වැව් ටික භාර දුන්නු නිසායි; අපේ කුඩා වැව් ටික ප්‍රතිසංස්කරණය කර දුන්නු නිසායි. ඒ තුළින් අපට හැකියාව ලැබුණා, ඒ වැව් කඩා බිඳ ගෙන යාම නතර කර ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කිවුලේකඩවැව ගැන මොකද කියන්නේ?

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
තමුන්නාන්සේ දන්නේ නැහැ. කිවුලේකඩ වැව කියන්නේ කුඩා වැවක් නොවෙයි. බලාපොරොත්තු ආකාරයට කඩ වළ බැන්දා. හැබැයි ඒකෙත් පිට වාන බැඳීම පරක්කු වීම නිසා තමයි ඒක වෙලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොරකමක් -

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
ඒක වෙනම දෙයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரன)
(The Hon. S.C. Mutukumarana)
නමුත් අපෙන් එක ප්‍රමාදයක් වුණා. ඒක මේ වර්ෂාවත් එක්ක ඔරොත්තු දෙන්නේ නැතිව ගියා. ඒකයි හදපු විගසින්ම කැඩිලා ගියේ. අපේ ප්‍රදේශයේ පවුල් 3,678යි ආපදාවට ලක් වුණේ. ඒ පවුල්වල සාමාජිකයන් 12,352ක් ඉන්නවා. ඒ හැම සාමාජිකයකුටම අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය ලබා දීලා, ඔවුන් නැවත ගෙවල්වලට යනකම් අවශ්‍ය කරන හැම පහසුකමක්ම ලබා දීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ අපට හැකියාව ලැබුණාය කියන එක අපට භය නැතිව කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව එක විනාඩියක් ලබා දෙන්නය කියා මා ඉල්ලනවා. ගරු ඇමතිතුමනි, අපට පොඩි

[ගරු එස්. සී. මුතුකුමාරණ මහතා]

ප්‍රශ්නයක් තිබෙනවා. මේ චක්‍රලේඛන අනුව ආපදාවට ලක් වෙන පුද්ගලයන් වශයෙන් ගණන් ගන්නේ කඳවුරු තුළට එකතු වන ජනතාව පමණයි. නමුත් මේ අවස්ථාව වන කොට සමහර අය ගෘහස්ථ කඳවුරුවල ඉන්නවා. උදාහරණයක් වශයෙන් දුවගේ ගෙය විනාශ වුණාම ඔවුන් මවගේ ගෙදරට ගිහින් ඉන්නවා. එවැනි දේවල් ගණන් ගැනීමක් සිදු වන්නේ නැහැ. මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා, ගෘහස්ථ කඳවුරුවල ඉන්න ආපදාවට ලක් වුණු පවුල්වල අය වෙනුවෙනුත් ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නය කියා. මේ අවස්ථාවේ ආපදා කළමනාකරණ අමාත්‍යවරයා වශයෙන් ගරු ඇමතිතුමා ගත්තු ක්‍රියා මාර්ගය ගැන අපේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. P. Ariyanethran. - [*Interruption.*] ඔව්. මොකක්ද ගරු අස්වර් මන්ත්‍රීතුමා?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
*தயவுசெய்து இரண்டு நிமிடங்கள் தாருங்கள்!*

Hon. Presiding Member, I stood up to express our deepest sorrow on the passing away of Rizana Nafeek in Saudi Arabia, who is reported to have been executed this morning. She was sent as an under-aged girl and had to meet this calamity at last.

I must place on record in this House the great efforts made by His Excellency the President and the Ministers concerned in order to get her a pardon. He even addressed two communications to the King of Saudi Arabia and also met Prince Salmon, the Second Command in the Royal Palace in Kuwait, recently, when we also went in a delegation to a Conference. Also, every effort has been made not only by the Sri Lankan Government, but even by civic societies all over the world.

I would also place on record that on the 16th of November, 2011, a delegation sponsored by our Government and led by the Governor of the Western Province, Mr. S. Alawi Moulana and his son Naqeeb went to the village of Dawadmi, 540 kilometers from Riyadh, and met the grandfather of the dead child, As-sheik Mirdas Al-Uthaibi and the tribal group. They said that they will intervene and get a pardon.

At this moment, we are very grateful to His Excellency President Mahinda Rajapaksa, the Government and also the Ambassador of Saudi Arabia in Sri Lanka, His Excellency Abdul Aziz bin Abdul Rahman Al-Jammaz; then the Minister of External Affairs and his Ministry officials, particularly the Hon. Dilan Perera, Ministry of Foreign Employment Promotion and Welfare, Mr. Nissanka Wijeratne, Secretary and Mr. Kingsley Ranawaka, Chairman, SLBFE, His Excellency Ahmed Jawad, the Sri Lankan Ambassador to Saudi Arabia, Mr. Ibrahim Ansar, Additional Secretary to the Ministry of External Affairs and also Moulavi M.S.M. Thassim of Jammiyathul Ulama Association for all the efforts that had been made. I was also in that delegation. We took Mr. and Mrs. Nafeek, the father and mother of Rizana, from Mutur with us. They also met that tribal leader at Dawadmi, the grandfather of the infant and pleaded with them for clemency. But, fate had the last call.

Sir, according to our religion, expressing my feelings in the Islamic way, I only have to say - she is also from the electorate of the Hon. Susantha Punchinilame and he too will express his condolences - "*Inna lillahi wa inna ilayhi rajioon*".

I also place on record our deep gratitude to Dr. Kifaya Ifthikar, a civil activist, who did everything possible by being in Saudi Arabia to get Rizana released.

[பி.ப. 4.42]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் எனது உரையை ஆரம்பிப்பதற்கு முன்னராக சவூதி அரேபியாவிலே மரண தண்டனை நிறைவேற்றப்பட்ட மூதூரைச் சேர்ந்த செல்வி றிஸானா நபீக் என்பவரின் அகால மரணத்துக்காகத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் கண்ணீர் அஞ்சலியைச் செலுத்துவதோடு, அவரின் பெற்றோர் மற்றும் குடும்பத்தினருக்கு எமது ஆழ்ந்த அனுதாபத்தையும் தெரிவித்துக்கொள்கிறோம். உண்மையில் இலங்கை அரசாங்கத்தைப் பொறுத்தமட்டில், அவரின் விடுதலைக்காக முயற்சியெடுத்திருந்தாலும் அந்த முயற்சி பலனளிக்கவில்லை என்பதைத்தான் இங்கே நாங்கள் சுட்டிக்காட்ட வேண்டியிருக்கிறது.

இன்று வெள்ள அனர்த்தம் தொடர்பான ஒத்திவைப்பு விவாதம் இங்கே நடைபெற்றுக்கொண்டிருக்கிறது. இயற்கை அனர்த்தம், செயற்கை அனர்த்தம் என்ற இரண்டு அனர்த்தங்களுக்கு மத்தியிலே குறிப்பாக வடக்கு, கிழக்கு மக்கள் தொடர்ச்சியாக பல அவலங்களைச் சந்தித்துக்கொண்டிருக்கின்றார்கள். அந்த வகையிலே, வட பகுதி, தென்பகுதி என்றில்லாமல் இலங்கை முழுவதிலுமுள்ள மக்கள் இந்த வெள்ள அனர்த்தத்தினால் பாதிக்கப்பட்டிருக்கிறார்கள். ஆயினும், இம்முறை ஏற்பட்ட வெள்ள அனர்த்தத்தினால் முதலாவதாகப் பாதிக்கப்பட்டது மட்டக்களப்பு மாவட்டமாகும். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தமட்டிலே வெள்ள அனர்த்தம் காரணமாக 800 வீடுகள் பகுதியாகவும் முழுமையாகவும் பாதிக்கப்பட்டிருக் கின்றன. 40,000 ஏக்கர் மானாவாரி நெற்செய்கை முழுமையாகப் பாதிக்கப்பட்டிருக்கிறது. 16,000 ஏக்கர் மேட்டு நிலப் பயிர்ச்செய்கை - மரக்கறிப் பயிர்ச்செய்கை - பாதிக்கப்பட்டிருக்கிறது. அதைவிட, அங்கு வளர்க்கப்படுகின்ற பசு மாடுகள், எருமை மாடுகள் அடங்கலாக 300 மாடுகள் இந்த வெள்ளத்தினால் அடித்துச் செல்லப்பட்டிருக்கின்றன. மேலும், 14 பிரதேச செயலாளர் பிரிவுகளிலுமுள்ள பல வீதிகள் முழுமையாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. மட்டக்களப்பு மாவட்டத்தின் செங்கலடி, வவுணதீவு போன்ற இடங்களிலே இருக்கின்ற அகத்தியர்குளம், தம்பனாவெளிக்குளம், நவத்தியாக்குளம், புதுக்குளம், தரப்பிலாக்குளம்,

பனிச்சையடிக்குளம் போன்ற 9 சிறுகுளங்கள் உடைப்பெடுத்திருக்கின்றன. இந்த வகையில் அங்கு விவசாயிகளும் கால்நடை வளர்ப்போரும் பெருமளவில் பாதிக்கப்பட்டிருப்பதுடன், கடற்றொழிலை நம்பி வாழ்கின்ற மீனவர்கள் கடற்றொழிலைச் செய்ய முடியாமலும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இதற்கப்பால், சாதாரண மக்கள் மற்றும் அரசாங்க ஊழியர்கள் தமது அன்றாடக் கருமங்களைச் செய்யமுடியாமல் பாதிக்கப்பட்டிருக் கின்றார்கள்.

இதுவரை மட்டக்களப்புக்கு 18 மில்லியன் ரூபாய் நிதி அரசாங்கத்தினால் ஒதுக்கப்பட்டிருக்கின்றது. அதற்கு மேலதிகமாக, புலம்பெயர்ந்து வாழ்கின்ற எமது மக்களினாலும் ஏனைய பல்வேறுபட்ட அரச சார்பற்ற நிறுவனங்களினாலும் வழங்கப்பட்ட நிதி உதவிகள் மூலமாகவும் அங்குள்ள மக்களின் அன்றாட தேவைகளை ஈடுசெய்ய நிவாரணங்கள் கொடுக்கப்பட்டிருக்கின்றன. எனினும், அனர்த்தம் என்று வருகின்றபோது பாதிக்கப்பட்ட மக்களில் பொது இடங்களில் தங்கி இருக்கின்றவர்களுக்கு மட்டும் நிவாரணங்கள் கொடுக்கப்படுகின்ற ஒரு செயல்முறை அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டு வருகின்றது. உண்மையிலே வெள்ள அனர்த்தம் ஏற்பட்டபோது, பொது இடங்களில் தங்கியவர்களைவிடக் கூடுதலானவர்கள் உறவினர்களுடைய வீடுகளில்தான் தங்கினார்கள்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)
Sir, give me one more minute.

ஆகவே, இடம்பெயர்ந்து இவ்வாறு உறவினர்களுடைய வீடுகளில் தங்கியிருக்கின்ற மக்களுக்கும் நிவாரணப் பொருட்கள் கொடுக்கப்படல் வேண்டும். மட்டக்களப்பு மாவட்டத்தில் மட்டுமல்ல, வடக்கு, கிழக்கிலே வெள்ளத்தினால் பாதிக்கப்பட்ட அனைத்து மக்களுக்கும் முழுமையான நட்டஈட்டைக் கொடுப்பதற்கு அரசாங்கம் உரிய முயற்சிகளை மேற்கொள்ளவேண்டும். இந்த வெள்ள அனர்த்தம் ஏற்படுவதற்கு முதல்நாள் மட்டக்களப்பு மாவட்டத்திலுள்ள வெல்லாவெளி பிரதேச செயலாளர் பிரிவு, களுவாஞ்சிக்குடி பிரதேச செயலாளர் பிரிவு, பட்டிப்பளை பிரதேச செயலாளர் பிரிவு மற்றும் வவுணதீவிலுள்ள பல வீடுகள் கரந்தடிச் சூறாவளியினால் - திடீரென்று வந்த சூறாவளியினால் - பாதிக்கப்பட்டிருக்கின்றன. அத்துடன், மகிழூர்முனை, மகிழூர், குருமண்வெளி, களுவாஞ்சிக்குடி, மண்டபத்தடி, கொக்கட்டிச்சோலை, செங்கலடி, வாகரை போன்ற இடங்களும் இதனால் பாதிக்கப்பட்டிருக்கின்றன. ஆகவே, இந்த அனர்த்தங்களுக்கான நட்டஈடும் கொடுக்கப்பட வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன்.

[අ.භා. 4.49]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අසා තිබෙනවා ඉස්සර කැලණියට ගවු හතක් දුරින් තමයි මුහුද තිබුණේ කියලා. ඒ බව රාජාවලියේ සඳහන් වෙලා තිබෙනවා. විහාර මහා දේවිය කැලණියේ ඉඳලා ගවු හතක් ගිහිල්ලා තමයි බෝට්ටුවට නැංගා කියන්නේ. එහෙම නම්, කොතරම් දුරට මුහුදු බාදනය වෙලා තිබෙනවාද කියලා තේරුම් ගන්න පුළුවන්. ස්වභාව ධර්මය වෙනස් කරන්න අපට බැහැ. 2004 ආපු සුනාමිය ගැන මෙහිදී බොහෝ දෙනෙක් කථා කළා. ඇමෙරිකාවේ කත්‍රිනා කියන සුළඟින් විතරක් ජීවිත 2,300ක් නැති වුණා. ඒ ආපදාව කළමනාකරණයට ඇමෙරිකන් ඩොලර් බිලියන 18ක් වියදම් වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුනාමිය පිළිබඳව මටත් අත් දැකීමක් තිබෙනවා. මා ඒ දවස්වල ප්‍රවාහන ඇමති. සුනාමියෙන් වූ විනාශය බලන්න අතිගරු ජනාධිපතිතුමා හෙලිකොප්ටරයේ යන කොට, සුනාමියට හසු වූ දුම්රිය දැකලා මට call කරලා කිව්වා, අන්න ඔබතුමාගේ දුම්රියක් පෙරළිලා කියලා. ඒ වන විට මාත් ඒ ගැන දැනගෙන සිටියේ නැහැ. සුනාමියට ඒ දුම්රිය හසු වීම නිසා දෙදහස් ගණනකගේ ජීවිත අහිමි වුණා. පරමාණු බෝම්බ 18,000කට වඩා සැර රළ පහරක් තමයි එදා සුනාමිය විධියට ආවේ. සුනාමියෙන් අපේ රටට විනාශ සිදු වුණා. අපි ඒ කාලයේ සුනාමි කියන වචනය අසා තිබුණේත් නැහැ. ඒ වචනය ජපානයේ එකක්. සුනාමිය කියන්නේ 'දැවැන්ත උස සාගර රැල්ල' කියන එකයි. නමුත් අපි ඒ ආපදාව කළමනාකරණය කළා. අපට ස්වභාව ධර්මය වෙනස් කරන්න බැහැ. ජලය කියන එක අපට වෙලාවකදී බාධාවක් වෙනවා; නමුත් තවත් වෙලාවකදී ශක්තියකුත් වෙනවා.

ජල විදුලි බලය කොපමණ ශක්තියක්ද කියලා බලන්න. ජල ගැලීම් ඇතුළුව ස්වභාව ධර්මයේ සිදුවීම් අපට පාලනය කරන්න බැහැ. මට මතකයි දුම්රිය සුනාමියට හසු වීම නිසා දෙදහස් ගණනක් මැරුණා. පළමුවැනි රළ පහර ඇවිල්ලා විනාඩි 20කට පමණ පස්සේ තමයි දෙවැනි එක ආවේ. එතෙක් ඒ දුම්රියේ engine driver වත් බැස්සේ නැහැ. බැස්සේ නැත්තේ, දැන් රළ ඇවිත් ඉවරයි කියලා ඔහු හිතපු නිසායි. නමුත් ඊට පස්සේ කලින් ආපු එකට වඩා ලොකු වේගයකින් රළ පහර ඇවිල්ලා කෝච්චි පෙට්ටි ගහගෙන ගියා. අපි මේ තත්ත්වය තේරුම් ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුනාමි අනතුර ඇඟවීම සඳහා දැන් නොයෙකුත් ක්‍රම තිබෙනවා. ජපානයේ තිබෙනවා Earthquake Early Warning System එකක්. අපි ඒ කාලයේ Tsunami Warning System එක දැම්මා. අපි NARA එක හරහා විශාල වැඩ කොටසක් කළා. චන්ද්‍රිකා මැතිනිය විදේශගතව හිටපු නිසා වර්තමාන ජනාධිපතිතුමා තමයි අපේ රටට පළමුවෙන්ම ආපු සුනාමි ආපදාව කළමනාකරණය කළේ. කල්පනා කරලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා අධිකරණය ගැනත් හැම වෙලාවේම කථා කරනවා. අධිකරණයේ සුනාමියකුත් තිබුණා නේ. ඉස්සර ප්‍රභාකරන් නඩු ඇහුවා, ගරු මන්ත්‍රීතුමනි. කිලිනොච්චියේ උසාවියක් තිබුණා, ඒ කාලයේ. ඒ උසාවියේ නඩු ඇහුවේ නැද්ද? මගේ යාළුවකුගේ ලොරියක් හසු වෙලා රුපියල් 80,000ක් දඩ ගැහුවා. ඒ අයගේ පොලීසියකුත් තිබුණා. එදා ඒ විධියට රටේ අධිකරණ දෙකක් තියෙද්දී කවුරුවත් කථා කළේ නැහැ ඒ ගැන. ශ්‍රේෂ්ඨාධිකරණයවත් කථා කළේ නැහැ ඒ ප්‍රශ්න ගැන. ඒක තමයි තිබුණු තත්ත්වය. එදා කවුරුත් පාහේ ඒ තත්ත්වය සහවාගෙනයි සිටියේ. එදා ඒ ගැන කවුරුවත් කථා කළේ නැහැ. ඒ තත්ත්වයත් වෙනස් කරලා, ඒ ආපදාව කළමනාකරණය කරලා, එක රටක් විධියට මේ රට බේරා දුන්නා අතිගරු ජනාධිපතිතුමා. ඒ එක පැත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න බොහොම සුළු වෙලාවක් තිබෙන්නේ. සුනාමිය නිසා අපට ලැබුණු අත් දැකීම් අනුව අප දැනගත් දේවල් තිබෙනවා. අපේ ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා ඒ ගැන කිව්වා. මේ දක්ෂ ඇමතිතුමා -ආපදා

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා ]

කළමනාකරණ ඇමතිතුමා- මොනවාද නොකළේ ගං වතුර ආපදාව කළමනාකරණය සඳහා?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කිව්වා වාගේ දැන් ගෝලීය උෂ්ණත්වය වැඩියි. ගෝලීය උෂ්ණත්වය කොතරම් වැඩිද කිව්වොත්, දැන් ඇන්ටාක්ටික් ප්‍රදේශයේ පෙන්ගුවින්ලා හති දාලා මැරෙනවා. මොකක්ද ඒකට හේතුව? කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය දිගින් දිගට ඉහළ යෑමයි. ඒ නිසා දැන් විශාල වශයෙන් උෂ්ණත්වය වැඩි වෙලා. මේවා කියන කොට හිනා වෙන්න එපා. දැන් ගෝලීය උෂ්ණත්වය වැඩි වෙලා. මේකට මූලිකම හේතුව තමයි අපි කාබන් ඩයොක්සයිඩ් විශාල ප්‍රමාණයක් පරිසරයට මුදා හරින එක. ඒක නිසා දියුණු රටවල් carbon credit කියලා credit එකක් අපට දීලා, "උඹලා මොකවත් කරන්න එපා, අපි අවශ්‍ය දේ කර ගන්නවා" කියලා විශාල වශයෙන් පරිසරයට කාබන් මුදා හරිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ආපදා කළමනාකරණය කරන්න ඕනෑ විධියක් තිබෙනවා. මා උදාහරණයක් කියන්නම්. ගං වතුර වෙලාවේ අනුරාධපුරයේයි මා සිටියේ. ආපදා කළමනාකරණ ඇමතිතුමාට මා අනුරාධපුරයේ ඉඳන් call එකක් දුන්නා, මෙන්න මේ වාගේ තත්ත්වයක් තිබෙනවා කියලා. එතුමා ඒ මොහොතේම මට කථා කළා. කථා කරලා ආපදා කළමනාකරණ කටයුතු කර දුන්නා. ගරු ඇමතිතුමනි, එදා කරපු ඒ ක්‍රියාවට මා ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. මුළු අනුරාධපුරයේම ජනතාව ඔබතුමාට ප්‍රශංසා කරනවා ගරු ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පීඩාවට පත්වූ ජනතාවට සහන සලසන්න ඕනෑ තරම් සල්ලි වියදම් කරන්න කියලා ජනාධිපතිතුමා කිව්වා. මොකද, එතුමාට මේවා ගැන පළපුරුද්දක් තිබෙනවා; එතුමාට වුවමනාවක් තිබෙනවා. එතුමා ගිහිල්ලා ගං වතුරෙන් පීඩා විඳින මිනිසුන්ට උදවු කළා. ජනාධිපතිවරයෙක් ගං වතුරින් පීඩාවට පත්වූ මිනිසුන් බලන්න ගිහිල්ලා ඒ මිනිසුන්ට උදවු කළේ කවදාද? මිනිස්සු සියලු දෙනා එතුමා පිළිගත්තා. මේකයි ඇත්ත කතන්දරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නම් කතෝලිකයෙක්. නමුත් මා කැමැතියි බුදු හාමුදුරුවන් සහ ආනන්ද හාමුදුරුවන් අතර ඇති වූ කතා බහක් ගැන කියන්න. දවසක් ආනන්ද හාමුදුරුවෝ අහස දිහා බලාගෙන කල්පනා කර කර සිටියා ලු. "මොකද ආනන්ද කල්පනා කරන්නේ?" කියලා බුදු හාමුදුරුවෝ ඇහුවා ලු. "මට මේ විශ්වය තේරුම් ගන්න බැහැ." කියා ආනන්ද හාමුදුරුවෝ කිව්වා ලු. ඊට පස්සේ බුදු හාමුදුරුවෝත් කියා තිබෙනවා, "මේ විශ්වය පිළිබඳ මගේ දැනීමත් අචින්ත්‍යයි." කියලා. අචින්ත්‍යයි කියන්නේ, 'මට දැනීමක් නැහැ' කියන එකයි. විශ්වයේ හැසිරීම පිළිබඳව අපට කියන්න බැහැ. නමුත් ආපදා කළමනාකරණය කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අපි තමයි ගඩොල්වලින්, කොන්ක්‍රීට්වලින් ගෙවල් හදන්නේ. ජපානය එහෙම නොවෙයි. ජපානයේ ගෙවල් හදන්නේ ගං වතුරක් ආවාම ඔරොත්තු දෙන විධියට බොහොම සැහැල්ලු, බර නැති ද්‍රව්‍යවලින්; යකඩවලින්. අද අපිත් ඒ විධියට කටයුතු කරන්න ඕනෑ.

මා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා, ඒ කැඩුණු ගෙවල් ගඩොල්වලින් හදන්න එපා, ලෑලිවලින් හදන්න කියලා. එහෙම නැත්නම් වෙනත් දෙයකින් හදන්න. එතකොට අනතුරු අඩු වනවා. දැන් ජපානයේ තිබෙනවා, Earthquake Early Warning system එකක්, Quakeguard system එකක්. මා ජපානයට ගිහින් සුනාමි ප්‍රශ්නය විසඳා ගන්න අවශ්‍ය තොරතුරු සොය ගත්තා. එහිදී මට පෙනී ගියා, හැම පාසල් වාරයකම තුන් වරක් ආපදා අනතුරු පිළිබඳ අධ්‍යාපනයක් පුංචි ළමයින්ට දෙන බව. පුංචි කාලයේ සිටම ඒ සම්බන්ධයෙන් ඔවුන් දැනුවත් කරනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමාත් එසේ කරන්න. පුංචි කාලයේ සිට දැනුවත් කළාම ආපදාවක් කියන්නේ මොකක්ද කියන එක අපට තේරෙනවා. අපට ස්වභාව ධර්මයට විරුද්ධව යන්න බැහැ. ස්වභාව ධර්මය මිනිසා පාලනය කරනවා මිසක්, මිනිසාට ස්වභාව ධර්මය අනන්ත අප්‍රමාණ විධියට පාලනය කරන්න බැහැ. ඒ warning system එක තිබෙන නිසා ඒවා කළමනාකරණය කර ගන්න අපට පුළුවන් වනවා.

අනික් කාරණය මේකයි. විශේෂයෙන්ම ඒ කාලයේ "සොදොම් ගොමොරා" නුවර මිනිසුන් කළ යම් යම් කරුණු කාරණා නිසා දෙවියන් වහන්සේ අනතුරු හැඟෙව්වා, භයානක තත්ත්වයක් තිබෙනවා, එය වළක්වා ගන්න කියලා. නමුත් මිනිස්සු ඇහුවේ නැහැ. අන්තිමට උන්වහන්සේ යහපත් මිනිසකුට කිව්වා, නැවක් අරගෙන එකම ජාතියේ සතුන් දෙදෙනා බැගින් ඒ නැවට දමා ගෙන යන්න කියලා. -ගරු නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා මේවා දන්නවා. මේවා ආගමේ කතන්දර- ඉතින් ඒ මිනිසා ඒ විධියට කළා. අවසානයේ දී මහා විශාල රළ පහරක් ඇවිත් සොදම් ගොමොරා නුවර විනාශ වුණා. මේ කථාව ඉතිහාසයේ තිබෙනවා.

අපේ මේ කළමනාකරණය පිළිබඳව එක්සත් ජාතික පක්ෂය අපට දොස් කියනවා, මහ ලොකු කයිවරු ගහනවා. නමුත් ඒ ගොල්ලෝ මොනවාද කළේ? කරපු දෙයක් නැහැ. අපේ ආණ්ඩුවෙන් තමයි ආපදා කළමනාකරණ systems, මුහුදේ රළ ඉහළ යන ප්‍රමාණය බලන්න මීනුම් දඬු ආදී ඒ හැම දෙයක්ම ඇති කළේ. මෙහිදී මටත් ප්‍රශ්නයක් ඇති වුණා. මට ඇති වුණු ප්‍රශ්නය මොකක්ද? මේ ප්‍රශ්නයේදී සමාජ සේවා අමාත්‍යාංශයෙන් තමයි උදවු ඉල්ලුවේ. නමුත් ඉතින් මට කරන්න දෙයක් නැහැ. කලින් සමාජ සේවා අමාත්‍යාංශය යටතේ තමයි ඒ කටයුතු කරන්න තිබුණේ.

ජනාධිපතිතුමා දැන් ඒ කටයුතු අපේ දක්ෂ ඇමතිවරයකුට භාර දීලා තිබෙනවා. එතුමා ඒ කාර්යයන් හොඳින් කරනවා. නමුත් අපේ සමාජ සේවා නිලධාරින් හැම කෙනකුටම මා කිව්වා, මේ කාර්යයට උදවු වෙන්න කියලා. ඒ හැම කෙනෙක්ම තමුනාන්සේලාට උදවු කළා. විෂයට අදාළ නැති වුණත් ඒ අය ගිහින් ඒ සම්බන්ධයෙන් සොයා බලා ඒ වැඩ කටයුතු කළා. ඒ වාගේම අපේ TNA මන්ත්‍රීතුවරයකුත් මාව හමු වන්න පැමිණියා. මා මගේ යාළුවන්ට කියලා රුපියල් ලක්ෂ 5ක්, ලක්ෂ 6ක්, ලක්ෂ 7ක්, ලක්ෂ 8ක් ඉල්ලා එතුමාටත් දුන්නා, වැඩ කර ගෙන යන්න කියලා. අපි එහෙම තමයි වැඩ කරන්නේ. මොකද, මේ ආපදා කියන එක, පක්ෂයකට, ජාතියකට, කුලයකට, ආගමකට සීමා වන එකක් නොවෙයි. එය කාටත් පොදු දෙයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ස் பெரேரா)
(The Hon. Felix Perera)
ආපදා කළමනාකරණය කරන්න ඉතාමත් සාර්ථක වැඩ පිළිවෙළක් අපේ රජය දියත් කරලා තිබෙනවා. ජනාධිපතිතුමා

පෞද්ගලිකව ගිහින් ඒ ගැන බලා තිබෙනවා. ඒ වාගේම අපේ අමාත්‍යතුමා මහා විශාල කාර්ය භාරයක් ඉෂ්ට කළා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා. අපේ රට කොච්චර හොඳ රටක්ද?

අද රිසානාට සිදු වුණු දේ ගැන හිතන කොට තමුන්නාන්සේලා සන්තෝෂ වන්න ඕනෑ, ශ්‍රී ලංකාව වාගේ රටක අතිගරු ජනාධිපතිතුමා යටතේ ජීවත් වන්න ලැබීම ගැන. එතුමා අධිකරණ සුනාමියත් නැති කළා. අධිකරණ පද්ධති දෙකක් තිබුණු රටේ 2009 මැයි මාසයේ ප්‍රභාකරන්ගේ මිය යෑමෙන් පස්සේ මේ රටට එකම අධිකරණ පද්ධතියක් ඇති කරමින් ඒ අධිකරණ සුනාමියත් අවසන් කළ නිසා මේ ආණ්ඩුව යටතේ සිටීම තමුන්නාන්සේලාගේ වාසනාවක් කියන එක ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ඊළඟට ගරු අකිල විරාජ් කාරියවසම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු නිරෝෂන් පෙරේරා මන්ත්‍රීමාට නියමිත කාලයෙන් විනාඩි කිහිපයක් මා ගන්නවා. එතුමා අද මේ සභාවට පැමිණෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ සියල්ලම අරගෙන තමයි දැන් විනාඩි 7 දක්වා කාලය අඩු වෙලා තිබෙන්නේ.

[අ.භා. 4.58]

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කෙටි කාලයක් තිබෙන්නේ. මේ විවාදයේදී ගංවතුර සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය මොනවාද කළේ කියා අපේ ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා චෝදනා කළා. වැඩි ඈතක යන්න ඕනෑ නැහැ. එතුමා කථා කරන මේ පාර්ලිමේන්තුවේ වටපිටාව බලන්න. මේ පාර්ලිමේන්තුවත් එක්සත් ජාතික පක්ෂයේ ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා මේ රටට ගෙනාපු දෙයක්. ඒ ගැන කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ වාගේම ඒ කාලයේ සුනාමියක් තිබුණේ නැහැ නේ. සුනාමිය ඇති වුණේ 2004 දෙසැම්බර් මාසයේ නේ. ඉතින් එක්සත් ජාතික පක්ෂය කාලයේ නොවෙයි, සුනාමිය ඇති වුණේ. අපේ කාලයේ ඇති වුණු ව්‍යසන පාලනය කරන්න අපි කටයුතු කළා.

ඒ විතරක් නොවෙයි. එතුමා බුද්ධාගමත් බොරු කරන්න හදනවා. දැන් එතුමා කිව්වා, "මේ විශ්වය ගැන මටත් තේරෙන්නේ නැහැ"යි කියලා බුදු හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට දේශනා කළා කියලා. මා දන්නා බුද්ධාගම අනුව නම් එහෙම එකක් කොහේවත් සඳහන් වන්නේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, කියන කල්. උන්වහන්සේ මේ විශ්වයේ තිබෙන අසීමිත ස්වභාවය ගැන ප්‍රකාශ කළා මිසක් "මටත් තේරුණේ නැහැ"යි කියා කොයි වෙලාවකවත් දේශනා කළේ නැහැ.

මා කියන්නම් . තමුන්නාන්සේ දන්නවා ද, බුදු වෙනවාය කියා කියන්නේ ඇයි කියා. [බාධා කිරීමක්] ඒක තමයි. ඒ තේරුම් ගැනීම, ඒ තරමටම පරතෙරට යන්නට තිබෙනවාය කියන එකයි. "මටත් තේරෙන්නේ නැහැ " කියා බුදුන් වහන්සේ වදාළේ නැහැ. බුදු වෙනවාය කියා කියන්නේ ගරු ඇමතිතුමා, පරිසරයේයි, ස්වභාව ධර්මයේයි සියුම් ක්‍රියාකාරකම් පිළිබඳව තේරුම් ගැනීමේ ඥානය පහළ කර ගන්න එක. ඒකට තමයි බුදු වෙනවාය කියන්නේ. ස්වභාව ධර්මයේ සියුම් ක්‍රියාකාරීත්වය තේරුම් ගැනිමේ ඥානය පහළ කර ගැනීම. බුදුන් වහන්සේ බුදු වෙලා, මේ " විශ්වයේ තියෙන්නේ මොනවා ද කියා මටත් තේරෙන්නේ නැහැ."කියා ආනන්ද හාමුදුරුවන්ට වදාළේ නැහැ. කතෝලික ආගමට අප ගෞරව කරනවා. ඒ වාගේම බෞද්ධ දර්ශනය ගැන කථා කරද්දී පොඩ්ඩක් විතර හොඳට දැනමුතුකම් අරගෙන කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එතැනින් එහාට ඒ ගැන උත්තර දෙන්නට යන්නේ නැහැ.

ගංවතුර උවදුර ඇතුළු මේ ස්වාභාවික ව්‍යසනයන් පිළිබඳව අප ආණ්ඩුවට දොස් කියන්නේ නැහැ. ඒක ස්වභාව ධර්මයේ ප්‍රශ්නයක්. මොන ආණ්ඩුව තිබුණත් මේ වාගේ ව්‍යසනයන්ට පත් වන්නට පුළුවන්. ඒ වාගේම මේ කාරණයේදී ගරු ඇමතිතුමා තරුණ මන්ත්‍රීවරයෙක් විධියට විශාල කාර්ය භාරයක් ඉටු කළාය කියන එක අප සතුටින් කියනවා. ඒක අප දැක්කා. එතුමා ඒ හැම තැනටම ගොස් සොයා බැලුවා. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. විපක්ෂය වශයෙන් අප ඒවායේ තිබෙන අඩු පාඩුකම් පෙන්වා දෙන්නට ඕනෑ. ඒක නේ විපක්ෂයේ කාර්ය භාරය. එහි අඩු පාඩුකම් බොහොමයක් තිබෙනවා.

උදාහරණයක් හැටියට මා මේ කාරණය කියන්න ඕනෑ. මේ හදිසි ආපදා කළමනාකරණය පිළිබඳව අපට අවශ්‍යතාව මතු වුණේ, ප්‍රධාන වශයෙන්ම 2004 වර්ෂය අවසානයේ පැමිණි සුනාමි ව්‍යසනයත් සමඟයි. ඒ අවස්ථාවේදී තමයි මෙහි තිබෙන බරපතළකම අපට දැනුණේ. අප 2005 වසරේදී ස්වාභාවික අපදාවන් පිළිබඳව සොයා බැලීමට පාර්ලිමේන්තුව විශේෂ කාරක සභාවක් පත් කළා. එම කමිටු වාර්තාව මඟින් නිර්දේශ ඉදිරිපත් කළා. තවමත් ඒ නිර්දේශ ක්‍රියාත්මක වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් බලන්න, මේ නිර්දේශවල තිබෙනවා, ගංවතුර අවදානම් ඇති ප්‍රදේශ සිතියම්ගත කිරීම; ගංගා ආශ්‍රිත ප්‍රදේශවල පෙර සිදු වූ ගංවතුර නිසා ඇති වූ ජල මට්ටම සටහන් කර තැබීම ආදිය. බංග්ලා දේශය වැනි දුප්පත් රටක මෙය දැනටමත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම ජල ගැල්ම පිළිබඳ තොරතුරු එකතු කිරීම, අධ්‍යයනය කිරීම සහ එය පදනම් කර ගෙන අනාවැකි පළ කිරීමත් එම නිර්දේශ අතර වනවා. මෙවැනි කරුණු කාරණා 2005 වර්ෂයේදීම හඳුනා ගෙන තිබෙනවා. මේවාට අවශ්‍ය ප්‍රතික්‍රියා දක්වා නැහැ. බංග්ලා දේශයේ ක්යෝටෝ සම්මුතිය පදනම් කර ගෙන ආපදා කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කර තිබෙනවා. බංග්ලා දේශය කියන්නේ අපේ රටට වඩා බොහොම පහළ මට්ටමේ තිබෙන රටක්. නමුත් අප තවම එතැනට ඇවිත් නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය. අප ඒ ටික ක්‍රියාත්මක කළා නම් මීට වඩා මේ ගංවතුර තත්ත්වය අවම කර ගන්නට තිබුණා.

අප කියන්නේ, මේ සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය තවත් වැඩි කරන්න කියලායි. අවතැන්වූවන්ගේ කඳවුරුවලට ගිහින් ඇමතිවරුන් වැඩ කළා මම දැක්කා. මාත් බිංගිරිය ප්‍රදේශයේ ගියාම මම දැක්කා, - [බාධා කිරීමක්] ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා, හාල් කිලෝ දෙකයි, සැමන් ටින් එකයි වාගේ බෙදලා දීලා ගියා. ආයෙත් තව තැනක හාල් කිලෝ පහක් වාගේ බෙදලා දීලා තිබුණා. අඩු පාඩු ඇති තැන්වලට උදව් කර තිබුණා. හැබැයි අප ඊට වඩා තවත් තැන් හඳුනා ගෙන තිබුණා. කඳවුරුවල ඉන්න

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

අය විතරක් නොවෙයි, ගෙවල්වලත් සිටියා. දැන් බිංගිරිය ගත්තොත් ගරු ඇමතිතුමනි, ඌරාපොත්ත, තිසෝගම ආදී ප්‍රදේශවලට අප ගියා. දැදුරු ඔය අවට ප්‍රදේශවලට විශාල ලෙස හානි වෙලා තිබෙනවා. සමහර අය ඒ කඳවුරුවලට එන්නේ නැහැ ගරු ඇමතිතුමනි. සමහරු ඥාතීන්ගේ ගෙවල්වල, හිතවතුන්ගේ ගෙවල්වල, අල්ලපු ගෙවල්වල, උස් තැන්වල තිබෙන ගෙවල්වල ඒ වාගේ තැන්වල නතර වුණා. ඒ මිනිස්සුන්ට කන්න බොන්න අමාරුකම් තිබුණා. අපත් අපේ වාහනවල හාල් පුරවා ගෙන ගියා, අතින් වියදම් කර ගෙන. මොකද, අප කවුරුත් මනුෂ්‍යයෝ නිසා. එහෙම අර ගෙන ගිහින් බෙදුවා.

මොකද ඒ තැන්වලට ආධාර ලැබිලා නැහැ. සමහර තැන්වලට ග්‍රාම නිලධාරි මහත්වරු ඇවිල්ලා තිබුණේත් නැහැ. පස්සේ ඇවිත් තිබුණා. නමුත් දවස් කිහිපයක් යන තුරු ඒ ගොල්ලන්ට හරි අමාරුකම් තිබුණා. මේ කාලයේ සාමාන්‍ය විධියට ජීවත් වෙන්නටත් අමාරුයි. වේල් තුනක් කන්න බැහැ, මේ තිබෙන ආර්ථික රටාව අනුවත්. එහෙමත් අමාරුකම් තිබෙද්දී මෙහෙම ව්‍යසනයක් ආවාම ඔය අතට අහුවුණු රෙදිකෑලි ටික අර ගෙන කොහේ හෝ දුවලා ගියා. මොකද, ගංවතුර එකපාර ආවේ. හිතා ගන්නට බැරි මොහොතක හදිසියේ ගංවතුර ආවේ. එම නිසා කොහේ හෝ දුවලා ගිහින් කාගේ හෝ හිතවතෙකුගේ ගෙවල්වල නතර වුණා. ඒ ගෙවල්වල හතර පස් දෙනා ඉන්නවා අප දැක්කා. කඳවුරුවලත් කට්ටිය සිටියා. එම නිසා මීට වඩා මේ ගැන ගැඹුරින් අධ්‍යයනය කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ගංවතුරෙන් හානියට පත් වුණු ගෙවල් හදා ගන්නට සහනයක් දෙනවාය කියනවා. ගරු ඇමතිතුමාත් හොඳයි. ජනාධිපතිතුමාත් ඕනෑ තරම් දෙනවාය කියා මට දැන ගන්නට ලැබුණා. අනේ! ගරු ඇමතිතුමනි, මේ රුපියල් පණස් දාහෙන් ලක්ෂයෙන් ගෙවල් හදන්න බැහැනේ. අද තහඩු ටිකක් ගන්න කීයක් යනවා ද? ගෙයක් හදන්න විශාල මුදල් ප්‍රමාණයක් යනවා. නමුත් යාන්තම් ගෙයක් අටවා ගන්නත් රුපියල් ලක්ෂ හතරක් පහක් අවශ්‍ය වෙනවා. ඒ මුදලින් මේ මිනිසුන්ට ගෙයක් හදා ගන්න බැහැ. මා දන්නේ නැහැ, අවාසනාව ද කියා. දැදුරු ඔය ඇතුළු ගංගා ආශ්‍රිත ප්‍රදේශවල ඉන්න හුඟක් මිනිස්සු කුලී වැඩ කරන මිනිස්සු, සාමාන්‍ය මිනිස්සු, ජීවත් වෙන්න අමාරුකම් තිබෙන මිනිස්සු ඉන්නවා.[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව කථා කරන්න කාලය ඇත්තේ මිනිත්තුවයි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
තව සුළු කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මිනිසුන්ට ගෙවල් හදා ගන්න මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න. මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, ඒ ගොල්ලන්ට නිවාස හදා ගන්න අවශ්‍ය සහන ලබා දෙන්න. මොකද, මේ මිනිසුන්ට මොනවාවත් කර ගන්නට බැහැ. ළමයි ටික ඉස්කෝලයේ යවා ගන්නට බැහැ. ආර්ථිකය හදා ගන්නට බැහැ. ඒවා කර ගන්න නම් අඩුම ගණනේ යම් මුදල් ප්‍රමාණයක් අතට ලැබෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මම කියා සිටිනවා, ඔය ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරිවරු කරන දේවල් පිළිබඳව තවදුරටත් සොයා බලන්න කියලා. මෙතැනත් ඉන්නවා කල දුටු කල වල ඉහගන්නා මිනිස්සු. මේක දේශපාලනයක් නොවෙයි. අපි යද්දී එක තැනක මම දැක්කා ගෙවල්වල ඉන්න මිනිස්සුන්ටත් අර බඩු භාණ්ඩ, පැකට් අර ගෙන තිබෙනවා. මේ ග්‍රාම නිලධාරිගේ ගෙදර ඒවා තිබෙනවා කියලා මට කෙනෙක් කිව්වා. ඉතින් අපට ගිහින් ඒවා අල්ලන්න බැහැ. නමුත් කඩා පැනීමේ හමුදාවක් දමලා හරි ඒවා ගැන සොයන්න. මොකද, අද මිනිස්සු තුළ සාරධර්ම - ethics - නැහැ. මොනවා හරි කරලා, මොකා මරා ගෙන හරි ජීවත් වෙන්න තමයි බලන්නේ. මේ තිබෙන ආර්ථික රටාවත් ඒකට එක හේතුවක් වෙන්න ඇති. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේවා ගැනත් විශේෂ අවධානය යොමු කරන්න.

මට කාලය වැඩිපුර නැති නිසා අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. දැන් කොළඹ ප්‍රදේශයේ නගර සංවර්ධනය වෙනවා. ලස්සන parks හැදෙනවා. ඒක හරිම හොඳයි. ඒවා හරි වටිනවා. පිට රටවලින් එන මිනිස්සුන්ටත් ඒවා දකිද්දී හරි වටිනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාගේ කථාව අවසාන කරන්න.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මට තව තත්පර 30ක් දෙන්න.

මේවා කරද්දී UDA එකේ අවසරය මත පමණක් හිතුන හිතුන විධියට මේ කටයුතු කරනවා කියලා මට දැන ගන්න ලැබී තිබෙනවා. ඒ නිසා මිනුම්පති දෙපාර්තමේන්තුව, ජල සම්පාදන හා ජලාපවහන-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු හුනෛයිස් ෆාරුක් මන්ත්‍රීතුමා.

[பி.ப. 5.05]

**ගරු හුනෛයිස් ෆාරුක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

அவைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இந்த நேரத்தில் இலங்கைவாழ் மக்களுக்கு ஒரு சோகமான செய்தி கிடைத்திருக்கின்றது. அதுதொடர்பில் நான் இலங்கைவாழ் அனைத்து முஸ்லிம்களுக்கும் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். அதாவது, இன்று சவூதி அரேபியாவில் மரண தண்டனை நிறைவேற்றப்பட்டிருக்கின்ற செல்வி றிஸானா நபீக் என்பவருக்கு மறுமையில் நல்ல ஈடேற்றமும் சுவனமும் கிடைக்க வேண்டுமென அனைத்துப் பள்ளிவாசல்களிலும் விசேட பிரார்த்தனை நிகழ்த்துமாறும் ஒவ்வொருவரும் தனித்தனியாகப் பிரார்த்தனை செய்யுமாறும் அன்பாகக் கேட்டுக்கொண்டு, விடயத்துக்கு வருகின்றேன்.

கடந்த வாரங்களில் எமது நாட்டின் பல பகுதிகளிலும் ஏற்பட்ட வெள்ள அனர்த்தத்தைப் பார்க்கின்றபொழுது, குறிப்பாக வன்னி மாவட்டத்தில் பல பாதிப்புக்கள்

ஏற்பட்டிருக்கின்றன. பாதிக்கப்பட்ட இடங்களுக்கு அனர்த்த முகாமைத்துவ அமைச்சர் கௌரவ மஹிந்த அமரவீர அவர்கள் உடனடியாக வருகை தந்தமையானது, பாதிக்கப்பட்ட எமது மக்களுக்கு ஓர் உற்சாகத்தை அளித்தது. அவர் என்னுடன் மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களுக்கு வருகை தந்தார். மன்னார் மாவட்டத்தில் பாதிக்கப்பட்டவர்கள் தங்கவைக்கப்பட்டிருந்த தற்காலிக முகாம்களுக்கு நேரடியாக விஜயம் செய்து, அம்மக்களுடைய குறைகளையும் தேவைகளையும் கேட்டறிந்தார். குறிப்பாக தம்பனைக்குளம் மக்கள், தாங்கள் அமைத்திருக்கின்ற குடிசைகள் ஒரு குளத்திற்குள் அமைக்கப்பட்டிருப்பதாகவும் அந்த இடத்தை மாற்றித் தருமாறும் கௌரவ அமைச்சர் அவர்களிடம் வேண்டுகோள் விடுத்தார்கள். அதைத் தொடர்ந்து, அதற்கான ஏற்பாடுகளைச் செய்யுமாறு கௌரவ அமைச்சர் அவர்கள் என்னை வேண்டினார். நான் அதற்கான ஏற்பாடுகளைத் தற்பொழுது செய்திருக்கின்றேன். அதேபோன்று, அதற்காக ஒதுக்கப்பட்ட நிதி குறைவாக உள்ளது என்பதை கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டுவந்தபொழுது, அவர் உடனடியாக அதற்கான மேலதிக நிதியை ஒதுக்கி, எங்களுடைய வன்னி மாவட்ட மக்களுக்கு உற்சாகத்தை வழங்கினார். அதற்காக நான் முதலில் கௌரவ அமைச்சர் அவர்களுக்கும் அந்நிதியை வழங்குவதற்கு உதவியாக இருந்த மேதகு ஜனாதிபதி அவர்களுக்கும் எமது மக்கள் சார்பாக நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன்.

வன்னி மாவட்டத்தில் குறிப்பாக யுத்தத்தினால் இடம்பெயர்ந்த மக்கள் மீளக்குடியேறிக் கொண்டிருக்கின்ற இச்சந்தர்ப்பத்தில், இவ்வாறான அனர்த்தமானது பாரிய பாதிப்புக்களை ஏற்படுத்தி இருக்கின்றது. அந்த மக்கள் மீண்டும் தங்களுடைய வாழ்விடங்களை அமைப்பதிலும் விவசாயத்தை மேற்கொள்வதிலும் ஏனைய வாழ்வாதார நடவடிக்கைகளை முன்னெடுத்துச் செல்வதிலும் பாரிய சிக்கல்களை எதிர்கொண்டு ஓர் இக்கட்டான சூழ்நிலைக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். முல்லைத்தீவு மாவட்டத்தைப் பொறுத்தமட்டில், ஆயிரத்துக்கும் மேற்பட்ட குடும்பங்கள் இந்த வெள்ள அனர்த்தத்தினால் இடம்பெயர்ந்திருக்கின்றன. சுமார் 667க்கும் மேற்பட்ட வீடுகள் முற்றுமுழுதாகவும் 12,151 வீடுகள் பகுதியளவிலும் சேதமடைந்துள்ளன. இதேபோன்று முல்லைத்தீவு மாவட்டத்தில் பெரும்போக விவசாயச் செய்கை நடைபெற்றுக்கொண்டிருப்பதனால், பல ஏக்கர் விவசாய நிலங்கள் முற்றுமுழுதாக அழிக்கப்பட்டிருக்கின்றன. அதேபோன்று, மேட்டுநிலப் பயிர்ச்செய்கைகள் அழிக்கப்பட்டிருக்கின்றன. இந்த அனர்த்தத்தின்மூலம் புதுக்குடியிருப்புப் பிரதேசத்தில் ஒருவர் உயிரிழந்திருப்பதாகவும் எங்களுக்குத் தகவல் கிடைத்திருக்கின்றது.

வவுனியா மாவட்டத்தைப் பொறுத்தமட்டில், 14,561 குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளன. இவர்கள் சுமார் 89 தற்காலிக முகாம்களில் தங்கவைக்கப்பட்டிருக்கின்றார்கள். அதேபோன்று 210 வீடுகள் முற்றாகவும் 2,270 வீடுகள் பகுதியளவிலும் சேதமடைந்துள்ளன. விவசாயத்தை அடிப்படையாகக்கொண்ட ஒரு மாவட்டமான வவுனியாவில் சுமார் 1,200 ஏக்கர் நெல் வயல்கள் முற்றாக அழிக்கப்பட்டிருக்கின்றன. இதேபோன்று 160க்கும் மேற்பட்ட குளங்கள் -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු හුනෛයිස් ෆාරූක් මහතා**
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

මට තව විනාඩි දෙකක් විතර දෙන්න. වන්නි ප්‍රදේශයේ තමයි වැඩිපුර හානි වී තිබෙන්නේ.

அதேபோன்று, மன்னார் மாவட்டமும் பாரிய பாதிப்புக்களுக்கு உள்ளாகியிருக்கின்றது. அங்கு மழை பெய்யாவிட்டாலும்கூட, வெள்ளத்தினால் பாதிப்புக்கள் ஏற்படுகின்றன. ஏனென்றால், அநுராதபுரத்திலுள்ள குளங்களின் வான்கதவுகள் திறந்துவிடப்படுகின்றபொழுது, அதிலிருந்து வெளியாகும் நீர் மல்வத்து ஓயா ஊடாக மன்னார் மாவட்டத்துக்குள் வருவதனால் அங்கு வெள்ள நிலைமை ஏற்பட்டு, பாரிய பாதிப்புக்கள் ஏற்படுகின்றன. அங்கு யுத்த காலத்தில் ஆற்றுப்படுக்கைகளிலும் நீர் தேங்கக்கூடிய பிரதேசங்களிலும் திட்டமிடப்படாத குடியேற்றங்கள் மேற்கொள்ளப்பட்டதனால், அங்குள்ள கிராமங்களில் பாரிய பாதிப்புக்கள் ஏற்படுகின்றன. உதாரணமாக நானாட்டான் பிரதேசத்திலுள்ள மடுக்கரை, மடுப் பிரதேசத்திலுள்ள தம்பனைக்குளம், பன்னவெட்டுவான் போன்ற கிராமங்களில் வெள்ளத்தினால் பாரிய பாதிப்புக்கள் ஏற்படுகின்றன. நாங்கள் இதுபற்றி நீர்ப்பாசனத் திணைக்களப் பொறியியலாளரிடம் கூறியிருக்கின்றோம். அவர் அதற்கான வரைவுகளைச் செய்திருக்கின்றார். எனவே, எதிர்காலத்தில் இவ்வாறு வெள்ளப் பாதிப்புகள் அங்கு ஏற்படாமல் தடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

මීළඟට ගරු රවුෆ් හකීම් ඇමතිතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[5.10 p.m.]

**ගරු රවුෆ් හකීම් මහතා (අධිකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹக்கீம் - நீதி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of Justice)

*Bismillahir Rahmanir Raheem.*

Hon. Presiding Member, using this opportunity I rise to say a few words to place on record the shock and grief of myself personally and that of the Government at the unfortunate report that Rizana Nafeek has been executed in the Kingdom of Saudi Arabia. Having said that, it is important to bear in mind that His Excellency the President and the Government took all possible steps to see that Rizana Nafeek is given a pardon by the King of Saudi Arabia. But, in the meantime, we must realize the constraints that the King himself faced in acceding to that request. We must be thankful to the Saudi authorities for having tried until the last moment. I must place on record, that it was just a few days ago, when His Excellency the Ambassador for the Kingdom of Saudi Arabia in Sri Lanka, paid a courtesy call on me at the Ministry of Justice, gave me an assurance that all efforts would be taken to see that the request of the President would be honoured and, as far as practicable, they will try their best not to execute Rizana Nafeek.

[ගරු රවුෆ් හකීම් මහතා]

But, unfortunately, today we have received this news. Therefore, while all of us genuinely are in grief and in shock at the unfortunate manner in which this has happened, we must realize that as a sovereign country, the Kingdom of Saudi Arabia has its own legal order and we are constrained to respect their sovereignty and also realize that the authorities, particularly His Highness the King, the Governor of Riyadh as well as Prince Salman and various high dignitaries of the Kingdom of Saudi Arabia, tried their very best to persuade the family of the unfortunate infant who had met with the death, supposedly or allegedly, at the hands of Rizana Nafeek.

We also made sure after His Excellency the President met with various high dignitaries of the Saudi government, we sent our Attorney-General to plead her case before the Saudi authorities and his Excellency the Ambassador, when he met me a few days ago, assured me that all this will have some salutary effect in preventing this death sentence from being carried out. However, once again it must be placed on record, that His Excellency President Mahinda Rajapaksa had made all possible steps and every time a delegation went from this country to the Kingdom of Saudi Arabia, he made sure and he advised all of us to take this matter up with the Saudi authorities. Therefore, it is not for want of trying by us that this has happened.

But yet, once again, we must bear in mind that as a sovereign country, we have to respect another country's internal procedures and, as I told this House, it is a fact that the internal judicial order in that country is such that even the King himself cannot give a pardon unless the family is willing to give that pardon to the accused concerned. In this instance, I was told finally that while one of the parents - the father - had agreed, the mother was still refusing to give the necessary pardon and that has finally resulted in this unfortunate execution.

Finally, what is left for all of us is to pray for her soul. I am sure the entire country will pray for her soul and for her to be granted *Jennath-ul-Firdous* in the hereafter.
I conclude my speech with those comments.

Thank you.

[අ.භා. 5.17]

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අධිකරණ අමාත්‍යතුමා ප්‍රකාශ කළ විධියටම සියලුම ශ්‍රී ලංකාවාසීන් බලාපොරොත්තු නොවුණ විධියට තමයි අද රිසානා නෆීක් සහෝදරියගේ මරණීය දණ්ඩනය ක්‍රියාත්මක වීම සිදු වුණේ. අද දවල් වරුවේ ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ පිළිබඳව අතුරු ප්‍රශ්න නඟපු වෙලාවේ පසු ගිය සතියේ ගරු සවුදි අරාබි තානාපතිතුමා ගරු අධිකරණ අමාත්‍යතුමා හමුවේ කළ ප්‍රකාශයත්, සමහර websites වල ගිය ඊට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශ දෙක තුනකුත් මතක් කරලා, මම කිව්වේ අපි සියලු දෙනාම ප්‍රාර්ථනා කරන්නේ ඇයට සමාව ලැබෙන්න ඕනෑ කියන කාරණය බවයි. ඊට ටික වෙලාවකට පසු අපට මේ අවාසනාවන්ත ප්‍රවෘත්තිය දැන ගන්න ලැබුණා.

අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ, රිසානා නෆීක් සහෝදරියට සමාව ලබා ගැනීම සඳහා රජයක් හැටියට අතිගරු ජනාධිපතිතුමාත් හිටපු විදේශ කටයුතු අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම මැතිතුමාත්, හිටපු නියෝජ්‍ය විදේශ කටයුතු අමාත්‍ය හුසේන් බහිලා මැතිතුමා, ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා ඇතුළු විදේශ කටයුතු අමාත්‍යාංශය උත්සාහයන් රාශියක් ගත්ත බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථා ගණනාවකදීම විවිධ කණ්ඩායම් ඒ රටට ගිහිල්ලා මේ සිද්ධිය පිළිබඳව කරුණු කාරණා කියන්න යෙදුණා. මම මේ අමාත්‍යාංශය භාර ගත්තාට පස්සේ ගරු අලෙවි මවුලානා ආණ්ඩුකාරතුමාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක්, -ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා, රිසානා නෆීක් සහෝදරිය ජීවත් වුණු ප්‍රදේශයේ ගරු එම්.එස්. තවුෆික් මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමක්- ඒ රටට ගිහිල්ලා රිසානා නෆීක් සහෝදරිය දඬුවම් ලබා සිටින, ඇය අතින් මිය ගියා යයි කියන දරුවාගේ පවුලේ දෙමව්පියන් හමුවීමට උත්සාහ දැරූ අවස්ථාවේ, එසේ හමුවීම ඔවුන් ප්‍රතික්ෂේප කරන කොට, රිසානා නෆීක්ගේ දෙමව්පියන් එක්ක ඒ ගමටම ගිහිල්ලා, ඒ පවුලේ අනෙක් අයව හමු වෙලා ඇයට සමාව ලබා ගන්න ඒ දෙමවුපියන්ගේ කැමැත්ත කෙසේ හෝ ලබා දෙන්න කියලා ඉල්ලීම් රාශියක් කළා. රිසානාගේ අම්මයි තාත්තයි දෙවතාවක් ගියා. 2008 අවුරුද්දේ ගියා. 2011 අවුරුද්දේ මම ඇමතිතුමා වුණාට පස්සේත් ගියා. ඒ විතරක් නොවෙයි, රිසානා නෆීක් සහෝදරියගේ ගමේ මුස්ලිම් දේවස්ථානයේ පූජකතුමා ඒ වෙලාවේ ගිහිල්ලා ඒ රටේ මුස්ලිම් පූජකතුමන්ලාගෙනුත් ඉල්ලීම් කළා, ෂරී-ආ නීතිය යටතේ සමාව දීමට අවශ්‍යතම අංගයක් වුණු ඒ දෙමවුපියන්ගේ කැමැත්ත කෙසේ හෝ ලබා ගැනීම සඳහා. නමුත් ඒ කැමැත්ත ලබා දීමට ඒ දෙමවුපියන් කැමැති වුණේ නැහැ.

අතිගරු ජනාධිපතිතුමා දෙවන වතාවට ජනවාරි මාසයේ 06 වනදා නැවත සෞදි අරාබියේ රජතුමාගෙන් ඉල්ලීමක් කළා, රිසානා නෆීක් සහෝදරියට සමාව ලබා දීමට කටයුතු කරන්න කියා. මේ වෙලාවේ මතක් කරනවා, විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ඇතුළු සමහර මන්ත්‍රීතුමන්ලා ඒ වාගේම සෞදි අරාබියාවේ සියලුම තානාපතිතුමන්ලා -සෞදි අරාබියාවේ ඇමෙරිකන් තානාපතිතුමා, යුරෝපා සංගමයේ රටවල තානාපතිවරු, අපේ ආසියානු කලාපයේ රටවල තානාපතිවරු- වෙන වෙනම විතරක් නොවෙයි, ඒකාබද්ධව ඒ රටේ බලධාරින්ගෙන් ඉල්ලීමක් කළා, රිසානා නෆීක් සහෝදරියට සමාව දෙන්න කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන හැටියට ඉතාම සුළු පිරිසක් මේ සිද්ධිය අරගෙන බොර දියේ මාළු බෑමට උත්සාහ කළත්, සමස්තයක් හැටියට අනෙකුත් සියලු දෙනා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ කාරණයේදී උදවු කළා. රටවල් හැටියට ගත්තත් පෙරදිග, අපරදිග රටවල් භේදයකින් තොරව, ඒ නීතියටත් අගරු කිරීමක් නොකර රිසානා නෆීක් සහෝදරියගේ ජීවිතය බේරා ගන්නට, ඇයට සමාව ලබා ගන්නට හැකි සෑම උත්සාහයක්ම ගත්තා. ඒ උත්සාහයන් සියල්ල බිඳ වැටී ඇති අවස්ථාවක වුණත් ඒ සහෝදරියගේ ජීවිතය බේරා ගන්නට උදවු කළ සියලු දෙනාම මේ වෙලාවේ අපි මතක් කරනවා. ෂරී-ආ නීතියට අගෞරවයක් කරන්නේ නැතුව ඒ ජීවිතය බේරා ගන්නට බොහෝ දෙනා උත්සාහ ගත්තා. මේ සිද්ධිය විදේශ කටයුතු අමාත්‍යාංශයට පවරන්නේ නැතුව මගේ අමාත්‍යාංශය ඒ

අමාත්‍යාංශයත් සමඟ එකතු වෙලා මේ සහෝදරියගේ ජීවිතය බේරා ගන්න උත්සාහ කළා.

මේ ක්ෂේත්‍රය භාර ඇමතිවරයා හැටියට මා කියනවා, රිසානා නෆීක් සහෝදරිය පිට රට යවපු ඒජන්ත මහත්වරු සම්බන්ධයෙන් අපි උසාවියේ නඩුවක් පවරා දඬුවම් ලබා දී ඇති බව. එම නඩුවේ පළමුවන විත්තිකරුට සහ දෙවන විත්තිකරුට බරපතළ වැඩ සහිතව අවුරුදු දෙකක සිර දඬුවමක් නියම වුණා. ඔවුන් දැන් ඒ දඬුවම විඳිමින් පවතිනවා. තුන්වන විත්තිකරු වරද භාර ගත් තත්ත්වය තුළ ඔහුට අත්හිටවූ සිර දඬුවමක් ලබා දී තිබෙනවා. හැබැයි, මේ සියලු කාරණාවලින්වත් අපි මේ වෙලාවේ සෑහීමට පත් වන්නේ නැහැ. අපේ එකම බලාපොරොත්තුව වුණේ රිසානා සහෝදරියට සමාව ලබා ගැනීමයි. රිසානා සහෝදරියට අත් වූ මේ කනගාටුදායක සිද්ධිය සැල වූ වහාම අතිගරු ජනාධිපතිතුමා මට දැනුම් දුන්නා, අතිගරු ජනාධිපතිතුමාගේ ශෝකය, මේ රජයේ ශෝකය රිසානා නෆීක් සහෝදරියගේ දෙමව්පියන්ට ප්‍රකාශ කරන්නය කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම මරණයට පත් වුණු ළදැරියගේ දෙමවුපියන්ගේ දෙපා නමැද මේ පිළිබඳව නැවත වරක් ඉල්ලීමක් කරන්නට දූත පිරිසක් පිටත් කර යවන්නට අපි සූදානම් කර තිබුණා. උදේ වරුවේ ටෙලිෆෝන් කළාම රිසානාගේ පියා රෝහල්ගතව සිටින බව දැන ගත් නිසා අපි ඒ කාරණය පසුවට කල් තැබුවා. ඒ තත්ත්වයත් එක්ක තමයි අද අපට මේ සිද්ධිය වාර්තා වුණේ. ඒ නිසා රිසානා නෆීක් සහෝදරියගේ පවුලේ උදවියත් සමඟ අප සියලු දෙනාම එකතු වෙලා එම සහෝදරියගේ ආත්මයට අල්ලා දෙවියන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරන අතර, එම පවුලේ උදවියත් සමඟ අපි ඒ ශෝකය බෙදා හදා ගන්නවා.

ඒ පවුලේ ආර්ථික දියුණුව ප්‍රාර්ථනා කරගෙන තමයි රිසානා නෆීක් සහෝදරිය පිට රට ගියේ. ඒ නිසා තම පවුලේ ආර්ථික දියුණුව පිළිබඳව රිසානා නෆීක් සහෝදරියගේ එම පරමාර්ථ මුදුන් පමුණුවා දීමට ඒ පවුලත් සමඟ විදේශ සේවා නියුක්ති කාර්යාංශයත්, අපේ අමාත්‍යාංශයත් බැඳී සිටිනවා. ඒ පිළිබඳව එම පවුලත් එක්ක සාකච්ඡා කිරීම සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිතුමා හෙට දිනයේදී කින්නියා ප්‍රදේශයට යනවා. ඒ එක්කම රිසානා නෆීක් සහෝදරිය විශ්වාස කළ ඉස්ලාම් ධර්මයේ හැටියට ඇය වෙනුවෙන් විශේෂ යාඥාවක් ලබන සෙනසුරාදා කොළඹ ප්‍රදේශයේ සිදු කරන්නට අපි සංවිධානය කර ගෙන යනවා. තමුන්නාන්සේලා සියලු දෙනාම පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව එයට සහභාගි වන්නය කියන ඉල්ලීම කරමින්, මේ සහෝදරියගේ අවාසනාවන්ත ඉරණම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා ඇතුළු රජයේ ශෝකය නැවත වරක් ප්‍රකාශයට පත් කරනවා.

අනාගතයේදී එම රටවල රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සේවකයන් සහ සේවිකාවන් සම්බන්ධයෙන් රැකියා කොන්දේසි පැනවීමේ දී මේ රටේ තිබෙන නීතිය සහ එම රටේ ක්‍රියාත්මක වන නීතිය පිළිබඳව ඒ සෞදි අරාබියේ බලධාරීන් එක්ක සාකච්ඡා කරන්නට අපි බලාපොරොත්තු වනවා. මෙවැනි දෙයක් නැවත ඇති වීම වැළැක්වීම සඳහා මුලින්ම රැකියාවලට යාමේදීම යම් යම් කොන්දේසිවලට එන්න පුළුවන්ද කියන තත්ත්වය පිළිබඳවත් ඉදිරියේදී සලකා බැලීමට අපි මේ වෙලාවේ දී කල්පනා කරන බවත් දැනුම් දෙන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදය අතරතුර මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. රිසානා නෆීක් සහෝදරියට අල්ලා දෙවියන්ගේ පිහිට ප්‍රාර්ථනා කරනවා.

[අ.භා. 5.26]

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින පැවැත්වෙන සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව කථා කරමින් සිටින මේ අවස්ථාවේ දී කනගාටුවෙන් මතක් කරනවා, අප කවුරුවත් බලාපොරොත්තු නොවුණු අවස්ථාවක රිසානා නෆීක් මෙනවියගේ අභාවය සිදු වෙලා තිබෙන බව. ඒ සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ ශෝකය මා මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා. රජය වාගේම එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රී රන්ජන් රාමනායක මැතිතුමා අවස්ථා ගණනාවකදී මේ දැරිවියගේ ජීවිතය බේරා ගැනීමට අවශ්‍ය උදවු උපකාර ලබා ගැනීමට සහයෝගය දුන්නා. එතුමා වෙනුවෙනුත්, අපේ පක්ෂය වෙනුවෙනුත් මා මේ අවස්ථාවේ දී ශෝකය ප්‍රකාශ කරනවා. රජය මැදිහත් වෙලා මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වුණා. නමුත් අවාසනාවන්ත විධියට වුණු මේ සිද්ධිය සම්බන්ධයෙන් අපේ කනගාටුව පළ කරන අතරම, අපේ ආගම අනුව එතුමියට නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ගැන කථා කරනකොට අපි දන්නවා මේ අමාත්‍යාංශය දක්ෂ, තරුණ අමාත්‍යවරයෙකුට භාර දී තිබෙන බව. එතුමා පසු ගිය දවස්වල ලොකු උනන්දුවකින් මේ කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරය මා දැක්කා.

හැබැයි එක ප්‍රශ්නයක් තිබෙනවා. වෙනදා අපි දැකපු විධියට ගෙයක් කැඩුණාම ඒ වාගේම වෙනත් ආපදාවක් ඇති වුණාම ආපදා කළමනාකරණ ඇමතිවරයාට හැකියාවක් තිබුණා ඒ සඳහා තමන්ට අවශ්‍ය පරිදි ප්‍රතිපාදන වෙන් කරන්න; ඒ සඳහා පියවර ගන්න. මේ තරම් දක්ෂ ඇමතිවරයෙක් මේ අමාත්‍යාංශය භාරව කටයුතු කරද්දී අද මොකක්ද වෙලා තිබෙන්නේ? මා දකින විධියට අද එතුමාට භාරව තිබෙන්නේ ඒ අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛන ටිකක් එකතු කර දීම විතරයි. මොකද, නිවාස කැඩුණාම එහෙම නැත්නම් වෙනත් ආපදාවකට ලක් වුණාම මේ තරම් දක්ෂ, වගකීමක් භාර අරගෙන කටයුතු කරන්න පුළුවන් ඇමතිවරයකු ගැන සැක හිතලාද මා දන්නේ නැහැ ඒවා වෙන අමාත්‍යාංශවලට භාර දීලා තිබෙනවා. එතුමා දක්ෂතාව, හැකියාව තිබෙන, පාර්ලිමේන්තුවේ අවුරුදු 20කට ආසන්න කාලයක් වැඩ කටයුතු කළ ඇමතිවරයෙක්. එතුමාගේ දක්ෂතාවෙන් රජය ප්‍රයෝජනයක් ගන්නේ නැද්ද කියන එක ගැන මට සැකයක් තිබෙනවා.

විශේෂයෙන්ම මගේ මිත්‍ර ගරු චන්ද්‍රසේන නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, ආධාර බෙදන අවස්ථාවේදී මාධ්‍ය සංදර්ශන පවත්වනවා කියා මං කිව්වා කියලා. එතුමා හිටියා නම් මා එතුමාට ඒ ගැන කියනවා. එතුමාගේ කථාවට මා බාධා කළේ නැහැ. ආණ්ඩුවේ බඩු බෙදලයි photosවල හිටියේ. අපත් ඒ කඳවුරුවලට ගිහිල්ලා උදව් කෙරුවා photosවල නැති වුණාට; මාධ්‍යවල ප්‍රචාරය කළේ නැති වුණාට. ඒ ජනතාව විපතට පත් වුණාම පක්ෂයක්, පාටක් ගැන හිතන්නේ නැතිව අපි සියලු දෙනාම එකතු වුණා. ආණ්ඩු පක්ෂයේ අය, විපක්ෂයේ අය, ව්‍යාපාරික ප්‍රජාව, අසල්වාසී ගම්වල ජනතාව සියලු දෙනා උදව් කළා. රජයේ ආධාර උපකාර ඇතිව නොවෙයි, ඒ අයගේ පෞද්ගලික වියදමිනුත් මේ සඳහා කටයුතු කළා කියන එක මා මේ අවස්ථාවේ කියන්න ඕනෑ. ඒ වාගේම එතුමා කිව්වා, ඒ ප්‍රදේශවල ප්‍රශ්නයක් නැහැ කියලා. ප්‍රශ්නයක් නැති වෙන්න විධියක් නැහැ ගරු නියෝජ්‍ය

ඇමතිතුමනි. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 3,677ක් අවතැන් වෙලා ඉන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් අවසන් කරන්න.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව පටන් ගත්තා විතරයි. ඒ වාගේම ගරු ඇමතිතුමනි, මුදල් අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබෙන මේ චක්‍රලේඛනය අනුව ඔබතුමාට මේ කාර්යය හරියාකාරව කරන්න පුළුවන් කියලා මා හිතන්නේ නැහැ. විශේෂයෙන්ම ඒ චක්‍රලේඛනය අනුව පස් දෙනකු ඉන්න පවුලකට රුපියල් 805ක වියළි සලාක දෙන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, ඒ චක්‍රලේඛනය අනුව එක පුද්ගලයකුට සතියකට වෙන් වෙන්නේ රුපියල් 115යි. එතකොට දවසකට රුපියල් 23යි. ඉතින් එහෙම බලපුවාම එක කෑම වේලක් සඳහා රුපියල් 7ක් වෙන් කෙරෙන විධියටයි සැලසුම් කරලා තිබෙන්නේ. මා දන්නවා ඔබතුමා මේක හැදුවා නම් මීට වඩා ප්‍රායෝගිකව හදන බව. හැබැයි කොළඹ ඉන්න, මුදල් අමාත්‍යාංශයේ නිලධාරින් ඒ සඳහා හරියාකාර කාර්යයක් කරලා නැහැ. රුපියල් 7කින් පාන් රාත්තලක්වත් ගන්න බැහැ. ඒකයි වියළි සලාක ක්‍රමයේ තිබෙන අඩු පාඩුව. මා තමුන්නාන්සේට කියනවා ආපදා කළමනාකරණ ඇමතිතුමා හැටියට කරුණාකර, ඒ චක්‍රලේඛනය ගැන මීට වඩා අවබෝධයක් ලබා ගන්නය කියලා.

ඒ විතරක් නොවෙයි. මේ චක්‍රලේඛනයේම තිබෙනවා ගරු ඇමතිතුමනි, නිවාස සඳහා ආධාර දෙන හැටි. මේකෙන් අවම සීමාවට ඇතුළත් වෙන්නේ, රුපියල් 3,000කට වඩා අඩු ආදායම් ලබන පවුල්. මා දන්නේ නැහැ, රුපියල් 3,000කට වඩා අඩු ආදායම් ලබන පවුල් හොයා ගන්න තිබෙනවාද කියලා. මොකද, එක මනුෂ්‍යයෙක් දවස් හතරක් කුලී වැඩට ගියොත් රුපියල් 3,000ක් හම්බ වනවා. ඉතින් එහෙම සීමාවක ඉඳලා මේ කටයුත්ත කරන්න ගියොත් ආපදාවට ලක් වුණු මිනිස්සුන්ට ආධාර දෙන කාර්යය සාර්ථකව කරන්න හම්බ වෙන්නේ නැහැ. දුප්පත්, පොහොසත් හැම කෙනෙක්ම ඒ ආපදාවට ලක් වෙනවා. ඒ අවස්ථාවේදී ඒ අය හුඟක් අසරණ වෙනවා. ඒ වාගේම මේ සහනාධාර බෙදීමේදී සමහර නිලධාරින් මේකට උදව් කරනවා; සමහර අය උදව් කරන්නේ නැහැ කියලා ඔබතුමා කැබිනට් මණ්ඩලයේත් ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කර තිබුණා. මේ සියලු දෙනාට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් මේ අයට ලොකු අසාධාරණයක් වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මට තව තප්පරයක් දෙන්න. මා බලාපොරොත්තු වුණා විනාඩි 15ක් කථා කරන්න. නමුත් අද ඒ අවස්ථාව ලැබුණේ නැහැ. ඒ කොහොම වෙතත් තමුන්නාන්සේ මේ ගැන හොයා බලා මේ ප්‍රදේශවල අවතැන් වූ ජනතාව වෙනුවෙන් උදව් කරන්නය කියා ඉල්ලමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට අවනත වෙමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු ඒ. එච්. එම්. ෆවුසි අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි දෙකක් තිබෙනවා.

[5.33 p.m.]

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා (නාගරික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ. எச். எம். பௌஸி - நகர அலுவல்கள் அமைச்சர்)
(The Hon. A.H.M. Fowzie - Minister of Urban Affairs)
Mr. Presiding Member, I thank you for giving me an opportunity to speak a few words on the demise of our sister, Rizana Nafeek. When I heard of her death this morning, it was a shock to me.

I knew that unless the parents of the dead child give pardon, nobody else could give pardon to release that young girl who was asked to look after the child. In fact, the President, the Government, the Ministers, the Hon. Members of Parliament and various organizations were trying their best to get this girl released. But, I knew that it would not happen unless the parents of the dead child were willing to pardon her. The mother of the dead child was very adamant with their decision and therefore, her execution was not avoidable.

Sir, I request the Saudi Government to take action against the mother of the infant for entrusting this small girl with the task of looking after her child. She must be charged with negligence. She should not have given to this young girl the task of looking after that small baby. Therefore, I request the Government of Saudi Arabia to take action against her. The King tried his best to negotiate and help, but unfortunately, as the parents of the dead child did not agree, this did not come through.

Thank you, Sir.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.34]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට අදාළව ඉදිරිපත් කර ඇති මෙම කල් තැබීමේ යෝජනාව ඉතාම ද්වේෂ සහගතව සාකච්ඡාවට බඳුන් කර ඇති යෝජනාවක් ලෙසයි මා දකින්නේ.

විශේෂයෙන්ම මම නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තොත්, එහි පවුල් 4,000කට වැඩි ප්‍රමාණයක් මේ ගංවතුර තත්ත්වය නිසා ආපදාවට ලක් වුණා. අප ප්‍රදේශයේ ඇති වුණු ඒ තත්ත්වය අනුව, දෙසැම්බර් මාසයේ 22වැනි දා සිට 31වැනි දා

දක්වා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලැබුණු උපදෙස් අනුව අප ආපදාවට ලක් වූවන්ට සහන සැලසීමේ කටයුතු කළා. මෙහිදී රජය විසින් ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය ඒ ආපදාවට ලක් වූ ජනතාවට ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදයේදී විවිධ ප්‍රදේශවල නම් කියමින් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු රජය අප්‍රසාදයට පත් කරන ආකාරයේ චෝදනා එල්ල කළ ආකාරය අප දැක්කා. හැබැයි, මේ ආපදා තත්ත්වයේදී කිසිම කෙනෙක් බඩගින්නේ හිටියේ නැති බව අපේ ප්‍රදේශවල ඒ අනාථ කඳවුරුවල සිටි ජනතාව සමඟ කථා කළාම තමුන්නාන්සේලාට වැටහේවි. රජය විසින් ලබා දිය හැකි උපකාරයත්, ඊට අමතරව දේශපාලනඥයන්, රාජ්‍ය නිලධාරින්, ස්වේච්ඡා සංවිධාන, ව්‍යාපාරිකයන් ඇතුළු සියලු දෙනාම එකතු වෙලා ඔවුන්ට අවශ්‍ය අවම පහසුකම් ටික සැපයුවා. මේක හදිසි තත්ත්වයක් බව අප දන්නවා. මේක සැලසුම් කරලා ඇති කළ තත්ත්වයක් නොවෙයි. හැබැයි ඒ ආපදා තත්ත්වයට අප හෘදය සාක්ෂියට එකඟව, ඉතාම සාර්ථකව මුහුණ දුන්නා කියන එකයි මගේ නම් මතය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගංවතුර නිසා අපේ ප්‍රදේශවල වී ගොවිතැන ඇතුළු අනිකුත් අතිරේක බෝග වගා කළ අක්කර 35,000ක් විතර හානියට පත් වුණා. හැබැයි මේ වෙන කොට ඔවුන් නැවත නඟා සිටුවීම සඳහා රජයට ලබා දෙන්න පුළුවන් උපරිම සහයෝගය ලබා දෙමින් පවතිනවා. ගරු මහින්ද අමරවීර අමාත්‍යතුමාට අප විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. එතුමා ඇවිත් අපේ ප්‍රදේශවල අවශ්‍යතා සොයා බලලා ඒ ජනතාවට ලබා දෙන්න පුළුවන් සහයෝග ලබා දුන්නා. කවුරු මොනවා කිව්වත්, චක්‍රලේඛනවලටම කොටු වන්නේ නැතිව, ඒ ජනතාව වෙනුවෙන් කළ හැකි, කළ යුතු යුතුකම ඒ වෙලාවේ අප ඉටු කළා. මෙවැනි ආපදා තත්ත්වයක් නැවත ඇති නොවේවායි කියලා මම ප්‍රාර්ථනා කරනවා. මේ තත්ත්වය නිසා වගාවන්ට සිදු වූ හානියත්, ඒ නිවාසවලට සිදු වූ අලාභයත් කොපමණද කියලා රජය විසින් මේ වන විට තක්සේරු කරගෙන යනවා. ඒ අලාභය ගණන් බලලා ලබා දිය හැකි වන්දි ලබා දෙන්න රජය කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී විශේෂයෙන්ම රජයේ නිලධාරින්, දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ත්‍රිවිධ හමුදාව, පොලීසිය ඇතුළු සියලුම නිලධාරින් දේශපාලන අධිකාරියට ලබා දිය හැකි උපරිම සහයෝගය ලබා දුන්නා. මේ වෙලාවේදී ඒ නිලධාරින්ටත් මගේ ගෞරවය පුද කරන අතරම, ඒ අවස්ථාවේ අපේ ජනතාවට සහන සැලසීම සඳහා දැක් වූ සහයෝගයට නැවතත් ගරු මහින්ද අමරවීර ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමා ඇතුළු රජයට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මීළඟට ගරු නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 6ක් තිබෙනවා.

[අ.භා. 5.39]

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

Sir, first, I would like to speak about the girl who has been executed in Saudi Arabia, Rizana Nafeek.

In 2005, she left the country due to the economic problems her family had been facing. No parent likes to send his or her small child abroad to earn. But, Rizana's parents had no choice. During that time, due to the curse of the war with the LTTE in the East, her parents had no choice, but to send their child abroad to make money, to make ends meet.

At that time, the President of Sri Lanka, the Hon. Minister of Foreign Affairs, the Hon. Minister of Foreign Employment Promotion and Welfare, the Deputy Ministers as well as the Secretaries of both Ministries did their best, sending several delegations to appeal against the death sentence passed on her. It was a special case because they found that the infant had got choked to death. It is true that the young girl would not have known how to feed an infant. But, this girl had been sent to Saudi Arabia using a different method, not through the regular way of sending maids. Some people who wanted to make money had forged documents, changing the girl's date of birth and sent her to Saudi Arabia. The Government had taken action against those perpetrators and stopped them. It has been exercising the same rules with regard to the other such institutions as well which have been sending young children or elderly parents abroad forging documents. This child's death sentence has enlightened our approach to the dealings in many areas and the Government has taken correct measures on those dealings carried out illegally. So, I must thank the Government for that.

Anyway, many of our Ministers went to Saudi Arabia and lots of money had been spent to save her. Various institutions wanted to make collections for blood money and a lot of effort had been made to save this girl's life. But, unfortunately, she had an untimely death. I do not think she had any intention of killing that infant although it happened.

So, according to my religion, I pray for her soul to rest in peace. I know that the Church, the Holy See and the Holy Father also made an appeal.

All religious leaders, international religious organizations and NGOs made appeals. They made investigations into this matter. Even our Cardinals, Bishops, the Church, jointly with the Muslim clergy, with the Muslim hierarchy made pleas. Buddhist monks, high priests, everybody made pleas, but all in vain.

Coming to the subject, I would like to take this opportunity to thank the Hon. Mahinda Amaraweera. After 1958, the Chilaw Town also went under water.

ගරු ඇමතිතුමනි, හලාවත ජනතාව නිදා ගෙන සිටි අවස්ථාවේදී, කවුරුත් හිතපු නැති විධියට ඉතාම ඉක්මනින් දැදුරු ඔයේ වතුර

[ගරු නියෝමාල් පෙරේරා මහතා]

වැඩි වී මුත්නේෂ්වරම, නල්ලන්දළුව වැව පිටාර ගැලීම හේතුවෙන් නගරය, රෝහල ඇතුළු සියයට 90ක් පමණ ස්ථාන ජලයෙන් යට වුණා. හලාවත නගරයට ඒමට පිවිසුම් මාර්ගයක් තිබුණේ නැහැ. හලාවත - කුරුණෑගල පාර ජලයෙන් යට වුණා; කොළඹ - හලාවත පාර යට වුණා. හලාවත - පුත්තලම මාර්ගය යට වෙලා දවස් දෙකක් ඒ ප්‍රදේශයට යන්න එන්න කිසිම ක්‍රමයක් තිබුණේ නැහැ. ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට සහ හලාවත ප්‍රාදේශීය ලේකම්ට ඒ ස්ථානයට එන්න හැකියාවක් තිබුණේ නැහැ, ඒ දෙදෙනාම ඒ ප්‍රදේශයේ පුද්ගලයන් නොවන නිසා. මාදම්පේ ප්‍රාදේශීය ලේකම්තුමා ඒ ගමේ ඉන්න නිසා මැදිහත් වෙලා ඒ කටයුතු කරන්න සිදු වුණා.

නමුත් අපි පිළිගන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මෙවැනි තත්ත්වයක් ඇති වුණාම ඒ ග්‍රාම නිලධාරි මහත්වරුන්ට, මහත්මියන්ට පවා තමන්ගේ රාජකාරි කටයුතු කර ගන්න බැරි වෙනවා. ඒ අයගේත් දේපළ, නිවාස අලාභ හානි වීම නිසා පළමුවැනි දවසේ, දෙවැනි දවසේ යන්න එන්න, කර කියා ගන්න ක්‍රමයක් නැතුව ඒ අයත් අතරමං වෙලා සිටියා. ගරු ඇමතිතුමනි, අතිගරු ජනාධිපතිතුමාගේ මැදිහත් වීම, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත් වීම, ඔබතුමා ඒ ස්ථානවලට ඉක්මනින් පැමිණීම අගය කිරීමට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. සතියක් නොව, සති දෙකක් වියළි සලාක ලබා දීමටත්, පිසූ ආහාර ලබා දීමටත් අවශ්‍ය සෑම කටයුත්තක්ම ඔබතුමා කළා. මේ වෙලාවේ බොර දියේ මාළු බානවා වාගේ සමහර රජයේ නිලධාරීන්, වෙනත් පක්ෂවල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලැබෙන, සමුපකාරයෙන් ලැබෙන, සතොසෙන් ලැබෙන සලාක ලබාගෙන -හාල් ටික, පිටි ටික, සීනි ටික, පරිප්පු ටික ලබා ගෙන- ඒ අයගේ පෞද්ගලික දේපළ බෙදනවා වාගේ ඒවා බෙදන්න කටයුතු කළා. පසුව අපට ඒ ගැන දැන ගන්න ලැබුණාම ඒ අය විවේචනයට ලක් වුණා. මේ අය අතර රජයේ නිලධාරීන් සහ ග්‍රාම නිලධාරීන් සිටිනවාය කියන එක ගරු ඇමතිතුමාගේ දැනුවත් වීම සඳහා මා මේ අවස්ථාවේ සඳහන් කරනවා.

දැදුරු ඔයට කිට්ටුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හලාවත ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි. ප්‍රාදේශීය ලේකම්තුමාගේ තොරතුරු අනුව මට දැන ගන්න ලැබී තිබෙනවා ඒ ප්‍රදේශයට සිදු වුණු හානිය පිළිබඳව. දැන ගැනීම සඳහායි මා ඒ ගැන සඳහන් කරන්නේ. පවුල් 6,190ක්, පුද්ගලයන් 22,072ක් අවතැන් වෙලා එක මරණයක් සිදු වුණා. ඒ මරණය ගැනත් මා කනගාටු වෙනවා. ඒ මරණය සිදු වුණේ උදව් උපකාර කරන්න ගිහිල්ලායි. එහෙම නැතිව වතුරට යට වීම නිසා නොවෙයි. ජීවිතක්ෂයට පත් වෙන්න ගිය කිහිප දෙනෙකුට උදව් උපකාර කරන්න ගිහිල්ලා තමයි ඔහු මරණයට පත් වුණේ. ඒ වාගේම හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මේ වන විට පවුල් 9,503ක්, පුද්ගලයන් 33,856ක් ඒ ප්‍රදේශය වතුරෙන් යට වීම නිසා අවතැන් වෙලා තිබෙනවා. ඒ වාගේම මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 761කුත්, පුද්ගලයන් 2,850කුත් අවතැන් වෙලා තිබෙනවා. ඒ ප්‍රදේශයේ ජලයෙන් යට වූ මුළු පවුල් ගණන 16,454ක් වන අතර, පුද්ගලයන් ගණන 58,778ක් වනවා. හලාවත ආසනයෙන් අර්ධයකට වැඩි -ඒ කියන්නේ සියයට 60කට වැඩි- ප්‍රමාණයක් ජලයෙන් යට වුණාය කියන එක මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මැදිහත් වෙලා හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් බෝට්ටු දෙකක් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. ඒ වාගේම ඒ ජනතාවගේ නිවාස යථා තත්ත්වයට සාදා ගැනීමට අවම වශයෙන් දෙන රුපියල් ලක්ෂය ඉතා ඉක්මනින් ලබා දෙන්න කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. හලාවත ප්‍රදේශය නැවත යට වීමේ අවදානමක් තිබෙන බැවින් ඒ සඳහාත් මුදල් වෙන් කිරීමට පොරොන්දු වීම ගැන ඔබතුමාට ස්තුති කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ අවශ්‍ය තොරතුරු ඔබතුමාට ලබා දෙන්න කටයුතු කරන බව ප්‍රකාශ කරමින් ඔබ සියලු දෙනාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Sivasakthi Ananthan . You have six minutes.

[பி.ப. 5.46]

**ගරු සිවශක්ති ආනන්දන් මහතා**
(மாண்புமிகு சிவசக்தி ஆனந்தன்)
(The Hon. Sivasakthi Ananthan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தில் உரையாற்றுவதற்கு முன்னராக சவூதி அரேபியாவில் மரண தண்டனை நிறைவேற்றப்பட்ட றிஸானா நபீக் என்பவரின் குடும்பத்தினருக்கு தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பிலும் தமிழ் மக்களின் சார்பிலும் நான் இரங்கலையும் ஆழ்ந்த கவலையையும் தெரிவித்துக்கொள்கின்றேன்.

அண்மையிலே ஏற்பட்ட வெள்ள அனர்த்தத்தினால் வன்னி மாவட்டத்தைச் சேர்ந்த மக்கள் மிகவும் பாதிக்கப்பட்டார்கள். இந்த வன்னி மாவட்டம் முழுவதும் போரினால் இடம்பெயர்ந்த பல்லாயிரக்கணக்கான குடும்பங்கள் இன்னும் தற்காலிக வீடுகள்கூட இல்லாமல் இருக்கின்ற நிலையில்தான் இந்த இயற்கை அனர்த்தம் அவர்களை மிகவும் பாதித்திருக்கின்றது. குறிப்பாக முல்லைத்தீவு மாவட்டத்தின் கரைதுறைப்பற்று, புதுக்குடியிருப்பு போன்ற பல கிராமங்களில் பல பேருக்குத் தற்காலிக வீடுகள்கூட இல்லாத நிலையில் அங்கு சிறுவர்கள், பெரியவர்கள் உட்படப் பலரும் மிகப் பாதிப்படைந்துள்ளார்கள். இந்த வெள்ள அனர்த்தத்தினால் பாதிக்கப்பட்டுப் பாடசாலைகள் மற்றும் பொது இடங்களில் இடம்பெயர்ந்திருக்கின்றவர்களுக்கு சமைத்த உணவை மூன்று நாள் வழங்கியதோடு மட்டும் தங்களுடைய கடமை முடிந்ததாக அரசாங்கம் அல்லது அமைச்சர்கள் நினைக்கின்றார்கள். ஆனால், உண்மையிலே இந்த அனர்த்தமானது போரினால் பாதிக்கப்பட்ட மக்களுக்குப் பெருமளவில் துன்பத்தைக் கொடுத்திருக்கின்றது. அதுமட்டுமல்ல, அவர்கள் பலவிதங்களில் கடன்களைப் பெற்றுச் செய்கை பண்ணிய பல்லாயிரக்கணக்கான ஏக்கர் நெற்காணிகள் இந்த வெள்ள அனர்த்தத்தினால் அழிவடைந்திருக்கின்றன. குறிப்பாக வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மூன்று மாவட்டங்களிலும் 50 ஆயிரத்துக்கும் மேற்பட்ட நெற்காணிகள் அழிவடைந்திருக்கின்றன. அதேபோல் உழுந்து, பயறு, கௌபி மற்றும் சிறு தானியங்கள் உட்பட13,265 ஏக்கர் மேட்டுநிலப் பயிர்ச்செய்கைகள் அழிவடைந்திருக்கின்றன. அதேநேரம் இந்த மூன்று மாவட்டங்களிலும் 23 ஆயிரம் விவசாயக் குடும்பங்கள் பாதிக்கப்பட்டிருக்கின்றன. 277 குளங்கள் முற்றாக அல்லது பகுதியாகப் பாதிக்கப்பட்டிருக்கின்றன. விவசாயக் காணிகளுக்கான 260 வீதிகள் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றன.

அதுமட்டுமல்ல, மன்னார் மாவட்டத்திலே தம்பனைக்குளம், மடுக்கரை ஆகிய இரண்டு கிராமங்களும் பாதிப்புக்குள்ளாகியுள்ளன. கௌரவ அமைச்சர் அவர்களே! நீங்கள் கடந்த வாரம் அங்கு வருகை தந்தபோது இந்த இடங்களைப் பார்வையிட்டிருப்பீர்கள். இந்தக் கிராமங்கள் ஒவ்வொரு வருடமும் நீரில் மூழ்கின்ற ஒரு நிலைவரம் இருக்கின்றது. ஆகவே, வேறு ஓர் இடத்தில் இவர்களுக்கான காணியையும் வீட்டுத் திட்டத்தையும் கொடுத்து அவர்களை அங்கு இடமாற்றம் செய்ய வேண்டும் என்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

இந்த அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட பொதுமக்களுக்கு அங்குள்ள ஒருசில உதவி அரசாங்க அதிபர்கள் உதவி செய்ய வேண்டியநேரத்தில் அவர்களுக்குப் பல்வேறு அசௌகரியங்களைக் கொடுத்திருக்கிறார்கள். அதாவது, பாதிக்கப்பட்ட மக்களுக்கு உதவி செய்வதற்கு மாறாக அவர்களுக்கு நெருக்கடியைக் கொடுத்திருக்கின்றார்கள். உதாரணமாக ஒரு விடயத்தைக் கூறுகின்றேன். அதாவது, மன்னார் மாவட்டத்தின் சன்னார் கிராம மக்கள் தாங்கள் இடம்பெயர்ந்தபோது தங்களுக்கு உணவு வழங்கவில்லை என்று ஊடகங்களுக்கு தகவல் தெரிவித்துவிட்டார்கள் என்பதற்காக மன்னாரிலுள்ள மாந்தை மேற்கு உதவி அரசாங்க அதிபரான மாணிக்கவாசகம் சிறிஸ்கந்தகுமார் என்பவர் அந்த மக்களுக்குச் சமைத்த உணவு வழங்கவில்லை. அதேநேரம், குறித்த கிராம சேவையாளர் அங்கு உலர் உணவு வழங்கப் போனவிடத்து, அவரைக்கூட தடுத்தது மட்டுமல்லாமல், "இந்த மக்கள், தங்களுக்கு உணவு வழங்கவில்லை என்று ஊடகங்களுக்குத் தகவல் தெரிவித்துவிட்டார்கள். எனவே, தகவல் கொடுத்தவர்களைக் கைதுசெய்யுங்கள்" என்று பொலிஸ் மற்றும் இராணுவ அதிகாரிகளுக்கு அறிவித்தல் கொடுத்திருக்கின்றார். *[இடையீடு]* மாணிக்கவாசகம் சிறிஸ்கந்தகுமார். அதேநேரம் போரினால் பாதிக்கப்பட்ட மாந்தை மேற்குப் பிரதேசத்தில் மணல் கொள்ளை, மரக்கொள்ளை மற்றும் காணி சுவீகரிப்புகள் எனப் பல்வேறு மோசடி நடவடிக்கைகளில் இவர் ஈடுபட்டு வருகின்றார். இவரின்கீழ் பணியாற்றுகின்ற கிராம சேவையாளர்கள் 36 பேர் அவருடன் பணியாற்ற முடியாதென்று இடம்மாற்றம் கேட்டுள்ளார்கள். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே! இப்படியான இயற்கை அனர்த்தங்கள் ஏற்படுகின்ற நேரத்தில் பாதிப்புக்குள்ளாகும் மக்கள் உரியமுறையில் கவனிக்கப்படுகின்றார்கள் என்பதை உத்தரவாதப் படுத்திக்கொள்ள நடவடிக்கை எடுங்கள் என்று உங்களிடம் கேட்டுக்கொள்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඊළඟට ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 05ක් තිබෙනවා.

මෙම අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු හුනෛයිස් ෆාරූක් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මහින්ද අමරවීර මහතා ( ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හුනෛයිස් ෆාරූක් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හුනෛයිස් ෆාරූක් මහතා මූලාසනාරූඪ විය.*
*அதன் பிறகு, மாண்புமிகு உதித் லொக்குபண்டார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon MR. UDITH LOKUBANDARA left the Chair, and THE HON. HUNAIS FAROOK took the Chair.*

[අ.භා. 5.52]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදා කළමනාකරණය ගැන කථා කරන මේ අවස්ථාවේදී අපට ඇති විශාලම ආපදාව හැටියට අප දකින ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඉපදුණු රිසානා දැරියගේ ශෝකජනක මරණය පිළිබඳව වචනයක් අනිවාර්යයෙන්ම කථා කළ යුතුයි. ඒ මන්ද, රජය, අතිගරු ජනාධිපතිතුමා ඒ වාගේම මුළු මහත් ලෝකයම විශාල පරිශ්‍රමයක් දැරුවා මේ දැරියගේ ජීවිතය බේරා ගන්න. නමුත් ඒ රටේ නීතිය අනුව එසේ කිරීමේ අවස්ථාව ගිලිහී ගියා.

මේ දැරිය මුතූර් ආසනයේ, කින්නියා ප්‍රදේශයේ දරුවන් තුන් දෙනෙක් සිටින දුප්පත් පවුලක වැඩිමහල් දියණියයි. පියා මොවුන්ව ජීවත් කරවන්නේ කැලේට ගිහිල්ලා දර කඩලා විකුණලායි. ඒ වාගේ පවුලක දැරියකට තමයි තමන්ගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් ජීවත් කරවන්නට අඩු වයසින් රට රැකියාවකට යන්නට සිදු වුණේ. හොර උප්පැන්න සහතිකයක් හදලා ඇයව රට යවපු නිසා, මේ සිද්ධිය අද ලෝකයක් හඬවන සිද්ධියක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපේ යුතුකමක් වනවා, මෙවැනි සිද්ධීන් යළි ඇති නොවීමට; පුංචි සිද්ධියක්වත් යළි ඇති නොවන විධියට අවශ්‍ය නීතිරීති ගෙනෙන්නට කටයුතු කිරීම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද අපි ආපදා පිළිබඳව කථා කරන කොට අපට කියන්න පුළුවන්, පසු ගිය කාල සීමාව තුළ, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කින්නියා, මුත්තූර් සහ සේරුවිල කියන මැතිවරණ කොට්ඨාස තුනේ ඇති වුණු ගංවතුරේදී අපේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල එකොළහක ඉන්න ප්‍රාදේශීය ලේකම්තුමන්ලා, ග්‍රාම නිලධාරිතුමන්ලා, ත්‍රිවිධ හමුදාව, පොලිසිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව අපේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ සුවිශේෂී මෙහෙයක් කළ බව. ඒ මන්ද? ඇත්තෙන්ම අපි දේශපාලන වශයෙන් උපදෙස් දුන්නත් නොදුන්නත් ආපදාවට ලක් වූ ඒ ජනතාවට අවශ්‍ය කරන සියලු දේ ලබා දුන්නා. වියළි සලාක, ආහාර පාන, නවාතැන්, කඳවුරුවලදී ඒ ගොල්ලෝ රැකබලා ගැනීම ආදී ඒ ක්‍රියාදාමයන් සියල්ලම ඉටු කළා. අපේ ප්‍රදේශයේ අලුතින් තමයි මේ තත්ත්වයන් ඇති වන්නට පටන් ගත්තේ. ඒ මොකද? ජනගහනය වැඩි වෙනවා. තිබෙන ඉඩම් ප්‍රමාණ අඩු වනවා. මිනිස්සු කානු ගොඩ දමන්නේ නැහැ; ඇළක් වේල්ලක් කැඩුණාම ඒක හදන්නේ නැහැ. ඒ නිසා තමයි මේ කාරණා සිදු වුණේ. තවත් කියන්න කාරණා කටයුතු බොහොමයක් තිබුණත් කාලය මදි නිසා විශේෂයෙන් අමාත්‍යතුමාට, අමාත්‍යාංශයේ නිලධාරින්ට මේ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මෙතැනින් හමාර කරනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Wasantha Aluwihare. You have only five minutes.

[අ.භා. 5.57]

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාමත් කනගාටුදායක සිද්ධියක් ගැන අපට අහන්නට ලැබුණා. රිසානා මෙනෙවියගේ

[ගරු වසන්ත අලුවිහාරේ මහතා]

මරණය සම්බන්ධව විරුද්ධ පාර්ශ්වය හැටියට අපේ බලවත් කනගාටුව, ශෝකය මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරන්න කැමැතියි.

කාල වේලාව නැති නමුත් ගරු ඇමතිතුමාගේ විෂයට සම්බන්ධ කරුණු කීපයක් මා අවධානයට යොමු කරන්න කැමැතියි. විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ පසු ගිය දෙසැම්බර් 17 වැනිදා සිට මේ දක්වා තවමත් අයහපත් කාලගුණ තත්ත්වයකුයි තිබෙන්නේ. මම මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කීපයක, එක් එක් ගම්වල ස්ථිර වශයෙන් පදිංචි ස්ථාන අහිමි වූ සංඛ්‍යාව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව අනුව සඳහන් කරන්න කැමැතියි. මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 24යි. රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 110යි. උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 8යි. නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 5යි. මේ අනුව පවුල් 147ක් වැනි ප්‍රමාණයකට ස්ථිර වශයෙන්ම පදිංචි ස්ථාන අහිමි වී තිබෙනවා. ස්ථිර වශයෙන් පදිංචි ස්ථාන අහිමි වූ පවුල් 147 සම්බන්ධව ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ මොරේමඩ මැතිතුමාගේ වාර්තාව මම ඉදිරිපත් කරන්න කැමැතියි. කාල වේලාව නැති නිසා, මම මේ අවස්ථාවේදී එම වාර්තාව **සභාගත*** කරනවා.

ඒ වාර්තාවේ සියලුම තොරතුරු පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා මේ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කරයි කියලා මා බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, ඒ අයට ඉඩම් ලබා දෙන්නේ කොයි පැත්තෙන්ද? දැන් මේ අයට වියළි සලාක ලැබෙනවා. රජයෙන් වියළි සලාක දෙනවා. ඒ වාගේම ස්වේච්ඡා සංවිධානවලින් දෙනවා. නමුත් දැන් ඉඩම් සම්බන්ධව ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව තමයි අවධානය යොමු කළ යුත්තේ. නමුත් තවම ඒ සම්බන්ධව නිලධාරීන් විධිමත්ව ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ යාන්ත්‍රණය හරියට ක්‍රියාත්මක වෙලා නැහැ. ඉතාමත් කනගාටුවෙන් වුවද ඒක කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මා මේ කාරණය කියන්න ඕනෑ. ජාතික ගොඩනැඟිලි හා පර්යේෂණ ආයතනයේ වාර්තාවට අනුව, ගෙබිම තුළින් උල් දිය ගලා ඒම, නාය යෑම් අවදානම, නිවාස හා බිත්ති ඉරි තැලීම, ගල් පෙරළීමේ අවදානම හා ගිලා බැසීම් මත අවදානම් ස්ථාන ලෙස හඳුනාගත් තැන්වල පදිංචි වී සිටින ජනතාවට අනතුරුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිකළොය රාජ්‍ය වතු යායේ තමයි විශාල වශයෙන් නාය යෑම් වෙලා තිබෙන්නේ. විශේෂයෙන් මා සඳහන් කරන්න කැමැතියි, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිකළොය වත්ත නාය යෑම සම්බන්ධව. මෙය ජනාධිපතිතුමාගේද නිරීක්ෂණයට ලක් වුණා.

රාජ්‍ය වැවිලි සමාගමට අයත් නිකළොය වතු යායෙන් ආරම්භ වෙලා, දන්කන්ද පාලම දක්වා වූ විශාල ප්‍රදේශයක් නාය යෑමට ලක් වුණා. මෙම නාය යෑම හේතුවෙන් නිකළොය වතු යායේ ගොඩනැඟිලි 12ක් සම්පූර්ණයෙන් විනාශ වුණා. මෙයින් එක් පවුලක සාමාජිකයන් හය දෙනෙක් අතුරුදන් වී තිබෙනවා. තවම ඒ අය කොහේද කියලා දන්නේ නැහැ. මෙම නාය යෑමෙන් නිකළොය වතු යායේ මැද කොටසේ පදිංචි පවුල් 69ක්ද, පහළ කොටසේ පදිංචි පවුල් 81ක්ද, top division එකේ පදිංචි පවුල් තුනක් ද ඇතුළත් පවුල් 153ක සාමාජිකයන් 590ක් පීඩාවට පත් වුණා. නාය යෑමෙන් පසු එම පිරිස රත්තොට හින්දු විද්‍යාලයේ අවතැන් කඳවුරුවල රැඳී සිටිනවා. නැවත මේ පිරිස නිකළොය වත්තේ පදිංචියට යන්න කැමැති නැහැ. එයට හේතුව, එම ප්‍රදේශයේ නාය යෑම් අවදානමක් පැවැතීමයි. මෙම පිරිස මේ දක්වා ස්ථිර පදිංචි ස්ථානයක් නැතුව අසරණව සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩම් තිබෙනවා.

මේ ඉඩම්වලින් ඉතාමත් ඉක්මනටම ඒ අයට ඉඩම් ලබා දීමට පුළුවන්කමක් තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරවනවා. මේ සම්බන්ධව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරලා, එහෙමත් නැත්නම් එම පළාතේ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා සමඟ සාකච්ඡා කරලා ඒ අයට අවශ්‍ය, -විශේෂයෙන් ද්‍රවිඩ ජනතාවත් ජීවත් වෙනවා.- නිවාස ටික ලබා දෙන්න. එහෙමත් නැත්නම් ඉඩම් ටික ලබා දීලා නිවාස ටික ඉදි කරන්න. ඒ අවශ්‍යතා ඉටු කර දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කියන්න ඕනෑ, රත්තොට වෙලන්ගහ වත්ත, එගොඩ ගෙදර අජිත් කුමාර මහතාගේ රුපියල් ලක්ෂ 40ක්, 50ක් පමණ වටිනා නිවස නාය යාමට ලක්ව සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙන බව. ඔහුගේ පුංචි අම්මා කෙනෙකු වන ඒ.ජී. කරුණාවතී මහත්මියගේ නිවසත් නාය යෑමට ලක්වෙලා ඇය මිය ගොස් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම කියන්න කැමැතියි රුපියල් ලක්ෂ 40ක්, 50ක් පමණ වටිනා නිවසක් සහ ඉඩමක් සම්පූර්ණයෙන්ම විනාශ වෙලා තිබෙද්දීත් මේ වන තෙක් ඔහුට කිසිම සහනයක් ලැබී නැති බව.

ඒ නිසා ඒ පවුලටම යම් සහනයක් ලබා දෙන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා ගිහින්, ඔවුන්ට රුපියල් 25,000ක මුදලක් ලබා දී තිබෙනවා. ප්‍රාදේශීය ලේකම්තුමා තවම ඒ මුදල ලබා දීමට කටයුතු කරලා නැහැ කියන එකත් මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Faiszer Musthapha, you have two minutes.

[6.03 p.m.]

**ගරු ෆයිසර් මුස්තාපා මහතා (තාක්ෂණ හා පර්යේෂණ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைசர் முஸ்தபா - தொழில்நுட்ப, ஆராய்ச்சி பிரதி அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Deputy Minister of Technology and Research )
Sir, I wish to express my grief with regard to the execution of Rizana Nafeek. I would like to place on

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

record the efforts taken by His Excellency the President, the appeals made on behalf of the family and the efforts taken in trying to stop this execution. I would like to thank His Excellency for all steps and initiatives taken and the appeals made to prevent the execution.

Once again, I share the grief with the family of Rizana with regard to her death.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. V.S. Radhakrishnan please. You have five minutes.

[பி.ப. 6.04]

**ගරු වී.එස්. රාධක්‍රිෂ්නන් මහතා**
(மாண்புமிகு வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. V.S. Radhakrishnan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று சவூதி அரேபியாவில் மரண தண்டனை நிறைவேற்றப் பட்டிருக்கின்ற றிஸானா நபீக் என்பவரின் குடும்பத்தினருக்கு முதலில் மலையக மக்களின் சார்பில் என்னுடைய அனுதாபங்களைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்த ஒருமாத காலமாக நாட்டிலே அசம்பாவிதங்கள் பல ஏற்பட்டு வருகின்றன. இந்த அனர்த்தத்தினால் நுவரெலியா பகுதியிலே 3,296 வீடுகள் பாதிக்கப்பட்டிருக்கின்றன. அவற்றிலே 119 வீடுகள் முழு அளவிலும், 463 வீடுகள் பகுதியளவிலும் பாதிக்கப்பட்டிருக்கின்றன. அனர்த்தம் காரணமாக 3 மரணங்கள் ஏற்பட்டிருப்பதோடு 1,21,062 பேர் பாதிக்கப்பட்டுமிருக்கிறார்கள். கடந்த அனர்த்தம் காரணமாக நுவரெலியா மாவட்டத்திலிருக்கின்ற மக்கள் மிகவும் அசௌகரியமான நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். பல இடங்களிலே மண் சரிவுகள் ஏற்பட்டிருக்கின்றன. இத்தகைய மிகவும் மோசமான நிலையிலே அங்கு மக்கள் இருக்கின்ற நிலையிலே அனர்த்த முகாமைத்துவ அமைச்சர் மாண்புமிகு மஹிந்த அமரவீர அவர்களால் அந்தப் பகுதிக்கு வர முடியாதிருந்தாலும் அங்கிருக்கின்ற அரசாங்க அதிபர் திரு. டி.பி.ஜி. குமாரசிறி அவர்கள் மூலமாக தேவையான உதவிகளை செய்து கொடுத்திருக்கிறார். ஆகவே, அவருக்கு எனது நன்றியை நான் இந்த நேரத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

கடந்த 3 நாட்களுக்கு முன்பு பெய்த மழையின் காரணமாக நுவரெலியா நகரத்திலே 194 பேர் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். பல கடைகளிலே தண்ணீர் புகுந்து அவர்களுக்கு மிகவும் கஷ்டமான நிலைமைகளை ஏற்படுத்தியிருக்கின்றது. இங்கு ஒரு விடயத்தைக் கேட்டுக்கொள்ளவேண்டியவனாக இருக்கின்றேன். அதாவது, நுவரெலியா நகரத்திலுள்ள பல கடைகள் அங்கு அமைக்கப்பட்டிருக்கின்ற பாலங்களின் மேலாக அனுமதியின்றிக் கட்டப்பட்டிருக்கின்றன. அத்தகைய கடைகளை அப்புறப்படுத்துவதற்கான நடவடிக்கையை எடுத்தால் அங்கு இந்த மாதிரியான அசம்பாவிதங்கள் எதிர்காலத்திலே நடைபெறாமல் பார்த்துக்கொள்ளலாம். கௌரவ அமைச்சர் நிமல் சிறிபால த சில்வா அவர்கள் அங்கே இருக்கின்ற Barrack Lane Lake இனை சுத்தப்படுத்துவதற்கான நடவடிக்கையை கடந்த காலத்திலே எடுத்திருந்தார். அதன் காரணமாக அங்கு வெள்ளப்பெருக்கு ஏற்படுவது தடுக்கப்பட்டிருக்கின்றது. மீண்டும் அதைச் சுத்தப்படுத்துவதற்கான நடவடிக்கையை அவர் எடுக்க வேண்டுமென்பதையும் நான் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, தோட்டத்தொழிலாளர்கள்- 'லயன் காம்பறா'வில் இருப்பவர்கள் அனர்த்தத்தினால் பாதிக்கப்பட்டால் அவர்கள் நிவாரணம் மற்றும் உதவிகளுக்காகப் பிரதேச செயலகங்களுக்குச் செல்ல வேண்டியிருக்கிறது. அங்கு அவர்களிடம், உங்களிடம் வீட்டு ஒப்பினை - உறுதி இருக்கின்றதா? உங்களுடைய வீடு சொந்தவீடா? என்றவாறெல்லாம் கேள்விகளைக் கேட்டு, "உங்களுக்கு உதவி செய்யக்கூடிய நிலையில் நாங்கள் இல்லை" என்று சொல்கின்றார்கள். இவ்வாறு "இல்லை" என்ற பதத்தைப் பாவிக்காமல், அவர்கள் இலகுமுறையில் சேவையைப் பெறுவதற்கு உரிய வசதிகளை கௌரவ அமைச்சர் அவர்கள் ஏற்படுத்திக் கொடுக்கவேண்டுமென்று நான் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன். கடந்த காலங்களில் ஏற்பட்ட ஒவ்வொரு அனர்த்தத்தின்போதும் நான், கௌரவ அமைச்சர் மஹிந்த அமரவீர அவர்கள் மூலமாக பல உதவிகளை நுவரெலியாவிலுள்ள தோட்டப்புற மக்களுக்குப் பெற்றுக்கொடுத்து, உதவி செய்திருக்கின்றேன். எதிர்காலத்திலும் இவ்வாறான உதவிகளை இலகுமுறையில் செய்வதற்கு உரிய நடவடிக்கைகளை எடுக்கும்படி கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, கௌரவ அமைச்சர் அவர்கள், ஏனைய பகுதிகளில் உதவிகள் செய்துகொண்டிருப்பதன் காரணமாக தாமதம் ஏற்பட்டாலும்கூட, நுவரெலியாப் பகுதிகளில் அனர்த்தங்களின்போது பாதிக்கப்பட்ட வீடுகளைத் திருத்தியமைப்பதற்கு உடனடியாகத் தேவைப்படும் கிட்டத்தட்ட 5,800 கூரைத்தகடுகளைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்று வினயமாகக் கேட்டுக்கொள்கிறேன். அதுமட்டுமல்ல, தற்பொழுது ரம்பொடை பகுதியில் பெரியதொரு கல் சரிந்துகொண்டு வருகின்றது. இச்சரிவின் காரணமாக அங்குள்ள பல குடும்பங்கள் தற்காலிகமாக வேறு இடங்களில் குடியமர்ந்துள்ளன. இதனால் பாதிக்கப்பட்ட மக்களுக்குத் தோட்ட முகாமையாளர்கள் மூலமாகப் புதிய வீடுகளைக் கட்டிக்கொடுப்பதற்கு உரிய நடவடிக்கைகளை நாங்கள் எடுத்துவருகின்றோம். அதற்காகவும் கௌரவ அமைச்சர் அவர்கள் எதிர்காலத்தில் உதவிகளைச் செய்யவேண்டும் என்று கேட்டுக்கொண்டு, கடந்த காலங்களில் எங்களுக்கு பல வழிகளிலும் உதவிகளைச் செய்ததற்காக மீண்டும் நன்றி தெரிவித்து, என்னுடைய பேச்சை நிறைவுசெய்கின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you. The next speaker is the Hon. Selvam Adaikkalanathan. You have only five minutes.

[பி.ப. 6.08]

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் முதலில் செல்வி றிஸானா நபீக் என்பவருக்கு மரண தண்டனை நிறைவேற்றியமை தொடர்பில் தமிழ் தேசியக் கூட்டமைப்பின் சார்பாக அவருக்கு அஞ்சலியையும் அவருடைய குடும்பத்தாருக்கு ஆழ்ந்த அனுதாபங்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

[ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]

எங்களுடைய வன்னிப் பிராந்தியத்தைப் பொறுத்தமட்டில், உண்மையிலே அங்குள்ள மக்கள் போரினால் மிகவும் நொந்தவர்கள். அவர்களைத் தற்பொழுது இயற்கையும் பழிவாங்குகின்றது. இந்நிலைமையானது மிகவும் கவலை தருகின்ற விடயமாக இருக்கின்றது என்பதை நான் இச்சபையிலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அந்தப் பிராந்தியத்திலுள்ள வவுனியா, மன்னார், முல்லைத்தீவு ஆகிய மாவட்டங்களில் தொடர்ந்து மழை பெய்து கொண்டிருப்பதனால், அங்குள்ள மக்கள் சொல்லொணாத் துன்பங்களை அனுபவித்துக்கொண்டிருக்கின்றார்கள். முக்கியமாக, அநுராதபுரத்திலுள்ள குளங்களின் துருசுகள் திறக்கப்பட்டவுடன் வாய்க்கால்களூடாக வெளியேறுகின்ற நீரானது குறிப்பாக தம்பனைக்குளம், பன்னவெட்டுவான், மடுக்கரை போன்ற இடங்களிலே பெருகிவருவதனால் அங்குள்ள மக்கள் ஒவ்வொரு வருடமும் பல்வேறு பிரச்சினைகளைச் சந்தித்து வருகின்றார்கள். எனவே, அங்கு பெருகிவரும் தண்ணீர் வடிந்தோடக்கூடிய வழிமுறைகளைக் கண்டறிந்து, தேவையான வழிவகைகளைச் செய்ய வேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களிடமும் இந்த அரசிடமும் நான் வேண்டுகோள் விடுக்கின்றேன். இல்லையென்றால், வருடாவருடம் அந்த மக்கள் இடம்பெயர வாய்ப்பிருக்கின்றது. ஆகவே, வெள்ள அனர்த்தத்திலிருந்து அந்த மக்களைப் பாதுகாப்பதற்கான முயற்சியை மேற்கொள்ள வேண்டுமென்று நான் கேட்டுக்கொள்கின்றேன்.

வெள்ளத்தினால் அங்கு கால்நடைகளும் இறந்திருக்கின்றன. சேற்றுக்குள் மேய்கின்றபடியால் அங்குள்ள கால்நடைகளுக்கு வைரஸ் நோய் ஏற்படுவதற்கான சாத்தியக்கூறு இருக்கிறது. கால்நடை விவசாயிகளின் இறந்த கால்நடைகளுக்கு நஷ்டஈடு கொடுக்க வேண்டும். ஏனென்றால், அவர்கள் அந்தத் தொழிலைத்தான் நம்பியிருக்கிறார்கள். அதைவிட, வைரஸ் தொற்றியிருக்கின்ற கால்நடைகளுக்கு உடனடியாக மருத்துவப் பரிசோதனை செய்ய வேண்டும்.

இங்கு இன்னொரு விடயத்தை நான் சொல்ல வேண்டும். அதாவது, இந்த அனர்த்தம் காரணமாக எங்களுடைய பள்ளிக்கூடப் பிள்ளைகள் மிகவும் மோசமான ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். கல்வியைத் தொடர்வதற்கான வாய்ப்பை அவர்கள் இழந்திருக்கின்றார்கள். அவர்களுடைய வீடுகளுக்குள் தண்ணீர் புகுந்து அப்பியாசக் கொப்பிகள், காலணிகள், சீருடைகள் போன்றவற்றை அடித்துச் சென்றிருக்கிறது. இதனால் அந்தப் பிள்ளைகள் பாடசாலைக்குச் செல்ல முடியாத நிலையில் உள்ளனர். இதுபற்றியும் கவனம் செலுத்தி அவர்களுக்கு அவற்றைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுக்கவேண்டும்.

சென்றமுறை ஏற்பட்ட வரட்சி காரணமாக மிகவும் பாதிப்புக்குள்ளான விவசாயிகள், இந்தமுறை ஏற்பட்ட வெள்ள அனர்த்தத்தினால் தொடர்ந்தும் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். வரட்சி காரணமாகப் பாதிக்கப்பட்ட விவசாயிகளுடைய கடன்கள் அறவிடப்படமாட்டாதெனச் சொன்னாலும்கூட எங்களுடைய விவசாயிகள் அந்த கடன்களைக் கட்டிவிட்டுத்தான் விவசாயத்தைச் செய்தார்கள். இப்பொழுதும் அவர்களுடைய பயிர்ச்செய்கை அழிந்திருக்கிறது. அவர்களுக்கு உடனடியாக நஷ்டஈடு கொடுத்தாக வேண்டுமென்ற நிலையில் அவர்கள் இருக்கின்றார்கள். ஆகவே, அதற்கு ஆவன செய்ய வேண்டும்.

அடுத்ததாக, இந்த அனர்த்தத்தின்போது உண்மையிலே எங்களுடைய மாவட்டத்தில் உங்களுடைய திணைக்களத்தைச் சேர்ந்த முக்கிய அரச அதிகாரிகள், அரச உத்தியோகத்தர்கள் என எல்லோரும் இரவிரவாகக் கண்விழித்துப் பல சேவைகளை ஆற்றினார்கள். அவர்களுக்கு இச்சந்தர்ப்பத்தில் நான் நன்றி கூறுவதுடன், எனக்கு முன்பு பேசிய கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்கள் சொன்னதுபோல அவர்களிலே குறிப்பாக மாணிக்கவாசகம் ஸ்ரீஸ்கந்தகுமார் என்பவருடைய நடவடிக்கைகளிலே நீங்கள் கவனம் செலுத்த வேண்டும். அவரை இடம்மாற்றி வேறொருவரை அந்தப் பதவிக்கு நியமித்தால் நன்றாக இருக்குமென்று கௌரவ அமைச்சர் அவர்களிடம் நானும் ஒரு வேண்டுகோளை விடுக்க விரும்புகின்றேன். ஏனென்றால், அந்தளவுக்கு அவருடைய நடத்தைகள் திருப்தியற்றிருக்கின்றன. நானும், கௌரவ சிவசக்தி ஆனந்தன் அவர்களும் வேறு யாரையும் குறை சொல்லவில்லை. ஆனால், இவருடைய நடத்தை உண்மையில் குறைசொல்கின்ற அளவுக்கு இருக்கின்ற காரணத்தினால் அதை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டுமென்று நான் இச்சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up.

**ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்)
(The Hon. Selvam Adaikkalanathan)
Please give me one more minute.

எங்களுடைய பகுதியில் தொடர்ந்தும் மழை பெய்து வருகின்றது. சிறந்த வடிகாலமைப்புகள் தொடர்ச்சியாகப் பெய்கின்ற மழைநீரை வடிந்தோடச் செய்யும். அந்த வகையில், ஒவ்வொரு மாவட்டத்திலும், குறிப்பாக எங்களுடைய முல்லைத்தீவு, வவுனியா, மன்னார் போன்ற பிரதேசங்களிலே, இவ்வாறான வடிகாலமைப்பு நடவடிக்கைகளைச் செய்ய வேண்டுமென்று கேட்டுக்கொள்ள விரும்புகின்றேன். முல்லைத்தீவிலே இன்றைக்கும் பல இடப்பெயர்வுகள் நடந்திருக்கிறது. எனவே, இவற்றை நீங்கள் கவனத்தில் எடுக்க வேண்டுமெனக் கேட்டு, முடிக்கின்றேன்.

[අ.භා. 6.14]

**ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා**
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අපට අහන්න ලැබුණු රිසානා නෆීක් සහෝදරියගේ අභාවය පිළිබඳව ඛේදනීය ආරංචිය ගැන අපගේ ශෝකය පළ කරනවා. අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව ගැන වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මගේ සහෝදර පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ෂෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කථාව පටන් ගන්න කොට කිව්වා, මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ ද්වේෂ සහගතවයි කියා. අනික් අතට මට හිතෙනවා, ද්වේෂ සහගතව නොවෙයි ආණ්ඩු පක්ෂය හැටියට අපි මේ ගැන ස්තුතිවන්ත විය යුතුයි කියා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් බොහොමයක් දෙනා ආණ්ඩු පක්ෂයට හිතවත්ව තමයි වැඩ කටයුතු කරන්නේ. මොකද, මේ මඟින් අපට අවස්ථාවක් ලබා දී තිබෙනවා, මේ තත්ත්වය පිළිබඳව මේ ගරු පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමක් කරන්න.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා ඇමතිතුමා කථා කරමින් ඉතාම පැහැදිලිව කරුණු ඉදිරිපත් කළා, මේ මුළු ලෝකයම අද ස්වාභාවික ව්‍යසනවලින් පිරිලාය කියන එක ගැන. මීට කලින් නොතිබුණු ප්‍රශ්නවලට මුහුණ දෙන කාලයක තමයි අද අපි ඉන්නේ. ලංකාවේ අපටත් කවදාවත් අසන්න නොලැබුණු දේවල්

තමයි අද අපට අහන්න ලැබෙන්නේ. මාළු වැහි වහිනවාය කියනවා; එක එක පාටවලින් වැසි වහිනවාය කියනවා. මා නියෝජනය කරන ප්‍රදේශයටත් අයිස් වැස්සක් වැස්සා. ඒ ප්‍රදේශයේ ජනතාවගේ සියලු ගොවිතැන් කටයුතු විනාශ වුණා. ලංකාවේ අපි කවදාවත් අහලා නැති ටොනේඩෝ තත්ත්වයකටත් අපට මුහුණ දෙන්නට සිදු වුණා. මේවා ස්වභාවික විපත්. අපට ඒවාට කරන්න දෙයක් නැහැ.

හැබැයි ඒ සෑම දෙයකින්ම පීඩාවට පත් වන්නේ අසරණ ජනතාවයි. ඒ සෑම දෙයකින්ම පීඩාවට පත් වන්නේ යමක් කමක් තිබෙන පුද්ගලයන් නොවෙයි. කිසිම දෙයක් කර ගන්න බැරි අහිංසක ජනතාව තමයි ඒ විධියේ තත්ත්වයන්ට මුහුණ දෙන්නේ. ඒ ජනතාවගේ කඳුළු තුළින්, ඒ ජනතාවගේ දුක තුළින් දේශපාලන වාසි දකින, කාළකණ්ණි දේශපාලන අරමුණු තිබෙන අය ගැන ඇත්තෙන්ම අපි කනගාටු වෙනවා, ඒ විධියටද දේශපාලනඥයන් වශයෙන් වැඩ කරන්නේ කියලා. ඊටත් වඩා අද අපට හිත රිදෙන ආරංචි කොච්චර එනවාද? අද මේ ව්‍යසන තත්ත්වය විකුණා ගෙන සමහරුන් තමන්ගේ සාක්කු පුරවා ගන්න හදනවා. අද මේ ගංවතුරෙන් ව්‍යසනයට පත් වූ අහිංසක ජනතාවගේ ෆොටෝ අරගෙන, ඒවා පිට රටවලට පෙන්වා සාක්කුවලට සල්ලි දමා ගන්නවා. එහෙම සල්ලි අරගෙන ඇවිල්ලා පනස් දාහේ ඒවා බෙද බෙදා යන්න අපටත් පුළුවන්. හැබැයි, ඒ විධියේ දේවල් නොවෙයි කළ යුත්තේ.

මීට ඉස්සෙල්ලා කවදාවත් මේ නමින් අමාත්‍යාංශයක් තිබුණේ නැහැ. ලංකාව සුනාමි ව්‍යසනයට ලක් වුණායින් පසුව අපේ අතිගරු ජනාධිපතිතුමා හිතුවා ලංකාවටත් ස්වභාවික ව්‍යසනයන් එන්න පුළුවන්ය කියලා. කලින් අපි කෑ ගැහුවේ අපේ රටට භූමි කම්පා නැහැ; මොනවත් නැහැ කියලායි. හැබැයි අද එහෙම නොවෙයි. අද අපට පෙනෙනවා, ශ්‍රී ලංකාවටත් එවැනි තත්ත්වයන් උදා වනවාය කියා. ඒ නිසා තමයි මේක වෙනමම විෂයයක් හැටියට අරගෙන, ඉතාමත්ම දක්ෂ අමාත්‍යවරයකු යටතේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය නමින් මේ අමාත්‍යාංශය බිහි කළේ. ඒ වාගේම තමයි එතුමාගේ සභාපතිත්වයෙන් ආපදා කළමනාකරණ කමිටුව මෙහෙයවන්නේ. මම විරුද්ධ පාර්ශ්වයෙන් අහනවා, මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මාධ්‍යවලට පෙනෙන්න යෝජනා ඉදිරිපත් කළාට, විරුද්ධ පාර්ශ්වයේ කවුරුවත් එක දවසක් හරි මේ ආපදා කළමනාකරණ කමිටුවට ඇවිල්ලා තිබෙනවාද කියලා. කමිටුවට ඇවිත් ඔවුන්ගේ අදහසක් ප්‍රකාශ කරනවාද? නැහැ. ඇයි? ඒක ටීවී එකේ වැටෙන්නේ නැහැ නේ. මේ ආකාරයෙන් ජනතාවගේ දුක විකුණා ගෙන කන, තුනයි පණහේ දේශපාලනයක් නොවෙයි කරන්න ඕනෑ.

ජනතාව විසින් පාර්ලිමේන්තුවට අපව පත් කරන්නේ මේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ ඔවුන්ගේ හඬ අවදි කරලා ඔවුන් වෙනුවෙන් කථා කරන්නයි. තමන්ගේ පෞද්ගලික දේශපාලනික මති මතාන්තර ඉස්සරහට දමා ගෙන හැම පොඩි දේකටම දේශපාලනය ගාවා ගන්නේ නැතිව ජාතියක් හැටියට, මිනිස්සු හැටියට, මනුස්සකම හදවතේ තියා ගෙන අපි ඉස්සරහට යනවා. ගරු ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට, ඒ වාගේම ඒ අමාත්‍යාංශයේ ලේකම් වන මොහොමඩ් මැතිනිය ඇතුළු ඒ සියලුම නිලධාරින්ට ඔවුන්ගේ තිබෙන දැඩි කැප වීම පිළිබඳව මම ස්තුතිවන්ත වනවා.

අපට යම් කිසි විධියක සුළු හෝ අවශ්‍යතාවක් ඇති වුණු ගමන් අපි කථා කරන්න කලින් ගරු අමාත්‍යතුමා අපට කථා කරනවා. එතුමා කැබිනට් අමාත්‍යවරයෙක්. එතුමා කැබිනට් අමාත්‍යවරයෙක් වුවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපට call කරලා අහනවා, "මන්ත්‍රීතුමනි, අපට ආරංචියක් ඇවිල්ලා තිබෙනවා, ඔබතුමාගේ ආසනයේ මේ විධියේ තත්ත්වයක් තිබෙනවා කියලා. අපෙන් මොකක්ද කෙරෙන්න ඕනෑ. දැන් මොකක්ද තත්ත්වය, දැන් කී දෙනෙක් අවතැන් වෙලා තිබෙනවාද, කොපමණ සල්ලි එවන්න ඕනෑද?" කියලා. ඒ ආකාරයෙන් අපෙන් අහලා එතුමන්ලා අපට ඒ අවශ්‍ය වැඩ කටයුතු කරනවා. අද අපට ඉතාමත්ම වග කීමෙන් කියන්න පුළුවන්, අවතැන් වුණු හෝ එවැනි අවාසනාවන්ත සිද්ධියකට මුහුණ පෑ කිසිම කෙනෙක් කිසිම තැනක අපි බඩගින්නේ තියලා නැහැ කියලා. අතිගරු ජනාධිපතිතුමා අපට කිව්වේ, කිසිම මනුස්සයෙක් බඩගින්නේ තියන්න එපා කියලායි.

මගේ කාලය සීමා වෙලා තිබෙන අවස්ථාවේ මේ දේවල් හිතට අරගන්න කියලා මම තව එකම එක දෙයක් කියනවා. ගරු ඇමතිතුමනි, ඒ සඳහා ඔබතුමා අවධානය යොමු කරන්න. ඔබතුමාගේ හදවත පිරිසිදුව, ඔබතුමා කරන මේ සියලු වැඩ කටයුතු ඉස්සරහට කර ගෙන යන්න. ඔබතුමාට අකුල් හෙළන නිලධාරි ටිකකුත් මේ අමාත්‍යාංශය අස්සේ රිංගා ගෙන සිටිනවා. ඒක තමයි රාජ්‍ය සේවයේ හැටි. හැබැයි ඔබතුමා ඒගොල්ලන් පිළිබඳව පොඩ්ඩක් සොයා බලා ඔබතුමාගේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්න කියලා කියමින් මම නිහඬ වනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The next speaker is the Hon. Mahinda Amaraweera, Minister of Disaster Management.

**ගරු මහින්ද අමරවීර මහතා ( ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Disaster Management)
මට කොපමණ වෙලාවක් තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You have only ten minutes.

[අ.භා. 6.20]

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විවාදය අවස්ථාව ආරම්භයේදී දැන ගන්න ලැබුණු රිසානා දැරියගේ ඝාතනය පිළිබඳව අපේ ශෝකය පළ කරමින්ම මගේ කථාව ආරම්භ කරනවා.

මේ විවාදය ගෙන ආවේ අවංක හිතින් ජනතාවට සේවයක් කරන්නද, නැත්නම් තමන්ගේ මුහුණ අද රාත්‍රියේ රූපවාහිනියේ දමා ගන්නද කියන එක තමයි මට තිබෙන පළමුවැනි ප්‍රශ්නය. මොකද, යෝජනාව ඉදිරිපත් කළ රවි කරුණානායක මන්ත්‍රීතුමාවත්, යෝජනාව ස්ථිර කළ සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාවත් මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ නැහැ. මම දන්නවා, ඒ යෝජනාව ඉදිරිපත් කරලා රූපවාහිනි ආයතනවලට කථා කරලා කිව්වා, අද රාත්‍රී කොහොම හරි news එකක් දමා දෙන්න කියලා. මේ අහිංසක මිනිස්සු විපතට පත් වුණු වෙලාවේ තමන්ගේ ප්‍රතිරූප ගොඩ නඟා ගන්න ගෙනෙන විවාදවලින් කිසිම ඵලයක් ඇති වන්නේ නැහැ. අද දවසේ පාර්ලිමේන්තුව වෙනුවෙන් කීයක් වියදම් කළාද? මම දැක්කා, සජිත් ප්‍රේමදාස මහත්තයා

[ගරු මහින්ද අමරවීර මහතා]

පුවත් පත් සාකච්ඡාවක් තියලා කියනවා, "මම පාර්ලිමේන්තු එන්නේත් නැහැ, මම සූදානම් වෙලා ඉන්නේ මගේ මුළු කාලයේම ඒ මිනිස්සුන්ට සේවය කරන්න" කියලා. එතුමා යෝජනාවක් ගෙනාවා පාර්ලිමේන්තුව අවලංගු කරන්න කියලා. අද මේ යෝජනාව නැත්නම් අද පාර්ලිමේන්තු රැස්වීම් රහිත දිනයක් බවට පත් කරන්න තිබුණා. මේ සඳහා රුපියල් ලක්ෂ ගණනක්, කෝටි ගණනක් වියදම් කරනවා. මේ මන්ත්‍රීවරු ඔවුන්ගේ කථාව කරලා ආපහු යනවා. අඩු ගණනේ තමන් කියපු අසත්‍යය පැහැදිලි කර ගන්නවත්, ඒකට පිළිතුරක් ලබා ගන්නවත් මේ මන්ත්‍රීවරු අද මේ වෙලාවේ මෙතැන නැති වීම පිළිබඳව මම කනගාටු වනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගංවතුර ආධාර බෙදන්න ගිහිල්ලා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

ගරු මන්ත්‍රීතුමා, ගංවතුර ආධාර බෙදන එක ගැන අහ ගන්න තිබුණා. 31 වැනිදා ගංවතුර. මේ කියපු මන්ත්‍රීවරු 31 වැනිදා රාත්‍රි රාමඩා හෝටලයේ. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා රාමඩා හෝටලයේ party එකේ dance කරනවා. මම 20 වැනිදා මේ ගංවතුර ඇති වුණු වෙලාවේ ඉඳලා ඒ ස්ථානවලට ගියා. මම 31 වැනිදා අවුරුද්ද අවසාන කළේත් පුත්තලම ප්‍රදේශයේ ඒ අහිංසක ජනතාවත් එක්ක ඉඳලායි. ඒ වාගේම 2013 ජනවාරි පළමුවැනිදා නැවත කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රදේශයට ගිහිල්ලා තමයි අවුරුද්ද ආරම්භ කළේ. එහෙමයි මේ කටයුතු කළේ.

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් හොඳ අදහස් ඉදිරිපත් කළා. මම නම් වශයෙන් කියන්නේ නැහැ. විශේෂයෙන් ගරු වසන්ත අලුවිහාරේ මන්ත්‍රීතුමා, ගරු පී. හැරිසන් මන්ත්‍රීතුමා වැනි අය හොඳ අදහස් ඉදිරිපත් කළා. කියන්න ගියොත් ගොඩක් කට්ටිය ඉන්නවා. ඔවුන් හොඳ අදහස් ඉදිරිපත් කළා. ඒක හොඳයි. එහෙම වෙන්න ඕනෑ. ඒ වාගේම තමයි මේ වාගේ ව්‍යසනයක් ඇති වුණාම කවුරුත් එකමුතු වෙලා වැඩ කරන්න පුරුදු වන්න ඕනෑ.

ද්‍රවිඩ ජාතික සන්ධානයේ සමහර මන්ත්‍රීවරු ඔවුන්ගේ ප්‍රදේශවල ඉඳගෙන මට කථා කළා. මේ වාගේ තත්ත්වයක් තිබෙනවා, අඩු පාඩු දෙන්න කියලා කිව්වා. ආණ්ඩු පක්ෂයේ මෙතුමන්ලා නිරන්තරයෙන්ම ඒ පිළිබඳව අවධානය යොමු කළා. ද්‍රවිඩ ජාතික සන්ධානයේත් එහෙම කථා කළ කට්ටිය ඉන්නවා. නමුත් මේ ගැන විවේචනාත්මකව බැලූ කණ්ඩායම් මේ පිළිබඳව අවධානයක් යොමු කළේ නැහැ. අඩු ගණනේ අපට ඒ තොරතුරක්වත් කිව්වේ නැහැ. මාධ්‍යයට කථා කළා විතරයි. බොහෝ කට්ටිය කළේ මාධ්‍ය සන්දර්ශන පැවැත්වීම විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වුණත් ලබා දෙන්න පුළුවන් හැම සේවාවක්ම අපි ලබා දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව එක කාරණයක් කියන්න කැමැතියි. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා සම්පූර්ණ අසත්‍ය ප්‍රකාශ ටිකක් තමයි කළේ. එතුමා කිව්වා ගෙවල් ලක්ෂ තුනක් කැඩිලා කියලා. ලංකාවේ විතරක් නොවෙයි, එතුමා ඉන්දියාවේ කැඩුණු ගෙවල් එක්කත් ගණන් හදාගෙනද කියලා දන්නේ නැහැ. ඒක තමයි එතුමාගේ දැනීම. ඒ ප්‍රදේශවලට ගියා කියලා එතුමා කිව්වා. කොහේද ගිය තැන් කියලා මම අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මණ්ඩලාන කියන ගමටයි, ඒ වාගේම හලාවත ප්‍රදේශයේ බංගදෙණිය කියන ගමටයි ගිහිල්ලා පැය දෙකක් වාගේ බොහොම පොඩි වෙලාවක් සිටියා. මිනිස්සුන්ට එකතු වෙන්න කිව්වා. මිනිස්සු හිතුවා ආධාර ගෙනාවා කියලා. අඩුම ගණනේ පැනඩෝල් පෙත්තක්වත් දුන්නේ නැහැ. එහෙම දෙන්නේ නැතිව මිනිස්සුන්ට කිව්වා, සහනාධාර දෙන්න රජයට බල කරනවා කියලා. එපමණයි කළේ. හරියට රට වටේ ඇවිද්දා වාගේ තමයි කථා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ සාමාජිකයෙක්. දැන් කියනවා, ඒ කමිටුව පාර්ලිමේන්තුවට ගේන්න කියලා. ජනාධිපති මන්දිරය පැත්තක තියමු. අරලිගහ මන්දිරය කියන්නේ ජනාධිපතිතුමා රාජකාරි කරන කන්තෝරුව. ජනාධිපතිතුමා තමයි ඒ කමිටුවේ සභාපති. හරි නම් මේ මන්ත්‍රීවරු එතැනට යන්න ඕනෑ. ගිහිල්ලා අදහස් ඉදිරිපත් කරන්න ඕනෑ. තිබෙන අඩු පාඩු,-

**ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා**
(மாண்புமிகு உதித் லொக்குபண்டார)
(The Hon. Udith Lokubandara)
රට රට ගිහිල්ලා කථා කරන්න පුළුවන්.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)

රට රට ගිහිල්ලා කෝපි බොන්නයි, තව දේවල් කාලා බීලා තමන්ගේ යම් යම් දේවල් කථා කරන්නයි යන්න පුළුවන් කට්ටියට දවල්ට යන්න බැරි ඇයි? ජනතාව දුක් විඳින වෙලාවේ, ජනතාව පීඩාවට පත් වුණු වෙලාවේ ඒ අයට සහන දෙන වැඩ පිළිවෙළ ගැන කථා කරන වේදිකාවට, කථා කරන රැස්වීමට සහභාගි වෙන්න බැරි මන්ත්‍රීවරු කවුද? ඒ ගොල්ලන්ට වෙන වෙලාවල්වල ගිහිල්ලා කථා කරන්න පුළුවන්. හැබැයි, ජාතික වැදගත්කමක් තිබෙන කරුණු පිළිබඳව, ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළ පිළිබඳව කථා කරන්න සහභාගි නොවීම පිළිබඳව අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම කඳවුරුවල ඉන්න ජනතාවට විතරයි කන්න දෙන්නේ කියලා වසන්ත අලුවිහාරේ මන්ත්‍රීතුමා කිව්වා. කඳවුරුවල ඉන්න අයට විතරක් නොවෙයි, පීඩාවට පත් වුණු ඕනෑම කෙනෙකුට ආහාර ලබා දෙන්න කියලා අපි කියලා තිබෙනවා. නිවස යට වෙලා නම් ඒ මනුස්සයා ගෙදර අත හැරලා කඳවුරට එන්න ඕනෑ නැහැ. ඒත් ඔහුට පිසූ ආහාර ලබා දෙන්න කියලා අපි දැනුම් දීලා තිබෙනවා.

මම අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලා යෝජනා කළා, ඒ පිසූ ආහාර සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩි කරන්න කියලා. අතිගරු ජනාධිපතිතුමා අපට ඒ සඳහා අනුමැතිය ලබා දුන්නා. ඒ නිසා තමයි අද වෙනදාට වැඩිය දෙගුණයක මුදල් ප්‍රමාණයක් ආහාර සඳහා ලැබෙන්නේ. වියළි සලාකය දෙන විධිය සමහර මන්ත්‍රීවරු ගණන් හදලා කිව්වා. ඒ විධියට සතියකට විතරක් දෙන්න කියලා නැහැ; සති දෙකකට දෙන්න කියලාත් නැහැ. අවශ්‍යතාව අනුව ඕනෑ නම් මාසයක් වුණත් දෙන්න පුළුවන්; මාස 6ක් දෙන්න වුණත් බැරිකමක් නැහැ. දේශපාලන අධිකාරිය, ඔබතුමන්ලා එහෙම ඉල්ලීම් කළ අවස්ථාවල අපි එහෙම ලබා දීලා තිබෙනවා.

සමහර ප්‍රදේශවලට අපි මාස ගණනක් සඳහා වියළි සලාක දීලා තිබෙනවා. එතකොට ගණනේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළ තමයි අපි ක්‍රියාත්මක කළේ. එක්සත් ජාතික පක්ෂය අද කයිවාරු ගැහුවාට

2003 වෙන කොට ගෙයක් හදා ගන්න දුන්නේ රුපියල් 20,000යි. දැන් රුපියල් ලක්ෂයක් දෙනවා. ඒ විතරක් නොවෙයි, තවත් ශක්තිමත්ව ආරක්ෂිත ස්ථානයක නිවසක් ඉදි කර ගැනීම සඳහා ඊට වඩා වැඩි මුදලක් ලබා දීමේ යෝජනාවක් අපි අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරි කාලයේදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය පිළිබඳව මා තවත් කාරණයක් සඳහන් කරන්න කැමැතියි. මේ තත්ත්වය අහම්බෙන්, ඒ කියන්නේ වෙන කිසිම දෙයක වැරැද්දක් නිසා ඇති වුණු දෙයක් නොවෙයි. කාණු අවහිර වීම්, වැව්වල වතුර පිරීම් වාගේ එක එක කථා කිව්වාට ඉතාම ඉහළ වර්ෂාපතනයක් ලැබීම නිසායි මේ තත්ත්වය ඇති වුණේ. කුරුණෑගලට අවුරුදු 125කට පස්සේ තමයි මිලිමීටර් 315ක වර්ෂාපතනයක් වාර්තා වෙලා තිබෙන්නේ. ඒක ඉතාම ඉහළ වර්ෂාපතනයක්. මඩකලපුවේත් ඒ වාගේ වර්ෂාපතනයක් ඇති වුණා. ගරු වසන්ත අලුවිහාරේ මන්ත්‍රීතුමාට මතක ඇති එක් වතාවක් අම්පාරේත් එවැනි වර්ෂාපතනයක් ඇති වුණ බව. ඒ වාගේ අවස්ථාවල තමයි මේ වාගේ ගංවතුර තත්ත්වයන් ඇති වෙන්නේ. ඒක ලංකාවේ මිනිස්සු කළ දෙයක් නිසා -කාණු ගොඩ කිරීම, ගස් කැපීම නිසා- ඇති වුණු දෙයක් නොවෙයි. ඒවාත් යම් ආකාරයකට බලපාන්න ඇති.

නමුත් ලෝකයේ ඇති වුණු පරිසර විනාශය, ඒ වාගේම ගෝලීය උණුසුම වැඩි වීම, ලෝක කාලගුණ විපර්යාස එක්ක තමයි අපේ රටටත් මේ වාගේ තත්ත්වයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අපි ඒ පිළිබඳව දැන් කථා කරන්න පටන් අරගෙන තිබෙනවා. ඒ සඳහා වූ වේදිකාවන් අපි සකස් කරලා තිබෙනවා. රජයක් විධියට අපි සූදානමින් ඉන්නේ කොහොමද කියලා ඇහුවා. අපි සූදානමින් සිටි නිසා තමයි අඩු ගණනේ ජීවිත 1,000ක් මරණයෙන් බේරා ගන්න අපට පුළුවන් වුණේ.

ඕනෑම වේලාවක ප්‍රයෝජනයට ගැනීම සඳහා අපි සෑම හමුදා කඳවුරකම අවම වශයෙන් 25 දෙනෙකු සූදානම් කරලා තිබුණා. ඒ අයට පහසුකම් දීලා තිබුණා; බෝට්ටු දීලා තිබුණා; ජීවිත ආරක්ෂක කබා ලබා දීලා තිබුණා. ඒ අයගේ විවිධ අවශ්‍යතා ඉෂ්ට කරමින් හදිසි අවශ්‍යතාවකදී ඒ අය යොදා ගැනීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළා. ගංවතුරින් ජනතාව මුදවා ගැනීමේ වැඩසටහන්වලට ත්‍රිවිධ හමුදාවේ 2,500කට වැඩිය යොදා ගත්තා. ගුවන් හමුදාව, නාවික හමුදාව විශාල සේවාවක් කළේ අතිගරු ජනාධිපතිතුමා මේ කමිටුවේ සභාපතිතුමා විධියට අපිට ලබා දුන්නු උපදෙසුත්, ඒ වාගේම අපේ අමාත්‍යාංශය කළ වැඩ පිළිවෙළත් නිසාය කියන කාරණය මා ඉතාමත්ම පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි. ග්‍රාම නිලධාරින් විතරයි මේ කටයුත්තට එන්නේ කියලා සමහර මන්ත්‍රීවරුන් කිව්වා. නැහැ. ඕනෑම නිලධාරියෙක් යොදවා ගන්න පුළුවන් විධියට අපි චක්‍රලේඛය වෙනස් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ කටයුත්තේ දී මුදල් මදියි කියලා ගණන් හදලා කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්වල කිසිම සීමාවක් නැහැ. අපට මුදල් ඇති වෙන්න තිබුණා. අපේ අමාත්‍යාංශය කෑම ලබා දීම සඳහා සීමාසහිත වෙලා නැහැ. පසු ගිය කාලයේ උතුරු නැගෙනහිර ඇති වුණු ගංවතුර තත්ත්වයට අපට තිබුණේ රුපියල් මිලියන 250යි. නමුත් අපි රුපියල් මිලියන 800කට වැඩිය වියදම් කළා. ගිය අවුරුද්දේ අවසාන කාලයේ සමහර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් මුදල් ඉතුරුවෙලාත් ආවා. අපි මේ අවුරුද්දේ මේ දවස් ටිකටත් මිලියන 76ක් ආපසු යවලා තිබෙනවා. තව අවශ්‍ය නම් ඒ මුදල් සියල්ලම ලබා දෙන්නත් අපි සූදානමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ජනතාව රැක බලා ගන්න ලංකාවේ අපි ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව මේ රටේ දේශපාලනඥයන්ට තේරෙන්නේ නැති වුණාට ජාත්‍යන්තර වශයෙන් ඇගයුමක් තිබෙනවා. වෙන රටවල ඒ තත්ත්වය නැහැ. ඇමෙරිකාවට බැරි වුණා, මේවා හරියට කළමනාකරණය කර ගන්න. පසු ගිය දවස්වල ඇති වුණු තත්ත්වයට ලයිට් එළිය දෙන්න විතරක් මාස තුන - හතරක් ගියා. ඕස්ට්‍රේලියාවේ විශාල ජීවිත හානි සිද්ධ වුණා. ඒවා දියුණු රටවල්. නමුත් ඒ රටවලින් පවා අපට කියනවා, "ලංකාවේ තිබෙන වැඩ පිළිවෙළ සාර්ථකයි, මුදවා ගන්නා වැඩ පිළිවෙළ සාර්ථකයි, සහන ලබා දීමේ වැඩ පිළිවෙළ සාර්ථකයි" කියලා. අපේ කඳවුරුවල මිනිස්සු බඩගින්නේ මැරෙන්නේ නැහැ. අපේ මිනිස්සු වතුර නැතිව මැරෙන්නේ නැහැ. අපේ මිනිස්සු ලෙඩ හැදිලා බෙහෙත් නැතිව මැරෙන්නේ නැහැ. ඒ සියලු අංශයන්ගෙන් සූදානමක් තිබුණු නිසා තමයි අපට ඒ තත්ත්වය අත් කර ගන්න පුළුවන්කම ලැබුණේ කියන කාරණයත් මා සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන කොට අපේ පූර්ණ හානි වුණු නිවාස සංඛ්‍යාව 5,737කුත් අර්ධ හානි වුණු නිවාස 28,727කුත් තිබෙනවා. ඒ වාගේම කුඹුරු හෙක්ටෙයාර 60,250ක් විනාශ වෙලා තිබෙනවා. එළවලු වගාව විශාල වශයෙන් විනාශ වෙලා තිබෙනවා. ඉස්සෝ කොටු ටිකත් විනාශ වෙලා. මිනිස්සුන්ගේ කුකුල්ලු ටික ගංවතුරට ගිහිල්ලා; හරක් ටික ගිහිල්ලා. ස්වයං රැකියා විශාල ප්‍රමාණයක් අයින්වෙලා තිබෙන බව අපට වාර්තා වෙනවා. දැනටමත් අපි ඒ සියලු තොරතුරු ලබා ගනිමින් යනවා. ඒ සියලු වාර්තා ලැබුණු පසු සියලුම අමාත්‍යාංශ ඒකාබද්ධව රජයක් විධියට අපේ ජනතාවට සහන ලබා දෙන වැඩ පිළිවෙළ දියත් කරන බවත් සඳහන් කරනවා. මේ කටයුතු අපිට නිවැරැදිව ඉටු කිරීම සඳහා අපේ අතිගරු ජනාධිපතිතුමා නායකත්වය ලබා දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඉහළ දායකත්වයක්, සහයෝගයක් මට ලබා දෙනවා. තව අපට ඉස්සරහට යන්න තිබෙනවා. ප්‍රාදේශීය මට්ටමින් වැඩ කරන්න ඉන්න නිලධාරින් එක්ක විතරක් වැඩ කරන එක වෙනස් කරලා ඔබතුමන්ලාත් එක්ක එකතුවෙලා මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යාම අවශ්‍ය වෙනවා. එතකොට අපට බොහොමයක් අඩු පාඩු සම්පූර්ණ කර ගන්න පුළුවන් වෙනවාය කියලා මා විශ්වාස කරනවා. දිස්ත්‍රික් කමිටුව, ප්‍රාදේශීය කමිටුව කැඳවලා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් තවත් සාර්ථක ප්‍රතිඵල අපට ලබා ගන්න පුළුවන්.

අපේ අමාත්‍යාංශය විධියට, ලේකම්තුමිය, අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළු සියලුම නිලධාරින් ඉතාමත් මහන්සිවෙලා මේ කටයුතු මෙහෙයවූවා. ඒ වාගේම දිසාපතිතුමන්ලා විශාල වෙහෙස මහන්සියක් දැරුවා. ප්‍රාදේශීය ලේකම්තුමන්ලා කීප දෙනෙකු හැරුණාම, ග්‍රාම නිලධාරිවරු, සියලුම රජයේ නිලධාරින් මේ සඳහා දැක්වූ සහයෝගය අපි අගය කරන්න ඕනෑ. බිංගිරිය ප්‍රාදේශීය ලේකම්තුමා ගැන මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. එතුමා ඉතාමත් ඉහළින් මේ සඳහා කැප වුණා වාගේම, ඉහළ දායකත්වයක් ලබා දුන්නා. මම එතුමාට ප්‍රශංසාවක් විධියට මේ අවස්ථාවේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවට මේ කරුණු ඇතුළත් කරනවා. එවන් ආකාරයට අනික් සියලුම නිලධාරින් හැඩ ගැස්සවීමේ වැඩ පිළිවෙළ ඉදිරියේ දී අපේ මන්ත්‍රීවරුන් එක්ක එකතුවෙලා කරන්න සූදානම් බව සිහිපත් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

***එකල්හි වේලාව අ.භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2013 ජනවාරි 10 වන බ්‍රහස්පතින්දා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2013 சனவரி 10, வியாழக்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m., MR. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 1.00 p.m. on Thursday, 10th January, 2013.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.